326 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 326 - இல. 06
Volume 326 - No. 06

2026 මැයි 06 වන බදාදා
2026 மே 06, புதன்கிழமை
Wednesday, 06th May, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න** [තීරු 1033-1038]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** ]තීරු 1038-1052]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීම සහ ස්වේච්ඡා ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීම [තීරුව 1054]

"දිට්වා" සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල කෘෂි කර්මාන්තය වැඩිදියුණු කිරීම [තීරුව 1059]

**ශ්‍රීලන්කන් ගුවන් සේවය ප්‍රතිසංස්කරණයන්හි වත්මන් තත්ත්වය:**
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1062]

**විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1069]

**මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1069]

**ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1070]

**බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 1071 - 1192]


# பிரதான உள்ளடக்கம்


**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்** [ப: 1033-1038]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1038-1052]

**தனி அறிவித்தல் மூல வினா:**
முன்பள்ளிக் கல்வியை ஒழுங்குபடுத்தல் மற்றும் தொண்டர் ஆசிரியர்களுக்கான நிரந்தர நியமனங்களை வழங்கல் [ப: 1054]

"தித்வா" புயலால் பாதிக்கப்பட்ட பகுதிகளில் விவசாயத்தை மேம்படுத்தல் [ப: 1059]

**இலங்கை விமான சேவை நிறுவன மறுசீரமைப்பின் தற்போதைய நிலை:**
துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று [ப: 1062]

**தொலைத்தொடர்பு அறவீடு (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1069]

**நிதி (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1069]

**தேசிய சூழல் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1070]

**மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்கவகையின்மை (கூட்டிணைப்பு மற்றும் தனிப்பட்ட) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1071 - 1192]


# PRINCIPAL CONTENTS


QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 1033-1038]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1038-1052]

QUESTION BY PRIVATE NOTICE:
Regulation of Preschool Education and Permanent Appointments for Volunteer Teachers [Col. 1054]

Upliftment of Agriculture in Areas Affected by Cyclone "Ditwah" [Col. 1059]

CURRENT STATUS OF RESTRUCTURE OF SRILANKAN AIRLINES:
Statement by Minister of Ports and Civil Aviation [Col. 1062]

TELECOMMUNICATION LEVY (AMENDMENT) BILL:
Read the First Time [Col. 1069]

FINANCE (AMENDMENT) BILL:
Read the First Time [Col. 1069]

NATIONAL ENVIRONMENTAL (AMENDMENT) BILL:
Read the First Time [Col. 1070]

RESCUE, REHABILITATION AND INSOLVENCY (CORPORATE AND PERSONAL) BILL:
Read a Second, and the Third Time, and passed [Cols. 1071 - 1192]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2026 මැයි 06 වන බදාදා*
*2026 மே 06, புதன்கிழமை*
*Wednesay, 06th May, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the Sri Lanka Institute of Advanced Technological Education for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- Proclamation made and published in Gazette Extraordinary No. 2486/13 of 28th April, 2026 and Schedule thereto, by virtue of the powers vested with the President in terms of Section 2 of the Essential Public Services Act, No. 61 of 1979; and

- Note on Supplementary Allocations from the Development Activities Programme appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 04.03.2026 to 31.03.2026 in terms of Section 6(1) of the Appropriation Act, No. 23 of 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන්, 2023 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රත්ගම, ඉඹුලගොඩ, මහගෙදරවත්ත, "වර්ණ" යන ලිපිනයෙහි පදිංචි අනුෂා නිරංජලී ගමගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගාල්ල, කරාපිටිය, හිරඹුර හරස් පාර, අංක 108 යන ලිපිනයෙහි පදිංචි එම්.ජේ. නුරුල් ෆරීසා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) මහරගම, පුරාණ පාර, පළමු පටුමග, අංක 6/10 යන ලිපිනයෙහි පදිංචි එම්.කේ.ඩබ්ලිව්. වික්‍රමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අම්බලන්තොට, මානජ්ජාව, හයිඩ්‍රාමනි නිවාස, අංක 23 යන ලිපිනයෙහි පදිංචි රංජිත් සමරවික්‍රම මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) අම්බලන්තොට, විත්‍රාගල, මිණිපුරගම යන ලිපිනයෙහි පදිංචි එස්.ඒ. නිමල් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) හකුරුවෙල, අක්කර 10, අංක 29/1 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. නන්දාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු දිලිත් ජයවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු මංජුල සුගත් රත්නායක මහතා**
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)
ස්තුතියි, ගරු කථානායකතුමනි. ගරු අගමැතිතුමියගෙන් මා අසන ප්‍රශ්නය මෙයයි.

2025 වසර සඳහා වන අපොස උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමට විභාග දෙපාර්තමේන්තුව ක්‍රියා කළ අතර, දූ පුතුන් දහස් ගණනක් එහි ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂාවෙන් පසුවෙති.

01. මෙම විභාගය සඳහා ඒ ඒ ධාරාවෙන් මුහුණ දුන් ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

02. ඒ අතුරින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා කොපමණ ප්‍රමාණයක් සුදුසුකම් ලබා තිබේද?

03. මෙම සිසුන් අතරින් රජයේ විශ්වවිද්‍යාල සඳහා බඳවා ගැනීමට නියමිත සිසුන් ප්‍රමාණය කොපමණද? එය පසුගිය වසරට වඩා කොපමණ වැඩිවීමක්ද?

04. මෙම වසරේ සිට නව පාඨමාලා කොපමණ ප්‍රමාණයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නේද?

05. මෙම සිසුන්ගේ අධ්‍යයන කටයුතු කිනම් කාලයක ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු මංජුල සුගත් රත්නායක මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01.

| විෂය ධාරාව | මුහුණ දුන් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| ජීව විද්‍යාව | 56,355 |
| භෞතික විද්‍යාව | 37,364 |
| වාණිජ්‍ය | 59,749 |
| කලා | 91,706 |
| පොදු විෂය ධාරාව | 8,127 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 19,908 |
| ජෛව පද්ධති තාක්ෂණවේදය | 8,601 |
| **එකතුව** | 281,810 |

02.

| විෂය ධාරාව | විශ්වවිද්‍යාලවලට සුදුසුකම් ලැබූ ප්‍රමාණය |
|---|---|
| ජීව විද්‍යාව | 32,935 |
| භෞතික විද්‍යාව | 23,012 |
| වාණිජ්‍ය | 39,608 |
| කලා | 58,269 |
| පොදු විෂය ධාරාව | 4,199 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 12,472 |
| ජෛව පද්ධති තාක්ෂණවේදය | 6,043 |
| **එකතුව** | 176,538 |

03. 42,937කි.

මෙම වර්ෂයේදී ප්‍රථම උපාධි පාඨමාලාවන්ට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමකින් තොරව වඩාත් ඵලදායී හා ගුණාත්මක අධ්‍යාපනයක් පවත්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්හට පහසුකම් වැඩි කරමින් අදාළ පාඨමාලා විධිමත්ව පවත්වා ගැනීම අරමුණු කර ගනිමින් කටයුතු කරන අතර, පසුගිය වසරවල ප්‍රථම උපාධි පාඨමාලාවන්ට අදාළ ප්‍රවේශ සිසුන් සංඛ්‍යාවෙන්ම මේ වසරේදී ද පවත්වා ගන්නයි අදහස් කරන්නේ.

04. 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා නව පාඨමාලා 2ක් හඳුන්වා දීමට කටයුතු කරලා තිබෙනවා. පළමුවැනි එක, රුහුණ විශ්වවිද්‍යාලයේ භූගෝලීය තොරතුරු පද්ධති පාඨමාලාව. ඒකට ශිෂ්‍යයන් 50දෙනෙකු බඳවා ගන්න නියමිතයි. දෙවැනි එක, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික සහ බුද්ධිමය පද්ධති ඉංජිනේරු විද්‍යාව. ඒකට සිසුන් 50දෙනෙකු බඳවා ගන්න නියමිතයි.

05. 2025/2026 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල කඩඉම් ලකුණු නිකුත් කර සියලු ශිෂ්‍ය ලියාපදිංචි නාම ලේඛන 2026 අගෝස්තු 31වන විට විශ්වවිද්‍යාලවලට යවන්න කටයුතු කර තිබෙනවා. ඒ අනුව 2026 සැප්තැම්බර් මාසයේ පළමු සතියේ සිට එම පාඨමාලා ආරම්භ කිරීමේ දින ඒ ඒ විශ්වවිද්‍යාලවලට තීරණය කරන්න හැකි වෙනවා.

**ගරු මංජුල සුගත් රත්නායක මහතා**
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)
ස්තුතියි, ගරු අගමැතිතුමියනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් පාසල්වල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු කරගෙන යන බව අපි දන්නවා. ඊළඟ පියවර විධියට විශ්වවිද්‍යාවල, ඒ වාගේම අම්පාරේ පිහිටි හාඩි උසස් තාක්ෂණ ආයතනය වැනි උසස් අධ්‍යාපන ආයතනවල, ඊළඟට වෘත්තීය අධ්‍යාපන ආයතනවල මීට සමගාමීව ප්‍රතිසංස්කරණ ඇති කළ යුතු වෙනවා. එකී ප්‍රතිසංස්කරණ සඳහා රජය විසින් කටයුතු සලසා තිබෙනවාද? එසේ නම් ඒ කුමන කාල වකවානුවකදීද කියලා ඔබතුමියගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ පිළිබඳව ප්‍රතිපත්තියක් සහ framework එකක් සූදානම් කරන්න අපි කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුව මාස 6ක් විතර

තිස්සේ වැඩ කරමින් යනවා. ඔබතුමන්ලාත් දන්නා පරිදි, උසස් අධ්‍යාපනය කියන්නේ විශ්වවිද්‍යාලවලට සීමා වෙච්ච එකක් නොවෙයි. ඒක ඊට වඩා පුළුල් එකක්. එයට Higher National Diploma programmes යනාදි සියල්ල අයත් වෙනවා. වෘත්තීය ක්ෂේත්‍රයේත් උසස් අධ්‍යාපන අවශ්‍යතා තිබෙන නිසා මේ සියල්ලම නියෝජනය වන පරිදි අපි කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුව දැන් වැඩ ආරම්භ කර තිබෙනවා. ඒගොල්ලන් මුලින්ම කරන්නේ දැනට පවතින උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටලු හඳුනා ගැනීම සහ සාමාන්‍ය අධ්‍යාපනයට අදාළව කරන ප්‍රතිසංස්කරණවලට අනුගත වීම සඳහා විය යුතු වෙනස්කම් හඳුනා ගැනීමයි. මේ කියපු කමිටු වාර්තාව, ඒ නිර්දේශ සහ ඒකට අදාළ සාකච්ඡාවෙන් පසුව ඉදිරියේදී උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේත් විය යුතු වෙනස්කම් සිදු කිරීම සඳහා අපි සැලසුම් කරගෙන යනවා.

**ගරු මංජුල සුගත් රත්නායක මහතා**
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)
ගරු අගමැතිතුමියනි, මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමේ සිසුන් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. එකී වැඩි වීමත් එක්කම ඒ අයට පහසුකම් වැඩි කරන්නත් සිද්ධ වෙනවා. ඒ වාගේම ඊට ගැළපෙන පරිදි කාර්ය මණ්ඩලය වැඩි කරන්නත් සිද්ධ වෙනවා. මේ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් රජය විධියට ගෙන තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, අපි නිරීක්ෂණය කරපු දෙයක් තිබෙනවා. පසුගිය වසරවල බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවත් වැඩි කරලා තිබෙනවා; ඒ වාගේම විෂය ධාරාවන් offer කරන පාඨමාලාත් - coursesත් - වැඩි කරලා තිබෙනවා; අලුතින් විශ්වවිද්‍යාල පීඨ ද පිහිටුවා තිබෙනවා. නමුත් ඒවා කර තිබෙන්නේ ඒවා තුළ තිබිය යුතු පහසුකම්, කාර්ය මණ්ඩලය ආදිය ගැන සැලැස්මක් නැතිවයි. ඒ නිසා අප මේ වෙලාවේ කරන්නේ පවතින තත්ත්වය තුළ ඒවායේ ගුණාත්මකභාවය වැඩි කිරීම සහ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමයි. ඔබතුමා දන්නවා, විශ්වවිද්‍යාලවල උගන්වන කටයුතුවලට අමතරව පර්යේෂණ කටයුතු ද කළ යුතුයි කියලා. ඒ සඳහාත් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වෙනවා. මේ සියල්ල සලකා බලමින් මා අර කලින් සඳහන් කළ කමිටුව විසින්ම ඒ අවශ්‍යතාව ගැනත් සොයා බලනවා. අපි ඒ අනුව cadre review එකකට යන්න බලාපොරොත්තු වෙනවා. 2022 වර්ෂයෙන් පසුව පවතින පුරප්පාඩුවලට අදාළවවත් බඳවා ගැනීම් කරලා තිබුණේ නැහැ. විශ්වවිද්‍යාලවලින් ඉල්ලීම් කරන විධියට ඒ පුරප්පාඩු පිරවීමට අපි දැන් අවසර දීලා තිබෙනවා. දැන් ඒ පුරප්පාඩු පුරවා ගෙන යනවා. මට මතක හැටියට, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 3,000කට අධික ප්‍රමාණයකට පුරප්පාඩු පිරවීමට ගිය අවුරුද්දේ අවසර දීලා ඒ බඳවා ගැනීම් මේ වන විට කර තිබෙනවා. ඒ අනුවම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේත් පුරප්පාඩු ගිය අවුරුද්දේ සිට පුරවනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි,

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මරික්කාර් මන්ත්‍රීතුමා, ඔබතුමා දැනුයි ඇවිල්ලා ඉන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමියගෙන් ඇසීමට නියමිත ප්‍රශ්නය මම අහනවා.

පිරිපහදු නොකළ පොල්තෙල් ශ්‍රී ලංකාවට ගෙන්වා නැවත නිෂ්පාදනය කර වෙළෙඳ පොළට දැමීමේදී VAT සහ SSCL ගෙවිය යුතු අතර,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, නියමිත වෙලාවේදී මම ඔබතුමාගේ නම ප්‍රකාශයට පත් කළා. ඒ වෙලාවේ ඔබතුමා සභාවේ සිටියේ නැහැ නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
නමුත්, ඊළඟ වටයේදී ප්‍රශ්නය අහන්න මට අවස්ථාව දෙනවා නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අගමැතිතුමියගෙන් අහන ප්‍රශ්නවලදී අවස්ථාව දෙන්න පුළුවන්, ගරු කථානායකතුමනි. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අවස්ථාවේ තමයි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මරික්කාර් මන්ත්‍රීතුමා, ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
පිරිපහදු නොකළ පොල්තෙල් ශ්‍රී ලංකාවට ගෙන්වා නැවත නිෂ්පාදනය කර වෙළෙඳ පොළට දැමීමේදී VAT සහ SSCL ගෙවිය යුතු අතර, පසුගිය කාල වකවානුව තුළ එලෙස නොගෙවීම සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වන බව ගරු අග්‍රාමාත්‍යතුමිය 2025 පෙබරවාරි මස 05වන දින ප්‍රකාශ කර සිටි බැවින්, පහත ප්‍රශ්නවලට ඔබතුමියගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙමි.

01. දැනට මේ පිළිබඳව විමර්ශනයක් කර තිබේද?
02. පිරිපහදු නොකළ පොල්තෙල් ගෙන්වා නැවත නිෂ්පාදනය කර වෙළෙඳ පොළට දැමීමේදී VAT සහ SSCL, බදු නොගෙවා ඇති ආයතන සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?
03. 2024 ජනවාරි 01වන දිනෙන් පසුව ලංකාවට ආනයනය කරනු ලැබූ පිරිපහදු නොකළ පොල්තෙල් සඳහා මෙම බදු මුදල් අදාළ ආයතන මඟින් අය කරගෙන තිබේද?
04. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මේ වන විට මේ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?
05. මෙමඟින් රජයට සිදුව ඇති අලාභය සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ගරු අගමැතිතුමියනි, පොල්තෙල් කිලෝ මිලියන 63ක් ඇවිල්ලා තිබෙනවා. කිලෝවකට රුපියල් 120 ගණනේ බදු අය කර ගන්න ඕනෑ. මීට අවුරුද්දකට කලින් ඔබතුමිය පොරොන්දු වුණා, ඒ බදු මුදල් අය කර ගන්නවා කියලා. නමුත් තවම බඩු එනවා. ඒවා refine කරන්නේ නැතුව විකුණුවා නම් ජනතාවට කවන්නේ වස. Refine කරලා විකුණුවා නම් මේ බදු මුදල ගෙවන්න ඕනෑ. ඔබතුමිය කිව්වා, Inland Revenue Department එකට බදු අය කර ගන්නවා කියලා. වසන්ත සමරසිංහ ඇමතිතුමාත් ගිය අවුරුද්දේ මේ පාර්ලිමේන්තුවේදී පිළිගත්තා, ජනවාරි මාසයේ එම මුදල අය කර ගන්නවා කියලා. මම ගරු අනිල් ජයන්ත ඇමතිතුමාටත් ප්‍රශ්නයක් යොමු කළා. එතුමාත් කිව්වා, ඒ බදු මුදල් අය කර ගන්නවා කියලා. නමුත්, ඒ මුදල් අයවෙලා නැහැ. ඒ තුළින් දළ වශයෙන් රුපියල් බිලියන 8කට වැඩි ආදායමක් අහිමි වෙලා තිබෙනවා. රුපියල් මිලියන 8,000ක් අය කර ගන්නේ නැතුව ඒ ව්‍යාපාරිකයන්ට ඒ සහන ලබා දෙන්නේ කවර පදනමකින්ද? හිටපු ජනාධිපතිවරයාගෙන් මේකට VAT exemptions ඉල්ලා තිබුණා. නමුත් Inland Revenue Department එක දෙන්න බැහැ කිව්වා. ඔබතුමන්ලාගේ රජය ආවාට පස්සේත් මේ ජාවාරම දිගින් දිගටම කරගෙන යනවා. මේ අවුරුද්දේ මාර්තු 31වැනි දා විතර වෙනකොට කිලෝ මිලියන 63ක් ගෙනැත් තිබෙනවා. ඒකෙන් දළ වශයෙන් බිලියන අටක විතර ආදායමක් අහිමි වෙනවා. ඉතින්, අවුරුද්දක් ගිහිල්ලාත් ඔබතුමන්ලාගේ රජය පොරොන්දු වෙච්ච පරිදි මේ මුදල් අය කරගන්න බැහැ කිව්වාම සැකයක් මතු වෙනවා. ඒ නිසා පැහැදිලි පිළිතුරක් මේ සභාවට ලබා දෙන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

01. 2022, 2023, 2024 සහ 2025 වර්ෂ තුළදී පිරිපහදු නොකරන ලද පොල්තෙල් ආනයනයකරන ලද සමාගම් පිළිබඳ තොරතුරු රේගු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා සිටි අතර, සමාගම් 07ක් පරිපහදු නොකරන ලද පොල්තෙල් එකී වර්ෂ තුළදී ආනයනය කරන ලද බවට වන තොරතුරු ලබා දෙන ලදී. ඒ අනුව පරීක්ෂා කිරීමේදී 2024.01.01 දිනෙන් පසු පිරිපහදු නොකරන ලද පොල්තෙල් ආනයනය කරන ලද සමාගම් 06ක් හඳුනා ගන්නට යෙදුණි. එකී සමාගම් පිළිබඳව විමර්ශන කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත.

    එමෙන්ම විමර්ශන කටයුතු කඩිනමින් සිදුකර, අයකර ගත යුතු බද්දක් තිබේ නම් ඒ සඳහා තක්සේරු දැන්වීම් නිකුත් කර අදාළ බදු අයකර ගැනීමට කටයුතු කර ඒ පිළිබඳව වාර්තාවක් ලබා දෙන ලෙසට අදාළ අංශ දැනුවත් කර ඇත.

02. විමර්ශන කටයුතු අනුව එක් සමාගමක් සඳහා තක්සේරු දැන්වීම් නිකුත් කර ඇති අතර, එම සියලු තක්සේරු දැන්වීම් සඳහා අදාළ සමාගම අභියාචනා ඉදිරිපත් කර ඇත. එකී අභියාචනා දැනට විභාග වෙමින් පවතින අතර, අනෙකුත් සමාගම් සම්බන්ධ විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරමින් පවතී.

03. එක් සමාගමක් සඳහා තක්සේරු දැන්වීම් නිකුත් කර ඇති අතර, එකී සියලු තක්සේරු දැන්වීම් සම්බන්ධයෙන් ලද අභියාචනා සම්බන්ධ කටයුතු අවසන් වූ පසුව එහි තීරණය අනුව අතිරේක බදු අය කිරීමට කටයුතු ආරම්භ කරනු ලැබේ. අනෙකුත් සමාගම් සම්බන්ධ විමර්ශන කටයුතු නිම වූ පසු අතිරේක බදු පැන නඟින්නේ නම්, අය කිරීමට කටයුතු කරනු ලැබේ.

04. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා වූ යෝජනා අනුව එතෙක් පැවති VAT බදු නිදහස් කිරීම් ගණනාවක් 2024.01.01 දින සිට ඉවත් කරන ලදී. ඒ අනුව, දේශීයව පොල්තෙල් නිෂ්පාදනය කර සැපයීම සඳහා වූ VAT බදු නිදහස් කිරීම ද ඉවත් කරන ලදී. නමුත් පොල්තෙල්, පිරිපහදු කළ හා නොකළ යන දෙයාකාරයෙන්ම මෙරටට ආනයනය කිරීමේදී ඒ සඳහා සංයුක්ත බද්දක් වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද - SCL - අය කෙරුණු බැවින් ආනයන අවස්ථාවේදී ඒ සඳහා VAT බදු අය නොකරන ලදී. එසේ වෙතත් පිරිපහදු නොකළ පොල්තෙල් ආනයනය කර දේශීයව පිරිපහදු කර වෙළෙඳ පොළට නිකුත් කිරීම VAT බද්දට යටත් වන නිෂ්පාදන කාර්යයක් ලෙස සැලකෙන්නේ ද යන්න පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් විමසන ලදුව ඒ සඳහා වන නීතිමය තත්ත්වය පිළිබඳව තහවුරු කර ගැනීමට මෙම දෙපාර්තමේන්තුව විසින් ගරු නීතිපතිතුමාගේ උපදෙස් පතා ලිපියක් යොමු කරන ලදී. එහිදී ගරු නීතිපතිතුමන් විසින් ලබා දුන් නිරීක්ෂණ සහ උපදෙස් අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2025.07.01 දිනැති අංක FP/R/01/01/20/Gen-2025 දරන ලිපිය මඟින් කරුණු වාර්තා කර ඇත.

05. තක්සේරු දැන්වීම් නිකුත් කරන ලද ගොනුව හැර අනෙකුත් ගොනු සම්බන්ධව දැනට සිදු කරනු ලබන විමර්ශන කටයුතු අවසන් වූ පසුව නොගෙවන ලද බද්දක් ඇති බවට අනාවරණය වන්නේ නම් ඒ සඳහා ද තක්සේරු දැන්වීම් නිකුත් කර අදාළ බදු අය කිරීමට කටයුතු කරනු ලැබේ.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -885/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

## ලග්ගල බස් නැවතුම්පොළ: පහසුකම්
### லக்கல பேருந்துத் தரிப்பிடம்: வசதிகள்
### LAGGALA BUS STATION: FACILITIES

1033/2025

**2. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලග්ගල බස් නැවතුම්පොළ පිහිටුවන ලද දිනය කවරේද;

(ii) එම බස් නැවතුම්පොළ ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එහි ප්‍රමාණවත් පහසුකම් නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) லக்கல பேருந்துத் தரிப்பிடம் நிர்மாணிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி பேருந்துத் தரிப்பிடத்தை நிர்மாணிப்பதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) அங்கு போதியளவு வசதிகள் இல்லாததை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the date on which the Laggala bus station was established;

(ii) the amount of money that was spent on the construction of the said bus station;

(iii) whether he is aware that there are no adequate facilities in the bus station concerned; and

(iv) if so, what measures will be taken in this regard?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2019.01.08 දින.

(ii) රුපියල් 45,105,110.55

(iii) ඔව්.

(iv) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයිතිය සතු වූ මොරගහකන්ද වාරි ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ලග්ගල බස් නැවතුම්පළ මධ්‍යම පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ එකඟතාව මත ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, එම පවරා ගැනීමෙන් අනතුරුව එහි අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීමට නියමිතව ඇත.

එසේම ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් අඛණ්ඩව බවුසර් මගින් බස් නැවතුම්පොළේ අවශ්‍යතා සඳහා ජලය සැපයීමටත්, සනීපාරක්ෂක පහසුකම් පවත්වාගෙන යැමටත් කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මට අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවා. ඔබතුමාට උත්තර දෙන්න පුළුවන් නේ.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මහවැලි අධිකාරිය මේ ඉඩම තියාගෙන ඉන්න නිසා ප්‍රදේශයේ ජනතාවට සෑහෙන ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේ ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා දෙන දවස කවදාද? දැන් මේ ඉඩම ඉල්ලනවා, ඉල්ලනවා. නමුත් මහවැලියෙන් ඒක නිදහස් කරන්නේ නැහැ, පළාත් පාලන අමාත්‍යාංශයට.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මම කලින් සඳහන් කළා මේ ගැන කටයුතු කරමින් පවතිනවා කියලා. මට ස්ථිර දිනයක් කියන්න බැහැ, ගරු මන්ත්‍රීතුමියනි. මේක මම පළාත් පාලන ඇමතිවරයාගේ අවධානයට යොමු කරන්නම්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය එන්නේ එතැනින් තමයි, ගරු ඇමතිතුමා. දැන් ඒ වැසිකිළි පද්ධතිය කඩා වැටිලා තිබෙනවා; ඔක්කොම වතුර leak වෙනවා. කානු ටික සුද්ද කරන්න විධියක් නැහැ. ඒවාට ප්‍රතිපාදන වෙන් කරගන්න විධියක් නැහැ. විදුලි බල්බ ටික සවි කරගන්න විධියක් නැහැ. පුටු ටික කැඩිලා ගිහින් තිබෙනවා. ජනතාවට - මගීන්ට - එතැනට ඇවිල්ලා වාඩිවෙන්න විධියක් නැහැ. දැන් මේ ප්‍රශ්නය නිසා පළාත් පාලන අමාත්‍යාංශයෙන් වෙන් කරන මුදලක් මේ බස් නැවතුම්පොළට පාවිච්චි කරන්න විධියක් නැතිව තිබෙනවා.

විෂය භාර ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් උත්තර දෙයි. මම ඔබතුමාට යෝජනාවක් කරනවා, ගරු ඇමතිතුමනි. මේ වැඩේ කඩිනම් කරන්න. මොකද, ප්‍රදේශයේ ජනතාව තමයි අපහසුතාවට පත් වෙන්නේ. මේ පද්ධතිය දිගින් දිගටම විනාශ වෙලා ගියොත් නැවත වතාවක් ප්‍රතිසංස්කරණය කරන්න මීට වඩා වැඩි මුදලක් වියදම් කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා ප්‍රශ්නයකට වඩා මේක යෝජනාවක් සහ ඉල්ලීමක්. පළාත් පාලන අමාත්‍යාංශය වෙත මේ භූමිය පවරාදීමේ කටයුත්ත කඩිනම් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. එහෙම නැති වුණොත්, පළාත් පාලන අමාත්‍යාංශයෙන් වෙන් කරන ප්‍රතිපාදන මේ සඳහා යොදවන්න හැකියාවක් නැතිව යනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, 2019 ජනවාරි 8වැනි දා තමයි මෙය විවෘත කර තිබෙන්නේ. එතැන් සිට මේ කාලය ගතවෙලා තිබෙන බව අපට පෙනෙනවා. අපි ඒ ගැන සොයා බලා කටයුතු කරන්නම්.

## ආර්ථික මධ්‍යස්ථාන ඒකාබද්ධ කර පිහිටුවන ලද සමාගම: විස්තර

பொருளாதார மத்திய நிலையங்களை ஒருங்கிணைத்து தாபிக்கப்பட்ட நிறுவனம்: விபரம்

COMPANY ESTABLISHED AMALGAMATING ECONOMIC CENTRES: DETAILS

1247/2025

3. **ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සියලුම ආර්ථික මධ්‍යස්ථාන ඒකාබද්ධ කර පෞද්ගලික සමාගමක් ස්ථාපිත කිරීමට සූදානමක් තිබේද;

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

(ii) එසේ නම්, එම සමාගම ස්ථාපිත කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම සමාගමේ ව්‍යුහය කවරේද;

(iv) එම සමාගම ස්ථාපිත කිරීමෙන් ලැබෙන වාසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள அனைத்துப் பொருளாதார மத்திய நிலையங்களையும் ஒருங்கிணைத்து தனியார் நிறுவனமொன்றைத் தாபிப்பதற்கான ஆயத்தம் உள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனில், அந்த நிறுவனம் தாபிக்கப்படும் முறையியல் யாது என்பதையும்;

(iii) அந்த நிறுவனத்தின் கட்டமைப்பு யாது என்பதையும்;

(iv) அந்த நிறுவனத்தைத் தாபிப்பதால் கிடைக்கப் பெறும் நன்மைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether there is a plan to amalgamate all economic centres in Sri Lanka and establish a private company;

(ii) if so, what methodology will be adopted for establishing such a company;

(iii) the structure of that company; and

(iv) the advantages of establishing such a company?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) සියලුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ඒකාබද්ධ කොට භාණ්ඩාගාර ලේකම්ට පූර්ණ කොටස් අයිතිය හිමි රාජ්‍ය සමාගමක් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2025.10.09 දින National Agri-Marketing Services Limited නමින් සමාගමක් ස්ථාපිත කර ඇත.

(iii) එම රාජ්‍ය සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ. එනම්,

- මූල්‍ය හා ආර්ථික විද්‍යාව පිළිබඳ විෂය දැනුමක් සහිත මහා භාණ්ඩාගාරයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
- වෙළෙඳ, වාණිජ හා ආර්ථික විද්‍යාව පිළිබඳ විෂය දැනුමක් සහිත වෙළෙඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
- කෘෂිකර්මය සහ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ විෂය දැනුමක් සහිත කෘෂිකර්ම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
- ප්‍රාදේශීය සංවර්ධනය සහ පළාත් පාලනය පිළිබඳ විෂය දැනුමක් සහිත ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
- කෘෂිකර්මය, අලෙවිකරණය, ව්‍යාපාර අධ්‍යයනය, නීතිය සහ මූල්‍ය පිළිබඳ විෂය දැනුමක් සහිත ගරු වෙළෙඳ විෂය භාර ඇමතිතුමා විසින් නම් කරන සාමාජිකයන් පස් දෙනෙකු

මෙම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පත් කිරීම සිදු කරනු ලබන්නේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ නිර්දේශ මත මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වේ.

මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල කාලය ඔවුන් පත් වූ දින සිට වසර 05ක උපරිම කාලයක් වේ.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 12 වගන්තිය අනුව සෑම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයක් සඳහාම පාලන කමිටුවක් - Governance Committee එකක් - ස්ථාපිත කළ යුතුය. එම කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

- දිස්ත්‍රික් ලේකම් කමිටුවේ සභාපති
- ප්‍රාදේශීය ලේකම් කමිටුවේ ලේකම්
- පොලිස් අධිකාරී කමිටු සාමාජික
- නගර සභාවේ කොමසාරිස් / ප්‍රාදේශීය සභාවේ ලේකම් කමිටු සාමාජික
- ගොවිජන සේවා කොමසාරිස් කමිටු සාමාජික
- දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කමිටු සාමාජික
- මහවැලි කොට්ඨාසයන්හි නේවාසික කළමනාකරු කමිටු සාමාජික
- ආර්ථික මධ්‍යස්ථාන වෙළෙඳ සංගමයේ සාමාජිකයන් දෙදෙනෙකු කමිටු සාමාජික
- ගොවි සංවිධානවල නියෝජිතයන් දෙදෙනෙකු කමිටු සාමාජික
- ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකරු කමිටු සාමාජික
- ගරු අමාත්‍යතුමාගේ නියෝජිතයන් දෙදෙනෙකු කමිටු සාමාජික

මෙම කමිටුව විසින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල මෙහෙයුම්, පරිපාලන සහ සංවර්ධන කටයුතු සිදු කරන අතර, එම කමිටුව විසින් කමිටු රැස්වීම්වල ගන්නා තීරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ක්‍රියාත්මක කරනු ලැබේ.

(iv) මෙම සමාගම ස්ථාපිත කිරීම තුළින් පහත සඳහන් වාසි ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබයි.

ගොවීන්, වෙළෙන්දන් සහ පාරිභෝගිකයන්ගේ සුබසාධනය වැඩි දියුණු කිරීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ස්ථාවර වෙළෙඳ පොළ පද්ධතියක් ස්ථාපනය කිරීම.

- කෘෂිකාර්මික නිෂ්පාදන මිලදී ගැනීම, ගබඩා කිරීම, විකිණීම සහ බෙදා හැරීම - ඇසුරුම් කිරීම ඇතුළුව - පහසු කිරීම සඳහා අවශ්‍ය වෙළෙඳ පොළ ස්ථාන හෝ යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍යතා දිගු කාලීන කුලී හෝ බදු පදනම මත ලබා ගැනීම.
- ලිඛිත ගිවිසුම් මත ගොවීන්, නිෂ්පාදකයන් හෝ තොග සහ සිල්ලර වෙළෙන්දන්ට වෙළෙඳ සැල් හෝ ගබඩා පහසුකම් කුලියට හෝ බදු දීම.
- පරිසර ආරක්ෂාව, ජල හා විදුලි කළමනාකරණය, ප්‍රවාහන සැලසුම්, කම්කරු නීති, ආරක්ෂාව ආදී සම්බන්ධ සියලු අදාළ නීති, නියමයන් ලිඛිත උපදෙස්වලට අනුකූලව වීම සහතික කිරීම.
- සෑම වෙළෙඳ පොළක් තුළම අදාළ නීති හා නියමයන්ට අනුව, උපයෝගිතා සේවා සැපයුම්කරුවන් සමඟ පොදු සේවා පහසුකම් ලබා ගත හැකි බව සහතික කිරීම.
- සමාගමේ සෑම වෙළෙඳ පොළක් තුළම තොග හා සිල්ලර වෙළෙඳ මිල ගණන් ලබා ගත හැකි කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රමාණ පිළිබඳ දත්ත, තොරතුරු ඇතුළත් පද්ධතියක් ස්ථාපනය කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, අපි දන්නවා, අපේ රටේ ආර්ථික මධ්‍යස්ථාන 17කට ආසන්න ප්‍රමාණයක් තිබෙන බව. මේ ආර්ථික මධ්‍යස්ථානවලට සම්බන්ධ වෙන ගොවි ජනතාවත්, වෙළෙඳ මහත්ම මහත්මීනුත් බොහෝ අවස්ථාවල අපහසුතාවලට පත් වෙනවා, මේ ආර්ථික මධ්‍යස්ථානවල තිබෙන පොදු පහසුකම් සම්බන්ධයෙන්. මෙම ආර්ථික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මේ වෙනකොට අමාත්‍යාංශය විධියට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නවලට දුන් පිළිතුරු තුළත් එම පහසුකම් සම්බන්ධයෙන් අපි යම් කරුණු ප්‍රමාණයක් සඳහන් කළා. මම මුලින්ම මේ කාරණය පිළිබඳව පැහැදිලි කරන්නට ඕනෑ, ගරු කථානායකතුමනි. විවිධ අධිකාරීත්වයන් සහ අයිතිකාරීත්වයන් යටතේ තමයි මේ ආර්ථික මධ්‍යස්ථාන තිබෙන්නේ. දැන් අපි ඒවා එකක් යටතට ගෙනැල්ලා තිබෙනවා. සමහර ඉඩම් මහවැලියේ, සමහර ඉඩම් CGR එකේ, සමහර ඉඩම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, සමහර ඉඩම් දිස්ත්‍රික් ලේකම් යටතේ ආදී වශයෙන් විවිධාකාර විධියට තිබෙනවා. සමුපකාරය යටතේ තිබෙන ඉඩමකුත් කොළඹ තිබෙනවා. මේ සියල්ල එක තැනකට ගෙනැල්ලා පහසුකම් සංවර්ධනය කිරීමට අවශ්‍ය පොදු නීති රාමුවක් සහ පිළිවෙත් වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබෙනවා. ඒ අනුව තමයි මේ කටයුතු කෙරෙන්නේ. මේක පෞද්ගලික සමාගමක් කරන්න හදනවා කියලා විපක්ෂයෙන් ඝෝෂාවක් නඟන්න හැදුවා. දැන් ඒක අසත්‍යයක් වෙලා තිබෙනවා. මේක සම්පූර්ණයෙන්ම රාජ්‍ය සමාගමක් විධියට ස්ථාපිත කරලා රජයේ මැදිහත්වීම සහිතව ගොවියාගේ අස්වැන්න වෙළෙඳ පොළට ගෙනාවාට පස්සේ ඒවා පාරිභෝගිකයා දක්වා ගෙනයාමේදී ලබා දිය යුතු සේවා සහ පහසුකම් - ඇසුරුම් ඇතුළු - ලබා දෙමින්, නිෂ්පාදනයේ හානිය අවම කරමින්, පසු අස්වනු හානිය අවම කරමින් වෙළෙඳ පොළ තුළ මිල ස්ථාවරත්වයක් ඇති කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමයි අපේ බලාපොරොත්තුව.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි.

අපේ රටේ දෙකෝටි විසි ලක්ෂයක් පමණ වන ජනතාවට ආහාර නිෂ්පාදනය කරන ගොවි ජනතාව, වී ටික නිෂ්පාදනය කරනවා වාගේම එළවලු සහ අතිරේක භෝග නිෂ්පාදනයත් කරනවා. මේ වන විට මධ්‍යම කඳුකරයේ, විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව වගා කරපු අල ගලවන්න පටන්ගෙන තිබෙනවා. සමහර තැන්වල මිලෙහි යම් ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, අල ගොවීන්ට යම් සාධාරණ මිලක් ලබා දීම සඳහා අල මිලදී ගැනීමට යම් යන්ත්‍රණයක් ස්ථාපිත කරලා තිබෙනවාද, ඒ කොහොමද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එම ප්‍රශ්නය ඇසීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ගරු කථානායකතුමනි, ගරු සුසන්ත නවරත්න මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය යොමු කරද්දීත්, නුවරඑළිය නියෝජනය කරන අපේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුත් අද උදේ මේ පිළිබඳව සාකච්ඡා කළා. ජනාධිපතිතුමා පසුගිය අය වැයේදීත් මේ යෝජනාව කළා. අපේ රටේ අල අස්වැන්න ලැබෙන්න පටන් ගන්නේ මාර්තු මාසයෙන් පස්සේයි. අපේ රටේ අල අස්වැන්න අඛණ්ඩව මාස 9ක් ලැබෙනවා. ඒ අල අස්වැන්න වැඩිපුරම ලැබෙන්නේ සැප්තැම්බර්, ඔක්තෝබර් වාගේ කාලවලදී. ඒ නිසා මේ වනකොට අල අස්වැන්නෙන් යම් ප්‍රමාණයක් ලැබෙමින් තිබෙනවා. ඒක නුවරඑළිය, බදුල්ල-බණ්ඩාරවෙල දෙපැත්තෙන්ම ලැබෙනවා. ඒ නිසා වෙළෙඳ පොළ තුළ මිල පහළ යෑමක් පිළිබඳව දැන් සාකච්ඡාවක් තිබෙනවා. නමුත්, ලංකා සතොස ආයතනය හරහා අපි අල මිලදී ගන්නවා, රුපියල් 235ක වාගේ මුදලකට. ඒ, දේශීය අල. අපි ආනයනික අල සඳහා රුපියල් 80ක බද්දක් පනවලා තිබෙන්නේ. ඒ බද්ද දැනුත් තිබෙනවා.

වෙළෙඳ අමාත්‍යාංශය හැටියට අපි කෘෂිකර්ම අමාත්‍යාංශය, සමුපකාර තොග වෙළඳ සංස්ථාව, ලංකා සතොස කියන ආයතන ඒකාබද්ධව අද දවසේත් සාකච්ඡාවක් පවත්වන්න සූදානම් කර තිබෙනවා. ඒ, අල මිලදී ගැනීමේ ක්‍රියාවලිය තීරණය කරන්න. එහිදී නිශ්චිත මිලක් ගොවියාට ලබා දීමේ - මිලක් තීරණය කිරීමේ - ක්‍රියාවලියට අපි යනවා. ගරු මන්ත්‍රීතුමන්ලාත් ඒ පිළිබඳව අදහස් යොමු කළා. විශේෂයෙන් නිෂ්පාදන පිරිවැයත්, වෙළෙඳ පොළේ තිබෙන මිලත්, ආනයනික අලවල මිලත් මේකට බලපානවා. නමුත්, දේශීය ගොවියා ගොවිතැනට උනන්දු කිරීම වෙනුවෙන්, ඔහුගේ අලවලට සාධාරණ මිලක් ලබා දීම වෙනුවෙන් තීරණයක් ගන්න අද හවස ඒ කමිටුව රැස්වනවා. ලංකා සතොස ආයතනය, සමුපකාර තොග වෙළඳ සංස්ථාව හා ලංකාවේ පෞද්ගලික අංශයේ වෙළඳ ජාලා එක්කත් මේ පිළිබඳව අපි සාකච්ඡා කර තිබෙනවා. ඒගොල්ලන් සමඟ local purchasingවලදී - දේශීය අල අපි එකඟ වන මිලට මිලදී ගැනීම සඳහා - එකඟතාවක්

[ගරු වසන්ත සමරසිංහ මහතා]

හඳාගන්න අපි සූදානම් වනවා. දවසකට අල මෙට්‍රික් ටොන් සියයකට වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීම වෙනුවෙන් සැලැස්මක් හදන්න තමයි අපි කටයුතු කරමින් යන්නේ. ඒ හරහා ගොවියාගේ ප්‍රශ්නයට යම් උත්තරයක් ලබා දෙන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

## මහනුවර දිස්ත්‍රික්කයේ උඩගම ග්‍රාමය: පානීය ජල ගැටලුව
## கண்டி மாவட்டத்திலுள்ள உடகம கிராமம்: குடிநீர்ப் பிரச்சினை
## UDAGAMA VILLAGE IN KANDY DISTRICT: DRINKING WATER PROBLEM

1374/2025

**4. ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම ග්‍රාමයේ ජීවත් වන ජනතාව මේ වන විට උග්‍ර පානීය ජල ගැටලුවකට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தின், உடகம கிராமத்தில் வசிக்கும் மக்கள் தற்போது பாரிய குடிநீர்ப் பிரச்சினைக்கு முகம்கொடுத்துள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி குடிநீர்ப் பிரச்சினையைத் தீர்ப்பதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether he is aware that the residents in Udagama Village in the Kandy District are currently experiencing a serious drinking water issue; and

(ii) if so, the measures that will be taken to solve the said drinking water issue?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අසා තිබෙන ප්‍රශ්නයේ යම් අපැහැදිලිතාවක් තිබෙනවා. ඔබතුමිය අසා තිබෙන්නේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩගම කියන ග්‍රාමය සම්බන්ධයෙන්. නමුත්, අමාත්‍යාංශය වාර්තා කරනවා, උඩගම කියලා ප්‍රදේශ ගණනාවක් මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙනවා කියලා. උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් උඩගමක් තිබෙනවා; ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් උඩගමක් තිබෙනවා; උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් උඩගමක් තිබෙනවා. ඔබතුමිය ප්‍රශ්නයෙන් අහන්නේ කුමන උඩගම ප්‍රදේශය පිළිබඳවද කියලා අවිනිශ්චිතයි. නමුත් අපි අනුමාන කරලා උත්තරයක් හදලා තිබෙනවා. සමහර විට ඒක නොගැළපෙන්නත් ඉඩ තිබෙනවා.

ගරු කථානායකතුමනි, කෙසේ නමුත් එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම පැනය මඟින් ඉදිරිපත් කර ඇති උඩගම නැමැති ග්‍රාමය මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උඩගම ග්‍රාමය ලෙස අනුමාන කරන අතර, එම ග්‍රාමයෙහි කොටසකට අපගේ අම්පිටිය ජල සම්පාදන ක්‍රමය මඟින් ජල සැපයුම කරනු ලබයි. වියළි කාලගුණ තත්ත්ව යටතේ උස් බිම් සඳහා අඩු ජල සැපයුමක්ද, අනෙකුත් ප්‍රදේශ සඳහා නිසි ජල සැපයුමක්ද කරනු ලබයි. අපගේ අම්පිටිය ජල සම්පාදන ක්‍රමය මඟින් ආවරණය නොවන කොටසක්ද මෙම ග්‍රාමය තුළ පවතී.

(ii) මෙම පැනයෙන් අපේක්ෂිත ප්‍රදේශය උඩගම ග්‍රාමයේ කොටසක්ද යන බව තහවුරු කර ගැනීමෙන් පසුව තාක්ෂණික යෝග්‍යතාව පරීක්ෂා කර බලා නව ජල සැපයුම් ක්‍රමයක් මඟින් ආවරණය කළ හැකිද යන්න ශක්‍යතා අධ්‍යයනයකින් පසු තීරණය කළ හැකි ය.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ, බලගොල්ල ප්‍රදේශයේ ජනතාවට ගිය මාසයේදී දැඩි ජල අර්බුදයකට මුහුණපෑමට සිදු වුණා. විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 32ක ජීවත් වන පාරිභෝගිකයින් 17,000කට ආසන්න සංඛ්‍යාවකට අඩුම තරමේ පානීය ජලයවත් නැති වන තත්ත්වයක් ඇති වුණා. මොකද, අපේ රටේ ඇති වුණු ඒ ගල් අඟුරු අර්බුදය නිසා වික්ටෝරියා ජලාශයෙන් අවශ්‍ය ප්‍රමාණයට වැඩිය ජලය මුදා හැරීම නිසා තමයි සති තුනකට ආසන්න කාලයකට ඒ ප්‍රදේශයට මේ අර්බුදයට මුහුණපෑමට සිදු වුණේ. ගරු කථානායකතුමනි, බලගොල්ල කියන්නේ සංවේදී ප්‍රදේශයක්. විශේෂයෙන්ම පළාත් සභාව, හමුදා කඳවුරු සහ කර්මාන්ත උද්‍යානයක් ද මේ ප්‍රදේශයේ තිබෙනවා.

2023දී, ඒ කියන්නේ පසුගිය ආණ්ඩුව සමයේදී මේ බලගොල්ල ප්‍රදේශයේ තිබෙන පොම්පාගාරයේ ගැටලු නිසා, විශේෂයෙන්ම තුළුමුවේ තිබෙන ක්‍රියාකාරිත්වයේ ගැටලු නිසා, ඒ

පොම්පාගාරය හාරගම ප්‍රදේශයට ගෙන යෑමට යෝජනාවක් තිබුණා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ පොම්පාගාරය හාරගමට ගෙන යෑමේ ක්‍රියාවලිය කවදා අවසන් කරන්න පුළුවන් වෙයිද කියලා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අතුරු ප්‍රශ්නය අහන්න කලින් පැහැදිලි කරපු කරුණු වැරැදියි. ගල් අඟුරු ප්‍රශ්නයක් නිසා එතැන වතුර ප්‍රශ්නයක් ආවා නොවෙයි. ඔබතුමිය විස්තර කියනවා නම් කරුණු සහිතව ඒ ගැන විස්තර කියන්න කියලා මම ඉල්ලන්න කැමැතියි. එතැන ප්‍රශ්නය වුණේ මේකයි. "දිට්වා" සුළි කුණාටුව නිසා මඩ ගහගෙන ඇවිල්ලා ඒ වතුර ගන්න තැන - water intake එකේ - ප්‍රශ්නයක් තිබුණා. ඒ වාගේම එතැන කැඩිලා බිඳිලා ගිහිල්ලා තිබුණා. විශේෂයෙන්ම මඩ ගහගෙන ආපු නිසා තමයි, එතැන ප්‍රශ්නයක් තිබෙන්නේ. ඒ නිසා තමයි අපට ඇත්තටම ඒක මාරු කරන්න සිද්ධ වෙන්නේ. දීර්ඝ කාලීනව දේශගුණික විපර්යාස සිදු වෙනවා. ඒවාට ඔරොත්තු දීම සඳහා තමයි අපි water intake එක මාරු කරන්නේ. ඒ සඳහා තාවකාලිකව අපි line එකකුත් දැම්මා. අපි දැන් ඒ කටයුතු කරගෙන යනවා. නිශ්චිත කාලයක් කියන්න බැහැ. දැනට තාවකාලිකව ඒ ප්‍රශ්නය විසඳලා තිබෙනවා. අපි හැකි ඉක්මනින් ඒ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරනවා කියලා ඔබතුමියට මම කියන්න කැමැතියි.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, "දිට්වා" සුළි කුණාටුව ආවේ පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේදී නේ. මේ වතුර ප්‍රශ්නය ඇති වුණේ මාර්තු මාසයේදී. ඉතින් මාස හතරකට පස්සේ, "දිට්වා" සුළි කුණාටුව නිසා මේ ප්‍රශ්නය ඇති වුණා කියලා මම හිතන්නේ නැහැ.

කෙසේ වෙතත් ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මහනුවර පාතහේවාහැට, දෙල්තොට, ගලහ යන ප්‍රදේශවල ජනතාව විශාල ජල ගැටලුවකට මුහුණ පානවා. සමහර ප්‍රදේශවල ජනතාවට, විශේෂයෙන්ම කොලබිස්ස ප්‍රදේශය ගත්තොත්, එම ප්‍රදේශයේ ජනතාවට අඩුම තරමින් කිලෝමීටර දෙකක් පමණ දුර ගිහින් තමයි ජලය ලබා ගැනීමට සිදු වෙලා තිබෙන්නේ. ඒ අයට සතියට දෙවතාවක් විතර කිලෝමීටර දෙකක් පමණ දුර ගිහින් ජලය ලබා ගැනීමට සිදු වෙනවා. ඒ වාගේම මොරගොල්ල, අංකිලිපිටිය, පනන්වල ජල ව්‍යාපෘති අතරමඟ නැවතී තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැමැතියි, එම ජනතාවට මේ සම්බන්ධයෙන් නිසි පිළිතුරක් ලබා ගැනීමට හැකි වන්නේ කවදාද කියලා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, මහනුවර දිස්ත්‍රික්කය තුළ ජල ගැටලුවක් තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කය තුළ විතරක් නොවෙයි, බස්නාහිර පළාත - Western Region එක - තුළත්, ඒ වාගේම ගාලු දිස්ත්‍රික්කය තුළත් ජල ගැටලුවක් තිබෙන බව අපි දන්නවා. මූලික ගැටලුව වන්නේ, "Water for All" කියලා වැඩසටහන පටන් ගෙන ජල පිරිපහදු නිෂ්පාදන ධාරිතාව වැඩි කරන්නේ නැතුව හැම තැනටම connections දීලා තිබීම. එසේ නිෂ්පාදන ධාරිතාව වැඩි නොකිරීම නිසා එම ප්‍රදේශවලට ජලය ප්‍රමාණවත්ව ලැබෙන්නේ නැහැ. එම නිසා අපි ඉක්මනින් කළ යුතු වන්නේ ජල පිරිපහදු මධ්‍යස්ථාන ප්‍රමාණය වැඩි කරන එකයි. ඒ අනුව අපි දැනට මූලික වශයෙන් හඳුනා ගෙන තිබෙනවා, පිරිපහදු මධ්‍යස්ථාන ඉදි කරන්න ඕනෑ කොහේද කියලා. ඒ සඳහා සැලැස්මක් තිබෙනවා. අපි දැනටමත් සාකච්ඡා කර තිබෙනවා, ඊළඟ අවුරුද්දේ මහනුවර දිස්ත්‍රික්කය තුළ ජල පිරිපහදු මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා සහ ජල සැපයුම වැඩිදියුණු කිරීම සඳහා මුදල් යෙදවීම සම්බන්ධව. ඒ අනුව අපි මහනුවර දිස්ත්‍රික්කයේ ජල සම්පාදන කටයුතු විධිමත් කරන්න සහ ජල ගැටලුව විසඳන්න කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1763/2025- (1), ගරු ගරු ලාල් ප්‍රේමනාත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -885/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා 2025 අය වැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන: විස්තර
2025 வரவு செலவுத் திட்டத்தில் தேயிலைக் கைத்தொழிலின் அபிவிருத்திக்காக ஒதுக்கப்பட்ட நிதி: விபரம்
PROVISIONS MADE FROM BUDGET, 2025 FOR DEVELOPMENT OF TEA INDUSTRY: DETAILS

1763/2025

5. **ගරු මංජුල සුරවීර ආරච්චි මහතා (ගරු ලාල් ප්‍රේමනාත් මහතා වෙනුවට)**
(மாண்புமிகு மஞ்சுள சுரவீர ஆரச்சி - மாண்புமிகு லால் பிரேமநாத் சார்பாக)
(The Hon. Manjula Suraweera Arachchi on behalf of the Hon. Lal Premanath)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025 වර්ෂයේ අයවැය මඟින් තේ කර්මාන්තයේ සංවර්ධනය සහ නගා සිටුවීම සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

(ii) එම මුලු ප්‍රතිපාදනයෙන් එක් එක් පළාත අනුව වෙන් කරන ලද ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නුවරඑළිය, බදුල්ල, මාතලේ, රත්නපුර, ගාල්ල සහ මාතර යන එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිපාදන නව වගා සහ නැවත වගා කිරීම, කර්මාන්තශාලා නවීකරණය සහ තාක්ෂණික දියුණුව, පර්යේෂණ සහ තේ වගා ප්‍රවර්ධනය, අලෙවිකරණය සහ වෙළඳපොළ ප්‍රවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන්ට සහනාධාර දීම සහ වෙනත් අදාළ අංශ අනුව යොදා ගැනීමට සැලසුම් කරන ලද ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2026 වර්ෂයේ අයවැය මඟින් තේ කර්මාන්තය සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டின் வரவு செலவுத் திட்டத்தில் தேயிலைக் கைத்தொழிலின் அபிவிருத்திக்காகவும் முன்னேற்றத்துக்காகவும் ஒதுக்கப்பட்டிருந்த மொத்த நிதி எவ்வளவு என்பதையும்;

(ii) அந்த மொத்த நிதியில் மாகாண வாரியாக ஒதுக்கப்பட்டிருந்த தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) நுவரெலியா, பதுளை, மாத்தளை, இரத்தினபுரி, காலி, மாத்தறை ஆகிய ஒவ்வொரு மாவட்டத்துக்குமென ஒதுக்கப்பட்ட நிதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) புதிய பயிர்ச்செய்கை, மீள் பயிர்ச்செய்கை, தொழிற்சாலை நவீனமயப்படுத்தல் மற்றும் தொழில்நுட்ப விருத்தி, ஆராய்ச்சி மற்றும் தேயிலைச் செய்கை மேம்பாடு, சந்தைப்படுத்தல் மற்றும் சந்தை மேம்படுத்தல், சிறிய மற்றும் நடுத்தர செய்கையாளர்களுக்கு மானியம் வழங்குதல் அத்துடன் சம்பந்தப்பட்ட பிற துறைகளுக்கு ஏற்றவாறு மேற்படி நிதியில் பயன்படுத்தத் திட்டமிடப்பட்டுள்ள சதவீதம் ஆகியவை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2026ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத் திட்டத்தில் தேயிலைக் கைத்தொழிலுக்காக ஒதுக்கப்பட்டுள்ள மொத்த நிதி எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House the-

(i) total provision allocated by the Budget, 2025 for the development and improvement of the tea industry;

(ii) amounts allocated from the said provision to each province, separately;

(iii) amounts allocated for the Districts of Nuwara Eliya, Badulla, Matale, Ratnapura, Galle and Matara, separately; and

(iv) percentage of said provision to be allocated for new cultivation and re-cultivation, factory modernization and technological upgrading, research and promotion of tea cultivation, marketing and market promotion, provision of relief to small and medium-scale cultivators and other related sectors, separately?

(b) Will he also inform this House of the total provision allocated for the tea industry in the Budget, 2026?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2025 වර්ෂයේ අය වැය මඟින් තේ කර්මාන්තයේ සංවර්ධනය හා නඟා සිටුවීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 900කි. මෙයට අමතරව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආයතනික අරමුදල් ලෙස රුපියල් මිලියන 5,947.4ක මුදලක් වෙන් කරන ලදී.

ඒ අනුව, තේ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 6,847.4කි.

(ii) එම ප්‍රතිපාදන පළාත් අනුව පහත දැක්වේ.

| විශේෂ ව්‍යාපෘති/වැඩසටහන් | වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනය රු.මි. | මධ්‍යම | සබරගමුව | දකුණ | වයඹ | ඌව | බස්නාහිර |
|---|---|---|---|---|---|---|---|
| නව වගාව | 36.90 | 2.71 | 13.67 | 5.29 | - | 5.33 | 9.9 |
| නැවත වගා කිරීම | 454.633 | 55.1 | 154.943 | 173.1 | - | 37.28 | 34.21 |
| පාළු සිටුවීම | 225.70 | 43.25 | 61.75 | 60.88 | - | 35.75 | 24.08 |
| කර්මාන්තශාලා නවීකරණය | - | - | - | - | - | - | - |
| තාක්ෂණික දියුණුව | 5.11 | 0.672 | 0.655 | 0.564 | - | 0.282 | 2.937 |
| * පර්යේෂණ | 100.00 | - | - | - | - | - | - |
| තේ වගා ප්‍රවර්ධනය | - | - | - | - | - | - | - |
| අලෙවිකරණය සහ වෙළඳපොළ ප්‍රවර්ධනය | - | - | - | - | - | - | - |
| සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන්ට සහනාධාර දීම | - | - | - | - | - | - | - |
| අතුරු බෝග වගාව | - | - | - | - | - | - | - |
| ව්‍යාප්ති සේවා | 17.781 | 2.404 | 2.091 | 4.511 | - | 0.938 | 7.837 |
| වෙනත් | 59.88 | - | - | - | - | - | 59.88 |
| | 900 | 104.136 | 233.109 | 244.34 | - | 79.58 | 138.844 |

ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා අය වැය මඟින් ප්‍රතිපාදන අරමුදල් වෙන් නොවන අතර දිස්ත්‍රික් මට්ටමට වෙන් කොට අවශ්‍ය වේ නම් ලබා දිය හැක.

* තේ පර්යේෂණ ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු තේ වගාව සිදු කෙරෙන සියලු පළාත් හා දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කෙරේ.

(iii) නුවරඑළිය, බදුල්ල, මාතලේ, රත්නපුර, ගාල්ල සහ මාතර යන එක් එක් දිස්ත්‍රික්ක සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

| විශේෂ ව්‍යාපෘති/වැඩසටහන් | වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනය රු.මි. | නුවරඑළිය | බදුල්ල | මාතලේ | රත්නපුර | ගාල්ල | මාතර |
|---|---|---|---|---|---|---|---|
| නව වගාව | 36.90 | 1.18 | 5.33 | 0.19 | 4.29 | 2.47 | 2.82 |
| නැවත වගා කිරීම | 454.633 | 22.18 | 37.28 | 4.115 | 112.763 | 81.22 | 91.88 |
| පැළ සිටුවීම | 225.70 | 13.50 | 35.75 | 3.72 | 36.25 | 27.50 | 33.38 |
| කර්මාන්තශාලා නවීකරණය | - | - | - | - | - | - | - |
| තාක්ෂණික දියුණුව | 5.11 | 0.28 | 0.28 | 0.047 | 0.28 | 0.28 | 0.28 |
| පර්යේෂණ * | 100.00 | - | - | - | - | - | - |
| තේ වගා ප්‍රවර්ධනය | - | - | - | - | - | - | - |
| අලෙවිකරණය සහ වෙළඳපොළ ප්‍රවර්ධනය | - | - | - | - | - | - | - |
| සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන්ට සහනාධාර දීම | - | - | - | - | - | - | - |
| අතුරු බෝග වගාව | - | - | - | - | - | - | - |
| ව්‍යාප්ති සේවා | 17.781 | 0.733 | 0.938 | 0.148 | 1.062 | 3.015 | 1.496 |
| වෙනත් | 59.88 | - | - | - | - | - | - |
| | **900.00** | **37.88** | **79.58** | **8.22** | **154.65** | **114.49** | **129.85** |

තේ පර්යේෂණ ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු තේ වගාව සිදු කෙරෙන සියලු පළාත් හා දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කෙරේ.

තේ ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආයතනික අරමුදල් රුපියල් මිලියන 5,947.4ක ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

(iv) එම ප්‍රතිපාදන නව වගා සහ නැවත වගා කිරීම, කර්මාන්තශාලා නවීකරණය සහ තාක්ෂණික දියුණුව, පර්යේෂණ සහ තේ වගා ප්‍රවර්ධනය, අලෙවිකරණය සහ වෙළෙඳ පොළ ප්‍රවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන්ට සහනාධාර දීම සහ වෙනත් අදාළ අංශ අනුව යොදා ගැනීමට සැලසුම්කරණය කරන ලද ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

සැලසුම් කරන ලද ප්‍රමාණ

| විශේෂ ව්‍යාපෘති/ වැඩසටහන් | ප්‍රතිශතය |
|---|---|
| නව වගාව | 4.10 |
| නැවත වගා කිරීම | 50.51 |
| පැළ සිටුවීම | 25.08 |
| කර්මාන්තශාලා නවීකරණය සහ තාක්ෂණික දියුණුව | 0.57 |
| පර්යේෂණ හා තේ වගා ප්‍රවර්ධනය* | 11.11 |
| අලෙවිකරණය සහ වෙළඳ පොළ ප්‍රවර්ධනය | නැත* |
| සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන්ට සහනාධාර දීම | නැත* |
| වෙනත් | 8.63 |
| එකතුව | 100 |

* අලෙවිකරණය සහ වෙළෙඳ පොළ ප්‍රවර්ධනය හා තේ වගා ප්‍රවර්ධනය සඳහා තේ මණ්ඩලය විසින් උපයාගත් ආයතනික අරමුදල් මඟින් වැය කෙරේ.

(ආ) 2026 වර්ෂයේ අය වැය මඟින් තේ කර්මාන්තය සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1,190කි. මෙයට අමතරව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආයතනික අරමුදල් ලෙස රුපියල් මිලියන 4,946.34ක මුදලක් වෙන් කරන ලදී.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 28(ඊ) යටතේ මම කථා කරන්නේ. සාමාන්‍ය සම්ප්‍රදාය තමයි, අග්‍රාමාත්‍යතුමියගෙන් අසනු ලබන ප්‍රශ්න සඳහා විනාඩි 30ක කාලයක් ලබා දීම. ඒ විනාඩි 30 ඇතුළත ඔබතුමා ඉතා කාරුණිකව සාධාරණව පාර්ලිමේන්තු සම්ප්‍රදාය ආරක්ෂා කරලා ඒ අදාළ මන්ත්‍රීවරයා ආවාට පස්සේ ප්‍රශ්නය අහන්න දුන්නා.

හැබැයි, මගේ දැසට නිරීක්ෂණය වුණු පරිදි සභානායකතුමා එපා කිව්වාට පස්සේ ඔබතුමා ඒක වෙනස් කළා. ඒ මන්ත්‍රීතුමා ඒක පිළිගන්න ඇති. මරික්කාර් මන්ත්‍රීතුමා පිළිගත්තාට ගරු කථානායකතුමනි, මින් ඉදිරියට- *[බාධා කිරීමක්]* ඉන්න මම කියන්නම්. අපේ වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට මම මේ යෝජනා කරන්නේ. මොකද, අග්‍රාමාත්‍යතුමියගෙන් අහන ප්‍රශ්නවලදී දෙවැනි වටයක් නැහැ. එතුමියගෙන් ප්‍රශ්න අහන්න තිබෙන්නේ සෑම මාසයකම පළමුවැනි රැස්වීම් සතියේ බදාදා දින විතරයි. එතුමිය පිළිතුර සභාගත කළා. ඔබතුමා දුන්න අදහස ඒ කියන්නේ, ඔබතුමාගේ නියෝගය අද පාර්ලිමේන්තුවේ අගමැතිතුමිය- *[බාධා කිරීමක්]* ඔබතුමාට - මුලසුනට - මේ අගෞරවය කළේ. ඒ පිළිතුර දෙන්න තිබුණා. සභාගත කිරීම නීත්‍යානුකූල නැහැ. ඒක අපේ වරප්‍රසාදවලට අගතියක් වන නිසා මින් ඉදිරියට ඒක නීතියක් නොවී, සම්ප්‍රදායක් නොවෙන්න ඕනෑය කියන එක තමයි මම යෝජනා කරන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අගමැතිතුමියගෙන් අසනු ලබන ප්‍රශ්න වටයත්, වාචික පිළිතුරු අපේක්ෂාවෙන් අහන ප්‍රශ්නවලම දිගුවක් සහ කොටසක්. ඒක නේ අපි වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න පහකුත් ගරු අගමැතිතුමියට දාලා තිබෙන්නේ. මම හිතන විධියට, ඔබතුමා අවසරය ලබා දුන්නා. හැබැයි, එහෙම නොදී යන්න පුළුවන්. ඒක තමයි සම්ප්‍රදාය, ඒ මන්ත්‍රීවරයා පැමිණ නැත්නම්. මොකද, අගමැතිතුමියගෙන් අහන ප්‍රශ්නයටත් අදාළ මන්ත්‍රීවරයා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

වෙලාවට ආවේ නැහැ කියන්නේ ඒ ප්‍රශ්නයට ලබා දෙන වැදගත්කම සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. අනෙක් එක, ඕනෑ නම් පසු අවස්ථාවක එතුමාට ඉදිරිපත් කරන්නත් පුළුවන්. නමුත්, සාමාන්‍ය සම්ප්‍රදාය අනුව කටයුතු කරන එක තමයි හොඳ, ආවේ නැත්නම් මේ විධියට පිළිතුර සභාගත කරන එක.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අදාළ point එකට ආවාට පස්සේ කථා කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. දැන් තිබෙන්නේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. Order of Business follow කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, எனது கேள்வியைக் கேட்பதற்கு முன், எமது அயல் நாடான இந்தியாவின் சகோதர தமிழ் நாட்டு மாநிலத்தில் நடந்த தேர்தலில் சாதனை வெற்றிபெற்ற சகோதரர் விஜய் அவர்களை வாழ்த்துவதற்கான ஒரு சந்தர்ப்பமாக நான் இந்நேரத்தைப் பயன்படுத்திக் கொள்ள விரும்புகின்றேன்.

வாழ்த்துகள் விஜய் அவர்களே! தமிழ் நாட்டின் சட்ட மன்றத் தேர்தலில் தங்களின் தலைமையிலான தமிழக வெற்றிக் கழகம் பெற்றுள்ள மகத்தான அரசியல் வெற்றிக்கு, எனதும் எனது ஆதரவாளர்களதும் சார்பில் மனமார்ந்த வாழ்த்துகள்! சமூக நீதி, நல்லாட்சி, அனைவருக்குமான முன்னேற்றம் என்ற உயரிய கொள்கைகளோடு, சாதி, இன, மத வேறுபாடுகளைக் கடந்து, மக்களை ஒன்றிணைத்த உங்களுடைய அரசியல் பயணம் உண்மையிலேயே மகத்தானது. தங்களுடைய இந்த வெற்றி, தமிழக மக்களின் எதிர்பார்ப்புகளை நிறைவேற்றி, மாநிலத்தின் ஒட்டுமொத்த வளர்ச்சிக்கும் வழிவகுக்கும் என நான் நம்புகின்றேன். தொடர்ந்தும் தங்கள் மக்கள் பணி சிறக்க எனது நல்வாழ்த்துகள்!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීම සහ ස්වේච්ඡා ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීම
### முன்பள்ளிக் கல்வியை ஒழுங்குபடுத்தல் மற்றும் தொண்டர் ஆசிரியர்களுக்கான நிரந்தர நியமனங்களை வழங்கல்
### REGULATION OF PRESCHOOL EDUCATION AND PERMANENT APPOINTMENTS FOR VOLUNTEER TEACHERS

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே! நிலையியற் கட்டளை 27 (2)இன்கீழ், பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரிடம் எனது கேள்வியைக் கேட்க விரும்புகிறேன்.

"இளமையிற் கல்வி சிலையில் எழுத்து" என்பது பழமொழி! சவால்கள் நிறைந்த தற்போதைய உலகிலுள்ள சிறார்கள் வித்தியாசமானவர்கள். சூழலும், வளர்ச்சியடைந்த தொழில்நுட்ப வசதிகளும் அவர்களது கல்வியில் பல்வேறு தாக்கங்களை ஏற்படுத்துகின்றன. எனவே, நமது சந்ததிகளை எதிர்கால உலகிற்குப் பொருத்தமானவர்களாக உருவாக்க வேண்டும். தற்போதைய சிறார்கள் மூன்று வயதிலேயே சிறுவர் பாடசாலைக் கல்வியை ஆரம்பிக்கின்றனர்; குறைந்தது இரண்டு வருடங்கள் சிறுவர் பாடசாலைக் கல்வியைத் தொடருகின்றனர். ஆனால், அது ஆரோக்கியமானதல்ல என ஆய்வுகள் சுட்டிக் காட்டுகின்றன. எனவே, சிறுவர் பாடசாலைக் கல்வி ஒழுங்குபடுத்தப்பட வேண்டும் என்பதில் யாருக்கும் மாற்றுக் கருத்து இருக்காதென நம்புகிறேன்.

அதேபோன்று, கடந்த கால உள்நாட்டு யுத்த சூழ்நிலையில், வடக்கு, கிழக்கு மாகாணங்களிலும், அதனோடு அண்டிய வேறு மாவட்டங்களின் எல்லைக் கிராமங்களிலும் ஏற்பட்ட ஆசிரியர் பற்றாக்குறை காரணமாக, தொண்டர் ஆசிரியர்களைக் கற்பித்தல் நடவடிக்கைகளுக்குப் பயன்படுத்தினோம். பின்னர் அவர்களில் அனேகமானோருக்கு நிரந்தர ஆசிரியர் நியமனம் வழங்கப்பட்டது. எனினும், தேவையான தகைமைகளைக் கொண்ட, நேர்முகப்பரீட்சைகளில் பங்குபற்றிய மற்றும் பங்குபற்றாத தொண்டர் ஆசிரியர்கள் பலரும் இதுவரை நிரந்தர நியமனத்திற்காகக் காத்திருக்கின்றனர்.

கடந்த அரசாங்கக் காலத்தில் இவ்வாசிரியர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவதற்கான அமைச்சரவைப் பத்திரம் சமர்ப்பிக்கப்பட்டு அனுமதிக்கப்பட்டிருந்தபோதிலும், வடக்கு, கிழக்கு மாகாணங்களில் தமிழ் மற்றும் சிங்கள மொழி மூலமான தொண்டர் ஆசிரியர்களுக்கான அமைச்சரவைப் பத்திரம் சாதகமாக அமையாத காரணத்தினால், அதில் குறிப்பிட்ட அளவினர் விடுபட்டுள்ளனர். தேர்தல் காலம், பொருளாதார நெருக்கடி என்பன இதற்குக் காரணங்களாக அமைந்தன. எனவே, இவர்களுக்கான நிரந்த நியமனம் வழங்கப்படுவது மிக முக்கியமானதொரு விடயம் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அந்த வகையில், பின்வரும் கேள்விகளை நான் கேட்கின்றேன்:

1. சிறுவர் பாடசாலைக் கல்வி ஒழுங்குபடுத்தப்பட்டு, நிரந்தரமான, முழு நாட்டுக்கும் பொதுவான சிறுவர் பாடசாலைக் கல்வி முறையினை ஏற்படுத்தி, சிறுவர் பாடசாலை ஆசிரியர்களை ஒரே குடையின்கீழ்க் கொண்டுவர முடியுமா?

2. சகல சிறுவர் பாடசாலை ஆசிரியர்களுக்கும் நிரந்தர நியமனம் வழங்குவதோடு, அவர்களுக்குரிய சம்பளத் திட்டம் மற்றும் ஏனைய சலுகைகள் அனைத்தையும் வழங்க முடியுமா?

3. இரண்டு வருட சிறுவர் பாடசாலைக் கல்வியை இல்லாமலாக்கி, முதலாம் தரத்திற்கும் சிறுவர் பாடசாலைக் கல்விக்கும் இடையில் ஒரு கல்வி முறையினை உருவாக்கவும், முதலாம் தரத்தில் சேர்ப்பதற்கான வயதெல்லையை ஐந்து ஆக்குவது தொடர்பான ஆய்வுகளையும், அதற்குத் தேவையான நடவடிக்கைகளையும் மேற்கொள்ள முடியுமா?

4. 2014ஆம் ஆண்டு தேசிய பாடசாலையாக்கப்பட்ட எந்தப் பாடசாலைக்கும் புதிதாக ஆளணி உருவாக்கம் செய்யப்படவில்லை என்பதைத் தாங்கள் அறிவீர்களா? அதற்கு என்ன நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது?

5. யுத்த சூழ்நிலைகளையும் அதற்குப் பிந்திய புனரமைப்பு நிலையையும் கருத்திற்கொண்டு, கடந்த காலத்தில் அமைச்சரவை அனுமதியுடன் பிரதானமாக வடக்கு, கிழக்கு மாகாணங்கள் தவிர்ந்த நாட்டின் ஏனைய பகுதிகளில் தொண்டர் ஆசிரியர்களாகக் கடமைபுரிந்த பலருக்கு நிரந்தர நியமனம் வழங்கப்பட்டது. இதில் சிலர் நேர்முகப்பரீட்சைக்கு முகங்கொடுத்தும் அரசியல் காரணங்களினால் அவர்களுக்குரிய நிரந்தர நியமனம் வழங்கப்படவில்லை என்பதைத் தாங்கள் அறிவீர்களா?

6. அவ்வாறான தொண்டர் ஆசிரியர்கள் வேறு வேலைகளுக்கு முயற்சிக்காமலும், அரச சேவைக்கான வயதெல்லையைக் கடந்தும் காத்திருக்கின்ற துர்ப்பாக்கிய நிலையைத் தாங்கள் அறிவீர்களா?

7. அவ்வாறானவர்களுக்கு நிரந்தர நியமனம் வழங்கப்படாதவிடத்து அவர்களது உரிமைகள் மறுக்கப்படுவதையும் அவர்கள் உள ரீதியாகப் பாதிக்கப்படுவதையும் அவர்களது குடும்பப் பொருளாதார நிலையையும் கருத்திற்கொண்டு, விசேட குழுவொன்றினை நியமித்து, ஆராய்ந்து அத்தொண்டர் ஆசிரியர்களுக்கான நிரந்தர நியமனங்களை வழங்க அல்லது அவர்களை ஆசிரியர் உதவியாளர்களாக உள்வாங்க நடவடிக்கை எடுக்க முடியுமா?

நன்றி!

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. අධ්‍යාපනය ලෝකයේ ප්‍රතිරූපය වන අතර, දරුවන් අනාගත අභියෝග සඳහා සූදානම් කිරීම අත්‍යවශ්‍ය වේ. කුඩා වයසින් පෙර පාසල් අධ්‍යාපනය ආරම්භ කළද, එය සෑම විටම සුදුසු නොවන බැවින් නියාමනය අවශ්‍යය. තවද, සිවිල් යුද්ධ සමයේ ගුරු හිඟය පිරවීමට යොදාගත් ස්වේච්ඡා ගුරුවරුන්ගෙන් බොහෝ දෙනකුට ස්ථිර පත්වීම් ලැබී ඇතත්, තවත් පිරිසක් තවමත් බලාපොරොත්තු වෙති. කැබිනට් අනුමැතිය තිබුණද, මැතිවරණ හා ආර්ථික අර්බුද හේතුවෙන් සියලු දෙනාට පත්වීම් ලැබී නොමැත. එබැවින් ඔවුන්ට ස්ථිර පත්වීම් ලබා දීම ඉතා වැදගත් වේ.

2. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෙර පාසල් අතරින් වැඩි ප්‍රමාණයක් පෞද්ගලික අංශය මඟින් පවත්වාගෙන යන අතර, එකී පෙර පාසල් මඟින් එහි සේවය කරන ස්වේච්ඡා ගුරුවරු සඳහා යම් වැටුපක් ලබාදීම සිදු කරයි. තවද, පළාත් සභා විසින්ද තෝරා ගත් පෙර පාසල්වල සේවය කරන ස්වේච්ඡා පෙර පාසල් ගුරුවරු සඳහා යම් දීමනාවක් ගෙවීමට මේ වන විටද කටයුතු කරමින් පවතී.

ඒ අනුව බොහොමයක් පෙර පාසල් පෞද්ගලික අංශය යටතේ ක්‍රියාත්මක වන බැවින් පෙර පාසල් ගුරුවරු සඳහා ස්ථිර පත්වීම් ලබාදීමට හෝ ස්ථිර වැටුප් හෝ දීමනා ලබා දීමට අවකාශයක් අමාත්‍යාංශයට මේ වෙනකොට නැහැ, පෞද්ගලික අංශයේ පවත්වාගෙන යන පෙර පාසල් සම්බන්ධයෙන්.

3. වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව වයස අවුරුදු 5 සම්පූර්ණ වූ සිසුන් විධිමත් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා පාසලට ඇතුළත් වේ. ඒ අනුව වයස 3හි සහ 4හි සිටින දරුවන් පෙර පාසල් අධ්‍යාපනය සඳහා යොමු වේ.

පවතින පෙර පාසල් අධ්‍යාපන ක්‍රමය වෙනස් කරමින් 2027 වර්ෂයේදී පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම විෂය මේ දක්වා ක්‍රියාත්මක කරනු ලබන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සහාය සහිතව කටයුතු කරමින් පවතී.

ඒ යටතේ පෙර පාසල් අධ්‍යාපනය ප්‍රමිතිගත කර රටේ සමස්ත පෙර පාසල් සඳහා මග පෙන්වීමට 2025 වර්ෂයේදී ජාතික අධ්‍යාපන ආයතනය මඟින් "ජාතික මුල් ළමා විය අධ්‍යාපන විෂය මාලා රාමුව" හඳුන්වා දෙන ලදී. ඊට අමතර වශයෙන් මෙම විෂය මාලා රාමුවට අනුව පෙර පාසල් ගුරු මාර්ගෝපදේශයක් සහ ආදර්ශ ක්‍රියාකාරකම් සංග්‍රහයක් සකස් කරමින් පවතින අතර, සියලුම පෙර පාසල් ගුරුවරු පළාත් මට්ටමේ ගුරු පුහුණු වැඩසටහන් මඟින් ජාතික මුල් ළමා විය අධ්‍යාපන විෂය මාලා රාමුව, ගුරු මාර්ගෝපදේශය සහ ආදර්ශ ක්‍රියාකාරකම් සංග්‍රහය භාවිත කරමින් පුහුණු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කරමින් නිසි ප්‍රමිතියකට උසස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිසමේ ප්‍රතිපත්තිමය නිර්දේශ අනුව පෙර පාසල් අධ්‍යාපනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපනය කිරීමේ කටයුතුද 2026 වර්ෂයේදී සැලසුම් කර ක්‍රියාත්මක කරමින් පවතී.

4. වර්ෂ 2014දී කිසිදු පළාත් පාසලක් ජාතික පාසලක් ලෙස ප්‍රකාශයට පත් කර නොමැත.

5. මේ පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොමැත.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

6. මේ පිළිබඳ තොරතුරු ද අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොමැත.

අපට මේ පිළිබඳව පළාත් මට්ටමින් යම්කිසි සොයා බැලීමක් කරන්න යම් කාලයක් ගත වෙනවා, ගරු කථානායකතුමනි. අධ්‍යාපන අමාත්‍යාංශය මේ වාගේ ස්වේච්ඡා ගුරුවරුන්ට ලබා දී ඇති ස්ථිර පත්වීම් සම්බන්ධයෙන් වූ දේශපාලන මැදිහත්වීමක් පිළිබඳ තොරතුරු අප ළඟ නැහැ.

7. නොහැක.

දිවයිනේ විවිධ පළාත්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙසට පත් කිරීම මැයෙන් නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 2006/ED/E/139 හා 2006.11.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අනුමැතිය 2007.01.04වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මෙම යෝජනා ක්‍රමය යටතේ ගුරු සහායකවරුන් ලෙස පත් කිරීමට නියමිත 4,700ක් වන ස්වේච්ඡා ගුරුවරුන් සංඛ්‍යාවට අමතරව වෙනත් ස්වේච්ඡා ගුරුවරුන් කිසිවෙක් පත් කිරීම නොකළ යුතු බව දන්වා ඇත. ඒ බව සියලු පළාත් දැනුවත් කර ඇති අතර 2007.01.04වන දිනෙන් පසුව මෙම අමාත්‍යාංශය මඟින් ස්වේච්ඡා ගුරුවරුන් බඳවාගෙන නොමැත.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ பிரதமர் அவர்களே, நீங்கள் கூறியதுபோல தனியார் நடத்துகின்ற பாலர் பாடசாலைகள் இருந்தாலும், ஒரு பிரதேச சபைக்கு உட்பட்ட பாலர் பாடசாலைகள் அநேகமாக அப்பிரதேச சபைகளூடாகவே நடத்தப்படுகின்றன. எனினும், அவ்வாறான பாடசாலைகள் மிகக் குறைவு. குறிப்பாக எமது பகுதிகளை எடுத்துக்கொண்டால், ஒவ்வொரு பிரதேச சபை எல்லையும் பாரிய பரப்பளவைக் கொண்டது. ஆனால், அங்கே ஒன்று அல்லது இரண்டு பாடசாலைகளே இருக்கின்றன. எனவே, அவற்றை அதிகரித்து, தனியார் பாடசாலைகளைக் குறைக்க வேண்டும். ஏனென்றால், எமது பகுதிகளில் வறுமைக்கோட்டின் கீழுள்ள மக்கள் தனியார் பாடசாலைகளுக்குரிய கொடுப்பனவுகளைச் செய்து, தமது பிள்ளைகளுக்குக் கல்வி கற்பிப்பது மிகக் கடினமாக இருக்கின்றது. அதனால் அதிகளவான சிறுவர்கள் பாலர் பாடசாலைகளுக்குச் செல்லாமல் இருக்கின்றார்கள். எனவே, கிட்டத்தட்ட அத்திவாரக் கல்வி போன்றதான ஆரம்பக் கல்வியை அந்தப் பிள்ளைகள் கற்கக்கூடிய வசதி இல்லாத காரணத்தினால் பிரதேச சபைகளின் ஊடாக இயங்கக்கூடிய பாடசாலைகளை அதிகரிப்பதற்குரிய பொருத்தமான நடவடிக்கைகளை ஆராய்ந்து, அதற்கான சுற்றுநிருபத்தை வெளியிட வேண்டும்.

குறிப்பாக, யுத்தம் காரணமாகப் பாதிப்படைந்த வடக்கு, கிழக்குப் பகுதிகளில் ஒரு பிரதேச சபைக்கு ஒன்று அல்லது இரண்டு பாடசாலைகள்தான் இருக்கின்றது. ஆகவே, அங்கு அப்பாடசாலைகளின் தேவை மிக அத்தியாவசியமாக இருப்பதனால், அரசாங்கம் பிரதேச சபைகளுக்குரிய பாடசாலைகளைக் கூட்டி, அப்பாடசாலை ஆசிரியர்களுக்குரிய கொடுப்பனவுகளை அரசாங்கமோ அல்லது பிரதேச சபைகளோ கொடுப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டும்.

அதுமாதிரி, ஏனைய கற்றல் தொடர்பான ஒழுங்குபடுத்தல் ஏற்பாடுகள் 2027இல் மேற்கொள்ளப்பட இருப்பதாகக் கூறியிருந்தீர்கள்; நன்றி! அதேநேரம், கடந்த காலங்களில் volunteer ஆசிரியர்களாகக் கடமை புரிந்த சிலருக்கு appointment வழங்கப்படவில்லை. அதாவது, அந்த நேரம் இருந்த அரசியல் சக்திமிக்கவர்களால் அரசியல் காரணங்களின் அடிப்படையில், volunteerஆக ஆசிரியர் கடமையைச் செய்தவர்களில் ஒருசிலர் நிராகரிக்கப்பட்ட அதேவேளை மற்றவர்கள் ஏற்றுக் கொள்ளப்பட்டார்கள். வட மாகாணத்தை எடுத்துக்கொண்டால், இப்பொழுது அவ்வாறான கிட்டத்தட்ட 150 பேர் இருக்கின்றார்கள்; கிழக்கு மாகாணத்தையும் சேர்த்துச் சுமார் 300 - 400 பேர் இருக்கிறார்கள். யுத்தம் நடந்த ஏனைய மாவட்டங்களிலும் குறிப்பிடத்தக்க அளவில் இருக்கின்றார்கள். நிரந்த நியமனத்தை எதிர்பார்த்துக் காத்திருந்த அந்தத் தொண்டர் ஆசிரியர்களுக்கான நியமனத்தைக் கொடுப்பதற்குரிய Cabinet Paper கடந்த காலத்தில் சமர்ப்பிக்கப்பட்டிருந்தும் அது தொடர்பாகச் சரியான ஓர் ஆய்வு செய்யாததால் ஏற்பட்ட பிழை இது. அதனால் நாங்கள் சொல்வது என்னவென்றால், அதற்குரிய ஒரு குழுவை நீங்கள் நியமித்து, மாகாணங்கள் ரீதியாக இவ்வாறு பாதிக்கப்பட்டவர்களுக்கு ஆவன செய்ய வேண்டும். அவர்கள் மனோரீதியாகவும் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். அரசியல் ரீதியாகப் பழிவாங்கப்பட்டவர்கள் மற்றும் பாதிக்கப்பட்டவர்களுக்கு நிவாரணம் கொடுக்கக் கூடியவர்கள் என்ற அடிப்படையில்தான் மக்கள் இந்த அரசாங்கத்தைத் தெரிவு செய்திருக்கின்றார்கள். அவ்வாறாகப் பாதிக்கப்பட்டவர்களுக்குரிய நிரந்தர நியமனத்தையோ அல்லது ஆசிரிய உதவியாளர்களுக்குரிய நியமனத்தையோ வழங்க நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும்.

கடந்த காலத்தில் வெளியிடப்பட்ட சுற்றுநிருபம் பற்றி நீங்கள் சொன்னீர்கள். அதையே சொல்லிக்கொண்டு இருக்காமல், அதனை மாற்றிப் புதிய சுற்றுநிருபத்தை வெளியிட்டு, அவர்களுக்கு உரிய தீர்வை வழங்க வேண்டும். உங்களுக்கு இவ்வளவு ஆதரவை அளித்து மக்கள் உங்களைத் தெரிவுசெய்தது, பாதிக்கப்பட்ட தங்களுக்கு உங்களிடமிருந்து நல்லதொரு நியாயம் கிடைக்கும் என்ற அடிப்படையில்தான். எனவே, நியாயமான முறையில் அவர்களை நிரந்தரமாக்குமாறு இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, පෞද්ගලික ක්ෂේත්‍රයේ පෙර පාසලුත් නියාමනය කිරීම සඳහා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයෙන් මේ වන විට වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියන දේ හරි. විශේෂයෙන් උතුර, නැඟෙනහිර පළාත්වල පෙර පාසල් තිබෙන්නේ අඩු ප්‍රමාණයක්. පෞද්ගලික ක්ෂේත්‍රයෙන් ඒවා වැඩි වශයෙන් කරගෙන යනකොට සමහර වෙලාවට පෙර පාසල් අධ්‍යාපනය ලබා ගන්න බැරි වෙච්ච ළමයින් කොට්ඨාසයක් ඉන්න පුළුවන්. ඒ නිසා තමයි අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට යෝජනා කරලා තිබෙන්නේ, හැම කොට්ඨාසයක්ම මේ පිළිබඳව අධ්‍යයනය කරලා පෙර පාසල් අවශ්‍ය තැන්වල ආරම්භ කිරීම සඳහාත් විශේෂයෙන් ව්‍යුහ කමිටු හරහා යෝජනා ඉදිරිපත් විය යුතුයි කියලා. ගරු කථානායකතුමනි, පෙර පාසල් පවත්වාගෙන යෑමේ වගකීම තිබෙන්නේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට. අපි ඔවුන් සමඟත් මේ පිළිබඳව කථා කරන්නම්.

ස්වේච්ඡා ගුරුවරුන් පිළිබඳව තිබෙන ප්‍රශ්නයේදී ගරු මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධයෙන් නිශ්චිත කරුණු මොනවා හරි තිබෙනවා නම් මට ලබා දෙන්න කියලා. ඇත්තටම අපට ඒ පිළිබඳ තොරතුරු අමාත්‍යාංශයෙන් සොයා ගන්න ලැබුණේ නැහැ. නමුත්, ඒ පිළිබඳව අපි පළාතෙන් විමසන්නම්. යෝජනා කරපු විධියට අවශ්‍ය නම් කමිටුවක් පත් කරන්නම්. එය 2007 වාගේ කාලයේ සිද්ධ වෙච්ච දෙයක්. අපි මාසිකව පළාත් අධ්‍යාපන ප්‍රධානීන් රැස් කරලා සාකච්ඡා කරනවා. ඒ සාකච්ඡාවේදීත්, ඔබතුමා සම්බන්ධ වන උපදේශක කමිටුවේදීත් මේ කාරණය මතු කරලා, මේ පිළිබඳ තොරතුරු අරගෙන, අසාධාරණයට ලක් වෙච්ච කොටසක් තවම ඉන්නවා නම් මොකක්ද තත්ත්වය කියන එක ගැන සොයා බලන්න අපට පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මම අසන ප්‍රශ්නයට ආණ්ඩු පාර්ශ්වයෙන් අද පිළිතුරු ලබා දෙනවාද, කාලය ඉල්ලනවාද දන්නේ නැහැ, නේද? මම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්. පිළිතුරු ලබා දෙන්න කවුරුන් හෝ ඉන්නවාද දන්නේ නැහැ. පිළිතුරු දීමට කල් ගන්නවා නම් තවත් ප්‍රශ්න දෙකක් මේකට ඇතුළත් කරන්න තිබෙනවා. මොකද, කථානායකතුමා අවසර දෙන්නේ නැහැ නේ, -

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අද පිළිතුරු ලබා දෙන්නේ නැහැ. කල් ගන්නවා.

## II

## "දිට්වා" සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල කෘෂි කර්මාන්තය වැඩිදියුණු කිරීම
"தித்வா" புயலால் பாதிக்கப்பட்ட பகுதிகளில் விவசாயத்தை மேம்படுத்தல்
UPLIFTMENT OF AGRICULTURE IN AREAS AFFECTED BY CYCLONE "DITWAH"

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, 2025 නොවැම්බර් මස අග භාගයේ බලපෑ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ශ්‍රී ලංකාවේ දේශීය ආහාර නිෂ්පාදනයට දැඩි බාධා එල්ල වී ඇත. සාමාන්‍යයෙන් ජාතික සහල් නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක දායකත්වයක් දක්වන 2025/26 මහ කන්නය, වගාවේ වඩාත්ම අවදානම් සහිත මුල් අවධියේදීම මෙම ආපදාවට ලක් විය. සාමාන්‍යයෙන් සෑම මහ කන්නයකම හෙක්ටෙයාර 800,000ක් පමණ වගා කරන නමුත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වාර්තා කරන පරිදි මෙම කන්නයේ වී වගා කර ඇත්තේ හෙක්ටෙයාර 563,950ක පමණි. ඉන් වැඩි ප්‍රමාණයක් අධික වර්ෂාව, ජල ගැලීම් සහ නාය යෑම් හේතුවෙන් හානියට පත්ව ඇත. තේ, පොල්, පලතුරු සහ ගෙවතු වගාව ඇතුළු බහු වාර්ෂික භෝග ද මෙයින් පීඩාවට හා බලපෑමට පත්ව ඇත. වගා හානි හේතුවෙන් ගොවීන්ගේ මුදල් ප්‍රවාහය සිඳී පවතින පසුබිමක 2026 යල කන්නයේ වගා කටයුතු ආරම්භ වීමට ද නියමිතව ඇත.

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමාගෙන් මා පහත පැහැදිලි කිරීම් ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමාගෙන් මාස කිහිපයකට පෙර අහපු 27(2) යටතේ ප්‍රශ්නයටත් තවම පිළිතුරක් නැහැ කියන එකත් මම කියන්න ඕනෑ. කිවුල් ඔය වැඩ පිළිවෙළ ගැන ඇහුවා. ඒක ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් නිසා ඒ අවස්ථාවේදී ඇහුවාට මාස 2කින්වත් පිළිතුරක් නැති නිසා දැන් ඒකේ වැදගත්කමක් නැහැ. මම මේ අවස්ථාවේදී ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

1. 2025/26 මහ කන්නයේ වී නිෂ්පාදනය පිළිබඳ රජයේ වර්තමාන නිල ඇස්තමේන්තුව මෙට්‍රික් ටොන් කොපමණ ප්‍රමාණයක්ද සහ 2026 වසර සඳහා ජාතික මට්ටමින් සහල් හිඟයක් ඇති විය හැකි බව පුරෝකථනය කර තිබේද?

   ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහන්නේ ඉදිරියේදී සහල් හිඟයක් එන නිසා. ඒ පිළිබඳ පුරෝකථනයක් නැතිව, ඒ හිඟය ආවාට පස්සේ, මේ කන්නය අවසන් වුණාට පස්සේ මේ ප්‍රශ්නවලට පිළිතුරු දීලා වැඩක් නැහැ.

2. හානියට පත් ගොවීන්ට මේ දක්වා වෙන් කර ඇති සහ බෙදා දී ඇති සහන පැකේජ (ප්‍රතිස්ථාපන බීජ වී, පොහොර, රෝපණ ද්‍රව්‍ය, සහන ණය සහ වන්දි ඇතුළුව) දිස්ත්‍රික්ක අනුව සහ බෙදා හරින ලද වටිනාකම අනුව වර්ග කර දක්වන්නේද?

3. විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර සහ මධ්‍යම පළාත්වල සුළි කුණාටුවෙන් පීඩාවට පත් වූ දිස්ත්‍රික්ක කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රධාන ජලාශවලින් වාරි ජලය මුදා හැරීම, සහතික කළ බීජ වී ලබා දීම සහ පොහොර සැපයීම ඇතුළුව 2026 යල කන්නයේ වගා කටයුතු නියමිත වේලාවට සහතික කිරීම සඳහා ගනු ලබන නිශ්චිත ක්‍රියාමාර්ග මොනවාද?

   ගරු කථානායකතුමනි, උදාහරණයක් හැටියට මම මේ කාරණය කියන්නම්. "දිට්වා" සුළි කුණාටුවෙන් මඩකලපුවේ සම්පූර්ණයෙන් විනාශයට පත් වෙච්ච කුඹුරුවලට අක්කරයකට රුපියල් 60,000 ගණනේ දීලා තිබෙනවා. නමුත් අක්කර භාගය හෝ යම් ප්‍රමාණයක් හානි වෙච්ච අයට මුදල් ලබා දීලා නැහැ.

4. ඇතැම් දිස්ත්‍රික්කවල වගා කටයුතු ආරම්භ වී මාසයකට වැඩි කාලයක් ගතවී ඇතත්, ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත මෙතෙක් ප්‍රමාණවත් පරිදි හෝ නියමිත වේලාවට පොහොර ලැබී නොමැත. වැලි සහිත පස හේතුවෙන් අක්කරයකට අවම වශයෙන් යූරියා කිලෝග්‍රෑම් 100ක් අවශ්‍යවන අවස්ථාත් තිබේ. රජයෙන් දෙන්නේ කිලෝග්‍රෑම් 40යි. වැලි සහිත ප්‍රදේශවලට කිලෝග්‍රෑම් 100ක් අවශ්‍ය වන අවස්ථා ද තිබේ. පොහොර සැපයීමට ගිවිසුම්ගත CCS (Pvt.) Limited සහ රජයේ පොහොර සංස්ථාව පොහොර බෙදා හැරීම ප්‍රමාද කිරීම නිසා ගොවීන් දැඩි දුෂ්කරතාවට පත්ව ඇත. මේ සඳහා කඩිනමින් පියවර ගන්නේද?

கௌரவ சபாநாயகர் அவர்களே, நான் இங்கு முன்வைக்கின்ற கேள்வி மிக முக்கியமானது. தற்பொழுது, மட்டக்களப்பு மாவட்டத்தின் சில பிரதேசங்களில் நெல் விதைப்பு இடம்பெற்று 35 நாட்கள் கடந்துவிட்டன. வழமையாக நெல் விதைப்பு இடம்பெற்று 15 நாட்கள் கடந்த

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

பின்னர், வயல்களுக்கு முதலாவது கட்ட உரம் இடப்படும். ஆனால், வாகரை, ஏறாவூர் போன்ற பிரதேசங்களுக்கு அராங்கம் சொல்கின்ற CCS (Pvt.) Limited என்ற நிறுவனத்தின் ஊடாக இதுவரை ஒரு lorry அளவில்தான் உரம் வந்திருக்கிறது. நான் இந்த விடயம் சம்பந்தமாக Commissioner General of Agrarian Development உடன் பேசி இருக்கிறேன்; DC உடன் பேசி இருக்கிறேன். எனினும், இந்தப் பிரச்சினைக்கான தீர்வு இன்னும் எட்டப்படவில்லை. அரசாங்கம் வழங்கும் உரம் உரிய நேரத்துக்குக் கிடைக்காவிட்டால் விவசாயிகள் என்ன செய்வார்கள்? அவர்கள் தனியாரிடமிருந்து உரத்தை வாங்க முற்படுவார்கள்.

மட்டக்களப்பு மாவட்டத்தில் நடந்த ஒரு சம்பவத்தைச் சொல்கின்றேன். போரதீவுப்பற்றிலுள்ள பிரதீப் என்பவரின் பசளைக் கடைக்கு, கம்பனியானது 16,000 ரூபாயென உர bagஇல் விலையை அச்சிட்டே அனுப்புகின்றது. விவசாயிகளுக்குச் சரியான நேரத்துக்கு உரம் கிடைக்காவிட்டால், பயிர்கள் அளிந்து போய்விடுமோ என்ற பயத்தில், அரசாங்கம் 10,000 ரூபாய்க்கு உரத்தை வாங்கச் சொன்னாலும், அவர்கள் அவதிப்பட்டு 16,000 ரூபாய்க்கு உரத்தை வாங்குகிறார்கள். கடை உரிமையாளர்களை நாங்கள் குறைசொல்ல முடியாது. ஏனெனில், விவசாயிகள் சொல்கிறார்கள், "உரத்தைத் தர முடியாவிட்டால், கடையை மூடிவிட்டுப் போங்கள்!" என்று. 16,000 ரூபாய்க்கு உரத்தை விற்பனை செய்தால், அவர்களுக்கு எதிராக Consumer Affairs Authority வழக்குத் தாக்கல் செய்கிறது. அரசாங்கம் உரத்தை உரிய நேரத்துக்கு வழங்காவிட்டால், ஒன்றில் விவசாயம் முழுமையாக அழிந்துபோகும் அல்லது 16,000 ரூபாய்க்கு உரத்தை வாங்கி வயலுக்கு இடவேண்டும். 16,000 ரூபாய்க்கு உரத்தை விற்பனை செய்வதால் கடை உரிமையாளர்களுக்குப் பிரச்சினை வருகின்றது.

கௌரவ சபாநாயகர் அவர்களே, எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற சில பிரதேசங்களிலுள்ள வயல் நிலங்கள் மண் கூடுதலாக இருக்கின்ற பூமி! அரசாங்கம் சொல்கின்றது, விவசாயிகளுக்கு 40 கிலோகிராம் அளவில்தான் யூரியா உரத்தைத் தரலாம் என்று. எங்களுடைய பிரதேசங்களில் விளைச்சல் அதிகமாக வர வேண்டுமாக இருந்தால், 100 கிலோகிராம் வரைக்கும் உரம் இடவேண்டிய தேவை இருக்கின்றது. அப்படியென்றால், மிகுதி 60 கிலோகிராம் உரத்தை எங்கே வாங்குவது? தனியாரிடம்தான் வாங்க வேண்டும். தனியாரிடமும் வாங்குவதற்கு வழியில்லை என்றால், கூடுதலான விலைக்கு விற்கின்றவர்களுக்கும் பிரச்சினை என்றால், ஒன்றில் விவசாயம் முழுமையாக அழிந்து போகும். இல்லாவிட்டால், விவசாயிகள் அழிந்து போய்விடுவார்கள். எனவே, இதற்கொரு நிரந்தரத் தீர்வு காணப்பட வேண்டும்.

கௌரவ சபாநாயகர் அவர்களே, எங்களுடைய பிரதேசத்தில் நெல் விதைப்பு இடம்பெற்று 35 நாட்கள் கடந்துவிட்டன. இன்னும் 60 நாட்கள் கடந்துவிட்டால் இந்தப் போகம் முடிந்துவிடும். எனவே, இந்தக் காலப்பகுதியில் இதற்குரிய பதிலை வழங்காவிட்டால், இந்தக் கேள்வியை எழுப்புவதில் பிரயோசனம் இல்லாமல் போய்விடும்.

கௌரவ சபாநாயகர் அவர்களே, 'தித்வா' புயலால் ஓர் ஏக்கர் முழுமையாகப் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு 60,000 ரூபாய் கிடைத்ததாகச் சில இடங்களில் சொல்கிறார்கள். ஆனால், குறைந்தளவு - ½ ஏக்கர் அளவில் - பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு இதுவரை நஷ்டஈடு அரசாங்கத்தால் வழங்கப்படவில்லை. மட்டக்களப்பு மாவட்டத்தில் மட்டுமல்ல, பல இடங்களிலும் தென்னை மரங்களில் வெள்ளைப் பூச்சிகளால் ஒருவித நோய் ஏற்படுகின்றது. இரண்டு ஆண்டுகளாக அந்த நோயைக் கட்டுப்படுத்துவதற்கு எந்தவொரு கிருமிநாசினியும் இல்லை. அந்த நோயைக் கட்டுப்படுத்துவதற்கான கிருமிநாசினியொன்று கன்னொருவவில் கண்டுபிடிக்கப்பட்டு இருந்தாலும்கூட, அதற்கு Coconut Research Institute இதுவரை approval வழங்கவில்லை என்று சொல்லி, அதைக் கொடுக்கிறார்கள் இல்லை. அந்த நோய்த் தாக்கத்தால் தேங்காய் உற்பத்தி குறைந்துகொண்டு போகின்றது. இப்படியான பிரச்சினைகள் மலையகத்திலுள்ள தேயிலைத் தோட்டங்களிலும் இருக்கலாம். இவற்றுக்கு உரிய தீர்வைப் பெற்றுக்கொடுக்காவிட்டால், விவசாயிகள் மீண்டும் வீதியில் இறங்கிப் போராடவேண்டிய நிலைமை ஏற்படும். அதுமாத்திரமன்றி, நாங்களும் அவர்களுடன் இணைந்து அரசுக்கு எதிராகப் போராட்டம் செய்ய வேண்டிய நிலைமை ஏற்படும். தற்பொழுது, இச்சபையில் அரசாங்கத்தின் பிரதம கொறடா இருக்கிறார். நான் இந்த விடயத்தை அவருடைய கவனத்துக்குக் கொண்டுவருவதுடன், இந்தக் கேள்விகளுக்கான பதில்களை அவரசமாகப் பெற்றுத் தருமாறும் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය සඳහා ඉක්මනින් පිළිතුරක් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍ය, ගරු අනුර කරුණාතිලක මහතා.

2026.02.20වැනි දින ගරු රවි කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## ශ්‍රීලන්කන් ගුවන් සේවය ප්‍රතිසංස්කරණයන්හි වත්මන් තත්ත්වය: වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## இலங்கை விமான சேவை நிறுவன மறுசீரமைப்பின் தற்போதைய நிலை: துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று

## CURRENT STATUS OF RESTRUCTURE OF SRILANKAN AIRLINES: STATEMENT BY MINISTER OF PORTS AND CIVIL AVIATION

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

එතුමාගේ පළමුවැනි ප්‍රශ්නය යොමු වෙන්නේ එයාර් ලංකා සමාගමේ ප්‍රතිව්‍යුහකරණ හෙවත් වාණිජකරණ ක්‍රියාවලියේ වත්මන් තත්ත්වය පිළිබඳව.

1. රාජ්‍ය බැංකුවල පවතින රුපියල් බිලියන 91.3ක ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කරලා තිබෙනවා. ඒ වාගේම පොලී විෂමතාවේ මූලික ගෙවීම සමඟ පස් අවුරුදු සැලැස්ම යටතේ අර්ධ වාර්ෂික ප්‍රතිගෙවීම් සැලැස්මේ මූලික වාරිකය සමන්විත වන ස්කන්ධ ගෙවීමෙහි පළමුවන කොටස වන රුපියල් බිලියන 25.2ක මුදල 2025 දෙසැම්බර් මාසයේ දී ලැබුණු අතර, එම මුදල ප්‍රධාන බැංකු දෙකෙහි (ලංකා බැංකුව සහ මහජන බැංකුව) ණය මුදල පියවීම සඳහා මුළුමනින්ම භාවිත කර තිබෙනවා.

- මහා භාණ්ඩාගාරය, බැංකු ද්විත්වය, ශ්‍රීලන්කන් ගුවන් සේවය අතර එකඟතාවකට පැමිණි කාර්ය රාමුවට අනුව, රාජ්‍ය බැංකුවල ණය පියවීම සඳහා 2030 වසර දක්වා සෑම අප්‍රේල් මාසයකම සහ ඔක්තෝබර් මාසයකම ශ්‍රී ලංකා රජයෙන් සමාගමට තවදුරටත් ප්‍රාග්ධන මුදල් ගෙවීමට කටයුතු කරමින් ඉන්නවා.
- එක්සත් ජනපද ඩොලර් මිලියන 175ක ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ඇපකරයක් මේ වනවිට ප්‍රතිව්‍යුහගත කෙරෙමින් පවතිනවා. අපි විශ්වාස කරනවා, ඒ කටයුතු 2026 වසර අවසන් වෙනකොට සම්පූර්ණයෙන් අවසන් කරන්න පුළුවන් වෙයි කියලා.

2. 
- ලාභදායී ව්‍යාපාරයක් ලෙස ඉදිරියට පවත්වාගෙන යෑමේ හැකියාව සමූහයට/සමාගමට තිබේද යන්න පිළිබඳව සැලකිය යුතු සැකයකට තුඩු දෙන ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවක් පවතින බව විගණකාධිපති විසින් විගණන මතය ලෙස දක්වා තිබෙනවා.
- ලාභදායී ව්‍යාපාරයක් ලෙස සමාගම ඉදිරියට පවත්වාගෙන යෑමට අවශ්‍ය මූල්‍ය සහාය අඛණ්ඩව ලබාදෙන බව ශ්‍රී ලංකා රජය අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් හා මහා භාණ්ඩාගාර ලේකම් වෙත නිකුත් කරන ලද ලිපියක් මඟින් සහතික වෙලා තිබෙනවා.

කෙසේ වුවත්, අපි මේ තිබෙන තත්ත්වය තුළින්ම ශ්‍රීලන්කන් ගුවන් සේවය පවත්වාගෙන යෑමට බලාපොරොත්තු වෙන්නේ නැහැ. කිසියම් විධියක මූල්‍ය ව්‍යාපාර සැලැස්මක් අනුව කටයුතු කිරීම සඳහා ආයෝජකයන්ගේ සහයෝගය ලබාගෙන, business model එකක් පිළිබඳව අමාත්‍යාංශ මට්ටමින් සහ මහා භාණ්ඩාගාරය මැදිහත් වෙලා මේ වෙනකොට සාකච්ඡාවක් ආරම්භ වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

"Whether the Cabinet approved a definite pathway through a strategic partnership or a PPP model" කියලා අහපු එකට ඔබතුමා උත්තර දුන්නේ නැහැ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලි කරන්නම්. ඊට පස්සේ ඔබතුමාගේ, - *[බාධා කිරීමක්]* ඒක තමයි, ඔබතුමා ඒ ප්‍රශ්නයෙන් අහන්නේ, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව model එකක්ද, කළමනාකරණ කොමිසමක්ද, එහෙම නැත්නම් අඛණ්ඩ රාජ්‍ය හිමිකාරිත්වයක්ද කියන එක නේ. ඒක තමයි මම මෙතැනදී පැහැදිලි කළේ. මේ පිළිබඳ සාකච්ඡාවක් අමාත්‍යාංශ මට්ටමින් සහ මුදල් අමාත්‍යාංශය මට්ටමින් ක්‍රියාත්මක කරනවා. මේ වෙනකොට සාකච්ඡාවක් කෙරීගෙන යනවා. නමුත්, තවම නිශ්චිත වශයෙන්ම අපි එකඟතාවකට පැමිණිලා නැහැ, මොන වාගේ business model එකක්ද මෙතැන තිබෙන්නේ කියලා. 1වැනි ප්‍රශ්නයට අදාළව උත්තර දුන්නේ නැතත්, මම ඊළඟ ප්‍රශ්නයට අදාළ උත්තරයේ කොටසක් හැටියට එය පැහැදිලි කළා.

3.

| 2026.01.31 දිනට ණය | ලංකා රුපියල් මිලියන | එක්සත් ජනපද ඩොලර් මිලියන |
|---|---|---|
| මහා භාණ්ඩාගාර ඇපකර ණය | 152,010.86 | 491.23 |
| ගුවන්යානා කල්බදු වගකීම් මෙහෙයුම් කල්බදු | 111,865.34 | 361.50 |
| බැංකු ණය හා බැංකු අයිරා පහසුකම් | 22,626.25 | 73.12 |
| අන්තර් සමාගම් වගකීම් | 21,022.25 | 67.93 |
| එකතුව | 307,524.70 | 993.78 |

4. මම කලිනුත් පැහැදිලි කළා වාගේ "ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ තෝරාගත් ණය ගෙවීම සඳහා ත්‍රෛපාර්ශ්වික ගිවිසුම අවසන් කිරීම" යන විෂය යටතේ අංක 25/1884-804/122-1 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මත ගන්නා ලද 2025.10.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ඩොලර් ණයවලට අදාළව පවතින සියයට 6ක පොලී අනුපාතය හා රුපියල් ණයවලට අදාළව පවතින SLFR+1% පොලී අනුපාතයට අදාළ සමාන වාරිකවලින් ඉදිරි පස් අවුරුදු කාලය සඳහා අර්ධ වාර්ෂිකව ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ ණය ගෙවීමට අනුමැතිය ලබා දෙන ලදී. ණය විස්තර පහත දැක්වෙන පරිදි වේ.

ලංකා බැංකුව - මුළු හිඟ ණය 2025.04.30 දිනට

එක්සත් ජනපද ඩොලර් 106,946,105.94

ලංකා රුපියල් 13,256,075,342.47

මහජන බැංකුව - මුළු හිඟ ණය 2026.04.30 දිනට

එක්සත් ජනපද ඩොලර් 111,109,814.13

ලංකා රුපියල් 20,296,032,921.72

- ඒ අනුව ලංකා රුපියල් ණය මුදල්වල පළමුවන වාරිකය පහත දැක්වෙන ආකාරයට 2025 දෙසැම්බර් මස ගෙවන ලදී.

  ලංකා බැංකුව - රු.7,695,297,873.54

  මහජන බැංකුව - රු.8,767,324,353.48

- එක්සත් ජනපද ඩොලර් ණය මුදලේ පළමුවන වාරිකය නිදහස් කරන ලදී.

  Rs. 309.7101 විනිමය අනුපාතයට එක්සත් ජනපද ඩොලර් 28,456,297.57කට සමාන රු.8,813,202,766.03ක මුදලක්

  (ලංකා බැංකුවට - එක්සත් ජනපද ඩොලර් 13,956,466.83, මහජන බැංකුව - එක්සත් ජනපද ඩොලර් 14,499,830.74)

- තවද, 2026 වර්ෂයේ සිට ඉදිරියට වගකීම් පහත දැක්වෙන පරිදි වේ.

[ගරු අනුර කරුණාතිලක මහතා]

| බැංකුව | ණය මුදල ශ්‍රී ලංකා රුපියල් | ණය මුදල එක්සත් ජනපද ඩොලර් |
|---|---|---|
| ලංකා බැංකුව | 11,930,467,808.22 +පොලිය | 96,251,495.34 +පොලිය |
| මහජන බැංකුව | 18,266,429,629.55 +පොලිය | 99,998,832.72 +පොලිය |
| එකතුව | 30,196,897,437.77 +පොලිය | 196,250,328.06 +පොලිය |

(Rs. 7,695,297,873.54 + Rs. 8,767,324,353.48 + Rs. 8,813,202,766.03 = Rs. 25,275,824,993.05)

5. ඇත්ත වශයෙන්ම, SriLankan Ground Handling Limited ලෙස වෙනත් ආයතනයක් ස්ථාපිත වෙලා නැහැ. ඒක SriLankan Airlines සමාගම යටතේම තමයි ක්‍රියාත්මක කරන්නේ. නමුත්, SriLankan Catering Limitedවල වෙනම විගණන ගිණුම් පවත්වාගෙන යනවා.

බදුවලට පසු වසර සඳහා ශුද්ධ ලාභය/(පාඩු) (ගණන් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා රුපියල් මිලියනවලින් සඳහන් කර ඇත.)

| මූල්‍ය වර්ෂය | SriLankan Airlines Limited | SriLankan Catering Limited |
|---|---|---|
| 2020/21 | (45,231.46) | (909.23) |
| 2021/22 | (166,369.68) | 2,802.70 |
| 2022/23 | (73,621.53) | 4,697.21 |
| 2023/24 | 3,870.86 | 4,054.24 |
| 2024/25 | (7,594.56) | 4,859.73 |

6. බොහෝ වෙලාවට ඉන්දියාව වෙත පමණක් කෙරෙන කෙටි දුර ගමන්වලදී ගුවන් මගී මෙහෙයුම්වල පිරිවැය cover වෙන්නේ නැහැ. නමුත්, අපට මේ ගුවන් ගමන් පිළිබඳ බලන්න වෙන්නේ සම්පූර්ණ කොළඹ සිට ඒ අදාළ ගමනාන්ත වෙත කෙරෙන ගුවන් ගමන් ගැන විතරක් බලලා නොවෙයි. බොහෝ වෙලාවට මේක කටයුතු කරන්නේ connectivity එක අනුව. එතකොට, කෙනෙක් චෙන්නායිවල ඉඳලා කොළඹට ඇවිල්ලා, කොළඹ ඉඳලා මෙල්බර්න්වලට යනවා වෙන්න පුළුවන්. එතකොට අපට අන්න ඒ business model එක මත තමයි මේ කෙටි දුර සඳහා වන ගමනාන්ත පිළිබඳ සලකා බලන්න වෙන්නේ. එතකොට ඒ ගුවන් මාර්ග ලාභය ලැබීම පිළිබඳව වෙන් වශයෙන් ඇගයීම් කරන්න බැහැ. එසේ නොකළ යුතුයි කියන එක තමයි අපේ හැඟීම. කෙසේ වුවත්, ගුවන් සේවය මඟින් ගුවන් ගමන් මාර්ගවල කාර්යසාධනය අඛණ්ඩව සමාලෝචනය කරන අතර, අවශ්‍ය වූ විට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමක් කරනවා. කාලයෙන් කාලයට එක් එක් routesවලට සහ ඒවාට දෙන connectivity සලකා බලා, ඒ connectivityවල analysis එකක් කරලා, ඒකේ තිබෙන මූල්‍ය ලාභය සහ පාඩුව පිළිබඳව ඇගයීමක් කරලා, සමහර අවස්ථාවලදී ඒ නිශ්චිත ගුවන් ගමනාන්තයකදී අප ලාභ ලබන්නේ නැත්නම් සහ ඒවායින් අනෙකුත් connectivityවලට ලොකු බලපෑමක් කරන්නේ නැත්නම් ඒ වාගේ දේවල් අහෝසි කරන්න අපි කටයුතු කර තිබෙනවා. උදාහරණයක් හැටියට, අබුඩාබි වෙත ගමන් කරන ගුවන් ගමන් වාර අපි 2025 සැප්තැම්බර් මාසයේ ඉඳලා නවත්වා තිබෙනවා. ඒ වාගේම, විශේෂයෙන්ම ආසියානු ගුවන් මාර්ගවල ලාභදායී තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා විවිධ උපක්‍රම භාවිත කර තිබෙනවා. උදාහරණයක් හැටියට කියන්න පුළුවන්, ව්‍යාපාරික පන්තියේ ආසන අඩු කිරීම. ඒ වාගේම සාමාන්‍ය පන්තියේ ධාරිතාව වැඩි කිරීම, ගුවන් යානා දෙකක මැදිරි නැවත ක්‍රියාත්මක කිරීම ආදී විවිධ උපක්‍රම භාවිත කරලා ඒවායේ මෙහෙයුම් අලාභය අවම කර ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

සාමාන්‍යයෙන් ගත්තොත්, 2024-2025 මූල්‍ය වර්ෂය සඳහා Overall Load Factor - OLF - එක සියයට 70.10ක වාගේ ප්‍රමාණයක තමයි තිබෙන්නේ. නමුත්, 2026 ජනවාරි මාසය වෙනකොට මේ OLF අගය සියයට 72.3 දක්වා වැඩි කර ගන්න සමත් වෙලා තිබෙනවා. ඒ අනුව ශ්‍රීලන්කන් ගුවන් සේවයේ තිබෙන මූල්‍යමය තත්ත්වයේ යම්කිසි වර්ධනයක් අපි මේ වෙනකොට අත්පත් කරගෙන තිබෙනවා. නමුත්, ඒක තවමත් අර ලාභදායී තත්ත්වයට ගෙනෙන ප්‍රමාණය නොවෙයි.

ඒ සංඛ්‍යාව දැනට තිබෙන්නේ ගුවන් යානයක් සඳහා කාර්ය මණ්ඩලය 127ක් වාගේ අගයක්. නමුත්, මේ වාගේ ගුවන් සේවාවක් ක්‍රියාත්මක කිරීමේදී ගුවන් යානාවලට සාපේක්ෂවම කාර්ය මණ්ඩලය කියන එක තීරණය කරන්න බැහැ. සමහර සේවාවන් පවත්වාගෙන යෑම සඳහා අපට ඒ අවම සේවක සංඛ්‍යාව පවත්වාගෙන යන්න අවශ්‍යයි කියලා අපි හිතනවා.

7.

| මූල්‍ය වර්ෂය | ශ්‍රී ලංකාවට පැමිණි මුළු ගුවන් මගීන් සංඛ්‍යාව (දහස් ගණනින්) | SriLankan Airlines සමාගම මඟින් රැගෙන ආ මුළු මගීන් සංඛ්‍යාව (දහස් ගණනින්) | SriLankan Airlines සමාගම මඟින් රැගෙන එන ලද ගුවන් මගීන් සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් (දහස් ගණනින්) |
|---|---|---|---|
| 20/21 | 145 | 100 | 69% |
| 21/22 | 1,386 | 736 | 53% |
| 22/23 | 2,774 | 1,700 | 61% |
| 23/24 | 3,889 | 1,809 | 47% |
| 24/25 | 4,446 | 1,744 | 39% |

2024-2025 කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණි මුළු ගුවන් මගීන් සංඛ්‍යාව 4,446ක්. මෙයින් SriLankan Airlines එක හරහා 1,744ක් පැමිණිලා තිබෙනවා. ඒ අනුව බැලුවාම මුළු ගුවන් මගීන් සංඛ්‍යාවෙන් සියයට 39ක් SriLankan Airlines එක තමයි භාවිත කර තිබෙන්නේ. මේක විශ්ලේෂණය කරලා බලද්දී, උදාහරණයකට ගත්තොත් 2021දී සියයට 69යි. 2022දී එය සියයට 53 දක්වා අඩු වෙලා තිබෙනවා. මේ ප්‍රතිශතයේ කිසියම් විධියක අඩුවීමක් අපට නිරීක්ෂණය කරන්න පුළුවන්.

8. රාජ්‍ය බැංකු ණය ප්‍රතිගෙවීම් හේතුවෙන් අනාගතයේදී සිදු විය හැකි ඇස්තමේන්තුගත ස්කන්ධ ලැබීම් සම්බන්ධයෙන් 2026 අප්‍රේල් 30වැනි දා ඉඳලා 2030 අප්‍රේල් 30 දක්වා වන තොරතුරු පහත පරිදි වේ.

| දිනය | මුදල (ශ්‍රී ලංකා රුපියල් මිලියන) |
|---|---|
| 30 - Apr - 2026 | 13,318 |
| 31 - Oct - 2026 | 13,005 |
| 30 - Apr - 2027 | 12,596 |
| 31 - Oct - 2027 | 12,272 |
| 30 - Apr - 2028 | 11,885 |
| 31 - Oct - 2028 | 11,538 |
| 30 - Apr - 2029 | 11,154 |
| 31 - Oct - 2029 | 10,805 |
| 30 - Apr - 2030 | 10,432 |

- පොලී අනුපාතයේ කිසිදු වෙනසක් නැති බව හා එක්සත් ජනපද ඩොලරයක් රුපියල් 308ක ස්ථාවර විනිමය අනුපාතයක් ලෙස සලකා ඉහත අගයන් සකසා ඇත.

ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් හැටියට කිව්වොත්, 2026 අප්‍රේල් 30 වන විට එය රුපියල් මිලියන 13,318ක් වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒක 2030 වර්ෂය වන විට රුපියල් මිලියන 10,432ක් දක්වා අඩු වෙයි කියලා අපි මේ වන විට ඇස්තමේන්තු කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ස්වෛරී බැඳුම්කරවල දැනට එක්සත් ජනපද ඩොලර් මිලියන 188ක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. බොහොම සවිස්තර උත්තරයක් ලබා දුන්නා. එහෙම තමයි පාර්ලිමේන්තුවට උත්තර දිය යුත්තේ. මේ සම්බන්ධයෙන් මම අහන්නේ මේකයි. 2023-2024 වර්ෂයේ ලාභයක් ලබාගෙන, 2022-2023 වර්ෂයේත් ලාභයක් ලබාගෙන, 2024 වර්ෂය වනකොට අලාභයක් ලබනවා. 2025-2026 වනකොට ඊට වඩා අධික අලාභයක් ඇති වෙලා තිබෙනවා. ඒක තවම වාර්තා වෙලා නැහැ. එසේ තිබියදීත් ඔබතුමන්ලා 2025 වර්ෂයේ බෝනස් එකක් ගෙව්වේ ඇයි කියන ප්‍රශ්නය දැන් මතු වෙලා තිබෙනවා. මොකද, අලාභ ලබන ආයතනවලට බෝනස් ගෙවීම තහනම් කරලා තිබෙනවා. ඒ නිසා කොයි ආකාරයෙන්ද එහෙම ගෙවා තිබෙන්නේ කියලා මම අහනවා.

ඒ වාගේම මේක IMF එකේ සාකච්ඡාවට බඳුන් වෙලා තිබෙන ආයතනයක්. ඒ සම්බන්ධයෙන් වාණිජකරණයකට ලක් කිරීම අවශ්‍යයි. මම 8වැනි ප්‍රශ්නය යොමු කළේ, ඒකෙන් උත්තරයක් ලබා ගන්න. ඒ උත්තරයත් එකතු කරලා, මගේ ප්‍රශ්නයට පැහැදිලි උත්තරයක් ලබා දෙන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔව්. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තවශයෙන්ම තර්කයක් හැටියට ගත්තොත්, අලාභ ලබන ආයතනයක් බෝනස් ගෙවන්නේ කොහොමද කියන එක සාධාරණ ප්‍රශ්නයක්. නමුත් ශ්‍රීලන්කන් ගුවන් සේවයට අදාළ පනත වෙනත් විධියකින් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඔබතුමාත් දන්නවා, ඒ පිළිබඳව. ඒ සේවකයන් අතර කාර්මික සාමය පවත්වාගෙන යෑම සඳහාත්, ඒ වාගේම ගුවන් යානා මෙහෙයුම් කටයුතුවලට බාධාවක් ඇති නොවීම සඳහාත් - ඒ කාරණා සලකා බලා - අනෙකුත් ආයතනවල බෝනස් ගෙවන පදනමට වඩා අඩුවෙන් සලකා බලා තමයි බෝනස් හැටියට කිසියම් ගෙවීමක් කරන්න ශ්‍රීලන්කන් ගුවන් සමාගම කටයුතු කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* මම හිතන විධියට, ඒකත් එක්ක කිසි ගැටලුවක් මේ වනකොට පැන නැඟිලා නැහැ. IMF ක්‍රියාවලියත් එක්ක මේකේ ගැටලුවක් පැන නැඟිලා නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Hon. Speaker, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 යටතේ මම මේක අහන්නේ. පෙරේදා මම ඉදිරිපත් කළා, වරප්‍රසාද ප්‍රශ්නයක්. ඒකේ කොටසකට විතරයි උත්තර දීලා තිබුණේ. ඔබතුමා ඒ ගැන අද කියන්නම් කිව්වා. මට හෙටත් මගේ වැඩකටයුත්තක් සඳහා යන්න තිබෙනවා.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 29(1)හි මෙසේ සඳහන් වනවා:

> "පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට සෘජුව ම සම්බන්ධ හදිසි යෝජනාවක් අන් සියලු යෝජනාවන්ද එදිනට නියමිත සියලු කටයුතු ද අබිබවා මුලස්ථානය ගනු ලැබිය යුත්තේය. පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට සෘජුව ම සම්බන්ධ ප්‍රශ්නයක් මෑතක දී පැන නැඟ තිබෙන විට, ඡන්දය ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් මත වූ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පාර්ලිමේන්තුවේ කටයුතු කවර හෝ වේලාවක දී තාවකාලිකව නතර කරනු ලැබිය හැකි ය."

ඒ වාගේම මෙහි දෙවැනි කාරණය ගත්තොත්, මම ඔබතුමාට ලිපියක් දීලා තිබෙනවා, එම නිසා කරුණාකරලා මට ඉඩ දෙන්න, මේක ඉදිරිපත් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, උදෑසන 8.53ට මට ඔබතුමාගේ දීර්ඝ ලිපියක් හම්බ වුණා. ඒ ලිපිය සම්බන්ධයෙන් වාර්තාවක් මට ලබා දෙන්න කියලා මම ලේකම් මණ්ඩලයට දැනුම් දුන්නා. *[බාධා කිරීමක්]* ඒ සම්බන්ධව ඔබතුමා ස්ථාවර නියෝග 29 (1) වාගේම 29 (2)ත් කියෙව්වා නම් හොඳයි කියලා හිතනවා. එහි සඳහන්ව තිබෙනවා, ඒ සඳහා මූලාසනයේ අවසරය ලබා ගත යුතු බව. මම ලේකම් මණ්ඩලයෙන් වාර්තාව ලබා ගත්තාට පස්සේ ඔබතුමාව දැනුවත් කරන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා ස්ථාවර නියෝග අංක 118 යටතේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව සම්බන්ධයෙන් තිබෙන කාරණා කියවා බලන්න කියලා. ඒකේ තිබෙනවා, බැලූ බැල්මට පෙනෙන පරිදි වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම් එය විභාග කිරීමේ, විමර්ශනය කිරීමේ අයිතිය එම කාරක සභාවට තිබෙන බව. ගරු කථානායකතුමනි. එම නිසා මට මේක ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධව ඔබතුමාට ස්ථාවර නියෝග 29(1) යටතේ වාර්තාව ලබා දීමට කටයුතු කරන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට හෙට උදෑසන වෙන වැඩ වගයක් කරගන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට වාර්තාව ලබා දීමට ඉදිරියේදී කටයුතු කරනවා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
### தொலைத்தொடர்பு அறவீடு (திருத்தம்) சட்டமூலம்
### TELECOMMUNICATION LEVY (AMENDMENT) BILL

"2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2026 මැයි 20වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 மே 20, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education;*

*to be read a Second time upon Wednesday, 20th May, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

### මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත
### நிதி (திருத்தம்) சட்டமூலம்
### FINANCE (AMENDMENT) BILL

"Bill to amend the Finance Act, No. 35 of 2018."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2026 මැයි 20වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 மே 20, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education;*

*to be read a Second time upon Wednesday, 20th May, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

### ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත
### தேசிய சூழல் (திருத்தம்) சட்டமூலம்
### NATIONAL ENVIRONMENTAL (AMENDMENT) BILL

"1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ පරිසර අමාත්‍ය ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා විසිනි.***

***2026 මැයි 20වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*சுற்றாடல் அமைச்சர் மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 மே 20, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Dammika Patabendi, Minister of Environment; to be read a Second time upon Wednesday, 20th May, 2026 and to be printed;*

*and to be referred to the Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. You have 16 minutes.

# බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත
# மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்கவகையின்மை (கூட்டிணைப்பு மற்றும் தனிப்பட்ட) சட்டமூலம்
# RESCUE, REHABILITATION AND INSOLVENCY (CORPORATE AND PERSONAL) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[10.53 a.m.]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

Hon. Speaker, I move,

"That the Bill be now read a Second time."

Sir, this is a landmark piece of legislation that most of the persons in the legal profession, the academia as well as the business community have been awaiting, and discussions with regard to this law have been going on for a long time. I am grateful to the Government and also I am glad that our Government has finally been able to bring in this Bill to be made into a law.

At the start, I must mention that many worked towards bringing in this law: especially, the IMF, providing technical support, the Hon. Attorney-General, my own legal team at the Ministry, the Legal Draftsman as well as the Government Printer. You would see that this is amalgamating a lot of laws and it is a voluminous piece of law. So, there was a lot of effort involved. This was considered and handled by the Subcommittee under the Chairmanship of Mr. Chanaka de Silva, President's Counsel appointed by the Law Commission of Sri Lanka. I am very grateful to Mr. Chanaka de Silva, President's Counsel for his contribution. He worked on this with us continuously, tirelessly and assisted all of us, including myself today, for which I am, again, grateful and thankful.

Sir, now, I will give a brief overview of the rescue, rehabilitation and insolvency legal regime. All economies in the world, both corporate and personal, function on credit. Therefore, efficient management of credit and recoveries are essential to the smooth functioning of an economy. In every economy, there would be situations where people or business entities would be in financial distress or facing debt default. Some of them will result in corporate failures and personal insolvency situations. Therefore, without robust laws to deal with such situations, business and personal financial failures could create chaos in a society. We saw many situations like that in the past, perhaps, due to Cyclone "Ditwah" or COVID-19. In the absence of a robust legal regime for regulation or to deal with financial distress and insolvency situations, there would be disorder, a race to grab assets, it could lead to favoritism and side deals, some people would get their monies advanced while others would not and consequently, confidence in the financial system would erode. And, it is to address those negative impacts that this important piece of legislation is being presented today for its Second Reading.

Before I deal with the negative impacts, it is important to understand the present legal regime in the country. Sri Lanka's system is still largely traditional and liquidation-focused, though reforms have been discussed. In the existing legal framework in Sri Lanka, there are only two key laws for regulation of insolvency: the Insolvency Ordinance of 1853, which was last amended in 1884 and which is at least over 100 years old and outdated, and that is for individuals and partnerships. Then the Companies Act, No. 07 of 2007. This Act applies to companies. The Companies Act provides for winding up of companies and is governed by The Companies Winding Up Rules of 1939. Therefore, we understand that our legal system is very old and that issue needs to be addressed. As regards the scheme of the current legislation, our laws are structured for winding up - liquidation - of financially distressed entities, this could be either compulsory or voluntary, and then, there is declaration of bankruptcy for individuals and partnerships. There is very limited scope available in law for restructuring distressed entities. Under the Companies Act of 2007, under judicial supervision, there is a process and a scheme of arrangement with limited scope for companies, which is rarely used. No such regime for partnerships or individuals exists under the current system. So, the current legal regime is strong on liquidation, but weak on rescue and rehabilitation. Therefore, it is that last aspect this law is trying to address.

As far as the shortcomings of the current legislation are concerned, liquidation functions on insolvency. That is, failure of liquidity, which is the inability to pay debts, as they become due. This prevents further credit, even if there is a possibility or potential for a business to be rescued or resurrected. The result is, even potentially viable businesses often end up being liquidated. The consequences are, businesses in distress often delay action until collapse, enter into informal workouts often lacking transparency to stakeholders, banks accumulate non-performing loans and economic value is often destroyed rather than preserved.

It is important to look at the approach of other countries in this regard. Actually, we are fortunate to bring in the law this year because we had the chance of absorbing or following examples set by the rest of the world, especially India. Whatever shortcomings that existed in their legislation, we were able to fix in ours. So, it is a timely piece of legislation. If you look at other countries, rescue and rehabilitation regimes for corporates, partnerships and individuals are very common and are an integral part of the legal systems of developed countries. Chapter 11 of the United States of America is one of the best-known pieces of legislation of this nature and the Insolvency Act of 1986 of the United Kingdom,

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

as updated and supplemented, the Insolvency, Restructuring and Dissolution Act of 2018 of Singapore and the Insolvency and Bankruptcy Code of 2016 of India are some others.

In fact, it is through the technical assistance provided by the World Bank that we were able to draw all their experiences. Specifically, India, which used to have a situation very similar to that of our country, reaped very tangible benefits from their Insolvency and Bankruptcy Code or the IBC enacted in 2016. It changed the credit culture or the deterrence effect, as they call it, improved debt settlements observed and also improved the financial culture with average transition times from "overdue" back to "normal" status dropping from around 300 days in 2020 to less than 90 days by 2024. It helped in the recovery of "stuck" capital. It is reported that in the financial year 2024-2025, the Insolvency and Bankruptcy Code of 2016 of India accounted for nearly 48 to 52 per cent of all recoveries made by scheduled commercial banks. Realizations through rescue plans have been observed to deliver 171 per cent of the company's liquidation value. This is according to the publications of the Insolvency and Bankruptcy Board of India. This also results in claimants receiving better benefits and outcomes than through liquidation. So, we can see how these laws could benefit industry and commerce and in general, the economy of the country. Since the enactment of the Insolvency and Bankruptcy Code of India, their banking health has improved. The non-performing loan ratios have significantly improved since the enactment of it, as I mentioned earlier. The gross NPA ratio in India reached a low 2.0 per cent by December, 2025, according to the Monetary Policy Report of the Reserve Bank of India issued in April, 2026. The Reserve Bank of India attributes that to the effect of the IBC.

Business continuity and employment preservation are other important aspects which enable a business to be sold "as a whole" without dismantling assets and businesses to recover.

Now, I will cite a few well-known examples of restructuring under Chapter 11 of the USA. The restructuring of the Delta Airlines was commenced in 2005 and its revival was made in 2007. Then, the United Airlines' revival was in 2006 and the General Motors' revival took place within 40 days after commencing its restructuring in 2009! - *[Interruption.]* The restructuring of Marvel Entertainment was commenced in 1996 and the revival was made in 1998.

Now, if we take the reform efforts in Sri Lanka, there has been consistent calls for reforms by business owners and Chambers of Commerce.

It has always been contemplated that a comprehensive legal regime for rescue, rehabilitation and insolvency would be introduced in Sri Lanka. Therefore, even when the Companies Act was being reformed, the insolvency regime was not substantially reformed because even at the time, the discussion was to bring in this Bill separately.

If we have a broad overview of the Bill, it deals with rescue and insolvency of corporates, individuals and partnerships and makes special provisions for micro, small and medium enterprises, to which, hereinafter, I will refer as MSMEs. This Bill makes comprehensive provision for rescue and rehabilitation of business entities, in addition to providing for liquidation and bankruptcy. It also makes provision for full participation of creditors in decision-making relating to rescue and rehabilitation. It provides for orderly creditor participation in rescue, rehabilitation and restructuring, too. If decisions are taken to rescue and rehabilitate, it provides for a moratorium on legal action against the debtor entities, enabling the process of rescue and rehabilitation. Then, there is also provision for orderly liquidation and bankruptcy proceedings, in the event rescue and rehabilitation is not possible. The Bill sets out clear orders of precedence of debt for the purpose of orderly recovery of debt, makes provision for the establishment of a Regulatory Authority for the purpose of supervision of such proceedings and the participation of qualified insolvency professionals licensed by the Regulatory Authority, on which I will give more detail, if time permits. Overall, court supervision is provided for as required by the parties and is not essential to conduct the processes.

This Bill will repeal the old Insolvency Ordinance, which is completely outdated, as I told you earlier, and amend the Companies Act by repealing provisions relating to liquidation and administration and the Inland Revenue Act by repealing provisions relating to liquidation. Both are Amendments since elaborate provisions relating to liquidation and administration are made in this Bill.

If we take special regimes, the Bill makes provision for very fast resolutions in situations where the debtors have "no assets" or "no income". If you look at the Bill, provisions in pages 107 onwards under Part V deals with that. For restructuring of MSMEs, provision is made from page 314 onwards under Part XI of the Bill. That would be of major help to low-income people and MSEMs burdened under the weight of debt. Another important aspect dealt by this Bill is the "no assets" and "no income" debtor protection. It provides relief for persons with debts under Rs. 2 million and a monthly surplus income of Rs.100,000 or less. In such circumstances, the Official Receiver may make a recommendation for a Debt Rehabilitation Order. When such order is in effect, creditors cannot enforce the debt against the debtor. The debtor will have to fulfil the conditions of the DRO; that is, to make payment, as set out in it or based on his capacity. After one year or an extended period of 90 days, a Certificate of Discharge will be given to the debtor. What is important is that, when discharged from the Debt Rehabilitation Order, the debtor's included debts shall be cancelled and the debtor shall not be liable to pay any part of the debts, including any interest, fees or charges which may have become payable in relation to those debts.

Then, micro, small and medium-sized enterprise - MSME - protection. MSME protection is available to an MSME debtor. An MSME debtor is a company which has a total debt, secured and unsecured, of less than Rs. 50 million. Such a debtor can seek an MSME Company Debt Restructuring Arrangement in terms of Section 278 of the Act; the process is set out in the provisions. An MSME Company Debt Restructuring Arrangement approved by court is binding on all the creditors who are affected by the terms of the Arrangement. An MSME Company Debt Restructuring Arrangement shall be completed when all of the obligations that it created have been discharged. When such Arrangement is completed, under Section 291 (4), the debts affected by the Arrangement shall be cancelled and the MSME debtor shall not be liable to pay any part of the debts.

Sir, as I mentioned earlier, this is a very comprehensive law and it encompasses almost everything the current law was unable to focus on. Since there is no more time to go into the details of this Bill, I wish, after listening to its overview, the Opposition would support us in making it into a law by passing it today.

Thank you very much.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is it, Hon. (Dr.) Harsha de Silva?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I need one clarification from the Minister.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can raise it during your speech.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට කථාවක් කරන්න නැහැ. මට clarification එකක් පමණයි අවශ්‍ය වන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු ඇමතිතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට stakeholdersලා කණ්ඩායම් 15ක් ආවා. ඊට පස්සේ අපි ඔබතුමාට යෝජනා 23ක් ඉදිරිපත් කළා. ලේකම්තුමිය ඇතුළු සියලුම අය එදා හිටියා. ඒවායෙන් යෝජනා 2ක් ගැන විතරක් මම ඔබතුමාගෙන් අහන්නම්. ඒවා Committee Stage එකේදී ගේනවාද? It is regarding just two proposals.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Hon. Member, I will explain that.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට - MSME කට්ටියට - දින 60ක් තිබෙනවා, ණය හිමියා සමඟ සාකච්ඡා කරලා උසාවියේ restructuring එකකට එන්න. දින 60යි තිබෙන්නේ. ඒක බැරි වුණොත්, දින 90ක් දක්වා දීර්ඝ කරන්න පුළුවන්. ඒක, හතර වතාවක් අධිකරණයෙන් දීර්ඝ කරගන්න පුළුවන්. හැබැයි, ගරු ඇමතිතුමනි, එතැන දී සාකච්ඡා කරලා ලේකම්තුමියටත් දන්වා සිටියා, Committee Stage එකේ amendment එකක් ගෙනැල්ලා දින 60 කියන එක දින 180 කරන්න ඕනෑ කියලා. ඔබතුමා දන්නවා, මේ පරාටේ නීතිය ලංකාවේ තිබෙන නීතියක් කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. (Dr.) Harsha de Silva, please wrap up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක සාමාන්‍යයෙන් පාවිච්චි වෙන නීතියක් නොවෙයි. දින 60 හොඳටම මදියි. ඒක දින 180ක් දක්වා දීර්ඝ කරන්න Committee Stage එකට ගෙනෙන්න කියලා අපි එදා යෝජනා කළා. ඒක ගේනවාද කියලා තමයි අහන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ගොඩක් ස්තුතිවන්ත වෙනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව රැස්වෙලා නොතිබුණු අවස්ථාවක දී පවා ඉතා ශීඝ්‍රයෙන්, වේගයෙන් එම කමිටුව කැඳවලා අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් ඇමතිවරයා වශයෙන් මම ඉස්සෙල්ලාම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

Committee Stage එකේදී කරන්න කියලා ගොඩක් කට්ටිය අපට amendments propose කළා. ඒ සමහර දේවල් සාකච්ඡා කිරීමේදී නීතිපතිවරයා විසින් අපට CoC එක එවලා තිබුණේ ඒ සමහර වෙනස්කම් -ඔබතුමාගේ එක විශේෂයෙන්ම මෙතැන තිබෙනවාද කියලා මට මතක නැහැ - මේ නිශ්චිත මොහොතේ Committee Stage එකේදී කරන්න බැහැ කියලායි. ඒ නිසා අපි ඒ වෙනස්කම් Committee Stage එකේදී කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, තවත් සංශෝධන කිහිපදෙනෙක් විසින් යෝජනා කරන නිසා ඉතා ඉක්මනින් කමිටුව කැඳවා ඔබතුමා ඉදිරිපත් කරන යෝජනාවත් එම කමිටුව වෙත නැවත ඉදිරිපත් කර ඔබතුමාගේ අදහස්ද අරගෙන අවශ්‍ය නම් සංශෝධනයක් ඉක්මනින්ම ගෙන ඒමට බලාපොරොත්තු වෙනවා. නමුත් ඒක අපි අද Committee Stage එකේදී කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Mujibur Rahuman. You have 12 minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Ravi Karunanayake, your name is on the list of speakers for today. So, you can raise your matters at that time.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you may commence your speech.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, your request was turned down by the Hon. Speaker. So, if I permit it now, it would be demeaning the Hon. Speaker.

Hon. Mujibur Rahuman, please commence your speech.

[පූ.භා. 11.11]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත යටතේ මට කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මේ වෙනකොට මේ රටේ ආන්දෝලනාත්මක සිද්ධියක් බවට පත් වෙලා තිබෙන, මුදල් අමාත්‍යාංශයේ ඩොලර් මිලියන 2.5ක් - ඩොලර් ලක්ෂ 25කට ආසන්න මුදලක් - අතුරුදහන් වීම සම්බන්ධයෙන් කථා කරන්න විපක්ෂය හැටියට අපි ඊයේ දවසේ විවාදයක් ඉල්ලුවා. මෙහිදී අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ වාගේ වැදගත් කාරණාවක් රටේ මතු වෙලා තිබෙද්දී, භාණ්ඩාගාරයේ මුදල් අතුරුදහන් වෙලා තිබෙද්දී - ලංකා ඉතිහාසයේ කිසිම විටෙක මුදල් අමාත්‍යාංශය විසින් මුදල් වැරදි ලෙස ගෙවා නැහැ - විපක්ෂයක් හැටියට අපි ඒ සම්බන්ධයෙන් විවාදයක් ඉල්ලුවාම ඒ විවාදයට ඉඩ නොදී ඒක යටපත් කරන්න උත්සාහ දැරීමම සැක සහිතයි. ඇයි ඒක ගැන කථා කරන්න ඉඩ දෙන්නේ නැත්තේ? ඒ අනුව අපට සිද්ධ වුණා ස්ථාවර නියෝග යටතේ මන්ත්‍රීවරු 20දෙනෙක් නැඟිට ඉඳලා විවාදයක් ඉල්ලන්න. ඒ විවාදයත් පැය භාගයකින් අඩු කළා. ඉතින්, අපට තේරෙන්නේ නැහැ ආණ්ඩුවේ මේ හැසිරීම පිළිබඳව. ඇයි මේක ගැන කථා කරන්න ඉඩ දෙන්නේ නැත්තේ?

මේ මැරුණු පුද්ගලයා ආණ්ඩුවට සම්බන්ධ ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරිකයෙක් කියලාත් සියලු දෙනාම දන්නවා. ඔහුගේ මරණය සම්බන්ධවත් නොයෙකුත් ආකාරයේ කථා තිබෙනවා. ඒ හින්දා තමයි විපක්ෂය හැටියට අපි මේක ගැන කථා කරන්න විවාදය ඉල්ලුවේ. මොකද, මේක අද මේ රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක්, ලංකාවේ මුදල් අමාත්‍යාංශයේ ඩොලර් මිලියන 2.5ක් හොරකම් කරපු එක. ආණ්ඩුවේ ඉන්න නායකයන්ට ඒක සුළු ගාණක් වෙන්න පුළුවන්. ඒගොල්ලන්ට මේක ප්‍රශ්නයක් නොවෙන්න පුළුවන්. නමුත් මේ රටේ ජනතාවගේ මුදල් හොරකම් කරපු එක ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය ගැන කථා කරන්න ඉඩ දෙන්නේ නැත්තේ ඇයි? විවාදය ඉල්ලුවාම විවාදයක් දෙන්නේ නැත්තේ ඇයි? පැය දෙකක් ඉල්ලුවාම, පැය එකහමාරකට ඒක අඩු කරලා මේ ප්‍රශ්නය යට ගහන්න උත්සාහ කරන්නේ ඇයි? ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට අද මේ තිබෙන විවාදයේදීත් මේ ගැන තමයි කථා කරන්න වෙන්නේ. මොකද, ආණ්ඩු පක්ෂය තහංචි දානවා නම්, අපට වෙනවා අපේ මේ තිබෙන වේලාවත් ඒ වෙනුවෙන් පාවිච්චි කරලා ජනතාව දැනුවත් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේ සිද්ධිය වෙලා තිබෙනවා කියන කාරණය. මේ සිද්ධිය වෙන්නේ දෙසැම්බර් මාසයත්, ජනවාරි මාසයත් අතර. එතකොට මේ සිද්ධිය වෙලා මාස තුනකින් පසුව තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධව පැමිණිලි යන්නේ. මේ සම්බන්ධව ආණ්ඩුව පාර්ලිමේන්තුව දැනුවත් කරන්නෙත් නැහැ. පාර්ලිමේන්තුව විතරක් නොවෙයි, රටේ ජනතාව දැනුවත් කරන්නෙත් නැහැ. අර මෛත්‍රී ගුණරත්න නීතිඥ මහත්මයාගේ ලිපිය ආවාට පසුව තමයි ආණ්ඩුව මේ සම්බන්ධව කට අරින්නේ. ඒ වනතුරු ආණ්ඩුව කසාය බීපු ගොළුවෝ වාගේ කට වහගෙන හිටියා. ඒගොල්ලෝ කිසි කෙනෙක් මේ ගැන කට ඇරියේ නැහැ. අපි දන්නවා, මේ රටේ පොඩි වැස්සක් වැස්ස ගමන් ජනාධිපතිතුමා දුවගෙන එනවා, පාර්ලිමේන්තුවට. දැන් මේ මහ වැස්සක් වැහැලා තිබෙනවා, ජනාධිපතිතුමා නැහැ. ජනාධිපතිතුමා අනික් අයගේ අමාත්‍යාංශ වෙනුවෙන් ඇවිල්ලා මෙතැන උත්තර දුන්නා, පසුගිය කාලයේ. ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශයේ සල්ලි මේ නැති වෙලා තිබෙන්නේ; හොරකම් කරලා තිබෙන්නේ. හරි නම් මුදල් ඇමතිවරයා හැටියට එතුමා එන්න ඕනෑ, පාර්ලිමේන්තුවට. ඇවිල්ලා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න ඕනෑ. එතුමා ඕනෑ නැති දේවල්වලට ඇවිල්ලා ප්‍රකාශ කළා, පසුගිය මාස තුන හතරේම. නමුත් දැන් රටේ වැදගත්ම ආයතනයේ මුදල් හොරකම් කරලා තිබෙනවා. හැබැයි, ජනාධිපතිතුමා අතුරුදහන්. ඒ ගැන තව වෙනතුරු ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළේ නැහැ. මැයි දිනයේදීවත් ප්‍රකාශයක් කළේ නැහැ. මැයි දිනයේදී වෙන වෙන දේවල් ප්‍රකාශ කළා. නමුත් එතුමාගේ අමාත්‍යාංශයේ මුදල් හොරකම් කරලා තිබෙන එක ගැන එතුමා නිශ්ශබ්දව ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පෙනෙනවා මේ සම්බන්ධයෙන් කිහිප දෙනෙකුගේ වැඩ තහනම් කරලා තිබෙන බව. කොහොමද, වැඩ තහනමට ලක් වෙන්නේ? මේ වැඩ තහනමට ලක් වෙන්නේ මෙතුමන්ලා රාජකාරිය පැහැර හැරීම නිසාද? එහෙම නැත්නම් රාජකාරිය නිසි ආකාරයෙන් ඉෂ්ට නොකරපු නිසාද? නැහැ. මේ හතර දෙනා මේ සම්බන්ධව තිබෙන ප්‍රවෘත්තිය එළියට දැමීම නිසා තමයි මේ වැඩ තහනමට ලක් වෙන්නේ; ඒ නිසායි වැඩ තහනම් කරන්නේ. එහෙම නැතුව, රාජකාරි පැහැර හැරියා කියලා නොවෙයි. රාජකාරි පැහැර හැරියා කියලා වැඩ තහනමට ලක් වෙනවා නම්, ඉස්සෙල්ලාම වැඩ තහනමට ලක් වෙන්න ඕනෑ අමාත්‍යාංශයේ ලේකම්වරයා. ඔහුගේ වැඩ තහනම් කරන්න ඕනෑ. නමුත්, ඔහුගේ වැඩ තහනම් කරන්නේ නැහැ, පහළ නිලධාරින් හතරදෙනෙකුගේ වැඩ තහනම් කරනවා. ඒ වැඩ තහනම් කිරීම කරන්නේ මේ මුදල් හොරකම සම්බන්ධව තොරතුරු එළියට දුන්නා කියන සැකය නිසා මිස වෙන මොකවත් නිසා නොවෙයි. ඒක තමයි අපි මේ සැක කරන්නේ.

ඊළඟට, ඒ මරණය වෙච්ච විදිය ගන්නකෝ. වැඩ තහනමට ලක් වුණාට පස්සේ මිය ගිය රංග රාජපක්ෂ මහත්මයාගේ සිරුරේ කැපුම් තුවාල තිබෙනවා. ඒ කැපුම් තුවාල එක්ක ඒ මරණය සිද්ධ වුණාම, පොලීසිය ඇවිල්ලා මාධ්‍යයට කියනවා, ඒක සිය දිවි හානි කර ගැනීමක් කියලා. මරණය ගැන කිසිම පරීක්ෂණයක් කරන්නේ නැතුව, එකවරම කියනවා, 'මේක suicide එකක්' කියලා. ඊළඟට, සෞඛ්‍ය අමාත්‍යාංශය appoint කරනවා, හතරදෙනෙකුගේ committee එකක්. ඒ හතරදෙනාගේ committee එකේ කාර්යභාරය මොකක්ද? ඒගොල්ලන්ගේ කාර්යභාරය තමයි, මේ මරණයට හේතුව සෙවීම. අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ - JMO - කටයුත්ත තමයි, වගකීම තමයි මරණයට හේතුව සෙවීම. එහෙම නැතුව මරණය වුණු ආකාරය ගැන සෙවීම නොවෙයි. ඒගොල්ලෝ මරණය වෙච්ච ආකාරය ගැනත් කියනවා, සිය දිවි හානි කර ගත්තා කියලා ඒගොල්ලෝ සැක පහළ කරනවා කියලා. ඒක ඒගොල්ලන්ට අයිති වැඩක් නොවෙයි. මරණය වුණු හැටි සොයන්න තමයි, මරණ පරීක්ෂකවරයා ඉන්නේ. එහෙම නැත්නම් මහෙස්ත්‍රාත්වරයාට තිබෙන වගකීම ඒක; එහෙමත් නැත්නම් ISDලාට තිබෙන වගකීම ඒක. JMOsලාට තිබෙන වගකීමක් නොවෙයි ඒක. JMO කොහොමද කියන්නේ, "මේක සිය දිවි හානි කර ගැනීමක්" කියලා? ඒ ගොල්ලන්ට කරන්න තිබෙන්නේ මරණයට හේතුව - cause of death - මොකක්ද කියලා සෙවීම. මොකද, මේ වාගේ ඒවා අනන්ත අප්‍රමාණ වෙලා තිබෙනවා. පසුගිය සතියේ මරණයක් වාර්තා වෙලා තිබෙනවා අපි දැක්කා, අනුරාධපුරය පැත්තේ කෙනෙකුට නයෙක් දෂ්ට කරලා. ඒ නයා දෂ්ට කරලා ඒ පුද්ගලයාගේ ඇඟ පුරා විෂ ගිහිල්ලා තිබුණා. මරණයට හේතුව වුණේ නයි විෂ ශරීරගත වීම. ඒ නිසා ඔහු මැරුණා. නමුත්, පරීක්ෂණ කරන කොට එළි වුණේ මොකක්ද? එයාගේ ඇඳට නයෙක් ගෙනැල්ලා දැම්මා කියන එකයි. එතකොට ඒක ඝාතනයක්, a murder. මරණ පරීක්ෂණ කටයුතු ඉස්සරහට කරගෙන යන කොට අන්තිමට සොයා ගත්තා, නිදාගෙන ඉන්න ඇඳට නයෙක් ගෙනැල්ලා දාලා තමයි ඒ මනුස්සයා මැරුණේ කියලා. ඒක සොයන්න මරණ පරීක්ෂකයා වෙන්න ඕනෑ. ඒක JMOගේ කාර්යභාරය නොවෙයි; JMOට තිබෙන්නේ මරණයට හේතුව කියන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දොස්තර කෙනෙක් නේ. ඔබතුමාත් ඒක ගැන දන්නවා. එහෙම නම් මොකද මේ එක එක්කෙනා අනියම් ආකාරයට, 'මෙයා සිය දිවි හානි කර ගත්තා' කියලා ඔප්පු කරන්න හදන්නේ? ඇයි ඒ? අන්න ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැකය එන්නේ; මේක ඝාතනයක්ද කියලා සැකය එන්නේ ඒක නිසා තමයි. තමන්ට අයිති නැති රාජකාරිවලදී, statements දෙනකොට සැකයක් ඇති වෙනවා, එහෙම නම් මේකේ කුමන්ත්‍රණයක් තිබෙනවා. මොකද, ඒ පුද්ගලයා ඒ ආයතනයේ රාජකාරි කළා. ඔහු CID එකට දෙවරක්, තුන්වරක් කටඋත්තර දීලා තිබෙනවා. ඔහුව නැවත CID එකට කැඳවලා තිබෙනවා. එහෙම නම් ඔහු මේ ගනුදෙනුවේදී මේ හතරදෙනාගෙන් ප්‍රධාන කෙනෙක්. ඔහු මොකක් හරි තොරතුරක් දන්නවාද කියන සැකය තිබෙනවා. ඒ සැකය වහන්න තමයි debate එක දෙන්නේ නැත්තේ; ඒකයි විවාදය - debate එක - යට ගහන්නේ; විවාදයට පැය දෙකක් ඉල්ලුවාම පැය එකහමාරක් දෙන්නේ.

ඊළඟ කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අධිකරණ ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා ඊයේ පට්ටපල් බොරුවක් කිව්වා, ඒ පවුලේ උදවිය පැමිණිලි කරලා නැහැ කියලා. අධිකරණ ඇමතිතුමා ඊයේ ඒ ප්‍රකාශය කළා. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඊයේ ඒක ගැන කිව්වා. එතකොට ඇමතිතුමා හිටියේ නැහැ. එතුමා ඒ ප්‍රකාශය කරලා නැඟිටලා යන්න ගියා. හැබැයි එතුමා අපට චෝදනා කරනවා, අපි මෙහිදී කථා කරලා යනවා කියලා. එතුමාත් ඊයේ කථා කරලා, පට්ටපල් බොරුවක් කියලා පැනලා ගියා. බලන්න, මේ තිබෙන්නේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අසේල ගුණවර්ධන ලියපු ලියුම. ඔහු මොකක්ද ලියා තිබෙන්නේ? It states, I quote:

> "According to the said letter, it has been reported that Nishshanka Arachchilage Seelawathi, a resident of Pahala Veerambuwa Kuliyapitiya, within the Kuliyapitiya Police Division, has informed that her husband, Abeysinghe Mudiyanselage Ranga Nishshanka Rajapaksha, died under suspicious circumstances on 30.04.2026."

මොකක්ද මේ කියන්නේ? තමන්ගේ මහත්තයාගේ මරණය පිළිබඳව සැකයි කියලා ඇය කියන බවයි කියන්නේ. අධිකරණ ඇමතිවරයා කියනවා, එහෙම කට උත්තරයක් දුන්නේ නැහැ කියලා. ඒ කියන්නේ, දැනුවත්වම අධිකරණ ඇමතිතුමා පාර්ලිමේන්තුව නොමඟ යවන්න වැඩ කරලා තිබෙනවා. එහෙම නම් මම අහනවා, එතුමා ගෙනෙන මේ නීතිවල විශ්වාසය මොකක්ද කියලා. අධිකරණ ඇමතිවරයා හැටියට ඉදිමින් පාර්ලිමේන්තුවට බොරු කියන කොට මේ රටේ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරයි කියලා, නීතියේ සාධාරණයක් ඉෂ්ට කරයි කියලා බලාපොරොත්තු වෙන්නේ කොහොමද? අඩුම ගාණේ මේ මරණය සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්න ඉඩ දෙයි කියලා බලාපොරොත්තු වෙන්නේ කොහොමද? මොකද, එතුමා ඊයේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපි සියලුදෙනා හමුවේ පට්ටපල් බොරුවක් ගොතලා කිව්වා. ඇයි එහෙම කියන්නේ? ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට සාධාරණ සැකයක් ඇති වෙන්නේ, ආණ්ඩුව මේ සම්බන්ධයෙන් පොඩි කුමන්ත්‍රණයක් කරගෙන යනවා කියලා. JMO දාලා එකක් කියවනවා; පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා තව එකක් කියනවා. ඇමතිතුමා මෙහේ ඇවිල්ලා තවත් එකක් කියනවා. ගරු කථානායකතුමා debate එකක් දෙන්නේ නැහැ. ඒක යටපත් කරනවා. විවාදයට පැය දෙකක් ඉල්ලුවාම පැය එකහමාරක් දෙනවා. දවසක විවාදයක් ඉල්ලුවාම සභානායකවරයා කියනවා, ලබන සුමානයේ දෙන්නම් කියලා. එහෙම නම් මේ ඔක්කොම අකුල් හෙළන්නේ මේ සම්බන්ධව මොකක් හරි දෙයක් වෙලා තිබෙන නිසා; අපි දන්නේ නැති දෙයක් වෙලා තිබෙන නිසා. ඒ හින්දා නේ, මේක ඉස්සරහට යන්න දෙන්නේ නැත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ හුඟක් අය පරණ නඩු ගැන කිව්වා. සමහර අය කිව්වා, මහ බැංකුවේ නඩුව ගැන. මහ බැංකුවේ හිටපු අධිපතිවරයා වූ අර්ජුන මහේන්ද්‍රන්ව ලංකාවට ගෙනෙනවා කියලා නේ බලය ලබා ගත්තේ. ඇයි අර්ජුන මහේන්ද්‍රන්ව ලංකාවට ගෙනෙන්නේ නැත්තේ? රනිල් වික්‍රමසිංහව

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

හිරේ දමනවා කියලා නේ බලය ලබා ගත්තේ. ඇයි, ඒක කරන්නේ නැත්තේ? හැම දාම ඇවිල්ලා මේක ඇතුළේ කියවන්න එපා. ඔයගොල්ලෝ එදා වේදිකාවල බෙරිහන් දුන්නා; ෆයිල් 400ක් පෙන්නුවා. ජනතාව ඔයගොල්ලන්ට බලයක් දුන්නා. දැන් ඉතින් ඒවාට අදාළව කටයුතු කරන්න. ඇයි කටයුතු කරන්නේ නැත්තේ? බලයට ඇවිල්ලා කළ යුතු දේ කරන්නේ නැතිව ඉඳලා පරණ දේවල් කියවලා වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
දැන් තාජුඩීන් ගැනත් කථා කරනවා. තාජුඩීන්ගේ මරණයට අදාළ telephone conversations මකපු එක්කෙනා ජනාධිපතිතුමාගේ ඩිජිටල් උපදේශක. තව අහගන්න එපා මගෙන්. ඒ ඔක්කොම කරපු අය අද ආණ්ඩුව ඇතුළේ ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට අපි කථා කරමු, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ගැන. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි දෙකක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට තවත් විනාඩියක් ලබා දෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට දේශපාලන පත්වීමක් නොවෙයිද ලබා දුන්නේ? ඔය පත්වීම කරන කොට අපි කිව්වා, මුදල් අමාත්‍යාංශය දේශපාලනීකරණය කරන්න එපා කියලා. එදා නිවාඩ් කබ්රාල්ව මහ බැංකුවේ අධිපති කරන කොට අනුර කුමාර දිසානායක මන්ත්‍රීවරයා විපක්ෂය පැත්තේ ඉඳගෙන අපිත් එක්ක එකට එකතු වෙලා කෑ ගැහුවා, "ඒ වැඩේ කරන්න එපා" කියලා. තමුන්නාන්සේලා ඒ වාගේ වැඩ කරන්නේ නැහැ කියලා නේද බලය ගත්තේ? බලය අරගෙන අන්තිමට මොකක්ද කළේ? තමුන්නාන්සේලාම දූෂිත ආණ්ඩුයි කියලා කියපු, දූෂිත ජනාධිපතිවරුන්ය කියලා කියපු අය කරපු දේම නේද මේ කළේ? ඔහුව ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ගෙනාවා. ඔහුට මුදල් අමාත්‍යාංශය ගැන කිසිම දැනුමක් නැහැ, රාජ්‍ය සේවයේ ඉඳලා නැහැ, අත්දැකීමක් නැහැ. එහෙම කෙනෙකු ගෙනැල්ලා මුදල් අමාත්‍යාංශයේ ලේකම් කරලා, අද මුදල් අමාත්‍යාංශයේ තිබෙන මුදල් ටිකත් හොරකම් කරගෙන යන කල් තමුන්නාන්සේලා දන්නේ නැහැ. බොහොම ලොකු දෙයක්, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5න් බේරුණු එක. අපි දන්නේ නැහැ, තව කොච්චර ඒවා ගෙවලා තිබෙනවාද කියලා. දැනට එළියට ඇවිල්ලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5 ගැන විතරයි. ඒ වගකීම තමුන්නාන්සේලා භාර ගන්න ඕනෑ. අපි එකක් කියනවා. මේ පරීක්ෂණ පවත්වන නිලධාරීන්ටත් මම මතක් කරන්න කැමැතියි, කාරණයක්. නිලධාරීන් මේ පරීක්ෂණ වහන්න, මේ පරීක්ෂණ යටපත් කරන්න, මේ පරීක්ෂණ වෙන පැත්තකට ගෙනියන්න, සාක්ෂි යටපත් කරන්න වැඩ කරනවා නම් මතක තියා ගන්න, රංග රාජපක්ෂ කපපු දැලි පිහිය තමුන්නාන්සේලාගේ ඇඟටත් එන්න පුළුවන් කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ චෝදනාවට ලක් වෙලා ඉන්න අය කවුද, මේ චෝදනාව කාටද තිබෙන්නේ? චෝදනාව තිබෙන්නේ ආණ්ඩුවට. වෙන කාටවත් නොවෙයි. මතක තියා ගන්න, ආණ්ඩුවට තමයි චෝදනාව තිබෙන්නේ. මේක සිය දිවි නසා ගැනීමකට ලඝු කරන්න එපා. මේ පුද්ගලයා මේ ගනුදෙනුව ගැන තොරතුරු දන්න කෙනෙක්. ඔහු මරණයට පත් කිරීම යම්කිසි ආකාරයක දේශපාලන වැඩක් වෙන්න පුළුවන්. ඒ පරීක්ෂණය කරන්නේ කවුද? ආණ්ඩුව තමයි කරන්නේ. ඉස්සර මේ ජනාධිපතිතුමා කිව්වා, "පාලකයෝ පත් වුණාම ඒ පාලකයෝ යටතේ තමයි නීතිය, අධිකරණය වාගේ ඔක්කෝම තිබෙන්නේ. ඒ හින්දා පාලකයෝ තමන්ට ඕනෑ විධියට ඔක්කෝම දේවල් කර ගත්තා" කියලා. දැන් මේ පාලකයා මොකද කරන්නේ? දැන් මේ ජනාධිපතිතුමා යටතේ නේද පොලීසිය, අධිකරණය වාගේ ඔක්කෝම තිබෙන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have exhausted your time.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි, මම අවසන් කරන්නම්.

එතකොට මේ ජනාධිපතිතුමා යටතේ එදා ඒ කථා කළ සාධාරණත්වය අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්ද? මොකද එතුමා යටතේ තමයි අධිකරණය, පොලීසිය වාගේ සියලු ආයතන තිබෙන්නේ. මේ චෝදනාව තිබෙන්නේ ආණ්ඩුවට, රජයට, මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට, ලේකම්තුමාට. තමුන්නාන්සේලාට සාධාරණ පරීක්ෂණයක් කරන්න ඕනෑ නම් අඩුම තරමින් Scotland Yard එකවත් ගේන්න; Scotland Yard එක ගෙනැල්ලා බාර දෙන්න. මොකද අපි එහෙම කියන්නේ? අපි එහෙම කියන්නේ පසුගිය කාලයේ තමුන්නාන්සේලා හදපු ඒ මතයත් එක්ක අද ජනතාව ඉන්න හින්දා තමුන්නාන්සේලා කරන පරීක්ෂණ ගැන විශ්වාසයක් නැහැ, ඒවායින් සාධාරණයක් වෙයි කියලා විශ්වාසයක් නැහැ. මොකද, මේ සභාවට ඇවිල්ලා බොරු කියන ඇමතිවරු ඉන්න හින්දා මේ පරීක්ෂණ වෙනස් වෙයි කියලා හිතනවා.

ජපානයේ තානාපතිතුමා කියනවා, "Sri Lanka must walk the talk, not talk the talk" කියලා. දැන් ජපන්නුත් දන්නවා තමුන්නාන්සේලා කයිවාරු ගහනවා, වැඩ කරන්නේ නැහැ කියලා. ඒක ජපන්කාරයාටත් තේරිලා තිබෙනවා. හෙට අනිද්දා වෙනකොට චීන්නුත් මේක කියයි, ඉන්දියාවත් මේක කියයි කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Harshana Nanayakkara?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසාවියට බොරු කියන්නේ මම නොවෙයි මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. මක් නිසාද? මම අදත් කියනවා, කිසිදු අවස්ථාවක මිය ගිය අයගේ බිරිඳ මේ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කරලා නැති බව. අසේල ලේකම් කිව්වා කියලා එතුමා කියන්නේත් අසත්‍යයක්. ඒ වාගේම එතුමාට අවශ්‍යතාව තිබෙන්නේ මේ තොරතුරු විකෘති කරන්නයි. ඒ නිසා මම අදත් ඒ කාරණය ප්‍රතික්ෂේප කරනවා. මම මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට අභියෝග කරනවා. ඔය ලිපිය සභාගත කරන්න. ඊට අමතරව මට කියන්න, කොයි පොලීසියට, කවදාද ඒ බිරිඳ පැමිණිලි කළේ කියලා. මොකද, එහෙම දෙයක් වෙලා නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mujibur Rahuman, you can speak.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ලිපිය **සභාගත*** කරනවා.

ඊයේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් මේ ලිපියම සභාගත කළා. මේක සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යවලා තිබෙන්නේ under the caption, "Regarding the order to appoint a medical board and to conduct a post-mortem examination in relation to the Case No. B 88575/2026….." මේ ලියුම අත්සන් කරලා තිබෙන්නේ Dr. Asela Gunawardena. Dr. Asela Gunawardena තමයි කියන්නේ, I quote:

> "According to the said letter, it has been reported that Nishshanka Arachchilage Seelawathi, a resident of Pahala Veerambuwa Kuliyapitiya, within the Kuliyapitiya Police Division, has informed that her husband, Abeysinghe Mudiyanselage Ranga Nishshanka Rajapaksha, died under suspicious circumstances on 30.04.2026."

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, එය සභාගත කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මොකක්ද මේ කියන්නේ? මේ ලියුම බොරුයි කියලාද කියන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Harshana Nanayakkara, we would not let this go this way and that way.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මයික් එක දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I gave you the mike, Hon. Member. Hon. Mujibur Rahuman, would you wind up, please?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම Dr. Asela Gunawardena, ඒ කියන්නේ Director General of Health Services - DG - ඉදිරිපත් කළ ලිපිය තමයි කියෙව්වේ. ඇමතිතුමා මේ ලියුම බොරුයි කියලා කියනවා නම් - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Harshana Nanayakkara.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසුගිය අවස්ථාවේ කිව්වේ මොකක්ද, අද කියන්නේත් ඒකමයි. මෙම කාන්තාව කොයිම අවස්ථාවකවත් පොලීසියට පැමිණිලි කළේ නැහැ. මම එතුමාට අභියෝග කරන්නේ තමන්ගේ මනුස්සයාගේ මරණය සැකයි කියලා ඇය පොලීසියට පැමිණිලි කළා නම්, මට ඒ පොලිස් ස්ථානයයි, දිනයයි කියන්න කියලා විතරයි. ඒක නිසා මෙතැන අසත්‍ය කියන්නේ, එක්කෝ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔය තුනම පොඩ්ඩ පොඩ්ඩ තිබෙනවා කියලා මම කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Now, let us move onto the next speaker.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නේ මේ ලියුමේ තිබෙන දෙයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඒක සභාගත කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, point of Order.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම point of Order එක ඉදිරිපත් කරන්නේ ස්ථාවර නියෝග 91 (ඇ) යටතේ. අධිකරණ ඇමතිතුමා මේ මන්ත්‍රීවරයාට අපහාස කරනවා. ඒ අපහාස කරන්නේ කන් ඇහෙන්නේ නැහැ කියලා. එතුමා වෛද්‍යවරයෙක් නොවෙයි නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා එතුමාට කියන්න ශීලාචාරව හැසිරෙන්න කියලා. එතුමා අංග ලක්ෂණවලින්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පාර්ලිමේන්තුවේ. එතුමා අධිකරණ අමැතිකමට නොවෙයි හොඳ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
All unparliamentary words will definitely be expunged from Hansard.

Now, I call upon the Hon. Sunil Kumara Gamage. You have ten minutes to talk on the topic of the Debate today.

[පූ.භා. 11.29]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත ගැන තමයි අපි අද විවාද කරන්නේ, සාකච්ඡා කරන්නේ. ඇත්තටම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ, අපට මේ පනත් කෙටුම්පත ඇතුළේ වැදගත් සාකච්ඡාවක් මතු කරගන්න ඕනෑ නිසා.

ඒකට හේතුව මෙයයි. පසුගිය කාලයේ අපේ රටේ ව්‍යාපාර දිගටම ඇද වැටුණා, විවිධ හේතු නිසා. මේ ඇද වැටෙන ව්‍යාපාර නැවත ගොඩ ගැනීම සහ ඒ අසමත් ව්‍යාපාර වේගවත් සහ කාර්යක්ෂම ලෙස අවසන් කරන්න, liquidation process එක ඉක්මන් කරගන්න මෙන්න මේ පනත් කෙටුම්පත වැදගත් වෙනවා. අපි දන්නවා, ව්‍යාපාරිකයෙක් ව්‍යාපාර කළාම සමහර වෙලාවට ඒ ව්‍යාපාර අසාර්ථක වෙන්නේ, බංකොලොත් වෙන්නේ ඔහුගේ සාධක නිසාම නොවෙයි කියන එක. වෙනත් බාහිර සාධක නිසාත් ඔහුට මේ ව්‍යාපාරය කරගෙන යන්න බැරි වෙනවා; අසාර්ථක වෙනවා; බංකොලොත් වෙනවා. හැබැයි එතකොට අපි ඔහුට අවස්ථාවක් හදලා දෙන්න ඕනෑ, ඒකෙන් ගැලවිලා එක්කෝ නැවත ඒ ව්‍යාපාරය ඉදිරියට කරගෙන යන්න, එහෙම නැත්නම් අලුත් ව්‍යාපාරයක් පටන් ගන්න. අපේ රටේ මේකට තිබෙන අවස්ථාව බොහෝ වෙලාවට සීමා කරලා තිබෙනවා විවිධ කාරණා නිසා.

අපේ රටේ ව්‍යාපාරිකයන් බංකොලොත් වීම, වස්තුභංගත්වයට පත්වීම කියන කාරණය සැලකිල්ලට ගෙන අපි අද සාකච්ඡා කරන මේ පනත් කෙටුම්පතේ විශේෂ වගන්ති, විධිවිධාන එක්ක අපේ රටේ අනාගත ව්‍යාපාරිකයන්ට අපේ රටේ පහසුවෙන් ව්‍යාපාර කරගෙන යන්න සහ ඒකට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න පුළුවන්කම ලැබෙනවා. ඒ සඳහා තමයි මේ පනත් කෙටුම්පත ගැන අපි සාකච්ඡා කරන්නේ, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) කියන පනත් කෙටුම්පත ගැන දැන් සාකච්ඡා වෙන්නේ නැහැ. මොකද, විපක්ෂයේ සමහර පක්ෂත් මේ වෙනකොට පුනරුත්ථාපනය කරන මට්ටමට වැටිලා වස්තුභංගත්වයට පත් වෙමින් තිබෙන නිසා. ආයතනික සහ පුද්ගලික කිච්චාම පක්ෂත් තිබෙනවා, පුද්ගලයෝත් ඉන්නවා. ඒ නිසා ඒකත් පොඩ්ඩක් සැලකිල්ලට ගන්න වෙනවා. මොකද, මැයි දින වේදිකාවල කෙරුණු කථා ඇහුවාම අපට දැනෙනවා, දැන් ඒ පක්ෂ සහ පුද්ගලයෝ පුනරුත්ථාපනය කරන්න ඕනෑ මට්ටමට වැටිලා තිබෙනවාය කියන එක.

මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන ගමන්ම, මම මේ කාරණයත් මතු කරන්න කැමැතියි. ලංකාවේ ජාතික ක්‍රීඩාව වොලිබෝල් වුණත්, ක්‍රිකට් ක්‍රීඩාව ගැන යම්කිසි කරුණක් මතු කරන්න ඕනෑ. ඒකට හේතුව මෙයයි. අපි හැමෝම දන්නවා, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ අපේ රටේ මිනිස්සුන්ගේ ලේවලට කාන්දු වෙච්ච, ජීවිතයේ කොටසක් බවට පත් වෙච්ච, එහෙම නැත්නම් ලංකාවේ විශාල පිරිසක් විනෝදාස්වාදය ලබාගන්න ක්‍රීඩාවක් බව. ඒකට හේතුව මෙයයි. අපි ක්‍රිකට් ලෝක කුසලානය ජයග්‍රහණය කර තිබෙනවා. ලෝක ප්‍රසිද්ධ ක්‍රිකට් ක්‍රීඩකයෝ අපේ රටින් බිහි වෙලා තිබෙනවා. සමහර මිනිස්සු, සමහර රටවල් අපිව හඳුනාගත්තේ ක්‍රිකට්වලින්. ඒ නිසා ක්‍රිකට් ක්‍රීඩාවට අපේ රටේ විශේෂ වැදගත්කමක්, විශේෂ අවස්ථාවක් හිමි වෙලා තිබෙනවා.

ක්‍රිකට් ක්‍රීඩාව ගැන කථා කළොත්, අපි හැමෝම මේ කාරණය පිළිගන්නවා. මම හිතන විධියට, මේ පාර්ලිමේන්තුවේ මේ ගැන සාකච්ඡා කරලා තිබෙනවා, බොහෝ කාලයක් තිස්සේ. රටේ මිනිස්සුත් කථා කරලා තිබෙනවා. පසුගිය දශකයකට වඩා වැඩි කාලයක් තිස්සේ අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ඇදගෙන වැටුණා. ඒක සංඛ්‍යාලේඛනවලින්, තරගවලින්, ක්‍රීඩකයන්ගෙන් ඇතුළු සියල්ලෙන්ම අපිට ඔප්පු කරලා පෙන්වන්න පුළුවන් මට්ටමට පත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ක්‍රිකට් ක්‍රීඩාවේ වැටීම ගත්තාම, අපේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා තිබෙනවා, අපේ දේශීය ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා තිබෙනවා.

ඒ දෙකම සිද්ධ වෙලා තිබෙනවා. ජාත්‍යන්තර වශයෙන් ක්‍රිකට් ක්‍රීඩාව කඩා වැටීම ලංකාවේ හැමෝටම පෙනෙනවා; හැමෝම දන්නවා. මොකද, අපේ රටේ ක්‍රීඩකයන් තවත් රටක් එක්ක තරග කරනකොට ගොඩක් අය ඒ තරග නරඹනවා, තොරතුරු දන්නවා. එම නිසා ක්‍රීඩාවේ කඩා වැටීම ගැන අපට දැනෙනවා; හැඟෙනවා; පෙනෙනවා.

අපි පසුගිය අවුරුදු 10, 12 ඇතුළත ජාත්‍යන්තර ක්‍රිකට් තරගවලින් ගොඩක් පහළට ඇදගෙන වැටුණා. ඒක ලංකාවේ හැමෝම පිළිගන්නා කාරණයක්. බොහෝ අය අපෙන් ඉල්ලුවේ ඒකට උත්තරයක්. ක්‍රිකට්වලට එහෙම වෙන්න දෙන්න එපා, එය කඩා වැටෙන්න දෙන්න එපා කියලායි ඉල්ලුවේ. පාර්ලිමේන්තුවේ ඒ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. හැබැයි, පසුගිය ආණ්ඩු

කිහිපයකටම ඒකට උත්තර හොයන්න බැරි වුණාය කියලා අපි දන්නවා. ඔය කයිය ගහන කට්ටියට, ඒ ආණ්ඩුවල හිටපු ඇමතිවරුන්ට, ජනාධිපතිවරුන්ට ඒකට උත්තර හොයන්න බැරි වුණා. අවුරුදු 10ක් කියන්නේ ආණ්ඩු කීයක් පහු වෙලාද? ඒක නිසා අපට සිදු වුණා, ඒ ඇදගෙන වැටිච්ච ක්‍රීඩාව නඟා සිටුවන්න. අපි ඒ ගැන සාකච්ඡා කළා. අපි ඒ ගැන හැදෑරුවා. ඒකට උත්තර හොයන්න අපි කණ්ඩායමක් විධියට මැදිහත් වුණා. මොකද, ජාත්‍යන්තර වශයෙන් වාගේම, ජාතික වශයෙනුත් අපේ ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා තිබුණා. අපි මේ සම්බන්ධයෙන් කමිටු පත් කරලා සාකච්ඡා කළා. විශේෂයෙන්ම ජනාධිපතිතුමා ක්‍රිකට් ක්‍රීඩාවට බොහොම ඇලුම් කරන, ආශා කරන, ඒ ගැන උනන්දුවක් තිබෙන පුද්ගලයෙක්. අපි ජනාධිපතිතුමා එක්කත් නිතරම සාකච්ඡා කරලා, එතුමාගේ උපදෙස් අරගෙන, තවත් බාහිර කණ්ඩායම් එක්ක තමයි ක්‍රිකට් ක්‍රීඩාව වැටී තිබෙන අර්බුදයෙන් ගොඩ එන්න උත්තර හොයමින් හිටියේ. ජාත්‍යන්තර වශයෙන් වාගේම, විශේෂයෙන්ම අපේ රටේ පාසල් ක්‍රිකට් ක්‍රීඩාව, ඒ වාගේම දිස්ත්‍රික් ක්‍රිකට් ක්‍රීඩාව අද කඩා වැටිලා තිබෙනවා. අපට අලුතින් ක්‍රිකට් ක්‍රීඩකයන් බිහි නොවනවා වාගේම, අලුතින් ක්‍රීඩා සමාජ ඇති වෙන්නෙත් නැහැ. මේ සියලු අර්බුද අවබෝධ කරගෙන තමයි අපි එයට උත්තර හොයමින් සිටියේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේක රජයේ වගකීමක් විධියට දැකලා තමයි මේ පිළිබඳව අදහස් දක්වමින්, ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට අරගෙන යන්න, එය දියුණු කරන්න මොකක්ද කරන්නේ කියන සාකච්ඡාවට ආවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දිනවල ශ්‍රී ලංකාවේ ක්‍රිකට් සභාපතිතුමා ඇතුළු නිල බලයෙන් පත් වුණු කණ්ඩායම ඉල්ලා අස් වුණා. මොකද, ඒගොල්ලන්ට අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ගොඩගන්න බැරි වුණා කියන කාරණය ඒගොල්ලන් පිළිගන්නවා. පසුගිය ලෝක කුසලානයේදීත් අපි ඒක හොඳින් අත්වින්දා. ඒ සියලු කාරණා සැලකිල්ලට ගෙන ඒ අය ඉල්ලා අස් වුණා. අමාත්‍යවරයා විධියට ක්‍රිකට් අතුරු පාලක කමිටුවක් පත් කරන්න මට සිදු වෙනවා. එම කමිටුවේ සභාපතිවරයා ලෙස අපි පත් කළේ ඉරාන් වික්‍රමරත්න මහතාව. ඉරාන් වික්‍රමරත්න මහත්මයා කියන්නේ දක්ෂ පරිපාලකයෙක් මෙන්ම හොඳ දේශපාලනඥයෙක්. ඒ වාගේම එතුමා දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙක්. අපි එතුමා එක්ක ලෝක ප්‍රසිද්ධ හිටපු ක්‍රිකට් ක්‍රීඩකයන් අටදෙනෙක් සාමාජිකයන් ලෙස පත් කළා. සිදත් වෙත්තමුණි, කුමාර් සංගක්කාර, රොෂාන් මහනාම මහත්මයා වාගේ ලෝක ප්‍රසිද්ධ හිටපු ක්‍රිකට් ක්‍රීඩකයන් ඇතුළුව තමයි අපි එම කමිටුව පත් කළේ. එම කමිටු සාමාජිකයන් නම් කිරීමත් එක්ක විපක්ෂය පොඩ්ඩක් භය වෙලා මේ මාතෘකාව වෙන පැත්තකට අරගෙන යනවා. ඒගොල්ලන් කලින් කථා කළේ, "ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව කඩා වැටිලා, ඒක හදන්න ඕනෑ. මේ තිබෙන Sri Lanka Cricket Board එකෙන් ඒක කරන්න බැහැ" කියලා. එහෙම කිය කියා හිටපු කට්ටිය දැන් ඒ සාකච්ඡාවේ නැහැ. දැන් යන්නේ වෙන සාකච්ඡාවක්. කොහොම වුණත්, අපි එය නිවැරැදි කරන්න උත්සාහ ගනිමින්, ලංකාවේ අපට අහිමි වුණු ජයග්‍රහණ අත්පත් කර ගැනීම වෙනුවෙන් කණ්ඩායමක් පත් කරලා තිබෙනවා. එහි විශේෂත්වය තමයි, අපි අපේ රට හදන්න මිනිස්සු තෝරනකොට මේ රටේ පුරවැසියන් තමයි ඒ අයව නම් කළේ.

මේ රටේ පුරවැසියෝ තමයි මේ රට හදන්න ඕනෑ; මේ රටේ දියුණු, දක්ෂ පුරවැසියෝ එකතු වෙලා තමයි රට හදන්න ඕනෑ. මේ රට ගොඩනැඟීමේදී අපේ ප්‍රතිපත්තිය තමයි අපේ රටේ දක්ෂ, දියුණු පුරවැසියන් මේ කාර්යයට එකතු කර ගැනීම; දායක කර ගැනීම. ඒකේදි එයාගේ ආගම මොකක්ද, එයාගේ ජාතිය මොකක්ද, එයා උඩරට ද, පහත රට ද කියන එක අපි සලකන්නේ නැහැ. අපි ඒ කිසි දෙයක් සැලකිල්ලට ගන්නේ නැහැ. මිනිසුන්ගේ සංස්කෘතික ජීවිතයේ කොටස් අපි මේ සම්බන්ධයෙන් ඈඳා ගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට එයාගේ ආගම අදාළ නැහැ. අපට එයාගේ ජාතිකත්වය අදාළ නැහැ. අපට වැදගත් වෙන්නේ අපේ රට ගොඩනැඟීමේ කාර්යයට දියුණු දැක්මක් සහිත පුද්ගලයෙකු විධියට එයාව සම්බන්ධ කරගන්න පුළුවන්ද කියන එක විතරයි. ඒ අරමුණින් තමයි අපි මේ කමිටුව පත් කර තිබෙන්නේ. එම කමිටුව අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට ගෙන යන්න වැඩ කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. එම කමිටුව හරහා එය සිදු වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අපි එය නම් කරලා තිබෙන්නේ, Cricket Transformation Committee කියලා. අපි අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව නැවත පරිවර්තන යුගයකට ගෙන ගිහින් ක්‍රිකට් ක්‍රීඩාවෙන් නැවත ජයග්‍රහණ අත්පත් කර ගන්න පුළුවන් මට්ටමට මේ රට ගෙනෙනවා. ඒ සඳහා එම කමිටුවට දක්ෂයන් තෝරාගෙන තිබෙනවා. ඒ අයට මේ වැඩේ කරන්න හැකි වේවා! ඒ වාගේම ඒ අයට එම කටයුත්ත කරන්න පුළුවන් බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa, Leader of the Opposition. You have ten minutes.

[පූ.භා. 11.41]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන රජය හැම මොහොතකදීම තමන්ගේ දුර්වලතාව, නොසැලකිල්ල, නොහැකියාව නිසා වරදක් සිදු වුණොත් ඒකේ වගකීම කිසිසේත්ම භාර ගන්නේ නැහැ කියන එක අපි දකිනවා. හැබැයි, කුඩා හෝ හොඳ වැඩක් කළොත් ඉතාම ඉක්මනින් ඒකේ වගකීමත් භාර ගන්නවා, ගෞරවයත් භාර ගන්නවා. වෙන කිසිම කෙනෙකුට ඒ වටිනාකම දෙන්නට රජය සූදානම් නැහැ. මොනවා හෝ අඩුපාඩුවක් සිදු වුණොත් ඒක නිලධාරින්ගේ කරපිට පටවනවා. ඇත්ත වශයෙන්ම මේ ඇමෙරිකන් ඩොලර් ලක්ෂ 25ක් අපේ රටට අහිමි වීම, ඒ වංචාව, ඒ හොරා කෑම තුළ අපට ඉතාම පැහැදිලි දෙයක් පෙනෙනවා. අද අපේ රටේ රාජ්‍ය සේවය පැලවත්තකරණයකට, කාඩර්කරණයකට ලක් වෙලා තිබෙනවා. තමන්ට හිතෙෂී, තමන්ට අවංක, තමන්ට හිතවත් සුවච කීකරු ගෝලබාලයින් පත් කරගෙන ඒ අයගේ සුදුසුකම් බලන්නේ නැතිව, ඒ අයගේ හැකියාව අත්දැකීම් බලන්නේ නැතිව කටයුතු කිරීම තුළ, පරිපාලන සේවයේ මේ කාඩර්කරණය නිසා බරපතළ බිඳ වැටීමක් සිද්ධ වෙලා තිබෙනවා.

දැන් බලන්න, අපිට දැන ගන්න ලැබුණු විධියට 2025 නොවැම්බර් 14වෙනි දා වෙනකොට ඇමෙරිකන් ඩොලර් ලක්ෂ 25න් ගෙවීම් 4ක් කරලා තිබෙනවා. මේ වසර අවසානයේ ගිණුම් පියවීමේ ක්‍රියාවලිය නිශ්චිතව, විධිමත්ව සිදු වුණා නම් මේ අඩුපාඩුව, මේ හිඟභාවය අහු වෙනවා නේ. ඒක හොයා ගන්න පුළුවන් වෙනවා නේ. ඒක සිද්ධ වුණේ නැහැ. ඒ වාගේම මේ මූලික ගෙවීම් සිදු කරනකොට ඒ අදාළ invoices ටික ලබා ගෙන නැහැ. ඒ දේ හරියට කළා නම් මේ අඩුපාඩුව මුලදීම අහු වෙනවා. නමුත් අකාර්යක්ෂම, අදක්ෂ, දේශපාලනීකරණයට ලක් වුණු කාඩර්වරු මේ රාජ්‍ය යන්ත්‍රණය තුළට ඇතුළු කරලා, දක්ෂකම්; හපන්කම්; කුසලතා; නිපුණතා තිබෙන රාජ්‍ය සේවය මොට කරලා, බිඳ වට්ටලා දේශපාලනීකරණය කිරීම තුළ ඒ දේ කර ගන්නට බැරි වුණා. ඇත්ත වශයෙන්ම අද බේරා ගැනීම් ගැන නේ කථා කරන්නේ. වස්තු භංගත්වය ගැන නේ කථා කරන්නේ. රටට තිබෙන සම්පත් ටික අහිමි වෙමින් යනවා. මේ දුර්දාන්ත, අකාර්යක්ෂම ක්‍රියාවලින් රට බේරා ගැනීමේ වගකීම පැටවෙන්නේ අපටයි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේ පද්ධතිය තුළ, මේ යන්ත්‍රණ බිඳ වැටීමේ සිදුවීම තුළ, රාජ්‍ය ක්ෂේත්‍රයේ කාඩර්කරණය වහාම නතර කරන්නට ඕනෑය කියන එක මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. තමන්ගේ දේශපාලන අතකොළු, හෙංචයියන් මේවාට පත් කිරීම නතර කරන්නට ඕනෑ. අපි රාජ්‍ය සේවයේ නිලධාරින්ගෙන් ඉල්ලීමක් කරනවා, ඔබ නිශ්චිත පටිපාටින්ට අනුකූලව කටයුතු කරන්න කියලා. මොනම හේතුවකටවත්, යොමුවන දේශපාලන අභියෝගවලට, බලපෑම්වලට ඔබ යටත් වෙන්න එපා. මේ රජයට රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ ජීවිත වැදගත් නොවුණාට, අපිට වැදගත්. ඒ නිසා අවංක පිරිසිදු රාජ්‍ය සේවය ශක්තිමත් කරන්නට, ආරක්ෂා කරන්නට අපි ඉදිරිපත් වෙනවා කියන එක මම මේ අවස්ථාවේදී පැහැදිලිවම ප්‍රකාශ කරන්න කැමැතියි.

අද රටේ කථා කිරීමේ නිදහස - භාෂණයේ නිදහස -, අදහස් ඉදිරිපත් කිරීමේ නිදහස, සමාජ මාධ්‍ය තුළ රටේ ජනතාව දැනුවත් කිරීමේ නිදහස පලුදු වෙලා තිබෙනවා. මගේ අතේ තිබෙනවා, Clean Sri Lanka චක්‍රලේඛය. මොකක්ද, මේ චක්‍රලේඛය? මොකක්ද, ජනාධිපති ලේකම්වරයා යවලා තිබෙන මේ නියෝගය? ඒ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු රාජ්‍ය කාර්යාලවලට තමන්ගේ කාඩර්වරුන් පත් කිරීම. ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක කළ පත්වීම් පිළිබඳව විවේචනය කිරීම හේතුවෙන් අපේ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙක්, අපේ පක්ෂයේ සාමාජිකයෙක් අද දෙහිවල පොලීසියේ රිමාන්ඩ් එකේ ඉන්නවා. දෙහිවල, ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙන් එකකට පත් කරනවා, නියෝජ්‍ය නගරාධිපති කෙනෙක්. අනෙක් එකට පත් කරනවා, නගරාධිපතිවරයාගේ ලේකම්වරයෙක්. ඒක විවේචනය කරලා, ප්‍රාදේශීය පරිපාලන පද්ධතිය විවේචනයට ලක් කරන වීඩියෝ ඉදිරිපත් කිරීම නිසා ඔහු කෙරෙහි තරහක් ඇති කරගෙන, අපේ නාගරික මන්ත්‍රීවරයෙකුගේ උපදෙස් පරිදි printout එකක් නගර සභාවේ නිලධාරිනියකගෙන් ලබා ගැනීමට කරපු ක්‍රියාව වැරැදි ක්‍රියාවක් හැටියට අර්ථකථනය කරලා අන්න, ඔහු දෙහිවල පොලීසියේ රිමාන්ඩ් එකේ ඉන්නවා. තවමත් ඔහු කොහෙටවත් ඉදිරිපත් කරලා නැහැ. තවමත් ඔහු release කරලා නැහැ. බලන්න, ඔහු කරපු වරද මොකක්ද කියලා. ඔහු කරපු වරද තමයි, නාගරික මන්ත්‍රීවරයෙකුට නගර සභාවේ නිලධාරිනියකගෙන් printout එකක් ලබා ගන්න යැම. ඕකයි වරද. එතකොට, එලෙස වරදක් නිර්මාණය කරලා ඔහු මේකට පටලවන්නේ ඇයි? පටලවන්න හේතුව තමයි, මේ Clean Sri Lanka වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළට කාඩර්වරුන් - තමන්ගේ පාක්ෂිකයින් - පත් කරලා ප්‍රාදේශීය ලේකම්ලාටත්, දිස්ත්‍රික් ලේකම්ලාටත්, පළාත් ලේකම්ලාටත් උඩින් මේ අයව තියාගෙන රාජ්‍ය ක්ෂේත්‍රය මේ කාඩර්වරුන් යටතට පත් කරන ක්‍රියාවලිය විවේචනය කිරීම. ඒක තමයි තරහ ගන්න හේතුව. මම රජයෙන් අහන්න කැමැතියි, ඔබ පොරොන්දු වුණු system change එක මේකද කියලා.

ඒ විතරක් නොවෙයි. අපි දැක්කා, ඔබතුමන්ලා අපේ රටේ මලෙයහම් ප්‍රජාවට ඇති තරම් පොරොන්දු දෙනවා. හැබැයි, රත්නපුර දිස්ත්‍රික්කයේ එක්තරා වත්තක ඉඩමක්-කඩමක් නැති මනුස්සයෙක් - මේ, මලෙයහම් ප්‍රජාව නියෝජනය කරන පුද්ගලයෙක් - පුංචි තැනක් අටවා ගත්තා කියලා ඒ වත්තේ ආරක්ෂකයෝ ඔහුව පලවා හරින්නට, ඒ අටවා ගත් ස්ථානය බිඳ දමන්නට කටයුතු කරනවා. හැබැයි මතක තබාගන්න, ලැයිම් කාමර ජීවිතවල තෙරපිලා සිටින මලෙයහම් ප්‍රජාව අපේ රටට විදේශ විනිමය ලබා දෙන්නට අසීමිත පරිත්‍යාග කරන ප්‍රජාවක් කියලා. ඒ අයට ඔබතුමන්ලා ලබා දුන් පොරොන්දුව, ඒ අයත් එක්ක ඇති කරගත් සමාජ ගිවිසුම අද ඔබට අමතක වෙලා තිබෙනවා.

අපි ඉතාම පැහැදිලිව මේ කාරණය කියන්න කැමැතියි. අපේ රජයක් තුළ අපි බලාපොරොත්තු වන්නේ මේ මලෙයහම් ප්‍රජාව ඇතුළු සම්පත් විරහිතභාවයෙන් සිටින තරුණ ප්‍රජාවට මුඩු ඉඩම් සංවර්ධනය කොට කුඩා තේ වතු හැටියට ලබා දී, කුඩා තේ වතු හිමියන් හැටියට, සත්‍ය වශයෙන්ම ප්‍රාග්ධන හිමිකරුවන් - asset-empowered ප්‍රජාවක් - හැටියට ඔවුන්ට සමාජයේ ජීවත් වීමේ අවස්ථාව ලබා දීමයි. එම නිසා මේ රටේ රැකියා විරහිත තරුණ ප්‍රජාවට, ඒ වාගේම දුක්ඛිත ජීවිතයක් ගත කරන මලෙයහම් ප්‍රජාවට අපි ලබා දෙන්නේ "තවත් ගණනක් වැඩි කරන්නම්" කියන පොරොන්දුව නොවෙයි. ඒ වැඩි කරන ඒවා හොඳයි. නැහැයි කියන්නේ නැහැ. හැබැයි, ඊට වැඩිය මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන සම්පත් හිමිතාවක් - asset ownership එකක් - ඒ ප්‍රජාවට ලබා දෙන්න අපි කටයුතු කරනවා.

විශේෂයෙන්ම අදාළ ඇමතිවරයාට මම කියනවා, මේ නැති බැරි අහිංසක ජනතාව තමන්ට නිවසක් නොමැතිව කොහේ හරි වත්තක මොකක් හරි දෙයක් අටවා ගත්තාම, සානුකම්පිතව හිතලා බලලා ඒ අයගේ ඉඩම් ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙමින්, ඒ ගැටලු නිරාකරණය කිරීම මනුෂ්‍යත්වයේ නාමයෙන් ඉටු විය යුතු ක්‍රියාදාමයක් කියලා. විශේෂයෙන්ම මේ අවස්ථාවේ ජන සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදයට තිබෙන අවස්ථාව එන්න එන්නම අඩු වෙමින් පවතිනවා. මේ රටේ ලක්ෂ 220ක් වන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ජයග්‍රහණය කරවන්නට සමගි ජන බලවේගයත්, සමගි ජන සන්ධානයත්, ඒ වාගේම විපක්ෂයේ ප්‍රගතිශීලී සියලුදෙනාත් සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කරනවා කියන එක මේ වෙලාවේ මම ප්‍රකාශ කරනවා.

ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chathuranga Abeysinghe. You have 13 minutes.

[පූ.භා. 11.51]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ වෙලාවට මගේ කථාව ලැබෙන්නේ බොහෝ අත්දැකීම් සහිත අපේ රටේ විපක්ෂ නායකතුමාගේ කථාවෙන් පසුවයි. Macro සහ micro කියලා දෙකක් තිබෙනවා කියන එක මට කියන්න වෙනවා. සාමාන්‍යයෙන් විපක්ෂ නායක කෙනෙක් macro කථාවක් කරයි කියලා තමයි අපි බලාපොරොත්තු වුණේ. හැබැයි, අපට පෙනුණේ micro කථාවක්. සියවස් ගණනාවක් තිස්සේ විසඳාගන්න බැරි ප්‍රශ්නයකට මේ ආණ්ඩුව පිළිතුරක් දුන්නාම, එක වත්තක ප්‍රශ්නයක් ගේනවා.

ඒ වාගේම තමයි, දැන් මේ අය රාජ්‍ය සේවකයින් ගැන බොහොම කලකිරිලා තිබෙනවා. හැබැයි, අද ඕනෑම රාජ්‍ය සේවකයෙකුගෙන් ඇහුවොත් කියාවි, අලුත් ආණ්ඩුව ආ පසු අපි රාජ්‍ය සේවකයාට කොච්චර වටිනාකමක් දීලා තිබෙනවාද කියලා. ඉස්සර මේගොල්ලන් කියන කියන පදයට වැඩ කරපු නිසා තමයි රාජ්‍ය සේවකයෝ අද හිරේට යන්නේ. එහෙම කළේ නැත්නම් කියන්න, නැහැයි කියලා. විශේෂයෙන්ම අද රාජ්‍ය සේවකයින්ගේ දැනුම අරගෙන, ඒගොල්ලන්ගෙන් තොරතුරු අරගෙන තීන්දු

තීරණ ගන්න වෙලාවේ, වෘත්තීමය - professional - විධියට රාජ්‍ය සේවකයින් සමඟ ගනුදෙනු කරනවාද කියලා රාජ්‍ය සේවකයින් අතර survey එකක් කරලා බලන්න පුළුවන්. මේ අයට රාජ්‍ය සේවකයින්ගේ මූලික වැටුප වැඩි කර ගන්න බැරි වුණා. රාජ්‍ය සේවකයින්ගේ මූලික වැටුප වැඩි කර ගන්න බැරි වුණු අය තමයි දැන් රාජ්‍ය සේවකයින් ගැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවැරදිව, නීතියට අනුව, බුද්ධිමත්ව වැඩ කරන රාජ්‍ය සේවකයා අපි ආරක්ෂා කරනවා. රාජ්‍යයට හානි කරන, දූෂණ කටයුතු කරන, උනන්දුවක් නැතිව වැඩ කරන රාජ්‍ය සේවකයින් ආරක්ෂා කරන්න අපට වුවමනාවකුත් නැහැ. මම ඒක පැහැදිලිව කියන්න ඕනෑ. මොකද, අපට මේ රට හදාගන්න ඕනෑ. වෙනත් දියුණු රටවල වාගේ ශක්තිමත් රාජ්‍ය සේවයක් හදලා ක්‍රමානුකූලව රාජ්‍යය ක්‍රියාත්මක කරන විධිය, දේශපාලන මැදිහත් වීමකින් තොරව රාජ්‍යය ක්‍රියාත්මක කරන විධිය තමයි අවුරුදු 5ක් යනකොට අපි ඔබතුමන්ලාට හදලා පෙන්වන්නේ. මොන ඇමති ආවත්, මොන දේශපාලන බලයක් ආවත්, පද්ධතිය ක්‍රියාත්මක කරන දක්ෂ ලේකම්වරුන් සහ ලේකම්වරුනුත් සමඟ හරි හරියට වැඩ කරන්න පුළුවන් නියෝජ්‍ය ලේකම්වරුන්, අධ්‍යක්ෂවරුන් නිර්මාණය කරන එක තමයි අපේ ප්‍රධාන වැඩ පිළිවෙළ බවට පත්වෙලා තිබෙන්නේ. ඒත් එක්කම අපි තාක්ෂණයත් ගේනවා. තාක්ෂණය ගෙනාවාම වෙන්න පුළුවන් අත්වැරදීම් ප්‍රමාණය අඩු වනවා, විනිවිදභාවය වැඩි වනවා, control එක වැඩි වනවා. දශක ගණනාවක් රට පාලනය කරලාත් මෙන්න මේ පද්ධති ගේන්න බැරි වෙච්ච අය අද රාජ්‍ය සේවකයෝ ගැන කථා කරනවා.

අද මගේ කථාව ආරම්භ කරන්න කලින් විශේෂයෙන්ම මට මේ කාරණය සඳහන් කරන්න ඕනෑ වුණේ, අපේ රටේ නිවාස ඇමතිලා සිටියාට, ගංවතුරට යටවන, කඳු නාය යනකොට ගෙවල් යටවන ජනතාවට ගෙයක් දීගන්න බැරි වුණු නිසායි. ඒ කාලවල තමන්ගේ දේශපාලන අවශ්‍යතාවලට ගෙවල් බෙදුවා. තාත්තලා, පුතාලා ඒවා තමයි එදා කළේ. ගෙවල් යට වුණු මිනිස්සු ඔක්කෝටම ඉදිරි ජීවිත කාලයේදී තම පරම්පරාවේ කිසි කෙනෙකුගේ ගෙයක් යට වෙන්නේ නැහැයි කියන සහතිකය දුන්නේ මේ ආණ්ඩුවයි. මේ ආණ්ඩුව ගෙවල් 20,000ක් හදලා දෙනවා, මෙතැනින් පස්සේ මොන වැස්ස ආවත්, මොන ගංවතුරක් ආවත් යට වෙන්නේ නැති විධියට. ඒ අනුව, එම අවදානමට ලක් නොවන ජනතාවක් ගොඩනඟන්න පුළුවන් වුණේ මේ ආණ්ඩුවටයි.

කර්මාන්තකරණයට ඉතාම වැදගත් අණ පනතක් ගැන අද අපි කථා කරන්න යනවා. මේක ගැනත් මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. අවුරුදු 76ක් රට පාලනය කළත්, 1853 Insolvency Ordinance එක වෙනස් කර ගන්න මේ අයට බැරි වුණා. ඒක තමයි ඇත්ත කථාව. ඒ කියන්නේ, අපේ රටේ ව්‍යාපාරයක් හෝ පුද්ගලයෙක් බුන්වත්භාවයට පත් වුණාම ඒකට තිබුණේ 1853 වසරේ ගෙනාපු නීතියක්. ඔබතුමන්ලා කොච්චර පරණද? ඒ සඳහා මේ පාර්ලිමේන්තුවට පනතක් ගේන්නත් ජාතික ජන බලවේග ආණ්ඩුවක් ඕනෑ වුණා. ලජ්ජයි නේද? *[බාධා කිරීමක්]* ඔයගොල්ලන් දැන්ද බංකොලොත් වුණේ? ඔයගොල්ලන් රට බංකොලොත් කළා. රට බංකොලොත් වුණාම, රට ගොඩගන්න එකටත් පනතක් ඕනෑ වනවා. *[බාධා කිරීමක්]* මම මේ කියන එක අහගන්න. ආයතන ගැන, කර්මාන්තකරුවා ගැන, ආයෝජකයෝ ගැන මේගොල්ලන් කථා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chathuranga Abeysinghe, you have been given additional three minutes.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Thank you.

මේ වාගේ අය නම් මේවායෙන් ගොඩගන්න බැහැ. නමුත්, rehabilitate වෙන්න කැමැති අයව ගොඩගන්න පුළුවන්. මම මේ කියාගෙන ආවේ මේකයි. ආයෝජන එන්නේ නැහැ කියලා මෙච්චර කාලයක් කෑ ගැහුවා නේ. ආයෝජන නොඑන්න ප්‍රධාන හේතුවක් තමයි, මේ වාගේ ශක්තිමත් අණ පනත් අපේ රටේ නොතිබුණු එක. ආයතනයක් බංකොලොත් වුණාම, ඒ ආයතනයේ පැවැත්ම නැති වනවා. එහෙම ආයතනයක පැවැත්ම නැති වුණාම ඒ ආයතනය යථා තත්ත්වයට පත් කර ගන්න මේ වාගේ ශක්තිමත් පනතක් රටට ගෙන ඒමේ ඕනෑකම තිබුණා. අපේ 2007 Companies Act එකේ තිබෙන්නේ winding down process එකක්. බුන්වත් පනතේ තිබෙන්නේ ඒ මනුස්සයා එතැනින් පස්සේ ජීවිත කාලයම බුන්වත් කියායි. ආයතනයක් නම් එතැනින් පස්සේ ඒ ආයතනය ඉවරයි. දැන් මේ පනත ගෙන ඒමත් එක්ක මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේකේ නම, Rescue, Rehabilitation and Insolvency (Corporate and Personal) Bill. ඒ කියන්නේ, ව්‍යාපාරයක් හෝ පුද්ගලයෙක් ආරක්ෂා කරගෙන, එහෙම නැත්නම් බේරාගෙන පුනරුත්ථාපනය කරලා ඉන් පසුව වස්තුභංගත්වය කිරීම පිළිබඳව මේ පනත තුළින් සාකච්ඡා කරනවා. ජාත්‍යන්තර අවශ්‍යතාවකට අනුව ජාත්‍යන්තර නීතීන් පිළිබඳව අධ්‍යයනය කරලා, කාලාන්තරයක් තිස්සේ මේ පනත ගොඩනඟපු නිසා අපේ ආණ්ඩුවට වාගේම මේ සඳහා වැඩ කරපු රාජ්‍ය නිලධාරින් සියලුදෙනාටත් මේකේ ගෞරවය හිමි වෙනවා. මම කිව්වේ, මේගොල්ලන් දශක හතක් රට පාලනය කරලා කර ගන්න බැරි වෙච්ච එක අවසානයේ අපේ ආණ්ඩුවෙන් තමයි කර ගත්තේ කියන එකයි. ඉතින්, මේ පනත කඩිනම් කරලා අපි දැන් ගෙනැත් තිබෙනවා. මේ පනත ඉතාම වැදගත් වෙනවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට. මොකද, අපි පසුගිය අවුරුදු එකහමාරේම වැඩ කළේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගොඩනඟන්නයි. මොකද, අපි දන්නවා, මෙවැනි පනතක් නොතිබුණු නිසා තමයි මේ අය අර්බුදයට ලක් වුණේ කියලා.

කොවිඩ් වසංගතය කාලයේ පැවති ආර්ථික අර්බුදය තුළ ලංකාවේ ව්‍යාපාරිකයන් 12,000ක් විතර පරාටේ නීතියට අහු වන අවදානමට ලක් වෙලා තිබෙනවා. මේ වෙනකොට ඒකෙන් 1,000කට වැඩි ප්‍රමාණයකට පරාටේ නීතිය ක්‍රියාත්මක කරලා තිබෙනවා. 2019දී මෙන්න මේ පනත තිබුණා නම් අපට ව්‍යාපාර සෑහෙන ප්‍රමාණයක් බේරා ගන්න තිබුණා. අද වනකොට ඒ තත්ත්වයට අපේ ව්‍යාපාරිකයන් පත් වුණේ පාලකයන්ගේ අත්තනෝමතික, නැත්නම් දැක්මක් නොමැති ආර්ථික ක්‍රියාවලිය නිසායි කියන එක කියන්නත් කනගාටුයි.

හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැන් මේ පනත ක්‍රියාත්මක කරනවා. මේ පනතත් එක්ක සිද්ධ වෙන්නේ මොකක්ද? පුද්ගලයෙක් බුන්වත්භාවයට පත් වුණාම, නැත්නම් ව්‍යාපාරයක් බිඳ වැටුණාම එහි ණය හිමියන් ඇවිත් ඒ පුද්ගලයාට කරදර කරනවා. ඒ පුද්ගලයාට ඔළුව ඔසවන්න දෙන්නේ නැහැ. මේ සඳහා අවශ්‍ය කරන කාලයක් ලබා දීලා, නැවතත් මේ ව්‍යාපාරය හෝ පුද්ගලයා ප්‍රකෘති තත්ත්වයට පත් වෙන්නේ කොහොමද කියලා ඒ ණය හිමියන් එක්ක එකඟතාවකට එන්න රාජ්‍ය මැදිහත්වීමක් සිදු කරනවා. මේක ඉතාම සාධනීය ක්‍රියාවලියක්. ඒ කියන්නේ, මැරෙන්න යන මනුස්සයෙක්ට නව පණක් දෙන්න තමයි මේ පනතින් උත්සාහ කරන්නේ. අපි මුලින්ම හදා ගන්න ඕනෑ, Insolvency Regulatory Authority කියන එක. ඒ කියන්නේ, රාජ්‍ය ආයතනයක් හැදෙනවා, මේ බුන්වත්භාවය පිළිබඳව සලකා බලන්න. එතකොට යම්කිසි ව්‍යාපාරයකට හෝ

[ගරු චතුරංග අබේසිංහ මහතා]

පුද්ගලයෙකුට ස්වාභාවික හේතුන් නිසා හෝ, කළමනාකරණ හේතුන් නිසා හෝ, වෙළෙඳ පොළ හේතුන් නිසා තමන්ගේ ණය ගෙවා ගන්න බැරි නම් මේ ආයතනයට ගිහින් කියන්න පුළුවන්, මම මෙන්න මෙහෙම තත්ත්වයකට පත් වෙලා ඉන්නවා, මට මේ අධික පොලී සහිත ණය ගෙවා ගන්න විධියක් නැහැ, මට සහන කාලයක් දෙන්න, අපි පොදු වැඩ පිළිවෙළකට යමු කියලා. එතකොට මේ ආයතනය මේ ඉල්ලුම්කරුගේ අවශ්‍යතාවට සවන් දීලා කාලයක් ලබා දෙනවා, මෙන්න මේක නැවතත් ප්‍රකෘති තත්ත්වයට පත් කර ගැනීමට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න කියලා. මෙන්න මේ ප්‍රකෘති තත්ත්වයට පත් වෙන්න ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ ඉදිරිපත් කළාට පස්සේ තමයි ලංකාවේ තිබෙන පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීමේ අයිතිය හෝ බලය බැංකුවකට හිමි වෙන්නේ. මොකද, බැංකුවල විතරක් නොවෙයි ණය හිමියන් ඉන්නේ. Creditorsලා ඉන්නවා. රජයට විවිධ ගෙවීම් කරන්න තිබෙනවා. සේවකයන්ට ගෙවීම් කරන්න තිබෙනවා. අද වනකොට තිබෙන තත්ත්වය යටතේ ප්‍රමුඛතාව ලැබෙන්නේ බැංකුවලට. ඒ මොකද, ඇපකරයක් තියලා තිබෙන නිසා. ඇපකරය විකුණලා මුලින්ම විසඳන්න වෙන්නේ බැංකුවේ ණය.

ඒ වාගේම අද තිබෙන තත්ත්වයට අනුව මේ ක්‍රියාවලියෙන් පස්සේ පුද්ගලයෙකුට නිදහස් පුරවැසියෙක් විධියට ජීවත් වෙන්න අයිතියක් නැහැ. ඒ පුද්ගලයාව CRIB එකට යනවා. මේ solvency ක්‍රියාවලියෙන් පස්සේ ඒ පුද්ගලයාට හෝ ආයතනයට නැවත ප්‍රකෘතිමත් පුද්ගලයෙක් හෝ ආයතනයක් බවට පත් වෙන්න පුළුවන්. Companies Act එකට අනුව ආයතනයක් පිහිටෙව්වාම veil of incorporation කියලා එකක් අපට දෙන බව අපි දන්නවා. ඒ කියන්නේ, ආයතනයට අයිතිකරුවන්ගෙන් වෙනස් වුණු පැවැත්මක් තිබෙනවාය කියන එකයි. අද තිබෙන තත්ත්වය අනුව ආයතනයයි, අයිතිකරුයි කියන දෙදෙනාම බිඳ වැටෙනවා. මේ ක්‍රමය යටතේ අර ආයතනය නැවත වෙනම ගොඩනඟන්න නව අයිතිකරුවෙකුට එන්න පුළුවන්. නව ප්‍රාග්ධන හිමියෙකුට එන්න පුළුවන්. එහෙම නව ප්‍රාග්ධන හිමියෙකුට ඇවිල්ලා කර්මාන්තය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාවක් තිබෙනවා. මේ තුළින් සේවකයන්ට රැකියා සුරක්ෂිතභාවය ලැබෙනවා; නිෂ්පාදනයට අඛණ්ඩත්වය ලැබෙනවා; සැපයුම්කරුවන්ට, පාරිභෝගිකයන්ට අඛණ්ඩත්වය ලැබෙනවා. මෙන්න මේ වාගේ දියුණු ක්‍රමයකට තමයි අපේ රට අදින් පස්සේ ගමන් කරන්නේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙනුවෙන් කාලයක් සටන් කරපු පුද්ගලයෙක් විධියට මට ඉතාම සතුටුයි, මේ රජය යටතේ අවුරුදු එකහමාරක් ඇතුළත මේ පනත අපට ගෙනෙන්න පුළුවන් වීම ගැන. ඒ වාගේම තමයි, මේ Official Receiver; මේ වාගේ බුන්වත් වෙච්ච පුද්ගලයන්ගේ ප්‍රශ්න, ආයතනවල ප්‍රශ්න මේ ආයතනයට අපි ලබා ගන්නවා. මේ වාගේ ක්‍රියාවලියක මෙහෙයුම් කටයුතු කරන්න Insolvency Practitioners කියලා - අපි කියනවා IPs කියලා - වෘත්තිකයන් ප්‍රමාණයක් හෙට ඉඳලා බිහි වෙනවා. එතකොට ඒ වෘත්තිකයන්ට අලුත් වෘත්තියක් අපේ රටේ බිහි වෙනවා. ඒ අයට තමයි මේ මැදිහත්කරණය කරන්න අවශ්‍ය කරන නීති, ගිණුම්කරණය පිළිබඳ අවබෝධය තිබෙන්නේ. දැන් අපි සූදානම් වෙන්නේ District Courts - දිස්ත්‍රික් උසාවි - හරහා මේ ප්‍රශ්න විසඳා ගන්නයි. ඒවා තවදුරටත් ශක්තිමත් කර ගන්න වෙයි. සමහර වෙලාවට අපට Commercial Courts වෙනම හදන්න වෙයි, මේ ප්‍රශ්න ඉක්මනින් විසඳන්න.

මේ ක්‍රියාවලිය ගත්තාම විශේෂයෙන්ම මේ පනතේ ආකාර තුනක් තිබෙනවා. එක ආකාරයක් තමයි, ආයතනයක් නම් - company එකක් නම් - මොකක්ද ගන්න ඕනෑ ක්‍රියාමාර්ගය, මොකක්ද යන path එක කියන එක. ඊළඟ ආකාරය තමයි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් නම්, ක්ෂුද්‍ර ව්‍යාපාරයක් නම් ඉතාම ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳා ගන්න මැදිහත් වෙන්නේ කොහොමද කියන එක. ලබා ගත් ණය රුපියල් මිලියන 50ට අඩු නම් සමහර වෙලාවට ඒ ණය කපා හැර ගැනීමටත් මේ පනතින් පනවා තිබෙන විධිවිධාන යටතේ හැකියාවක් ලැබෙනවා. ඒ වාගේම, පුද්ගලයෙක් විධියට යම්කිසි හේතුවක් නිසා තමන්ගේ වගකීම් - liabilities - ඉටු කර ගන්න බැරි වුණොත් ඔහුට මේ ආයතනයෙන් ඉල්ලීමක් කරන්න පුළුවන්, මට අසනීප වෙච්ච නිසා, මට මේ අර්බුදය ඇති වෙච්ච නිසා, මගේ ගෙදර මේ ප්‍රශ්නය නිසා මම මේ ගත්ත ණය ප්‍රමාණය ගෙවා ගෙන යන්න විධියක් නැහැ, සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා. මෙන්න මේ ආකාරයෙන් අපේ රටේ අනාගතය සාක්ෂාත් කර ගන්න අවශ්‍ය වන පියවර මේ පනතට ඇතුළත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනකොට අපේ රටේ ගොඩක් ආයතනවලට, කර්මාන්තකරුවන්ට පරාටේ නීතිය ක්‍රියාත්මක වෙනවා. පරාටේ නීතිය කියන්නේ, අපේ රටේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ලබා දුන් අයිතියක්. තමන්ගේ බැංකුවලින් ලබා ගත් ණය ගෙවීම පැහැර හරින ආයතනවලට එරෙහිව අධිකරණ පද්ධතියට යන්නේ නැතිව ඔවුන් සම්බන්ධව මේ පරාටේ නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ කියන්නේ, ඇපයට තබා ඇති වත්කම විකුණලා තමන්ගේ ණය පියවා ගන්න බැංකුවලට අයිතිය ලැබුණා. අපි හරියට මේ පනත ක්‍රියාත්මක කරන්න පටන් ගත්තාම ඒ සඳහා නිතැතින්ම දින 60ක කාලයක් ලැබෙනවා. ඒ කියන්නේ, ඒ දින 60ක කාලය ඇතුළත බැංකුවට පරාටේ නීතිය ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ වාගේම, අපට සාධනීය හේතු ඉදිරිපත් කරලා ඒ දින 60ක කාලය, දින 90, දින 180 දක්වා දීර්ඝ කර ගන්න පුළුවන්. මේ පිළිබඳ සාකච්ඡාවක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් ඇති වී තිබෙනවා, මේ සඳහා දින 60ට වඩා කාලයක් ලබා දෙන්න කියලා. ඒ ගැන අපට ඉස්සරහට සලකා බලන්න පුළුවන්. නමුත්, මේ පනතේ දැනට දින 60ක කාලයකුත්, ඒ කාලය දීර්ඝ කර ගැනීමේ හැකියාවකුත් තිබෙනවා. මෙන්න මේ ක්‍රියාවලිය අනුව ඉස්සරහට කටයුතු කරගෙන යනකොට යම්කිසි හේතුවක් නිසා බිඳ වැටෙන අපේ රටේ ව්‍යාපාරවලට විදේශ ආයෝජන කැඳවා ගන්න, එහෙම නැත්නම් ඒ බුන්වත් වෙච්ච ව්‍යාපාර නැවත පණගන්වා ගන්න අවශ්‍ය කරන ප්‍රාග්ධන හිමියන්ට අවස්ථාවක් ලබා දෙන්නත් මේ තුළින් හැකියාවක් ලැබෙනවා. මෙතැනින් පස්සේ මේක හරියට ක්‍රියාත්මක වුණොත්, ඇත්තවශයෙන්ම අපේ රටේ කිසිම කර්මාන්තයක් බිඳ වැටෙන්න කිසිම හේතුවක් නැහැ. ඒ කියන්නේ, කළමනාකරණ අදක්ෂතාව නිසා හෝ හදිසි ව්‍යසනයක් නිසා ව්‍යාපාරයක් බිඳ වැටුණොත් ඒ ව්‍යාපාරය නැවත ගොඩනඟා ගන්න අවස්ථාවක් ලැබෙනවා. ඒ නිසා තමයි Rescue, Rehabilitation and Insolvency (Corporate and Personal) Bill කියන නම දාලා තිබෙන්නේ. ඒ කියන්නේ, එම ව්‍යාපාර නැවත නඟාසිටුවීමට මේ පනත තුළින් අවස්ථාවක් ලබා දෙනවා. මෙන්න මේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ගැනීම සඳහා අපට මේ අධිකාරිය පිහිටුවා ගන්න ඕනෑ. ඒ අධිකාරියේ කළමනාකාරිත්වය කොහොමද වෙන්න ඕනෑ, Board එක කොහොමද වෙන්න ඕනෑ කියලා මේ පනතේ සඳහන් කර තිබෙනවා. මේ ක්‍රියාවලිය තුළ තමයි අද මේ පනත ඉදිරිපත් කර තිබෙන්නේ.

ජාත්‍යන්තර වශයෙන් මේ පනත් ක්‍රියාත්මක වන ආකාරය, එහි ක්‍රියාවලිය පිළිබඳ හොඳ අධ්‍යයනයකින් පසුව තමයි මේ පනත ලංකාවට හඳුන්වා දෙන්නේ. මේ පනත සම්මත වුණාට පසුව මේ recovery speed එක වැඩි වෙනවා. ඒ කියන්නේ, කර්මාන්තයක් බිඳ වැටුණොත් එය වේගයෙන් නැවත පණගන්වා ගන්න පුළුවන් වෙනවා. මේකෙන් සමහර වෙලාවට අයුක්තියක් සිද්ධ වෙනවා. ඒ වාගේම තමන්ගේ වත්කම්වල වටිනාකම පිළිබඳව එකඟතාවකට එන්න බැරි වෙනවා. එහෙම එකඟතාවකට එන්න දැන්

මැදිහත්කරුවෙක් ඉන්නවා. එතකොට සාධාරණ ක්‍රියාවලියක් ඇතුළේ තමයි winding down process එකක් වුණත් යන්නේ. එතකොට මේ ක්‍රියාවලිය ඇතුළේ අපේ ණය නැවත ලබා ගැනීමට, එහෙම නැත්නම් ණය දීමට පෙලඹීමක් සිද්ධ වෙනවා.

මොකද, මේ වාගේ ක්‍රියාවලියක් තිබෙන තැනක ඇප සහිතව, ඇපම අරගෙන ණය දෙන අවශ්‍යතාව අඩු වේගෙන යනවා. මොකද, විධිමත් නෛතික ක්‍රියාවලියක් තිබෙනවා. අපි ආණ්ඩුවට එනකොට මේ අය හිනා වුණා, විශේෂයෙන්ම මට හිනා වුණා, මේ ඇප රහිත ණය කොහොමද දෙන්නේ කියලා. මම කියන්න කැමැතියි මහත්වරුනේ, ඇප රහිත ණය මේ වෙනකොට 1,600 දෙනෙකුට අපේ ආණ්ඩුව දීලා තිබෙන බව. මේ ක්‍රියාවලිය අපි පටන් ගත්තේ ගිය අවුරුද්දේ. කරන්න බැහැ කියපු එක අපි කරලා තිබෙනවා. මේ ඇප රහිත ණය ක්‍රමය අද ඉතාම ශක්තිමත් ණය ක්‍රියාවලියක් විධියට ක්‍රියාත්මක වෙනවා.

ඒ වාගේම, සහන පොලී ණය ක්‍රමය යටතේත් අපි මුදල් ලබාදී තිබෙනවා. සියයට 5ක පොලියට අපි මේ අවුරුද්දේ රුපියල් බිලියන 25ක් දීලා තිබෙනවා. සමස්ත සහන පොලී ණය වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රමාණය රුපියල් බිලියන 95ක්. එය ඉතිහාසයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලැබිච්ච වැඩිම ණය. සතුටුයි කියන්න, පළමුවැනි කාර්තුව අවසන් වෙද්දී රුපියල් බිලියන 44ක ණය ප්‍රදානය කරලා තිබෙනවා. මේ processes අපි improve කරලා තිබෙනවා. මුදල් අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය එකතු වෙලා වැඩ කරලා මීට කලින් මාස 4කට වැඩිය ණය ගන්න ගිය කාලය අපි මාස දෙකකට අඩු කරලා තිබෙනවා. මේවා ඔයගොල්ලන්ට කරගන්න බැරි වෙච්ච ඒවා. මේ ණය ක්‍රම හැම එකකටම අපි සුරකුම් ක්‍රමය, ඇප රහිත ණය ලබා දෙන ක්‍රමය එකතු කරලා තිබෙනවා. මෙන්න මේ ක්‍රියාවලිය ඉස්සරහට කරගෙන යනකොට ලබන අවුරුද්ද වෙනකොට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ප්‍රාග්ධනය ලබා ගන්නත් venture capital fund, නැත්නම් Fund of Funds එකක් හදනවා. එතකොට Agni Fund එකට - IT පැත්තට - බිලියන 1.5ක්, ඊළඟට tourism sector එකට World Bank එකේ fund එකක්, ADB fund එකක්, මේ වාගේ ප්‍රාග්ධනයට අවශ්‍ය කරන අවශ්‍යතා අපි සකසමින් යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ප්‍රධාන ප්‍රශ්නයක් තමයි අපි අද මේ විසඳන්නේ.

ඒ ප්‍රශ්නයට එහා ගිහිල්ලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය කරන කාරණා, ඒවාට ශක්තියක් වෙන්න අවශ්‍ය කරන අංග 11ක් සහිත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගොඩනැඟීමේ ජාතික රාමුව මේ එන 13වැනි දා අපි එළිදක්වනවා. මේ ජාතික රාමුවට අනුව තැන් තැන්වල විසිරිලා තිබුණු විවිධ ආකෘතිවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට උදව් දෙන්න තිබුණු සියලුම වැඩසටහන්, සියලුම ආයතන කර්මාන්ත අමාත්‍යාංශය හරහා ඒකාබද්ධ වෙනවා. එම ඒකාබද්ධ වීම ඇතුළේ අපේ රටට සංවිධිත වැඩ පිළිවෙළක් හැදෙනවා, මේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දත්ත මත පදනම්ව, අපනයන ප්‍රමුඛ, අපනයන ජාලයට එකතු වන කර්මාන්ත බවට, ව්‍යාපාර බවට පත් වෙන්නේ කොහොමද කියලා. මේවාට සංවිධිත ආකාරයෙන් බිම් මට්ටමේ සහාය දෙන්නේ කොහොමද, අපි අලුතින් හදන ආයතන පද්ධතිය මොකක්ද, මේවාට වෙළෙඳ පොළ අවශ්‍යතාව සපුරන්න වෙළෙඳ පොළට ප්‍රවේශය හදලා දෙන්නේ කොහොමද, මේ අයට ප්‍රාග්ධනය ලබා දෙන්නේ කොහොමද, මේ අයට අවශ්‍ය කරන දැනුම ලබා දෙන්නේ කොහොමද, මේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට උදව් කරන විවිධ ආයතන අමාත්‍යාංශය හරහා recognize කරන්නේ කොහොමද, එතැනින් එහාට ගිහිල්ලා ව්‍යාපාරකරණය, ව්‍යවසායකත්වය පිළිබඳව අධ්‍යාපන පද්ධතියට එකතු කරගෙන, අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක අපි ඒකාබද්ධව වැඩ කරන්නේ කොහොමද කියන ඒ සංයුක්ත වැඩ පිළිවෙළ මේ 13වැනි දා අපේ ජාතියට හිමි වෙනවා. ඒ ගැන සඳහන් කිරීමක් කරන්න අවශ්‍යයි.

ඊළඟට ගත්තාම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ප්‍රතිපත්තියක් අපේ රටේ නැහැ. 2016දී මෙගොල්ලන් ප්‍රතිපත්තියක් හැදුවා. ඒක දැන් යල් පැනලා; අවුරුදු 10ක් පරණයි. ඒක අලුත් කරලා මේ අවුරුද්ද අග වෙනකොට ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට නව ජාතික ප්‍රතිපත්තියක් අපි ගේනවා. මේවා තමයි කරන්න බැරි වෙච්ච වැඩ. අපි දැන් මේවා කරනකොට, මෙන්න මෙහෙම දෙයක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේක පාර්ලිමේන්තුවේ කියනවා කියලා හිතුවා. ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීන්; අපිත් එක්ක ඉතාම ශක්තිමත්ව වැඩ කරන නිලධාරීන් අපිත් එක්ක උරණ කරන්න, අපිත් එක්ක ඝට්ටනයක් ඇති කරන්න මෙගොල්ලන් බිම් මට්ටමින් බොරු ප්‍රචාර කරගෙන යනවා කියලා දැන් අපට ආරංචියක් ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ, රාජ්‍ය සේවය වර්තමාන ආණ්ඩුවත් එක්ක එකතුව ශක්තිමත්ව ආර්ථිකය ඉස්සරහට අරන් යනකොට, ආණ්ඩුවයි, රාජ්‍ය සේවයයි අතර ගැටුමක් ඇති කරන්න විවිධ බොරු තොරතුරු දීලා තිබෙනවා. විශේෂයෙන්ම නිලධාරීන් කිහිප දෙනෙකුටම මම ගැන සඳහන් කරලා තිබෙනවා. ඒ නිලධාරීන්ට කියා තිබෙනවා, මේ නියෝජ්‍ය ඇමතිතුමා මෙන්න මෙතැනදී, මෙන්න මෙහෙම දෙයක් ඔබතුමන්ලා ගැන කිව්වා කියලා. අපි සොයා බැලුවා. එවැනි meeting එකක් තිබිලත් නැහැ; එවැනි දෙයක් මම කියලත් නැහැ. ඒ නිසා දැන් මෙගොල්ලන්ට මේ ආණ්ඩුව වට්ටාගන්න ක්‍රමයක් නැතිව විවිධ උපක්‍රම හොයනවා. මම හිතන විධියට, එකක් තමයි දැන් ලොක්කාම කියලා ඔය පටන් ගත්තේ. මේ වෙන සිද්ධි ඇතුළේ රාජ්‍ය සේවයයි, දේශපාලනයයි අතර ගැටුමක් ඇති කරන්න තමයි හදන්නේ. අපි කියනවා, ඒවාත් අසාර්ථක වෙන බව. ඔයගොල්ලන්ගේ දේශපාලනය වාගේම ඔය ගන්නා උපක්‍රමත් අසාර්ථක වෙනවා. මොකද, අපි රාජ්‍ය නිලධාරීන්ට ඒ ගෞරවය ලබා දෙමින් ඉතාමත් ශක්තිමත්ව මේ ආණ්ඩුව අපේ අරමුණු කරා අරන් යනවා කියලා මම කියන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Chamara Sampath Dasanayake. You have 12 minutes.

[අ.භා. 12.11]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම මම කාරණයක් කියන්න ඕනෑ. ක්‍රීඩා ඇමති ඇවිල්ලා දැන් මෙතැන පම්පෝරියක් ගහලා ගියා. මධ්‍යම ආසියානු කනිෂ්ඨ වොලිබෝල් තරගාවලිය - CAVA කුසලාන වොලිබෝල් තරගාවලිය - දැන් කසක්ස්තානයේ පැවැත්වෙනවා. ලංකාවේ ජාතික ක්‍රීඩාව වොලිබෝල්. මේ සඳහා කනිෂ්ඨ කාන්තා සහ පිරිමි කණ්ඩායම් දෙකම - දෙගොල්ලන්ම - යවන එක නවත්වලා තිබෙනවා, ක්‍රීඩා අමාත්‍යාංශයෙන්. ඒකට දැන් දඬයකුත් ගහන්න සූදානම් වෙලා තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. නුවරඑළියේ ගිහිල්ලා මැයි පෙළපාළි තිබ්බා. මැයි පෙළපාළි තියලා කථා කරපුවාත් අපි දැන් කියන්නම්. ඊට කලින් මේ කාරණය මම කියන්න ඕනෑ. තවම කෝච්චිය නුවරට යන්න හදා ගන්න බැරි වුණා. සුද්දෝ හදපු පාර. හානියට පත් වුණාට පස්සේ තවම නුවරට කෝච්චිය යන්න හදා ගන්න බැරි වුණා. නුවරඑළියේ වැඩි හරියක් ද්‍රවිඩ ජනතාව - නාවලපිටියෙන් පටන් ගත්තාම නාවලපිටිය, රොසැල්ල, හැටන්, නානුඔය කියන ඔක්කෝම ප්‍රදේශවල වතු කම්කරු ජනතාව - ගමන් කළේ

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කෝව්චියෙන්. දැන් මාස අටක් වනවා. බදුල්ලට කෙසේ වෙතත් නුවරටවත් කෝච්චිය ගෙනියන්න බැරි වුණා, මහා ලොකුවට කයිවාරු ගහන ආණ්ඩුවට. වැඩිය ඕනෑ නැහැ, වෙන මොන project එකක්වත් කරන්න ඕනෑ නැහැ, අර සුද්දෝ හදලා යන්තම් බදුල්ලට තිබ්බ උඩරට දුම්රිය යළි ලබා දෙන්න කියලා මේ වෙලාවේදී මම කියනවා.

ඒ එක්කම මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ ආණ්ඩුව මැයි දිනයේදී ලැයිස්තුවක් කිව්වා. ජනාධිපතිතුමා නඩුකාරයා. තෝල්කයෝ ඉන්නවා, හතරපස්දෙනෙක්. අධිකරණ ඇමති එක තෝල්කයෙක්. බිමල් රත්නායක මහත්තයා එක තෝල්කයෙක්. ඒ ඇමතිවරු ඔක්කෝම meetingsවල කථා කරන්න ගියේ වෙන මොනවත් නොවෙයි, ලැහැස්ති වෙලාම ගියේ කෙළින්ම හිරේ දමන එක ගැන කථා කරන්නයි. කෙළින්ම නඩුකාරයා කියනවා, තෝල්කයෝ කියනවා. තැන් තැන්වල කියනවා හිරේ දමන ඒවා ගැන. මම කියනවා, අනේ ඕවා කියව කියවා ඉන්න එපා කියලා. නඩුකාරයෝ ඉන්නේ බොහොම පොඩ්ඩයි, මේ රටේ. උගත්, බුද්ධිමත් මිනිස්සු නඩුකාර තනතුරුවලට ගිහිල්ලා තිබෙන්නේ. ඕවා කියවලා ඒ මිනිසුන්ගේ රෙදි ගලවන්න එපා. ඒ මිනිස්සු අපහසුතාවට පත් කරන්න එපා. ඕක කියන්නේ නැතුව අධිකරණ ඇමතිතුමා හෙමිහිට යවන්න list එකක් "මේ චාමරයා වධයක්, මුව දමන්න ඊළඟ නඩුවෙන්" කියලා. "මේ චාමර සම්පත් වධයක්, මෙන්න මුව ඇතුළට දමන්න" කියලා හෙමිහිට ලියුම් කැල්ලක් පිටත් කරන්න. නැත්නම් ගෙන්වලා කියන්න. ඔහොම කිව්වාම දැන් නඩුකාරවරුනුත් තීන්දුවක් දෙන්න බැරි තත්ත්වයට පත් වෙලා නේ ඉන්නේ. ඇයි, 25වැනි දා දෙනවා කියනවා; අහවලා දෙනවා කියනවා; list එක කියවනවා. Lists පිටින් කියවනවා. එහෙම කිව්වාම කොහොමද?

මම මේ කාරණය කියනවා අග්‍ර විනිශ්චයකාරතුමාට. අග්‍ර විනිශ්චයකාරතුමා අවුරුදු 40ක් විතර සේවයේ හිටපු මනුස්සයෙක්. එතුමා නොවැම්බර් මාසයේ විශ්‍රාම යනවා. එතුමාගේ පුතාත් නඩුකාරයෙක්. අනේ අග්‍ර විනිශ්චයකාරතුමනි, අධිකරණයට අපහාසයක් වන විධියට මේගොල්ලන් කියන ඒවා කරන්න ගියොත්, නඩුකාර මහත්වරුන්ට ටයි එකක් දමලා, කෝට් එකක් දමලා Bench එකේ වාඩි වෙන්න විධියක් නැහැ; මේගොල්ලන් නඩු තීන්දු කියලා ඉවරයි නේ. ලජ්ජයි නේ. මෙහෙම වුණොත් අධිකරණයට මොකක්ද වෙන්නේ? අපහාසයක්. ඒ නිසා මම අග්‍ර විනිශ්චයකාරතුමාට කියනවා, ඔබතුමා පත් කරන්න සජිත් ප්‍රේමදාසත් ඡන්දය දුන්නා; අජිත් පී. පෙරේරාත් ඡන්දය දුන්නා; දෙමළ ජාතික සන්ධානයත් ඡන්දය දුන්නා. එතුමන්ලා ඔක්කෝම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ඡන්දය දීලා තමයි ඔබතුමාව පත් කළේ. මේ ආණ්ඩුව විතරක් අග්‍ර විනිශ්චයකාරවරයා පත් කළේ නැහැ. ඒ නිසා මම මේ වෙලාවේදී කියන්න ඕනෑ, මේවා කියන්නේ නැතුව, වැඩක් කරනවා නම්, අපිව හිරේ දමනවා නම්, ඒක හොරෙන් ලියුම් කැල්ලක් දමලා හරි, ගෙන්වලා කියලා හරි කරන්න; "මේ චාමර සම්පත්ව ඇතුළට දමන්න, මුව හරි වධයක්" කියලා ඒක ඒ විධියට කරන්න. එහෙම නැතුව මැයි රැළිවලයි, පාරවල් ගානෙයි නඩු තීන්දු කියව කියවා හිටියාම ඒක ආණ්ඩුවට හොඳ නැහැ. ඊළඟ කාරණය, ඔතැන ඉඳන්- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඒක කමක් නැහැ. දයාසිරි මන්ත්‍රීතුමායි මමයි- *[බාධා කිරීමක්]* ඒක පස්සේ බලා ගනිමු. ඒක මොනවා හරි වෙන දෙයක්. ඔබතුමා ඒක පටලවන්න හදන්න එපා මෙතැනට. *[බාධා කිරීමක්]*

ඊළඟ කාරණය මේකයි. ගිය සැරේ අය වැය කථාව, ඒ පොත අරගෙන බලන්න, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා ඔය පුටුවේ ඉඳන්ම කිව්වා, 2025 වෙනකල් හිටපු අනියම් සේවකයන් සියලුදෙනා - මාස 6කට වැඩි කාලයක් සේවයේ නියුතු - ස්ථිර කරනවාය කියලා. බිමල් රත්නායක මහත්තයා ඔතැන හිටියේ, ජනාධිපතිතුමා අතැන හිටියේ. දැන් දෙන්නේ 2019.09.10 වනතුරු අයට. ඒ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ගහපු ගැසට් එකට. එහෙම වුණොත් තුන්දහස් ගණනක් තමයි ස්ථිර වෙන්නේ. අනෙක් කට්ටිය ස්ථිර වෙන්නේ නැහැ. වැඩක් කරනකොට ටිකක් හිතලා බලලා කරන්න. මේ කියන ඒවා එකක් හරි, ජනාධිපතිතුමා කියන එකක් හරි ක්‍රියාත්මක කරවන්නකෝ.

ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. පොලීසිය භාර ඇමතිතුමනි, ඔබතුමා ගැසට් එකක් ගහලා තිබෙනවා, WPCsලා බඳවා ගන්න. මොනවාද ඉල්ලා තිබෙන්නේ? ගණිතයට "C", ඉංග්‍රීසිවලට "C", විද්‍යාවට "C". ඊළඟ එක මොකක්ද? වයස් සීමාව අවුරුදු 24 කියලායි සඳහන් කර තිබෙන්නේ. ගැසට් එකේ තිබෙන්නේ එහෙමයි. අවුරුදු 18-24 කියන්නේ, සාමාන්‍යයෙන් ළමයෙක් හිතන්නේ නැහැ ඒ වයසෙන් ජොබ් එකකට එන්න. පොලීසියට ගන්න අඩුම වශයෙන් උපරිම වයස අවුරුදු 28 කරන්න. දැන් PCsලා බඳවා ගන්න ගැසට් එකක් ගහලා තිබෙනවා. අපේ කාලයේ වාගේ නොවෙයි. අපේ කාලයේ වාගේ ළමයි අවුරුදු 18න්, 20න් පොලීසියට බැඳෙන්නේ නැහැ. ළමයි පොඩ්ඩක් ඇවිදිනවා; class යනවා; අරහේ යනවා; මෙහේ යනවා. ගිහිල්ලා, අඩුම වශයෙන් අවුරුදු 24ක් වෙනකල්වත් කල්පනා කරනවා ගෙවල්වල ඉඳන්, තමන් ජොබ් එකකට යනවාද කියලා.

අපේ කාලයේ නම් අවුරුදු 18, 19 වෙනකොට ආර්ථික ප්‍රශ්න ආවාම කොහේ හරි ජොබ් එකකට යන්න උත්සාහ කළා. ගරු සභානායකතුමනි, දැන් අවුරුදු 24න් පොලීසියට බැඳෙන්න පුළුවන් ගැසට් එකක් ගහලා. ඊළඟට, පොලිස් කාන්තාවන් බඳවා ගන්න දාලා තිබෙන සුදුසුකම් බලන්නකෝ. මේ ඉල්ලන සුදුසුකම් තිබෙන කාන්තාවක්, පොලිස් කාන්තාවක් වශයෙන් එයිද? නැත්නම් මේ ඉල්ලන සුදුසුකම් තිබෙන මිනිස්සු පොලීසියේ රාළහාමිලා වශයෙන් බැඳෙයිද? පොලීසියේ රාළහාමිට ඒ කාලයේ ASPගේ සුදුසුකම් දාලා. පොලීසිය භාර ඇමතිතුමනි, පොලීසියට නිලධාරීන් 40,000ක් අඩුයි. හෙට අනිද්දා වෙනකොට පොලීසි වහන්න වෙලායි තිබෙන්නේ. අවුරුදු 24ක් නොවෙයි, ගැසට් එකේ සඳහන් වයස, අඩුම වශයෙන් අවුරුදු 28වත් කරන්න. එහෙම කළේ නැත්නම් පොලීසියට බඳවා ගන්න ඔබතුමාට බැරි වෙනවා. තරුණයෝ එහෙම එකපාර පොලීසියට එන්නේ නැහැ.

ඊළඟ එක තමයි ඩිජිටල් හැඳුනුම්පත පිළිබඳ කාරණය. රනිල්ගේ ආණ්ඩුව තියෙද්දී එතුමා ඔය පැත්තේ - ආණ්ඩුව පැත්තේ - ඉඳන් ඒ කාරණය ගැන කථා කරන කොට, වත්මන් ජනාධිපතිතුමා මෙතැන ඉඳන් - විපක්ෂය පැත්තේ ඉඳන් - කිව්වා, ජාතික හැඳුනුම්පත් හදන්න ඉන්දියාවට දීලා ඔයගොල්ලන් කරන්න යන්නේ රටේ තොරතුරු ඉන්දියාවට දෙන්න හදන එකයි කියලා. වත්මන් ජනාධිපතිතුමා එදා මේ පැත්තේ - විපක්ෂය පැත්තේ - ඉඳන් එහෙමයි කිව්වේ. එතකොට අපි ඔය පැත්තේ; ඒ කියන්නේ ආණ්ඩුව පැත්තේ. නමුත් දැන් ඔබතුමන්ලා කරන දේ බලන්න. මේ ආණ්ඩුව - ලංකාවේ රජය - බිලියන 5.3ක් වෙන් කරලා තිබෙනවා, ඩිජිටල් හැඳුනුම්පත් හැදීම වෙනුවෙන්. ඔයගොල්ලෝ ඒක ඉන්දියාවේ Madras Security Printers Private Limited එකට දෙන්න කටයුතු කරලා තිබෙනවා. දැන් ටෙන්ඩර් වහලාත් ඉවරයි. ඒ කටයුත්ත ඉන්දියාවට දෙන්න යනවා. අනේ, ඒක කරන්න යන්න එපා. ඔයගොල්ලෝ; බිමල් රත්නායක මහත්තයලා ඒ කාලයේ පන්ති 5 කළා. පන්ති 5දී ඉන්දියානු ව්‍යාප්තවාදය ගෙනාවා. එදා ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන කියමින් ඉන්දියාවේ බඩු ගේන්න එපා කිව්වා. හැබැයි ඉතින්, දැන් මොකක්ද කරලා තිබෙන්නේ? ඔයගොල්ලෝ හැඳුනුම්පත් එකතු කරපු මිනිස්සු. මොන මඟුලටද ඉන්දියාව හරහා හැඳුනුම්පත් හදන්නේ? ඉන්දියාව හරහා හැඳුනුම්පත හදන එක වහාම නවත්වන්න. මොකද, මෙහිදී ඇඟිලි සලකුණුත් නොවෙයි යොදා

ගන්නේ. කලින් ඇඟිලි සලකුණු තියලා නේ කළේ. කළු ඉංගිරියාව ස්කෑන් කරලා තමයි ඩිජිටල් හැඳුනුම්පත හදන්න යන්නේ, ඉන්දියාව හරහා. මේ දේවල් කිව්වාම අපව හිරේ දමාවි. ඒකට කමක් නැහැ. මොකද, අපව හිරේ දාන්න මෙගොල්ලන් දැන් ලැයිස්තු හදලා ඉවරයි. මම ආයෙත් lawyersලා අල්ලන්නේ නැහැ. මොකද, අපරාදෙ නේ, lawyersලා අල්ලලා. Lawyersලාට සල්ලි දෙන්නේ නැහැ, ආයෙත්. දීලා වැඩක් නැහැ නේ. ඇයි, මෙගොල්ලෝ ලැයිස්තු හදලා කියවනවා. ඊයේ එක තැනකදී අපේ සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා, චාමර සම්පත්ගේ නම. ඊළඟට, අපේ අධිකරණ ඇමතිතුමා කිව්වා, "අර චාමර සම්පත්; අර බදුල්ලේ එක්කෙනා" කියලා. ඔන්න ඉතින්, දැන් නම් ලැයිස්තු, නඩු නම්බර් ඔක්කෝම කියලා ඉවරයි. ඒ හින්දා මම ආයෙත් lawyersලා අල්ලන්නේ නැහැ. මම අල්ලලා තිබුණේ ඔබතුමාගේ ගුරුන්නාන්සේ. ඔබතුමා වැඩ කළේත් එතැන තමයි. ඔබතුමාගේ ගුරුන්නාන්සේ තමයි මම අල්ලලා තිබුණේ. මම එතුමාගේ නම කියන්නේ නැහැ. හොඳ නැහැ නේ. මම ගිහිල්ලා ඔබතුමාගේ ගුරුන්නාන්සේට කියනවා, අපට නඩු දාන බව ඔබතුමාගේ ගෝලයා කියනවා කියලා. Proctorsලා ඕනෑ නැහැ නේ. ආයෙත් proctorsලාට සල්ලි දෙන්නේ නැහැ. ආයෙත් ඕනෑ නැහැ. අපි ගිහිල්ලා හිටගෙන ඉන්නවා. ඕනෑ නඩුවක් කථා කරලා මෙගොල්ලෝ කියන විධියට ඇතුළට දමාවි. ඇයි යකෝ, සල්ලි දෙන්නයි, ඇතුළට යන්නයි දෙකක් කරන්න පුළුවන්ද? සල්ලි දෙන්නයි, ඇතුළට යන්නයි දෙකක් කරන්න පුළුවන්ද කියන්නකෝ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
සල්ලි දෙන්නයි, හිරේ යන්නයි,-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
හිරේ යන්නයි, සල්ලි දෙන්නයි දෙකක් බැහැ. එක්කෝ සල්ලි, එක්කෝ හිරේ! මේක මාර කෙළියක් නේ. ජනාධිපතිතුමායි, බිමල් රත්නායක මහත්මයායි, ඔක්කෝම කියනවා,- *[බාධා කිරීම්]* සල්ලි දෙන්නයි, හිරේ යන්නයි දෙකක් කරන්න බැහැ. හිරේ නම් හිරේ, සල්ලි නම් සල්ලි. *[බාධා කිරීම්]*

ඊළඟට, තවත් වැදගත් කාරණයක් අහන්න ඕනෑ. බිමල් රත්නායක මහත්මයා, අපි මේ ගැන කිව්වාම හොයලා බලන්න. ආණ්ඩුව මේවා ගැන හොයලා බලන්න. වාර්ෂික ඉඩම් බලපත්‍ර තිබෙනවා නේ. අවුරුදු 30 ඉවර වුණාම, අවුරුදු 99 ඉවර වුණාම වාර්ෂික ඉඩම් බලපත්‍ර අලුත් කරන්න ඕනෑ. පොළොන්නරුව පැත්තෙන් දැන් අලුත් ක්‍රමයක් ඇවිත් තිබෙනවා. ඇමතිතුමාගේ ගෝලයෙක් කියනවා, වාර්ෂික බලපත්‍ර අලුත් කරන ක්‍රමය අපි ක්‍රියාත්මක කරනවා,- *[බාධා කිරීමක්]* ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට දැන් වාර්ෂික බලපත්‍ර 3,000ක් විතර ඇවිල්ලා තිබෙනවා. ඒ එකක්වත් අලුත් කරන්නේ නැහැ. එක්කෙනෙක් දාලා ඉන්නවා, "සමතින්ග්" එක ඉල්ලන්න. මම කියන්නේ ඒ ගැන හොයන්න කියලායි. ඔයගොල්ලෝ කණ්ඩායමක් දාලා බලන්න. මේ වැඩ ඔයගොල්ලන්ගේ ආණ්ඩුවට හොඳ නැහැ. ඔහු කියනවා ලු, "ඔබතුමාගේ වාර්ෂික බලපත්‍රය අපි හදලා දෙන්නම්, අලුත් කරලා දෙන්නම්, "සමතින්ග්" එක ඕනෑ" කියලා. මේ, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ- *[බාධා කිරීමක්]* මන්ත්‍රී කෙනෙක් නොවෙයි. *[බාධා කිරීමක්]* ගෝලයෙක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නම කියන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම ඔබතුමාට නම කියන්නම්; වෙනම ලියලාම දෙන්නම්. නමත් එක්කම දෙන්නම්. ඒ, ඉඩම් ඇමතිතුමාගේ ගෝලයෙක්. මම සභානායකතුමාට නමත් එක්කම දෙන්නම්. ඒ ඉඩම් බලපත්‍ර එකක්වත් දැන් අලුත් කරන්නේ නැහැ. සමහරු ඒ ඉඩම්වල හෝටල් හදාගෙන ඉන්නවා. සමහර මිනිස්සු ඒවායේ ව්‍යාපාර කරනවා. ඒවා අලුත් කරලා දෙන්න ඕනෑ, ඒ මිනිස්සුන්ට ව්‍යාපාර කරගෙන යන්න, ණය ගන්න, අරවා ගන්න, මේවා ගන්න. ගරු සභානායකතුමනි, රටක් දියුණු වෙන්න නම් ඒ රටේ මිනිස්සු වැඩ කරන්න ඕනෑ.

අපේ ඇමතිතුමා කිව්වා, පොලී නැතිව ණය දුන්නා කියලා. ඒ ණය ගනිපු කවුරුවත් අපට නම් හම්බ වුණේ නැහැ. ඒවා ඉන්දියාවේ ක්‍රියාත්මක වුණාද, ලංකාවේ ක්‍රියාත්මක වුණාද, වෙන රටක ක්‍රියාත්මක වුණාද කියලා අපි දන්නේ නැහැ. කමක් නැහැ. මෙහේ ක්‍රියාත්මක වෙනවා නම් අපට list එක දෙන්න. එතකොට අපිත් ඒ ගැන දන්නවා නේ. එතකොට අපටත් කියන්න පුළුවන් නේ, බලන්නකෝ ආණ්ඩුව ණය දුන්නා කියලා. එතකොට අපටත් කියන්න පුළුවන්, "මේ ආණ්ඩුව හොඳයි, අන්න ණය දෙනවා, ගිහිල්ලා ගන්න" කියලා. ඔබතුමන්ලා ඒවා ඔක්කෝම මාලිමාවටම බෙදා ගන්න එපා.

ඒ වාගේම කිව්වා, ගෙවල් 20,000ක්ද කොහේදෝ හැදුවා කියලා. හැබැයි, අපට නම් එහෙම හදපු ගෙයක් තවම හමු වුණේ නැහැ. ප්‍රේමදාස මහත්මයා හදපු ගෙවල් නම් හමු වෙනවා, යන යන තැන. අපේ බණ්ඩාරවෙල ආසනයේ මධුරගම, මිල්ලගම වාගේ ගම්මාන තිබෙනවා. හැබැයි, ඒවා ප්‍රේමදාස මහත්මයා හදපු ගම්මාන. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ තාත්තා හදපු පළමුවැනි ගම්මානය තිබෙන්නේ කොහේද කියලා දන්නවාද? ගලඋඩ. ඒ හදපු ගම්මානයේ තමයි එතුමාගේ අළු ටික තැන්පත් කරලා තිබෙන්නේ. වියලුව මැතිවරණ කොට්ඨාසයේ ගලඋඩ "වාසනාගම" තමයි ප්‍රේමදාස මහත්මයා හදපු පළමුවැනි ගම. ඒ විධියට ප්‍රේමදාස මහත්මයා හදපු ගෙවල් නම් තිබෙනවා. හැබැයි, අනුර කුමාර හදපු ගෙවල්, එහෙම නැත්නම් බිමල් රත්නායක හදපු ගෙවල් නම් තවම අපට හමු වුණේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලාත් හදලා පෙන්වන්න.

පොළොන්නරුවේ ඉන්න ඔබතුමන්ලාගේ රාජ්‍ය නායකයාට මේ රටේ දිස්ත්‍රික්ක තිබෙන්නේ මෙච්චරයි කියලා උගන්වන්න අප්පා! දිස්ත්‍රික්ක 26ක් කියලා කිව්වා, ඒ මනුස්සයා. දිස්ත්‍රික්ක 24යි තිබෙන්නේ. යටි උගුරෙන් කෑ ගහලා දිස්ත්‍රික්ක 26කින් අපි රටේ බලය පෙන්නුවා කියලා කිව්වා. ඉන්දියාවේ දෙකක් එකතු කළාද දන්නේ නැහැ. අපට තිබෙන කච්චතිව් දූපතත් හෙට අනිද්දාට ගනියිද දන්නේ නැහැ. මොකද, තමිල්නාඩුවේ ඡන්දයෙන් දැන් විජේ තමයි ඇවිල්ලා ඉන්නේ. මැතිනියට පින්සිද්ධ වෙන්න ගත්තු කච්චතිව් දූපතටත් හෙට අනිද්දාට විජයා කෙළියිද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, ඔයගොල්ලෝ කිව්වා වාගේම විජේත් පව කෙළලා තමයි ආවේ. ඔයගොල්ලෝ වාගේම, රත්තරන් දෙනවා, අරවා දෙනවා කියලා තමයි මිනිහාත් ඡන්ද අරගෙන තිබෙන්නේ. හෙට අනිද්දා වෙනකොට විජේටත් තමිල්නාඩුවේ පාලනය කරගෙන යන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ.

ඊළඟට නෙවිල් ප්‍රනාන්දු රෝහල ගැනත් කියන්න ඕනෑ. නෙවිල් ප්‍රනාන්දු රෝහල සම්බන්ධව මේ ආණ්ඩුවට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, නෙවිල් ප්‍රනාන්දු රෝහල සම්බන්ධයෙන් උද්ඝෝෂණ, උපවාස, ස්ට්‍රයික් ඔක්කෝම කළේ ඔයගොල්ලෝ. ඒකට කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chamara Sampath Dasanayake, your time is over.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මට තව පොඩි කාලයක් දෙන්න.

දැන් නෙවිල් ප්‍රනාන්දු රෝහල Air Force එකට දෙන්න යනවා. Air Force එකට Air Force එකේ වැඩේ කරන්න කියන්න. නෙවිල් ප්‍රනාන්දු රෝහල, ජයවර්ධනපුර රෝහල වාගේ හදන්න පුළුවන් රෝහලක්. දැනට නෙවිල් ප්‍රනාන්දු රෝහල පවත්වාගෙන යනවා. ඒකේ ඇඳන් 500ක් තිබෙනවා. ඒකට හොඳ විශේෂඥ වෛද්‍යවරු එනවා. නමුත් දැන් Air Force එක ඒක ඉල්ලනවා. ආරක්ෂක ලේකම් Air Force එකේ හිටියා කියලා එයාට ඉස්පිරිතාල දෙන්න අයිතියක් නැහැ. එයාට ආරක්ෂක ලේකම් තනතුර දුන්නාට කමක් නැහැ. නෙවිල් ප්‍රනාන්දු රෝහල ඉල්ලුවාට ඒක දෙන්න එපා. රජයේ, මහා භාණ්ඩාගාරයේ මුදල් ගෙවලායි නෙවිල් ප්‍රනාන්දු රෝහල අරගෙන තිබෙන්නේ. ඒකෙන් ලාභ ගන්න. ජයවර්ධනපුර රෝහල වාගේ හොඳට හදලා, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ 50:50 හෝ තබාගෙන ඒ රෝහලෙන් වාසියක් ලබා ගන්න. ඒක Air Force එකට දෙන්නේ මොකටද? Air Force එක, Army එක ඉල්ලන ඉල්ලන ඒවා -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chamara Sampath Dasanayake, please wind up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

දියතලාවේ හැම ඉඩමක්ම Army එක අරගෙන අරවා මේවා හදලා. එහි මිනිසුන්ට එළවලු වගා කරන්න විධියක් නැහැ. මට ලබා දීපු කාලය ඉවරයි. නෙවිල් ප්‍රනාන්දු රෝහල බේරාගන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. (Dr.) Najith Indika. You have ten minutes.

[අ.භා. 12.25]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දවසේ අප සාකච්ඡා කරන්නේ බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත පිළිබඳවයි. මේක ටිකක් ලොකු පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පත ගැන විවිධ අදහස් පළ වුණා. මුලින්ම මේ පනත් කෙටුම්පත මා සභාපති ධුරය දරන ආංශික අධීක්ෂණ කාරක සභාවට ඉදිරිපත් කරලා ඒ හරහායි මෙතැනට ආවේ. මේ ගැන කථා කරන්න දේවල් ගොඩක් තිබෙනවා. නමුත් අද මම මේ කථාව කරන්න යන්නේ මේ පනත් කෙටුම්පත ගැන නොවෙයි.

භාණ්ඩාගාරයේ මුදල් ගනුදෙනුව ගැන කථාව ඊයේ දවසේදී ඉවර වෙයි කියලා හිතුවාට විපක්ෂය අද දවසේත් ඒ ගැන කථා කළා. අද දවසේ වස්තුභංගත්වය ගැන කථා කරනවා වෙනුවට ඉච්ඡාභංගත්වයට පත් වෙච්ච, තමන්ගේ බුද්ධිය භංගත්වයට පත් වෙච්ච, එහෙම නැත්නම් තමන්ගේ මානුෂීයත්වය භංගත්වයට පත් වෙච්ච විපක්ෂයේ කිහිප දෙනෙකු කරපු කථාවලට උත්තර දෙන්න ඕනෑ හින්දා මම ඒ වෙනුවෙන් මේ වෙලාව වෙන් කර ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ හවස විපක්ෂයේ මන්ත්‍රීවරු 20දෙනෙකු නැඟිටලා විවාදයක් ඉල්ලලා, විවාදයක් අරගෙන ඒ කාරණය සම්බන්ධයෙන් විවාද කළා; කථා කළා. ඒ විවාදයට දෙපැත්තෙන්ම අදහස් දැක්වීම සිදු වුණා. භාණ්ඩාගාරයේ ඒ කියන මුදල් ගනුදෙනුව සම්බන්ධ සිද්ධිය සහ ඒකත් එක්ක ගැටගැහිලා භාණ්ඩාගාරයේ නිලධාරියෙකු මිය යෑම හා සම්බන්ධ සංවේදී කාරණය ගැන ඊයේ දවසේත් පාර්ලිමේන්තුවේදී කථා වුණා. එතැනදී අපි කියපු දේවල් තිබුණා, අපි ඉල්ලපු දේවල් තිබුණා. දේශපාලනයේ කථාව කෙසේ වෙතත්, මෙවැනි සිදුවීමකදී, මරණයක් සිදු වෙලා තිබියදී ඒ ගැන දුක් වෙන දරුවන් බිරිඳ ඇතුළු පවුලක්, නෑදෑයෝ, යහළුවෝ සිටිද්දී අවම සදාචාරයක් තියාගෙන ඒ ගැන කථා කරන්න කියන ඉල්ලීම අපි ඊයේ දවසේදීත් කළා. හැබැයි ඒ වෙනුවට විපක්ෂයේ සමහරු මොකක්ද කළේ? මට කලින් කථා කරපු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? එතුමා දැන් මෙතැන හිටියා නම් මම සතුටුයි. මෙහිදී එතුමා ඉතාම නරක විධියට, ඉතාම වැරදි විධියට බොරු ගොඩක් කිව්වා.

ඒ නිසා විශේෂයෙන්ම ඒ ගැන කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ හැම දෙයකම සීමාවක් තිබෙන්න ඕනෑ. කථා කරන්න, දේශපාලනය කරන්න, අපට මඩ ගහන්න, ප්‍රශ්නයක් නැහැ. නමුත්, අහුවෙන හැමදේම කියලා මේ තරම් සංවේදී සිද්ධියකිනුත් දේශපාලනය කරන පටු තැනට, ඒ අසංවේදී තැනට වැටෙන්න එපා. මේ මැරිලා ඉන්නේ මනුස්සයෙක්. ඒ මනුස්සයාගේ ගෙදර මිනිස්සු ඉන්නවා. ඒ සම්බන්ධ සියලු දේවල් හෙළිවෙද්දී බොරු කියන්න එපා, මෙතැන. දැන් මේ ඔක්කොම consultant JMOsලා වෙනවා නේ. විශේෂඥ අධිකරණ වෛද්‍ය මුජිබුර් රහුමාන් තමයි කලින් කථා කළේ. එතුමා දන්නවා ඔක්කොටම වඩා. ඒ මෘත දේහය සම්බන්ධයෙන් විශේෂඥ අධිකරණ වෛද්‍යතුමන්ලා හතරදෙනෙක් පරීක්ෂණ කරලා තිබෙනවා. නමුත් මෙතැන ඉන්නවා, ඒ ඔක්කොටම වඩා දන්න විශේෂඥ අධිකරණ වෛද්‍ය මුජිබුර් රහුමාන්. එතුමා තමයි ඔක්කොම දන්නේ. ලංකාවේ ඉන්න විශේෂඥ වෛද්‍යවරු 50දෙනාටම වඩා එතුමා දන්නවා. මම මුලින්ම මේ ක්‍රියාවලිය කියලා ඉන්නම්, ආයෙත් මේ ගැන කථා කරන එක නවත්වන්න ඕනෑ නිසා.

ඔබතුමාත් ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයෙක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා දන්නවා, මේ සිද්ධ වෙන හැම මරණයකටම පරීක්ෂණ කරන්නේ නැහැ කියලා. හැම මළ සිරුරම කපලා බලන්නේ නැහැ. ඒවාට හේතු තිබෙනවා. ඒවාට ඉල්ලීම් තිබෙනවා. ඒවා කරන ක්‍රම තිබෙනවා. හැම මළ සිරුරකටම ඒවා කරන්නේ නැහැ. අපි ඒක දන්නවා. යම් මරණයක් සැක සහිතයි නම්, මරණයට හේතුව දන්නේ නැත්නම්, යම් ව්‍යාකූලත්වයක් තිබෙනවා නම් මරණ පරීක්ෂණයකට යොමු වෙනවා. එහෙම නැත්නම් සමහර සිදුවීම් තිබෙනවා, නිශ්චිත කොන්දේසි තිබෙනවා, අනිවාර්යයෙන් මරණ පරීක්ෂණයක් කරන. මම මේක

කියන්නේ මෙන්න මේ ලියුම මත. මේ ලියුම ගැන කථාවේදී දෙපාරක් කිව්වා. මේ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ලිපිය ගැන කථාවේදී දෙපාරක් කිව්වා. ඒක පාවිච්චි කළා මියගිය තැනැත්තාගේ ගෙදර අය complain කරනවා කියන්න. ඒක මොන කැත වැඩක්ද කියන්නකෝ. මේක කියවලා තිබෙනවාද? අඩුම තරමින් මේක තේරෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එකින් එක කරුණු කියන්නම් මේ ලියුම එන්නේ කොහොමද කියලා. මේ ලියුමේ එහෙම එකක් නොවෙයි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් දෙයක් වෙන පිළිවෙළක් තිබෙනවා. මේ නිශ්චිත සිදුවීම ගත්තාට පස්සේ, ඒ මරණය සොයා ගත්තාට පස්සේ පොලීසිය නේ එතැනට මුලින්ම සහභාගි වෙන්නේ. එතකොට පොලීසිය විසින් මහෙස්ත්‍රාත්තුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඊට පසුව මහෙස්ත්‍රාත්තුමා තමයි නියෝග කරන්නේ. මේ සිද්ධියේදී පොලීසියෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. අපි දන්නවා, යම් සැක සහිත මරණයකදී වුණත් පරීක්ෂණ කරන්නේ අදාළ අධිකරණ වෛද්‍ය නිලධාරියා, විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියා. සාමාන්‍යයෙන් කුඩා ඉස්පිරිතාලෙක නම්, ලොකු සැක කටයුතු දෙයක් නොවෙයි නම්, සාමාන්‍ය අධිකරණ වෛද්‍ය නිලධාරියෙක් පරීක්ෂණ කරනවා. එහෙම නැත්නම් ළඟම රෝහලක විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරිතුමෙක් වෙත යවනවා. එතකොට මේ සිද්ධියේත් එහෙම තමයි යන්න තිබුණේ. හැබැයි මේ සිදුවීමේ තිබෙන සංවේදී බව නිසාම, පොලීසිය විසින් කුලියාපිටිය මහෙස්ත්‍රාත්තුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධ මරණ පරීක්ෂණය එක් අධිකරණ වෛද්‍යවරයෙකුගෙන් එහාට ගිහිල්ලා panel එකකින් කරන්න කියලා. ඒ ඉල්ලීම අනුව තමයි කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාට මෙන්න මේ ලිපිය යවන්නේ. මම මේ ලිපිය **සභාගත*** කරනවා.

ඒකෙත් කියන්නේ අර කථාවම තමයි. ඒ කියන්නේ, මරණයට හේතුව අනාවරණය කරගෙන නොමැති අතර, ඒ මෘත දේහය *[බාධා කිරීමක්]* හොඳයි, මම සභාගත කරන්නම්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම සභාගත කරන්නම්, බලාගන්න.*[බාධා කිරීමක්]* කියන්නම්. "මරණයට හේතුව අනාවරණ කර ගෙන නොමැති අතර, මෙම මරණකරුගේ මෘත දේහය මණ්ඩලයකට යොමු කර පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වන්න" කියලා ඉල්ලීමක් කරනවා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගෙන්. *[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න කියන්නම්. මම අවංක වෙන්නම්. ඔබතුමා පොඩ්ඩක් ඉවසලා විනාඩි දෙකක් ඉන්නකෝ. ඒ ලිපියට ප්‍රතිචාරයක් වශයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා මේ ලිපිය යොමු කරනවා. *[බාධා කිරීමක්]* Suspicious කියලා තමයි ලියන්නේ. Suspicious නැත්නම් මරණ පරීක්ෂණයක් කරන්න ඕනෑ නැහැ නේ. ඒක තමයි මෙච්චර කියන්නේ. Suspicious කියන්නේ ගෙදර මිනිස්සු ගිහිල්ලා complain කරන එක නොවෙයි. මරණ පරීක්ෂණයක් කරන්න හේතුවක් තිබෙනවා කියන එකයි ඒ කියන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නම කියන්න. එයා තමයි පැමිණිලි කරන්න කියලා තිබෙන්නේ. මේ ලියුම් දෙකේම තිබෙනවා.

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට කනගාටුයි, අජිත් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමා නීතිඥයෙක්. ඔබතුමාත් දන්නවා, මරණයකදී මහෙස්ත්‍රාත්තුමා ඉස්සරහට ගිහිල්ලා ඒ මරණය සැකයි කියලා කිව්වේ නැත්නම් මරණ පරීක්ෂණයක් කරන්න ඕනෑ වෙන්නේ නැහැ නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මහෙස්ත්‍රාත්තුමා කියන්නේ බිරිඳ විසින් පැමිණිලි කර තිබෙනවා කියලා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මරණයකට අයිතිකාරයෙක් ඉන්නවා. බිරිඳ හරි දරුවන් හරි කවුරු හරි තමයි ඒක කියන්නේ. එහෙම නැතුව පාරේ ඉන්න මනුස්සයෙක් ඇවිල්ලා කියන්නේ නැහැ නේ. නිකම් බොරු කියන්න එපා. දන්න දෙයක් කථා කරන්න. එහෙම නැතුව මැරිච්ච මනුස්සයා කියන්නද? මේ ලිපියේ තිබෙන්නේ මෙහෙමයි. මරණය ගැන ලියන විධියක් තිබෙනවා. ඔබතුමා නොදන්න විධියට කථා කරන්න එපා. මේ විකෘති කිරීමක් කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ලිපියට ප්‍රතිචාරයක් විධියට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා panel එකක් පත් කරන්න යවන ලියුම තමයි මේ තිබෙන්නේ. ඒ panel එක පත් කරන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් අසේල ගුණවර්ධන මහත්මයා. ඒ නිවැරැදි ක්‍රියාවලිය එතුමා කරලා තිබෙනවා. ඒකේ තිබෙනවා, "died under suspicious circumstances" කියලා. ඉතින්, ඒක කියන්නේ නැතුව මොකක්ද කියන්නේ? ඒ වාගේ මරණයකට එහෙම තමයි කියන්නේ. සිය දිවි නසා ගැනීමක්ද, මිනී මැරීමක්ද කියලා නොවෙයි, ඒක died under suspicious circumstances; එහෙම එකක්. ඒකට මරණ පරීක්ෂණයක් කරන්න ඕනෑ. ඒක තමයි මේ කියන්නේ. එහෙම නැතුව ඒකේ කියන්නේ නැහැ වෙන දෙයක්. නමුත් ඒක පාවිච්චි කරලා මරණකරුගේ බිරිඳ පැමිණිලි කළාය කියලා අමු බොරුවක් ඇද බානවා.

බිරිඳ පැමිණිලි කරනවා නම්, පැමිණිලි කරන්න ඕනෑ පොලීසියකට. ඒක හින්දා ආයෙත් කියනවා, ඊයෙත් කිව්වා, ඒ මිනිස්සුන්ට ඉන්න දෙන්න. ඒ මිනිස්සුන්ට ඉන්න දෙන්න. මේ වාගේ බොරු කියන්න එපා. මොකද, මේකේ සීමාවක් තියෙන්න එපා යැ.

Consultant JMOsලා හතර දෙනෙක්, විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන් හතර දෙනෙක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ මේ ලිපිය - කලින් විකෘති කරලා කියවූ ලිපිය - අනුවයි පත් කරන්නේ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ නිර්දේශයෙන් පත් කරනවා, කුලියාපිටිය, කුරුණෑගල, නිකවැරටිය සහ අනුරාධපුර යන රෝහල් හතරේ ඉන්න විශේෂඥ අධිකරණ වෛද්‍යවරු හතර දෙනෙක්; ලංකාවේ ඉන්න 50දෙනාගෙන් හතර දෙනෙක්. ඒ හතරදෙනා තමයි මේ මරණ පරීක්ෂණය කරලා අදාළ කටයුතු කරන්නේ. අපි දන්නවා, මරණ පරීක්ෂණයකත් යම් ක්‍රියාවලියක් තිබෙන බව. එහිදී crime scene එකට, නැත්නම් අපරාධය වෙච්ච තැනට යනවා. ඊට කලින් සාමාන්‍යයෙන් මරණය විවෘත කරන්න කලින් interview කරනවා. ගෙදර අය සහ මොනයම් හෝ සාක්ෂිකාරයෝ එක්ක සාකච්ඡා කරනවා. ඒ ඔක්කෝම කරලා තමයි ඒකට යන්නේ. මෙහි ක්‍රියාවලියක් තිබෙනවා. මේ ක්‍රියාවලිය හැමෝම දන්නේ නැහැ නේ. ඒ දන්නේ නැතිකම පාවිච්චි කරලා මේවායේ තියෙන වචන අල්ලා ගෙන අමු බොරු වපුරනවා. ඒක තමයි මේ කරන්නේ. මම

[ගරු (වෛද්‍ය) නලින් ඉන්දික මහතා]

අභියෝග කරනවා, මම මේ කියන කථාව වෙනස් නම්, මීට වඩා වෙනස් කථාවක් නම් තියෙන්නේ අද දවස ඇතුළත ඒක පෙන්නන්න කෝ. ඒ නිසා මේ නරක වැඩේ කරන්න එපා. මොකද, මෙකේ සීමාවක් තියෙන්න ඕනෑ. මෙක පාර්ලිමේන්තුව කියලා මිනිස්සුන්ගේ ජීවිතයි, මරණයයි ඔක්කෝම එක්ක මේ වාගේ සෙල්ලම් කරන්න පුළුවන්ද? මොකක්ද අපි අරගෙන තිබෙන එකඟතාව?

අපි දේශපාලනය කරමු, ප්‍රශ්නයක් නැහැ. දේශපාලනය කරමු. වාර්තා අරගෙන කථා කරමු, ඒ කරුණු ඉදිරිපත් කරමු, සභාගත කරමු. ඒ ඕනෑ දෙයක් කරමු. හැබැයි, මේ කැත වැඩේ කරන්න එපා. මේක තමයි මුජිබුර් මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ. මොකද, මේක තමයි Dr. Shafiට කළේ. මේ ජාතියේම වැඩක්. එකම බොරුවක් කියලා කියලා සමාජයට දාලා අන්තිමට ඒ දරුවන්ට පාරේ බැහැලා යන්න බැරි කළා. කනගාටුයි, ඒ වාගේම තව සිද්ධියකදී ඒකම ආපහු කරනවා. ඒ ඉන්නේ මනුස්සයෙක්ද, ඒ මනුස්සයාට පවුලක් තියෙනවාද කියන ඒ මොකක්වත් හිතන්නේ නැතුව අද දවසේ කොහොම හරි "ආණ්ඩුවට භාණ්ඩාගාරයේ එකෙන් තව දෙමු, ෂොට් එක දෙමු, මෙහෙම කරමු, මැරුවා කියමු" කියලා කථා කරනවා. එහෙම නම් තව සතියකින් විතර මරණ පරීක්ෂණ වාර්තාව ආවාට පසු අපි කථා කරමු කෝ. ඒ නිසා මේ කැත වැඩේ කරන්න එපා කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඇත්තටම මේ පාර්ලිමේන්තුවටත් අගෞරවයක්. මොකද, මේ මිනිස්සුන්ගේ ජීවිත එක්ක සෙල්ලම් කරන්න අපට අයිතියක් නැහැ. අපට දේශපාලනය කරන්න අයිතියක් තිබෙනවා; විවේචනය කරන්න අයිතියක් තිබෙනවා. අපට ගහන්න. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, කොහේවත් ඉන්න මේ මිනිස්සු අල්ලාගෙන දේශපාලනය කරලා ඒ ජීවිත එක්ක සෙල්ලම් කරන්න එපා. එතුමා තව ප්‍රශ්න ගොඩක් මතු කළා, පැමිණිලි කරලා තියෙන මහත්වරු, කියන ඒවා මේවා ගැන. ඒවා ගැන විස්තර ඇතුව ඊයේ කරුණු කිව්වා. අඩුම තරමින් ඊයේ කළ ඒ කථා ටික අහන්න. එහෙම නැත්නම් සංවිධායකතුමනි, ඒ වාගේ අතිශය උනන්දු කෙනෙක් ඉන්නවා නම් විනාඩි තුනක් හරි කථා කරන්න දෙන්න. එතකොට අපට ඒ වෙලාවේම ඒක බේරා ගන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වැදගත් වන පනත් කෙටුම්පතක දෙවැනිවර කියවීමේ විවාදය පවත්වන මේ අවස්ථාවේදී, ඒක මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ප්‍රගමනයට, ඔවුන්ගේ ආරක්ෂාවට, ඔවුන්ගේ සුරක්ෂිතතාවට ඉතා වැදගත් පනත් කෙටුම්පතක් වන බව මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා අද දවසේ ගෙන එනු ලබන මේ පනත් කෙටුම්පතට අපේ එකඟත්වය පළ කරන ගමන්, මේ මොහොතේ මේ රටේ තිබෙන ප්‍රශ්නයක් ගෙන හැර දක්වන්න කැමැතියි.

අපි දන්නවා, ශ්‍රී ලංකා පොලීසිය කියන්නේ මේ රටේ සුවිශේෂී දෙපාර්තමේන්තුවක් බව. ඔවුන්ගේ සේවාව ඉතා වෙහෙසකර සේවාවක් බව අපි දන්නවා. සමහර අවස්ථාවල පොලිස් නිලධාරි මහත්ම මහත්මීන් තමන්ගේ පැය 12ක රාජකාරිය පැය 24ක් හෝ එතැනින් එහාට ඊටත් වඩා රාජකාරි කාලයක නිරත වෙමින් ඉතා අවිවේකී, ඉතා දුෂ්කර සේවාවක් තමයි සිදු කරමින් සිටින්නේ. ශ්‍රී ලංකා පොලීසිය සිදු කරන සුවිශේෂී සේවා අතර තිස්වසරක ශාපලත් යුද්ධය පැවති සමයේ යම් යම් ආබාධවලට ලක් වෙච්ච විරෝදාර පොලිස් නිලධාරි මහත්ම මහත්මීන් සිටින බව අපි දන්නවා. ඒ වාගේම අපරාධකරුවන් හඹා යෑමේදී සිදු වෙච්ච යම් යම් අනතුරු නිසා, ආබාධවලට ලක් වෙච්ච පොලිස් නිලධාරි මහත්ම මහත්මීන් ඉන්නවා. ඒ විධියට රාජකාරි කටයුතුවලදී ආබාධයට ලක් වෙච්ච පොලිස් නිලධාරි මහත්ම මහත්මීන්ට අද දවසේ සිදු වෙලා තිබෙන ගැටලුවක් මේ ගරු සභාවට ගෙන එන්න මම කැමැතියි.

ඒ ආබාධයට ලක් වෙච්ච පොලිස් නිලධාරි මහත්ම මහත්මීන්ට වෙනම ඇඳුමක්, වෙනම uniform එකක් අඳින්න කියලා වර්තමාන පොලිස්පතිතුමා නියෝගයක් නිකුත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආබාධයට ලක් වෙච්ච ප්‍රජාවට වෙනස් කොට, වෙන් කොට නොසැලකිය යුතුයි කියන කාරණය මේ දියුණු සමාජයේ ඔබත් මමත් පිළිගන්නා කාරණයක්. ඒ කාරණය අද ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරන පොලිස් නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් බැහැර කරලා, ඔවුන්ට වෙන් කොට සලකන්න, වෙනස් කොට සලකන්න වෙනත් ඇඳුමක්, වෙනත් uniform එකක් ඔවුන්ට ලබා දෙන්න තීරණය කරලා තිබෙනවා. ඒ නිසා, ඒක ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරන යම් යම් ආබාධවලට ලක් වෙච්ච මහත්ම මහත්මීන් ඉතා චිත්ත පීඩනයට ලක් වෙච්ච, ඔවුන් මානසිකව බිඳ වට්ටන, ඔවුන් රාජකාරි කිරීමේදී අපහසුතාවට පත් වෙන යෝජනාවක්, නියෝගයක් කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා ඒක ඉවත් කරලා, පෙර පැවති විධියට ඒ ආබාධ සහිත මහත්ම මහත්මීන්ට කටයුතු කිරීමට ඉඩ කඩ සලසා දෙන්න කියලා මම මේ මොහොතේ ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොලිස් කොස්තාපල් තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම් පත් කැඳවා තිබෙනවා අපි දැක්කා. ඒ සඳහා වූ සුදුසුකම් බැලුවාම එදා උප පොලිස් පරීක්ෂක මහත්ම මහත්මීන් බඳවා ගැනීමේදී තිබිය යුතු සුදුසුකම් තමයි, අද පොලිස් කොස්තාපල් මහත්ම මහත්මීන් බඳවා ගැනීම සඳහා යොදා ගෙන තිබෙන්නේ. මේ මොහොතේ විශේෂයෙන්ම ඒ කාරණය මතක් කරන්න ඕනෑ. අද ශ්‍රී ලංකා පොලීසියේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින මොහොතක, පොලිස් කොස්තාපල් තනතුර සඳහා බඳවා ගැනීමට ඉල්ලා

තිබෙන ඉතා ඉහළ නිර්ණායක යම් විධියකින් සංශෝධනය කරන්න පුළුවන් නම් වටිනවා කියන කාරණය මේ මොහොතේ සිහිපත් කරනවා.

ඒ වාගේම මම නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගත් ගැටලුවක් ගැන මේ මොහොතේ කියන්න ඕනෑ. ඒක ගාල්ලට පමණක් නොවෙයි, සෞඛ්‍ය පද්ධතියටම බලපාන කරුණක්. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කරාපිටිය අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. අද කරාපිටිය ශික්ෂණ රෝහල ජාතික රෝහලක් බවට සංවර්ධනය කරමින් තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවත්, පැවති ආණ්ඩු සියල්ලත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මහින්ද රාජපක්ෂ මැතිතුමා ගාල්ලට දායාද කරලා දුන් දකුණු ආසියාවේ අග්‍රගණ්‍ය මාතෘ රෝහල තිබෙන්නේ ගාල්ල කරාපිටියේ. ඒ නිසා, අද කරාපිටිය කියන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානයක් කියලා මා විශ්වාස කරනවා. අද ගාල්ල කරාපිටිය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙනකොට, ගාල්ල කරාපිටිය ප්‍රදේශයට යෑම සඳහා අධිවේගී පිවිසුම් මාර්ගය තිබෙන්නේ පින්නදූව ප්‍රදේශයෙන්.

පින්නදූවේ සිට කරාපිටියට එන මාර්ගයේ තිබෙන ගැටලුවක් ගැන මම මේ මොහොතේ කියන්න කැමැතියි. එම ගැටලුව විසඳා දෙන්න කියා මා රජයෙන් ඉල්ලනවා. විශේෂයෙන්ම පින්නදූවේ සිට කරාපිටිය දක්වා පිවිසෙන මාර්ගයේ පළල අඩුකම, එම මාර්ගයේ තිබෙන වාහන තදබදය, එම මාර්ගයේ තිබෙන වංගු සහිත බව නිසා පින්නදූවෙන් එළියට එන වාහනයකට; විශේෂයෙන්ම ambulance එකකට අද වනවිට කරාපිටියට එන්න විශාල වෙලාවක් ගත වෙනවා. සෞඛ්‍ය පද්ධතිය දියුණු වෙනකොට කාලය කියන දේ ඉතාම වැදගත් බව මා විශ්වාස කරනවා. යම් යම් පරීක්ෂණ කටයුතුවලට, යම් යම් හදිසි අවස්ථාවලදී ඉතාම ඉක්මනින් ගිලන් රථ කරාපිටිය රෝහලට එන්න අවශ්‍ය බව අපි දන්නවා. ඒ නිසා ගාල්ල කරාපිටියට පින්නදූවේ සිට තිබෙන පිවිසුම් මාර්ගය වෙනුවට කරාපිටියට ඉතාම ළඟින්, කිට්ටුවෙන් ඇතුළු විය හැකි පිවිසුම් මාර්ගයක්; අධිවේගී මාර්ගයෙන් කරාපිටියට ඉතාම ඉක්මනින් ළඟා විය හැකි පිවිසුම් මාර්ගයක් නිර්මාණය කරන්න කියා මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. මොකද, ගාල්ලේ සෞඛ්‍ය කේන්ද්‍රස්ථානය තවත් ශක්තිමත් කරන්න ඔබගේ ආණ්ඩුව කටයුතු කරනවා නම් එය වටිනවා. ඒ වාගේම එය ඉතාම දැඩි අවශ්‍යතාවක්. වංගු නැතිව ඉතාම ඉක්මනින් කරාපිටිය රෝහලට එන්න පුළුවන්කම තිබෙන; කෙළින් තිබෙන මාර්ගයක් නිර්මාණය කර ගැනීමට අධිවේගී මාර්ගයත්, කරාපිටියත් අතර ඕනෑ තරම් ඉඩකඩ තිබෙනවා කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්නට ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව තත්ත්පර 10ක කාලයක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහමෝදර රෝහල ඉවත් කළත් එම ඉඩම වෙනත් කටයුත්තකට ලබා දීමට රජය කටයුතු කර තිබෙනවා. ඒක ඉතාම හොඳ කටයුත්තක්. හැබැයි, ඒ බාහිර රෝගී අංශය - OPD එක - අදටත් ඉතා සක්‍රියව ක්‍රියාත්මක වෙනවා. ගාල්ල, රත්ගම, දඩැල්ල ප්‍රදේශවාසීන් අදටත් ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙන මේ බාහිර රෝගී අංශය වෙත පැමිණෙනවා. එම ජනතාවට අවශ්‍ය සේවාව ඉතාම හොඳින් ලබා දෙන තැනක් ලෙස මහමෝදර රෝහලේ බාහිර රෝගී අංශය අදටත් ක්‍රියාත්මක වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි පසුගිය සම්බන්ධීකරණ කමිටුවලදී අපි දැක්කා ගාල්ල මහමෝදර බාහිර රෝගී අංශය එතැනින් ඉවත් කිරීමට ඔබේ ආණ්ඩුව තීන්දුවක් ගෙන තිබෙන බව. එහෙම කරන්න එපා කියා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද, ගාල්ලට ඉතාම ආසන්න ස්ථානයක තමයි මහමෝදර බාහිර රෝගී අංශය තිබෙන්නේ. ඒක ඉවත් කිරීම ගාල්ලේ ජනතාව සතුටට පත් වන කාරණයක් නොවෙයි. ගාල්ලේ ජනතාවට ඉතාම ඉහළ සේවාවක් සපයන බාහිර රෝගී අංශය එම ස්ථානයෙන් ඉවත් කරන්න එපා කියන කාරණයත් ඔබේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

අද දවසේ මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්තුතිවන්ත වන ගමන්, දුම්රිය දෙපාර්තමේන්තුව ගැනත් සඳහන් කළ යුතුයි. මේ මොහොත වනවිට දුම්රිය දෙපාර්තමේන්තුවේ ගැටලුවක් මතු වී තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු සරත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.07]

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත දෙවැනිවර කියවන අද දවසේ ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් හැටියට මා සලකනවා.

2021 අවුරුද්දේ හතරවන කාර්තුවේ අක්‍රිය ණය අනුපාතය සියයට 4.3යි. 2024 අවුරුද්දේ හතරවන කාර්තුව වෙනකොට අක්‍රිය ණය අනුපාතය සියයට 12.7 දක්වා වැඩි වෙනවා. මේකෙන් පැහැදිලි වන කාරණය තමයි 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වන කාල පරාසය තුළ අපේ රටේ ආර්ථිකයේ බිඳ වැටීම. ඒ වෙනකොට අපේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන ලද පාර්ශ්වවල තිබුණු නොසැලකිල්ල නිසා තමයි ඒ වාගේ තත්ත්වයක් ඇති වුණේ. ඒ නිසා රටක් හැටියට අපි බරපතළ මූල්‍ය අර්බුදයකට මුහුණ දුන්නා.

විශේෂයෙන්ම ගත්තාම, මේ තත්ත්වය අපේ රටේ ණයගැතියන්, ඒ වාගේම ණයහිමියන් - ඒ දෙපාර්ශ්වයම - මුහුණ දෙන බරපතළ අර්බුදයක් බවට පත් වුණා. අපේ රටේ මේ වෙනකොට නිර්මාණය වෙලා තිබෙන නීතියේ හැටියට සමාගම් නීතිය ගත්තොත්, 2007 අංක 7 දරන සමාගම් පනත තුළත් මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම තමයි 1853 වස්තුභංගත්ව ආඥා පනත ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ මඟිනුත් මේ වාගේ අවස්ථාවක -මූල්‍ය අර්බුදයකදී- කටයුතු කරන්නේ කොහොමද කියන කාරණාව සම්බන්ධයෙන් ප්‍රතිපාදන ඉදිරිපත් කර තිබෙනවා. නමුත් මේ පනත් දෙකෙන්ම ඉදිරිපත් කර තිබෙන ප්‍රතිපාදන අද වෙනකොට ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ

[ගරු නීතිඥ සරත් කුමාර මහතා]

නිසා, අද දින දෙවනවර කියවීමට ඉදිරිපත් කර තිබෙන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත ඉතාම කාලීන අවශ්‍යතාවක් කියා අපි හිතනවා. ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න අපි කටයුතු කර තිබෙන්නේ.

ඒ වාගේම අපේ රටේ මූල්‍ය ආයතන සහ ණයගැතියෝ, ණයහිමියෝ කියන මේ හැම කෙනෙකුම මේ අර්බුදයට ගොදුරු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ස්වල්ප කොටසක් අදත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන බව අපි සඳහන් කළ යුතුයි. මේ රට ආර්ථික වශයෙන් බරපතළ අර්බුදයකට යොමු කිරීමේ වගකීම මේ සුන්බුන් විපක්ෂයේ පූර්වගාමීන් භාර ගන්න ඕනෑ. ඒගොල්ලන්ගේ දුර්වල කළමනාකරණය නිසා තමයි අපේ රටේ ජනතාවට, අපේ රටේ ව්‍යාපාරවලට, සමාගම්වලට, ණයගැතියන්ට මේ අර්බුදයට මුහුණ දෙන්න සිදු වුණේ.

එම නිසා ඒ තත්ත්වය වෙනස් කරලා අපේ රටේ ජනතාවට, අපේ රටේ ව්‍යාපාරවලට, අපේ රටේ ණයහිමියන්ට, ණයගැතියන්ට, සමාගම්වලට - ඒ සියල්ලට - දෙවන අවස්ථාවක් නිර්මාණය කිරීමේ අවස්ථාව මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම මඟින් ලැබෙනවා කියන පණිවුඩය මම ලබා දෙන්නේ බොහොම සතුටින්.

ඒ වාගේම මේ පනත මඟින් කුමන මට්ටමේ සමාගමක් වුණත්, ව්‍යාපාරයක් වුණත් - තනි පුද්ගල ව්‍යාපාරයක් වෙන්න පුළුවන්, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරයක් වෙන්න පුළුවන්, විශාල සමාගමක් වෙන්න පුළුවන් - ඒ හැම කෙනෙකුටම සහන සලසන්න පුළුවන්. ඒ වාගේම මේ පනත මඟින් ලබා දෙන ප්‍රතිපාදන තුළින් සියලු පාර්ශ්ව ආවරණය කරන බව මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම අපේ පැරණි නීතියේ ගොඩක් වෙලාවට ප්‍රතිපාදන සකස් කරලා තිබුණේ ණයහිමියන්ගේ, ණයගැතියන්ගේ, ඇවර කරන්නන්ගේ, ඊළඟට අධිකරණ වගකීම් ආදිය ඉදිරිපත් කිරීම සඳහායි. මේක අපි දැන් වෙනස් කර තිබෙනවා. අලුත් අවස්ථාවක් අපේ රටේ ව්‍යාපාරිකයින්ටත්, ණයගැතියන්ටත්, ණයහිමියන්ටත් - මේ සියලු පාර්ශ්වවලට - මේ නව පනත හරහා ලබා දෙන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ බිඳ වැටෙන හැම ව්‍යාපාරයකටම, බිඳ වැටෙන හැම ව්‍යාපාරිකයෙකුටම දෙවන අවස්ථාවක්, එහෙම නැත්නම්, පුනරුත්ථාපනය සඳහා මේ තුළින් අවස්ථාවක් ලබා දෙනවා කියන එක මේ වෙලාවේ විශේෂයෙන් මම සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, බිඳ වැටුණු ආර්ථිකයක් සහිත රට නව පිම්මකින්, නව ජවයකින් වේගවත් වර්ධනයක් සහිත ආර්ථිකයක් තිබෙන රටක් බවට පරිවර්තනය කරන්න. ඒ පරිවර්තනීය අවශ්‍යතාව සම්පූර්ණ කරන්න ඉතාම වැදගත් වන පනතක් හැටියට මේ පනත හඳුන්වන්න අපි කැමැතියි. අපි දේශීය ආර්ථිකය නංවන්න ඕනෑ. ඒකට ඉවහල් වනවා, ජාත්‍යන්තර ආයෝජකයින්ගේ විශ්වාසය දිනා ගැනීම. ඒ නිසා ජාත්‍යන්තර ආයෝජකයින්ගේ විශ්වාසය දිනා ගැනීමත් මේ හරහා ඉටු වෙනවා.

ඒ වාගේම මේ පනත හරහා අපි අපේක්ෂා කරන අරමුණු මොනවාද කියන එක සම්බන්ධයෙනුත් කෙටියෙන් අදහස් කිහිපයක් එකතු කරන්න මා බලාපොරොත්තු වනවා. එකක් තමයි, ව්‍යාපාර ඇවර කිරීමට සීමා නොවී පුනරුත්ථාපනයට වැඩි අවධානයක් යොමු කිරීම. මම ඒක මීට පෙරත් සඳහන් කළා. මීට පෙර අපේ රටේ පැවති නීතිය හරහා අවධානය යොමු කර තිබුණේ, එය ශක්‍ය නොවන ව්‍යාපාරයක් නම් ඒක ඇවර කිරීමේ පැත්තට තල්ලු කරන්නයි. හැබැයි, එතැනට සීමා නොවී ඒ ව්‍යාපාර පුනරුත්ථාපනයට ලක් කරලා නැවත සාර්ථකත්වයට පත් කරන්න මේ තුළින් අපි බලාපොරොත්තු වනවා.

ඒ වාගේම තමයි, ශක්‍ය ව්‍යාපාර ගලවා ගැනීමේ ක්‍රියාවලියටත්, ශක්‍ය නොවන ව්‍යාපාර ඇවර කිරීමටත් ප්‍රතිපාදන දැක්වීමෙන් ශ්‍රී ලාංකීය ව්‍යාපාරවලට දෙවැනි අවස්ථාවක් ලබා දෙනවා කියන කාරණාව. ඒ වාගේම තවත් විශේෂ කාරණාවක් මා සඳහන් කරන්න ඕනෑ. බංකොලොත් වීමට පෙර ප්‍රතිව්‍යුහගතකරණයටත් මේ තුළින් අපි අවස්ථාවක් ලබා දෙනවා. මේ පනතේ ඒ සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන දක්වා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වනවා, අපේ රටේ ආර්ථික ක්ෂේත්‍රයේ සුවිශේෂ වර්ධනයක් ඇති කරන්න. ඒක මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම හරහා ලබා දෙන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ වාගේම යම් පුද්ගලයින්ගේ ව්‍යාපාර කඩාගෙන වැටෙනකොට, සමාගම් කඩාගෙන වැටෙනකොට අපි දන්නවා, ඒ ව්‍යාපාරවල, සමාගම්වල සේවයේ නියුක්ත වෙලා ඉන්න පිරිසගේ රැකියා අනතුරේ වැටෙන බව. ඒක අපට විශාල ප්‍රශ්නයක්. ඒ නිසා ඒගොල්ලන්ගේ රැකියා සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් අපි වගකීමක් ගන්න ඕනෑ. ඒ අනුව මේ නව පනත මඟින් ව්‍යාපාර අසාර්ථකභාවයෙන් මුදාගෙන සේවකයින්ගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

ඒ වාගේම ණයහිමියන්ගේ අයකර ගැනීමේ හැකියාවත් මේ හරහා ඉහළ නංවන්න පුළුවන්කම තිබෙනවා. ඒකට හේතුව මේකයි. ණයගැතියන්ට අවශ්‍ය වන සහන ලබා දීමත්, ඒ හරහා නැවත ඔවුන්ගේ ව්‍යාපාර ගොඩ නංවා ගන්න උපකාරී වීමත් කියන කාරණාව තුළින් අපට පුළුවන්, ණයහිමියන්ගේ අයකර ගැනීමේ හැකියාව ඉහළ නංවන්න. ඒ වාගේම ණයගැතියන්ගේ ණය ගෙවීමේ හැකියාව ඉහළ නංවන්නත් අපට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මේ දෙපාර්ශ්වයටම සහන සලසන්න පුළුවන් විධියේ අලුත් පනත් කෙටුම්පතක් තමයි මේ පාර්ලිමේන්තුවට අපි ඉදිරිපත් කර තිබෙන්නේ.

මා මුලින්ම සඳහන් කළා, අක්‍රිය ණය අනුපාතය ඉහළ යෑමක් පිළිබඳව. අපේ රටේ ආර්ථිකය බිඳ වැටෙනකොට අක්‍රිය ණය අනුපාතය ඉහළ යෑමක් අපට දකින්න පුළුවන් වුණා. දැන් මේ අලුත් පනත සම්මත කිරීමෙන් පස්සේ අපේ රටේ ආර්ථිකයේ වර්ධනයක් වාගේම අක්‍රිය ණය අනුපාතය අඩු කර ගන්නත් අපි බලාපොරොත්තු වනවා.

අපේ රටට අලුත් පරිච්ඡේදයක්, අලුත් ගමනක් ආරම්භ කරන්න පුළුවන් අවස්ථාවක් තමයි මේ පනත හරහා අපි උදා කර දෙන්නේ. ඒ වාගේම ණය ආපසු ගෙවීම අත්හිටුවීම සම්බන්ධයෙන් නියෝගයක් ලබා ගැනීමේ ප්‍රතිපාදන පවා මේ පනත හරහා ලබා දෙන්න උත්සාහ කරනවා. අපි දන්නවා, පසුගිය කාලයේ අපේ රටේ ක්‍රියාත්මක වුණු නීතිය අනුව ණයගැතියා දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙන අවස්ථා තිබුණු බව. විශේෂයෙන්ම පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම හරහා ණයගැතියෝ විශාල පීඩාවකට ලක් වෙලා හිටියා. අන්න ඒ ණයගැතියන්ට, ඒ කඩා වැටුණු ව්‍යාපාරවලට, ඒ සමාගම්වලට, ඒ ව්‍යාපාරිකයින්ට මේ තුළින් අවස්ථාවක් ලබා දෙන්න අපට පුළුවන්කම තිබෙනවා. විශේෂයෙන් අපි මේ වනකොට ඒගොල්ලන්ට නැවත අවස්ථා විවෘත කර දීලා තිබෙනවා, ඒගොල්ලන්ගේ බිඳ වැටුණු කර්මාන්ත, බිඳ වැටුණු ව්‍යාපාර නැවත ආරම්භ කරමින් මේ ආර්ථික ක්‍රියාවලියට දායක වෙන්න.

මේ වෙලාවේ මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, අපේ රටේ ආර්ථිකයේ බොහොම දුර්වල වුණු කාල පරිච්ඡේදයක් තමයි අපි පසු කරමින් ඉන්නේ කියන එක. දුර්වල කරන ලද ඒ

ආර්ථිකයට වග කිව යුත්තෝ කවුද කියලා අපි දන්නවා. මම ඉස්සෙල්ලාත් එය සඳහන් කළා. සුන්බුන් විපක්ෂය නියෝජනය කරමින් අදත් ඒ අය පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. අපි එතුමන්ලාට කියන්න කැමැතියි, ඔබතුමන්ලා විසින් දුර්වල කරන ලද මේ රටේ ආර්ථිකය, බංකොලොත් කරන ලද මේ රටේ ආර්ථිකය නැවත පණ ගන්වන්නට සූදානමින් අපි අලුත් නීති සම්පාදනය සඳහා නව පනත් කෙටුම්පත් ඉදිරිපත් කර තිබෙන බව.

අපි මේ රටේ ජනතාවට ලබා දුන් තවත් පොරොන්දුවක් තමයි, නීතියේ පාලනයට යටත් රටක් හදනවාය කියන එක. අපි දැක්කා, පසුගිය කාලයේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ වුණාම පාලකයෝ නීතිය ක්‍රියාත්මක කළේ පනත් අනුව, ව්‍යවස්ථාපිත නීතියට අනුව නොවෙයි කියන එක. ඒගොල්ලන් නීතිය ක්‍රියාත්මක කළේ තම තමන්ගේ හිතුමතේ අනුව, අත්තනෝමතිකව. අපි දැක්කා, සමහර අය සුදු වෑන්වල දාගෙන ගියා, සමහර අයගේ අත පය අහිමි වුණා, සමහර අයගේ ජීවිත පවා අහිමි වුණා, සමහර අය සිරගත වුණා. එවැනි වාතාවරණයක් පසු කරමින්, අඩිබවා යමින් තමයි අපි දැන් ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ. අපි මේ රටේ ජනතාවට කියනවා, ඔබ අපේක්ෂා කරන ලද නීතියේ පාලනයට යටත් රටක් අපි මේ වනකොට නිර්මාණය කරමින් ඉන්න බව. මේ අලුත් පනත් සම්පාදනය හරහා අවස්ථාවක් ලබා ගෙන අපේ රටේ අර්බුද නිරාකරණය කර ගන්නත් අපි බලාපොරොත්තු වනවා. අපි හිතනවා, අද අපි කථා කරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත හරහා අපේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ප්‍රජාවට සුවිශේෂී අවස්ථාවක් නිර්මාණය වනවා කියලා. මේ ගෞරවනීය සභාවට ඒ සම්බන්ධ කරුණු බොහොම සතුටින් ඉදිරිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තුරෙයිරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.18]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்கவகையின்மை (கூட்டிணைப்பு மற்றும் தனிப்பட்ட) சட்டமூலத்தின் இரண்டாம் மதிப்பீடு மீதான விவாதத்தில் கலந்துகொண்டு, குறித்த சட்டமூலம் தொடர்பில் கருத்துச் சொல்வதற்கு முன்னர், நீதிக்காகக் காத்திருக்கும் இனத்தின் குரலாக ஒருசில கருத்துகளை இச்சபையில் முன்வைக்க விரும்புகின்றேன்.

இற்றைக்கு 17 ஆண்டுகளுக்கு முன்னர், இந்தத் தீவில் எங்கள் இனத்தைச் சார்பாக்கிய ஓர் ஆயுதப் போராட்டம் பல நாடுகளின் உதவியோடு இலங்கை அரசால் முடிவுக்குக் கொண்டுவரப்பட்டது அல்லது மௌனிக்கப்பட்டது. கொத்துக் குண்டுகளிலும் இரசாயனக் குண்டுகளிலும் உலகப் போரியல் அறங்கள் குழிதோண்டிப் புதைக்கப்பட்டன. எங்கள் தமிழர் தாயகத்தின் நிபுணத்துவங்கள் அழித்தொழிக்கப்பட்டன. எங்கள் முகவரிகள், அடையாளங்கள் அகற்றப்பட்டன. இலட்சக்கணக்கான உறவுகளைப் போரில் குறிப்பாக முள்ளிவாய்க்காலில் இழந்தோம். ஓர் அரசென்று உங்களை நம்பி ஒப்படைத்த எங்கள் உறவுகளை இன்றளவும் தேடி அலைகின்றோம். எமது உரிமைக்காக, எமது இயல்பு இருப்புக்காக, எமது நல்வாழ்வுக்காகப் போராடிய எங்கள் உறவுகள் இன்றளவும் உங்கள் சிறைகளில் அரசியல் கைதிகளாக வாடுகின்றார்கள். எங்களுக்கான நியாயத்துக்காக, நீதிக்காக உங்களிடமும் பன்னாடுகளிடமும் 17 ஆண்டுகளாகக் காத்திருக்கின்றோம்.

ஒரு தீவில் இவ்வாறு நீதிக்காகவும் நல்வாழ்வுக்காகவும் காத்திருக்கும் எங்களுக்கான நீதியைத் தராமல் எவ்வாறு நல்லிணக்கம் ஏற்படும்? இலங்கை அரசின் நல்லிணக்க மறுப்பின் மற்றோர் ஆண்டு எதிர்வரும் மே மாதம் 18ஆம் திகதியுடன் கடக்கின்றது. ஆறாத வடுக்களோடு நீதியை வேண்டியவண்ணம் விடுதலைப் போரில் உயிரிழந்த எங்கள் மறவர்கள், பொதுமக்களை இச்சபையில் நினைவுகூருகின்றோம். மே 18 அன்று நினைவேந்தல் இருப்பதால் முன்கூட்டியே நினைவுகூருகின்றோம். எமக்கான நீதியைப் பெற்றுத்தருமாறு கடந்த காலங்களில்போல, இன்றும் இச்சபையின் வாயிலாக பன்னாடுகளிடம் கேட்டுக் கொள்கின்றேன். 2026.04.28ஆம் திகதி காலமான எங்கள் விடுதலைப் போராட்ட எழுச்சிப் பாடகரான 'பாசறைப் பாணர்' தேனிசை செல்லப்பா அவர்களுக்கு இச்சபையில் ஈழத் தமிழர்கள் சார்பாக எனது அஞ்சலியைச் செலுத்துகின்றேன்.

அடுத்து, இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள சட்டமூலம் தொடர்பாகச் சில கருத்துகளைத் தெரிவிக்க விரும்புகின்றேன். பொருளாதார அடிப்படையில் இடர்நிலைகளை எதிர்கொள்ளும் நிறுவனங்களையும் தனியாட்களையும் மீட்டெடுத்து, மறுசீரமைத்து மீண்டும் அவை செயற்படுவதற்கான சட்ட ஏற்பாட்டை நிறுவுதல் வரவேற்கத்தக்கது. சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சிகள் வீழ்ச்சியடையும்போது, அவற்றை மீண்டும் எழுச்சிபெறச் செய்வது வேலைவாய்ப்புகளையும் பொருளாதார உறுதிப்பாட்டையும் பாதுகாக்க உதவும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மேற்படி சட்டமூலம் நிறைவேற்றப்பட்டு நடைமுறைப்படுத்தப்படும்போது, பெரும் நிறுவனங்கள் மேற்படி சட்ட நடைமுறைகளை அணுகுவதற்குள்ள வழிநிலைகளைப் போன்று சிறிய மற்றும் நடுத்தர நிறுவனங்களும் தனியாட்களும் மேற்படி சட்ட நடைமுறைகளை அணுகக்கூடிய நிலையை உறுதிப்படுத்த வேண்டும். மேற்படி சட்டத்தினூடாக நன்மைகளைப் பெறுவதிலும் பிராந்திய அடிப்படையிலான சமத்துவ நிலையிலும் வன்னிப் பிராந்தியம் உரியவாறு விழிப்பூட்டப்பட வேண்டும். ஏனெனில், ஓர் அரசாக தங்களின் சுற்றறிக்கைகளில் பிராந்திய அடிப்படையிலான நலன்கள் கருத்திற் கொள்ளப்படுவதில்லையோ என்று எண்ணத் தோன்றுகின்றது. அதற்கு ஓர் எடுத்துக்காட்டுதான், கமத்தொழில் மற்றும் கமநல காப்புறுதிச் சபையின் சுற்றறிக்கையில் வட, கிழக்கில் பெரும்பாலும் மேற்கொள்ளப்படும் புழுதி விதைப்பின் புறக்கணிப்பு.

வடக்கு மற்றும் கிழக்கிலுள்ள பெருமளவான நெற் பயிர்ச்செய்கையாளர்கள் பெரும்போக நெற் பயிர்ச்செய்கைக் காலத்தில் புழுதி விதைப்பு முறையில் உலர் நிலத்தில் நெல் விதைப்பை மேற்கொள்கின்றனர். இவ்வாறு புழுதி விதைப்பு முறையில் உலர் நிலத்தில் நெல் விதைப்பை மேற்கொள்கின்ற விவசாயிகள், தமது நெற்பயிர்கள் அனர்த்தம் காரணமாக அழிவடையும்போது, அவ்வழிவுக்கான காப்பீட்டைப் பெற்றுக்கொள்ள இயலாது அவதியுறுகின்றனர். குறிப்பாக,

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

மழையை நம்பி புழுதி விதைப்பு முறையில் உலர் நிலத்தில் நெல் விதைப்பை மேற்கொள்ளும் விவசாயிகளின் அறுவடைக் காலம் பிந்துவதாலேயே இந்நிலை ஏற்படுகின்றது. எடுத்துக்காட்டாக, மூன்றரை மாத - 105 நாட்கள் - நெல்லை உலர் நிலத்தில் புழுதி விதைப்பு மேற்கொண்டால், குறித்த நெல்லின் அறுவடைக் காலம் நான்கு மாதங்களைக் கடக்கிறது. ஆனால், நெல் விதைக்கப்பட்டு மூன்றரை மாதங்கள் - 105 நாட்கள் - கடந்த நிலையில், நெற் பயிர்ச்செய்கை அழிவுறுகின்ற சந்தர்ப்பங்களில், அந்த அழிவுகளுக்குரிய காப்பீட்டை கமத்தொழில் மற்றும் கமநல காப்புறுதிச் சபை வழங்க மறுக்கின்றது.

கமத்தொழில் மற்றும் கமநல காப்புறுதிச் சபையின் சுற்றறிக்கையில், புழுதி விதைப்பு முறைக்கான காப்பீட்டுக்குரிய ஏற்பாடுகள் இல்லையெனச் சொல்லப்படுகின்றது. இதனால் வடக்கு, கிழக்கில் புழுதி விதைப்பு முறையைப் பின்பற்றும் நெற் பயிர்ச்செய்கையாளர்கள் பெரிதும் பாதிப்புகளை எதிர்நோக்குகின்றனர். எனவே, புழுதி விதைப்பு முறையில் நெற் பயிர்ச்செய்கையை மேற்கொள்கின்ற விவசாயிகளுக்கும் காப்பீடுகளை வழங்குவதற்கு ஏற்றவாறு கமத்தொழில் மற்றும் கமநல காப்புறுதிச் சபையின் சுற்றறிக்கையில் மாற்றங்களைக் கொண்டுவர வேண்டுமென இத்தருணத்தில் இச்சபையின் ஊடாக கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நிறுவனமும் தனியாட்களும் ஏற்கெனவே நலிவுற்றிருக்கும் நிலையில், சட்ட நடைமுறைப்படுத்தலில் ஏற்படும் தாமதமும் சட்ட நடைமுறைகளுக்கான செலவுகள் அதிகரித்தலும் அவற்றை மேலும் பாதிப்புக்கு உள்ளாக்கலாம். உள்ளூர் முயற்சியாண்மையாளர்கள் இவ்வாறான சட்ட ஏற்பாடுகளை அணுகுவதற்கான சட்ட விழிப்பூட்டல் உரிய நிறுவனங்களால் வழங்கப்படும்போதே, பிராந்திய அடிப்படையிலான சட்ட அணுகலில் சமத்துவ நிலை எட்டப்படும். அத்தோடு, மேற்படி சட்ட நடைமுறைப்படுத்தலின் பயன் அடிமட்ட மக்களையும் சிறிய முயற்சியாண்மையாளர்களையும் சென்றடையும். இந்நிலையில், இவ்வாறான சட்ட ஏற்பாடுகள் நடைமுறைப்படுத்தப்படும்போது, சிறிய வணிகதாரர்களும் தனியாட்களும் நுண்நிதி நிறுவனங்களால் மேலும் மாற்று ஏற்பாடுகள் ஊடாக நெருக்கப்படாது இருப்பதை உரிய அமைச்சு உறுதி செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நன்றி! வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.25]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින අපි දෙවන වර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත කියන ඉතා පුළුල් නීති සංග්‍රහය ලංකාවේ ව්‍යවස්ථාකරණයේ තීරණාත්මක අවස්ථාවක් කියායි මං හිතන්නේ. විශේෂයෙන්ම කර්මාන්ත සහ ව්‍යවසායකයන්ට අදාළව ඉතාම දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණු සාම්ප්‍රදායික, යල් පැන ගිය නීතිරීති විශාල ප්‍රමාණයක් මේ තුළින් නූතන සමාජ, ආර්ථික තත්ත්වයන්ට ගැළපෙන විධියට වෙනස් කරලා තිබෙනවා. ඉතාම සද්භාවයෙන් කටයුතු කරන ව්‍යාපාරිකයන්ට, ආයතනවලට සහ පුද්ගලයන්ට යම් යම් විවිධ හේතූන් නිසා වස්තුභංගත්වයට, විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වුණු නිසා ණය ගෙවීමට නොහැකි තත්ත්වයන් ඇති වුණා. විශේෂයෙන්ම 1854 වර්ෂය වාගේ ඉතා ඈත අතීතයේ පනවපු Insolvency Ordinance එක වාගේම 2007 අංක 07 දරන සමාගම් පනත වාගේ පනත්වලින් පනවා තිබුණු නීතිරීති නූතනත්වයට අදාළ විධියට ප්‍රතිසංවිධානය කරලා ඉදිරිපත් කිරීමට අපේ ආණ්ඩුවට හැකි වීම පිළිබඳව අපි ඉතාම සතුටු වෙනවා. මේ හරහා ලැබෙන නව අවස්ථා ලංකාවේ ආර්ථිකයේ නව පිබිදීමක් ඇති කරන්නත් උපයෝගී වනවා.

විශේෂයෙන්ම අද අපි සම්පාදනය කරන මේ නීතිය ව්‍යවසායකයන්ට, අලුත් පරම්පරාවට තමන්ගේ ව්‍යාපාර ඉතා හොඳින් කරගෙන යන්න හොඳ වටපිටාවක් නිර්මාණය කරන්නත්, නීතිඥවරුන් වාගේම ව්‍යවසායකයන් ඇතුළු සෑම ක්ෂේත්‍රයකටම ඉතාම වැදගත් නීතියක් බවට පත් වන බවටත් කිසිම සැකයක් නැහැ. කොහොම වුණත්, අපිට කියන්න තිබෙන්නේ මේකයි. අද වනකොට ඉතාම බේදවාචකයකට පත් වෙලා ඉන්න විරුද්ධ පක්ෂයට එහෙම නැත්නම් දීර්ඝ කාලයක් මේ රට මේ සා විශාල අගාධයකට ගෙනියපු විරුද්ධ පක්ෂයට මේ පනත් හරහා යම්කිසි සහනයක් ලැබෙයි කියලා අපිට හිතන්න අමාරුයි. මොකද, අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මේ රටේ ආර්ථිකය ස්ථාවර කරගෙන, ජාතික සමගිය තහවුරු කරගෙන, ජාත්‍යන්තර ප්‍රජාවගේ විශ්වාසය දිනාගෙන, විදේශ සම්බන්ධතා සහ විදේශ රාජ්‍යයන්ගේ විශ්වාසය තහවුරු කරගෙන රටක් හැටියට ස්ථාවර තත්ත්වයකට යනකොට, රාජ්‍ය පාලනයේදී විවිධ අභියෝග, විවිධ තත්ත්වයන් මතු වුණාම ඒ සියලු තත්ත්වයන් පාවිච්චි කරලා අපේ ආණ්ඩුවත් ඒගොල්ලන් වාගේ කියලා ජනතාවට ඒත්තු ගන්වන්න උත්සාහ කිරීමක් තමයි අපි දකින්නේ.

රාජ්‍ය නිලධාරින්ගේ අතින් යම්කිසි අත්වැරදීමක් වුණත්, එහෙම නැත්නම් කුමන තත්ත්වයක් යටතේ වුණත් ඔවුන් උත්සාහ කරන්නේ අපේ ආණ්ඩුවත් ඒගොල්ලන් වාගේ හොරකම් කළා, ඒගොල්ලන් වාගේ බොරු කියනවාය කියන මතයක් සමාජගත කරන්නයි. මම හිතනවා, ඒක පහසු වෙන්නේ නැහැ කියලා. 2022දී මේ රටේ ජනතාව ඒ හරකා වික්කා. දැන් මේගොල්ලන්ට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ, තවදුරටත් මේ රටේ ජනතාව ඒ වාගේ ගොනාට අන්දන්න. ඔවුන් දන්නවා, මේ රටේ පැවති ජරාජීර්ණ දේශපාලනය විසින් බංකොලොත්භාවයට, එහෙම නැත්නම් බුන්වත්භාවයට පත් කරපු, බිඳ වට්ටපු මව්බිම නැවත ගොඩනැඟීම සඳහා අපට අවස්ථාවක් දෙන්න කියලා තමයි අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ඇතුළු අපේ දේශපාලන ව්‍යාපාරය දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ ජනතාවට කරුණු පැහැදිලි කළේ කියන එක. ඒ අනුව දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි සියලුදෙනාම එකාවන්ව කටයුතු කරමිනුයි ඉන්නේ, මේ රටේ මුළුමහත් ජනතාව ඒ පැවතුණු ජරාජීර්ණ, දූෂිත දේශපාලන, ආර්ථික, සමාජ මඩ ගොහොරුවෙන් එළියට ගෙනෙන්න. එහිදී සෑම ක්ෂේත්‍රයකටම අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණ අපි සිදු කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා පසුගිය දවස්වල මුදල් අමාත්‍යාංශය හරහා ඕස්ට්‍රේලියානු ව්‍යාජ ගිණුමකට මුදල් බැර වීම නිසා ඇති වුණු තත්ත්වය ගැන.

මම දැක්කා, විශේෂයෙන්ම යම් අත්දැකීම් තිබෙන, උගත්කමක් ඇතැයි කියලා අපි මෙතෙක් විශ්වාස කරපු විපක්ෂයේ

සමහර මන්ත්‍රීවරු උත්සාහ කළා, මේ හරහා විශාල සමාජ අවිශ්වාසයක් ගොඩ නඟන්න. ඒ මිය ගිය අපේ රාජ්‍ය සේවකයා පිළිබඳව, ඔහුගේ පවුල පිළිබඳව කිසිම සානුකම්පිත බවක් නැතුව, සංවේදී බවක් නැතුව දේශපාලන පරමාර්ථයෙන් විශාල අවිශ්වාසයක්, සැකයක් තක්කඩි විධියට ගොඩ නැඟීම සඳහා මේ දේශපාලනඥයන් උත්සාහ කරන හැටි අපි දැක්කා. ඔවුන් අපේක්ෂා කරනවා ඒ හරහා මේ රටේ ජනතාව තුළ තමන්ට නැති වී ගිය, අහිමි වී ගිය ඒ විශ්වාසය ඇති කරන්න පුළුවන් වෙයි කියලා. මම හිතන විධියට, ඔවුන්ගේ හැසිරීම ඇතුළේ ඔවුන් තව තවත් දේශපාලන වශයෙන් බංකොලොත්භාවයට පත් වෙනවා; බුන්වත්භාවයට පත් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකෙන් පෙනෙන්නේ ඔවුන් කවදාවත් පුනරුත්ථාපනය කරන්න බැරි පිරිසක් බවට පත් වෙමින් සිටින බව පමණයි.

අපි කියන්න ඕනෑ, අපි රජයක් හැටියට ලංකාවේ රාජ්‍ය සේවයත් එක්ක කටයුතු කරනකොට දීර්ඝ කාලයක් තිස්සේ මේගොල්ලෝ පුරුදු - practise - කරපු රාජ්‍ය සේවයක් එක්කයි අපට කටයුතු කරන්න වුණේ කියන එක. නමුත් අපි බලයට පත් වෙලා මේ ගෙවී ගිය කාලය තුළ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරලා, රාජ්‍ය සේවකයන් එක්ක ඉතා හොඳ ගනුදෙනුවක් කරලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරින්, ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්, සමෘද්ධි නිලධාරින් ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරු, ජනාධිපති ලේකම් දක්වා ඒ සියලු තනතුරුවල සිටින රාජ්‍ය නිලධාරින්, රාජ්‍ය අංශයේ කටයුතු කරන හැම කෙනෙක් එක්කම ඉතාම සමීපව කටයුතු කරමින් අපි අපේ ආණ්ඩුකරණය තුළ ඉතාම ශක්තිමත්ව කටයුතු කරන මොහොතක, අපි දැක්කා විපක්ෂ නායකවරයා උත්සාහ කළා, අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අපේ නියෝජිතයන් පත් කරනවා වාගේ ප්‍රකාශයක් කරමින් එය දේශපාලනීකරණය කරන්න. මම හිතන විධියට, ඔවුන් තමයි විවිධ නම්වලින් විවිධ ආයතන ගොඩ නඟලා ඒ ආයතන සියල්ල දේශපාලනීකරණය කරලා මේ රට අගාධයට ඇදගෙන ගියේ. නමුත් අපේ හැසිරීම, අපේ වැඩ කලාව ඇතුළේ දැන් මේ රටේ සියලු රාජ්‍ය සේවකයන් කල්පනා කරනවා, මේ රටට තමන්ගේ සේවය ලබා දීම සඳහා ඔවුන්ට අවස්ථාවක් ලැබිලා තිබෙනවා කියලා. අද වෙනකොට අපේ ආණ්ඩුව, අපේ ජනාධිපතිවරයා, අමාත්‍යවරු, මන්ත්‍රීවරු වැඩ කරන ආකාරයත්, අපිත් එක්ක වැඩ කරන අනෙක් සියලු සංවිධානගත සාමාජිකයන් කටයුතු කරන ආකාරයත් එක්ක මේ රටේ බංකොලොත්භාවයට පත් වුණු විපක්ෂය හැරුණුකොට රටේ සමස්ත ජනතාව තුළ ප්‍රසාදයක් ඇති වී තිබෙනවා. අපට ඡන්දය දීපු නොදීපු බොහෝ පිරිසකගේත්, අනෙකුත් පක්ෂවලට ඡන්දය දීපු බොහෝ පිරිසකගේත්, රාජ්‍ය සේවයේත් ප්‍රසාදය වැඩි වෙමින් තිබෙනවා, අපේ රජය කටයුතු කරගෙන යන ආකාරය පිළිබඳව. අපේ පාලනයක් යටතේ දශක ගණනාවක් ඉදිරියට මේ රට පවත්වාගෙන යන්න අවශ්‍ය සහයෝගය ලබා දීමට ඔවුන් කටයුතු කරන බව අපට විශ්වාසයි. මොකද විරුද්ධ පක්ෂයේ මහත්වරු හැසිරෙන විධිය අනුව ජනතාවට පෙනෙනවා, කිසිම ආකාරයකින් නූතනත්වයට ගැළපෙන දේශපාලනයක් සඳහා ඔවුන් සූදානම් නැති බව; ඒ වාගේම ඔවුන් පුනරුත්ථාපනය කළ නොහැකි පිරිසක් බවට පත් වී ඇති බව.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.34]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய நாடு பொருளாதார ரீதியாக, சமூக ரீதியாக நெருக்கடிக்கு உள்ளாகும் போதெல்லாம் எங்களுக்கு உதவிபுரிகின்ற நாடு அயல் நாடான இந்தியாதான். இந்தியாவில் நான்கு மாநிலங்களில் ஜனநாயகத் திருவிழா - தேர்தல் - நடந்து முடிந்திருக்கின்றது. முக்கியமாக, தமிழ் நாட்டில் தேர்தல் நடந்து முடிந்திருக்கின்றது. தமிழ்நாடு என்பது, இலங்கையில் வாழக்கூடிய இந்திய வம்சாவளி மக்களான, இலங்கைப் பிரஜைகளான எங்களது தந்தையர் நாடு! அங்கு அண்மையில் நடைபெற்ற ஜனநாயகத் திருவிழாவில் ஜோசப் விஜய் சந்திரசேகர் அவர்களது தமிழக வெற்றிக் கழகம் வெற்றியீட்டி இருக்கின்றது. அக்கட்சியினருக்கு இலங்கையில் வாழ்ந்துகொண்டு இருக்கக்கூடிய இந்திய வம்சாவளி மலையக மக்களின் பிரதான கட்சியான தமிழ் முற்போக்குக் கூட்டணி சார்பில் என்னுடைய வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றேன். இது முக்கியமானது. இங்கு எனக்கு அருகில் தம்பி கௌரவ பழனி திகாம்பரம் அவர்களும் இருக்கின்றார். நாங்கள் மகிழ்ச்சியைப் பகிர்ந்துகொள்ளும் அதேவேளையில், இலங்கையில் வாழக்கூடிய இந்திய வம்சாவளி மலையக மக்கள் தொடர்பான துயரமான சம்பவத்தையும் பகிர்ந்துகொள்ள விரும்புகின்றோம்.

கடந்த ஏப்பிரல் மாதம் 22ஆம் திகதி இரத்தினபுரி மாவட்டத்தின் கஹவத்தையிலுள்ள நீலகாமம் தோட்டத்தில் வாழ்ந்துகொண்டு இருக்கக்கூடிய தொழிலாளர்கள்மீது காட்டுமிராண்டித்தனமான தாக்குதல் நடாத்தப்பட்டு இருக்கிறது. அந்தத் தாக்குதலை நடாத்தியவர்கள் யாரென்றால், Kahawatte Plantations - கஹவத்தை பெருந்தோட்ட - நிறுவனத்தைச் சார்ந்த பாதுகாப்புப் படை என்ற முறையில் இருக்கக்கூடிய படைதான். அந்தப் படையை அந்த நிறுவனம்தான் நடாத்திக்கொண்டு இருக்கின்றது. இராணுவத்திலிருந்து, பொலிஸிலிருந்து விலகி வந்தவர்களை இணைத்துக்கொண்டு அந்தப் படையை நடாத்துகின்றார்கள்.

நான் மேற்குறித்த சம்பவம் தொடர்பாக Kahawatte Plantationsஇன் CEOஆன Binesh Pananwala அவர்களுடன் தொலைபேசியில் உரையாடினேன். நான் அவரிடம் கடுமையாக எடுத்துக்கூறி இருக்கின்றேன். அங்கு சட்டவிரோத மாணிக்கக் கல் அகழ்வு நடைபெறுவதால், அதைத் தடுப்பதற்காகவே அப்படியான ஒரு படையை வைத்திருப்பதாக அவர் சொல்கிறார். பரவாயில்லை! அங்கு கள்ளச்சாராயம், கசிப்புப் பாவனைகூட இருக்கலாம்! அதனையும் தடுத்து நிறுத்துங்கள்! அதனுடன் தொடர்புடையவர்களைக் கைதுசெய்து பொலிசாரிடம் ஒப்படையுங்கள்! பரவாயில்லை. பெருந்தோட்டப் பகுதி என்பது, இலங்கையின் ஒரு பகுதி! அங்கு வாழ்கின்ற மலையக மக்கள் இலங்கைப் பிரஜைகள்!

இலங்கை பொலிஸ் என்பது நாடுமுழுவதும் இருக்கின்ற எல்லோருக்கும் பொதுவானது. நான் சற்று முன்னர், பொலிஸுக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ ஆனந்த விஜயபால அவர்களிடம் தனிப்பட்ட முறையில் தெளிவாக எடுத்துக் கூறினேன், "தயவுசெய்து, பெருந்தோட்ட மக்களையும் இலங்கை மக்களாகக் கருதும்படி பொலிஸ் அதிகாரிகளுக்குச் சொல்லுங்கள் - பணிப்புரை விடுங்கள்!" என்று. மேற்குறித்த காட்டுமிராண்டித்தனமான தாக்குதலால்

[ගරු මනෝ ගනේසන් මහතා]

எங்களது இளைஞர்கள் - எங்களது மக்கள் -காயப்பட்டு இருக்கிறார்கள்; மருத்துவமனையில் அனுமதிக்கப்பட்டு இருந்தார்கள். நான் வலியுறுத்திய பிறகு, தாக்கியவர்கள் கைதுசெய்யப்பட்டு, பின்னர் பிணையில் விடுவிக்கப்பட்டு இருக்கின்றார்கள். இதுபோன்றதொரு சம்பவம்தான் தென்னிலங்கையின் மாத்தறையிலும் நடந்தது. அதையும் நான் கௌரவ அமைச்சர் ஆனந்த விஜயபால அவர்களின் கவனத்துக்குக் கொண்டுவந்தேன். அது தொடர்பில் பெரிதாக நடவடிக்கை எடுக்கப்பட்டதாகத் தெரியவில்லை.

இனிமேல் இத்தகைய தாக்குதல்கள் பெருந்தோட்டங்களிலுள்ள எங்கள் மக்கள்மீது நடத்தப்படுமானால், நாங்கள் தற்பாதுகாப்புக்காகத் திருப்பி அடிப்போம்; வேறு வழியில்லை. அது தேவையில்லாத பிரச்சினையை உருவாக்கும். எனவே, இது தொடர்பில் அரசாங்கத்துக்கும் கடப்பாடு இருக்கின்றது என்பதை நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். நீலகாமம் சம்பவம் சம்பந்தமாக அங்குள்ள இளைஞர்கள் ஒன்றுசேர்ந்து "நீலகாமம் பிரகடனம்" என்றதொரு பிரகடனத்தைத் தயாரித்து என்னிடம் கையளித்து இருக்கிறார்கள். அதை நான் ஹன்சாட் பதிவுக்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

எங்களுடைய தமிழ் முற்போக்குக் கூட்டணி சார்பாக நாங்கள் இரண்டு முன்மொழிவுகளை அரசாங்கத்திடம் முன்வைக்கின்றோம்.

1. இராணுவத்திலிருந்து விலகி வந்தவர்களைக்கொண்டு தோட்டக் கம்பனிகள் குண்டர்படை அமைப்பதைத் தடைசெய்ய வேண்டும். தோட்டப் பிரதேசங்களும் இலங்கை நாட்டின் சட்டபூர்வ நிலம். அங்கே வாழும் மக்கள் இலங்கை நாட்டின் குடிமக்கள். அவர்கள் அடிமைகளும் அல்லர்; அந்நியர்களும் அல்லர். தோட்டங்களில் கம்பனிகள் குத்தகை உரிமையை மட்டுமே கொண்டுள்ளன. ஆகவே, பெருந்தோட்டப் பிரதேசங்களில் சட்டத்தையும் ஒழுங்கையும் நிலைநாட்டும் பணியில் இலங்கை பொலிஸ் மட்டுமே ஈடுபட வேண்டும்.

2. தோட்டப் பிரதேசங்களில் வாழும் வீடில்லா மற்றும் 'தித்வா' புயலால் வீடுகளை இழந்த குடும்பங்களுக்குத் தோட்டங்களில் பயிர்செய்யப்படாத தரிசுக் காணிகளில் தற்காலிக குடியிருப்புகளை அமைக்க உரிமையளிக்கப்பட வேண்டும். ஆளும் கட்சியான NPPஇன் ஹட்டன் பிரகடனத்தின் முதலாவது பக்கத்தில், 'வீடு - காணி' என்ற தலைப்பிலான அத்தியாயத்தில், தரிசு நிலங்களை மலையக மக்களுக்குத் தருவதாகச் சொல்லப்பட்டு இருக்கின்றது. ஆகவே, நீங்கள் அதைச் செய்ய வேண்டும்.

நான் இந்தச் சந்தர்ப்பத்தில் அரசாங்கத்துக்கு ஒன்றை ஞாபகப்படுத்த விரும்புகின்றேன். மலையக மக்கள் தொடர்பாக NPP வெளியிட்ட ஹட்டன் பிரகடனத்தின் இரண்டாவது பக்கத்தில், under the subtitle "Land and Housing", I quote:

> "The main problem faced by the Malaiyaga Tamil people is the housing problem."

> "Attempts are made to evict some workers from their homes when they leave plantation work."

> "Uncultivated areas and abandoned land in the plantation areas will be used to improve the livelihood of the unemployed youth …."

என்று சொல்லப்பட்டு இருக்கிறது. அதாவது, මුඩු ඉඩම් තිබෙනවා නම් ඒ ඉඩම්, වතුවල ජීවත් වෙන මලෛයහම් ජනතාවට බෙදා දෙනවා කියලා ආණ්ඩුව මේ "හැටන් ප්‍රකාශනය" තුළ කියලා තිබෙනවා. මම එය මතක් කරන්න කැමතියි. අමතක වෙලාද, ඔයගොල්ලන්ට? ගරු අනුර කුමාර දිසානායක මැතිතුමනි, ගරු හරිනි අමරසූරිය මැතිනියනි, අමතක වෙලාද ඒක? මෙය හොඳට මතක තියා ගන්න.

ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමා දැන් RPCsවල ඉඩම් ඉල්ලා තිබෙනවාලු, ගම්මානවල ජීවත් වන ජනතාවට බෙදලා දෙන්න. ඒක හොඳයි. ප්‍රශ්නයක් නැහැ. ගම්මානවල ජීවත් වෙන අපේ සහෝදර ජනතාවටත් ඉඩම් දෙන්න ඕනෑ. හැබැයි, ඊට පෙර වතුවල ජීවත් වෙන මලෛයහම් ජනතාව කියලා ඔයගොල්ලන් හඳුනා ගත් ජනතාවට ඉඩම් දීලා අනෙක් අයට ඉඩම් දෙන්න. අපිට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි ඉඩම් ප්‍රශ්නය. எங்களுடைய மக்களுக்குக் காணி உரிமையை வழங்காமல் நீங்கள் ஏனைய மக்களுக்குக் காணிகளை வழங்குவீர்களானால், தமிழ் முற்போக்குக் கூட்டணி ஏனைய கட்சிகளையும் சேர்த்துக்கொண்டு, மக்களையும் அரவணைத்துக்கொண்டு இந்த நாட்டில் பெரும் போராட்டத்தை நடத்தவேண்டிய நிலைமை ஏற்படும் என்பதைக் கூறிவைக்க விரும்புகின்றேன். எனவே, அவ்வாறு செய்ய வேண்டாம்! எங்களுடைய மக்களின் முதலாவது முக்கிய பிரச்சினையும் காணி; இரண்டாவது முக்கிய பிரச்சினையும் காணி; மூன்றாவது முக்கிய பிரச்சினையும் காணிதான். இது தொடர்பான ஆவணத்தை நான் ஹன்சாட் பதிவுக்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

இவ்வாறான செயற்பாடுகள் தொடர்ந்து இடம்பெறுவதை நாங்கள் அனுமதிக்க முடியாது. தயவுசெய்து, எங்களுடைய மக்கள்மீது காட்டுமிராண்டித்தமான தாக்குதல்களை நடத்தாதீர்கள்! இதற்கு முன்னர், மாத்தறை பகுதியில் நாயை ஏவிவிட்டு மலையக இளைஞர்களைத் தாக்கினார்கள். அதையும் நான் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவந்தேன். இவ்வாறு தொடர்ந்து நடக்குமானால் நாங்கள் சும்மா இருக்க மாட்டோம். எங்களால் சும்மா இருக்க முடியாது. தற்பாதுகாப்புக்காகத் திருப்பி அடிக்க வேண்டிய நிலை வரும். அது பாரதூரமான விபரீதங்களை ஏற்படுத்தும். அந்த நிலைக்குக் கொண்டுசெல்ல வேண்டாமென கேட்டுக் கொள்கின்றேன்.

சனாதிபதி மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் எனது நண்பர்; கௌரவ பிரதமர் ஹரினி அமரசூரிய அவர்கள் எனது நண்பி. அவர்களுக்கும் கௌரவ அமைச்சர் ஆனந்த விஜேபால அவர்களுக்கும் நான் ஒன்றைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அதாவது, மலையக மக்களை இலங்கைக் குடிமக்களாகக் கருதவேண்டிய கடப்பாடு உங்களுக்கு இருக்கின்றது. அதைவிடுத்து, மலையக மக்களுக்கு விரைவில் காணி தருகின்றோம், விரைவில் வீடு தருகின்றோம், விரைவில் வீதி அமைத்துத் தருகின்றோம்,

***පුස්තකාලයේ තබා ඇත.**

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

***පුස්තකාලයේ තබා ඇත.**

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

விரைவில் வாழ்வாதார கட்டிடங்களை அமைத்துத் தருகிறோம், விரைவில் ஹட்டன் பிரகடனத்தில் கூறியவற்றைச் செயற்படுத்தப் போகிறோம் என்று சொல்லி காலத்தைக் கடத்தாதீர்கள்! நீங்கள் எதிர்க்கட்சி அல்ல; ஆளுங்கட்சி! நீங்கள் ஆட்சிக்கு வந்து 1½ வருடங்கள் ஆகிவிட்டன. இன்னும் 3½ வருடங்கள்தான் இருக்கின்றன. செய்து முடியுங்கள்! உங்களுக்கு அவகாசம் தருகிறோம். அதைப் பயன்படுத்தி, பிரச்சினைகளைத் தீருங்கள்! பிரச்சினைகளைத் தீர்க்காவிட்டால், நாங்கள் ஆளுங்கட்சியாகச் செயற்படவேண்டி வரும் என்பதை இந்த இடத்தில் கூறிவைக்க விரும்புகின்றேன். நன்றி!

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද? ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට mike එක දෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මට point of Order එක කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්ථාවර නියෝග 91 යටතේ මම කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ ගරු සභාවේ මා නොසිටි වෙලාවේ ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා මා උදේ වරුවේ කරපු කථාවක් විකෘති කරලා කථා කළා. ඒ කාරණය ගැන මම පැහැදිලිව කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අර මුදල් අමාත්‍යාංශයේ නිලධාරියාගේ මරණය සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න කමිටුවක් පත් කළාම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් අසේල ගුණවර්ධන මැතිතුමා විසින් ඒ කමිටුවේ නිලධාරීන් වෙත ලියපු ලියුමක් මම මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ ලියුමේ පැහැදිලිව එතුමා සඳහා කර තිබෙනවා,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට මේකට ඉඩ දෙන්න. මම මේ නිවැරැදි කිරීම කරන්න එපායැ. මට මේ නිවැරැදි කිරීම කරන්න ඉඩ දෙන්නකෝ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මේ ලියුමේ පැහැදිලිව කියලා තිබෙනවා, I quote:

"According to the said letter, it has been reported that Nishshanka Arachchilage Seelawathi, a resident of Pahala Veerambuwa Kuliyapitiya, within the Kuliyapitiya Police Division, has informed that her husband, Abeysinghe Mudiyanselage Ranga Nishshanka Rajapaksha, died under suspicious circumstances on 30.04.2026."

ඒ කියන්නේ, එතුමිය කියලා තිබෙනවා, සැක සහිත තත්ත්වයන් යටතේ වුණා,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, විග්‍රහ කරන්න නොවෙයි, විනාඩියකින් අවසන් කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේ ඉදිරිපත් කළේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලියුම. එහි බොරුවක් තිබෙනවා නම් ඒ අධ්‍යක්ෂවරයාගේ බල නහරය කපන්න කියන්න. මගේ බල නහර කපන්න එන්න එපා. අඩුම ගණනේ තමන්ගේ පක්ෂයේ පාක්ෂිකයාගේ මරණ ගෙදරට යන්න බැරි වුණු මිනිස්සු ලජ්ජා නැතිව ඇවිල්ලා මෙතැන කයිවාරු ගහනවා. අපේ බල නහර කපන්න එන්නේ නැතිව අසේල ගුණවර්ධනව අල්ලා ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.44]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අදට අදාළ ප්‍රධාන විවාදයට එන්න පෙර ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සමහර කරුණු කාරණා සම්බන්ධව යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි කියා මම හිතනවා.

கௌரவ பாராளுமன்ற உறுப்பினர் மனோ கணேசன் அவர்கள் சற்று முன்னர் உரையாற்றிய பொழுது, ஒரு முக்கியமான விடயத்தைக் கூறியிருந்தார். அதாவது, நீலகாமம் பிரதேசத்தில் இடம்பெற்ற குறித்த தாக்குதல் சம்பவம் பற்றி இந்தச் சபையில் எடுத்துரைத்திருந்தார். உண்மையிலேயே நாங்கள் அவரது பேச்சினை அவதானித்தபொழுது, அவர் கூற முன்வரும் விடயம் என்னவென்றால், அரசாங்கம் முன்னின்று, அரசாங்கத்தின் அனுசரணையுடன்தான் குறித்த தாக்குதல் சம்பவம் மேற்கொள்ளப்பட்டது என்பதை மிகவும் கடினமாக எடுத்துரைக்க விரும்பியதைத்தான் எங்களால் காணக்கூடியதாக இருந்தது. எனினும் உண்மையாக நடந்த விடயம் என்னவென்று மக்களுக்குத் தெரியும். தேசிய மக்கள் சக்தி அரசாங்கம் இந்த விடயத்தை எவ்வாறு அணுகுகின்றது என்பதும் மக்களுக்குத் தெரியும். அது மாத்திரமல்லாது, [බාධා කිරීමක්] ඔබතුමා ගැන කිව්වේ නැහැ නේ. [බාධා කිරීමක්] මගේ වෙලාවේ මට කථා කරන්න දෙන්න. [බාධා කිරීමක්] මගේ

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

වෙලාවේ මට කථා කරන්න දෙන්න. [බාධා කිරීමක්] බාධා කරන්න එපා. ඔබතුමා ව්‍යාජ තොරතුරු සමාජගත කරන එක නවත්වන්න. ඒ කාලයේ - 1983දී - ඔයගොල්ලන්ගේ ආණ්ඩුව තමයි ඔය වතු ටිකට ගිනි තැබුවේ. [බාධා කිරීමක්]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

මම කථා කරන දෙමළ දන්නෙත් නැහැ, සිංහල දන්නෙත් නැහැ, එයා.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ඕනෑ නැති දේවල් කථා කරන්න එපා. මට කථා කරන්න දෙන්න.

அதாவது, இந்த விடயத்தைப் பொறுத்தவரையில், அரசாங்கம் தலையிட்டு, தேவையான அனைத்து நடவடிக்கைகளை மேற்கொண்டு, சரியான வகையில் சட்டரீதியான நடவடிக்கைகளை எடுத்து கைதுகளை மேற்கொண்டாலும், இவர்களைப் பொறுத்தவரையில், இவ்வாறான விடயங்கள் அரசாங்கத்தின் அனுசரணையுடன் மேற்கொள்ளப்படுவதாகத்தான் இன்னும் சொல்லிக்கொண்டு இருக்கின்றார்கள். எங்களுக்குத் தெரியும், மலையகத்தில் தேசிய மக்கள் சக்தியின் வளர்ச்சி, மிகவும் முக்கியமான பாரியதொரு வளர்ச்சியாகக் காணப்படுகின்றது என்ற விடயத்தினை அவர்களால் உணர்ந்து கொள்ள முடிகின்றது என்று. கடந்த காலங்களில் மே தினத்தைகூட ஒழுங்காகச் செய்துகொள்ள முடியாத நபர்கள், ஒருபோதும் இந்த அரசாங்கத்தை விமர்சிப்பதற்கு எந்தவிதமான அருகதையும் இல்லாதவர்கள் என்ற விடயத்தையும் கூறிக் கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ආර්ථිකයට අදාළ ඉතාම වැදගත් ප්‍රතිසංස්කරණයක් ගැන, අලුත් පනත් කෙටුම්පතක් ගැන අද අපි සාකච්ඡා කරනවා. අපි හිතනවා මෙය අපගේ ආර්ථික ගමනේදී අපට දැවැන්ත දායකත්වයක් ලබා දෙන පනතක් වේවි කියලා. මේ පනත් කෙටුම්පතේ නම තමයි, බේරා ගැනීම්, පුනරුත්ථාපනය සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත. මෙම පනත් කෙටුම්පතට අදාළව තමයි අද අපි සාකච්ඡා කරන්නේ.

මෙතැනදී අපට එක කාරණාවක් ගැන අදහසක් තිබෙන්නට ඕනෑ. ඒ තමයි, විවිධ කාල වකවානුවල ලෝකයේ විවිධ දේවල්, විවිධ ආර්ථික ප්‍රතිසංස්කරණ සිදු වනවා කියන එක. නමුත්, පසුගිය කාල වකවානුව තුළ ලෝකයට සරිලන ප්‍රතිසංස්කරණ මේ රට තුළ සිදු වුණේ නැහැ. අපි ඒ ගැන මෙතැනදී සාකච්ඡා කළ යුතුයි. නමුත් අපි විශ්වාස කරනවා, අපට ලැබිලා තිබෙන ජන වරමත් එක්ක ලෝකයට සරිලන වැදගත් ප්‍රතිසංස්කරණ අප ගෙන ආ යුතුයි කියලා. ඒ නිසා තමයි Rescue, Rehabilitation and Insolvency (Corporate and Personal) Bill කියන නමින් මේ නීතිය ගෙනෙන්න අප කටයුතු කරලා තිබෙන්නේ. ලෝකයේ විවිධ රටවල් මේ වාගේ පනත් තමන්ගේ රටවල ක්‍රියාත්මක කරගෙන යනවා. එතැනදී අපි ඇත්තටම එක කාරණාවක් දිහා බලන්නට ඕනෑ. ඒ තමයි, දැනට තිබෙන නීති රීතිවලින් බොහොමයක් ඉතාම කල් පැනපු ඒවා වීම. එම නීති රීතිවලට යම්කිසි ආකාරයක ප්‍රතිසංස්කරණ අවශ්‍යයි කියන පදනමින් තමයි අප මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ.

විශේෂයෙන් කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරවලට මෙම පනත දැවැන්ත දායකත්වයක් ලබා දෙනවා. ඒ 1853 Insolvency Ordinance එකේ ප්‍රතිපාදන හරහා තමයි මෙය සිදු වන්නේ. ඒ වාගේම 2007 අපේ Companies Act එක හරහාත් මෙය සිදු වෙනවා. නමුත්, අපි තීරණයක් ගත්තා ඒ තිබෙන ප්‍රතිපාදන මදි කියලා. ඒ පදනමත් එක්ක තමයි අපි මේ ප්‍රතිසංස්කරණවලට එන්නේ. එතැනදී අප හිතන කාරණාව මේකයි. ලෝකයේ සිදු වන විවිධ කරුණු කාරණා නිසා ව්‍යාපාර බිඳ වැටෙන්න පුළුවන්. ඒක රට අභ්‍යන්තරයේ සිදු වන යම්කිසි ගැටුම්කාරී තත්ත්ව නිසා වෙන්න පුළුවන්. ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් සිදු වන දේවල් හරහාත් ව්‍යාපාරවලට හානි සිදු වෙන්න පුළුවන්. නමුත්, එතැනදී රජය විධියට අප ගන්න ඕනෑ තීරණය තමයි, ඒ සිදු වන කරුණු කාරණා සහ ඇති වන බලපෑම් හමුවේ ඒ ව්‍යාපාර බිඳ වැටෙන්න දෙනවා ද, එහෙම නැත්නම් අප යම්කිසි ප්‍රතිසංස්කරණයක් කරන්න යම්කිසි ඉඩ කඩක් දීලා ඒ ව්‍යාපාර ආරක්ෂා කරන්න ඉඩ දෙනවා ද කියන එක. අපි ඒ කාරණා දිහා බලන්න ඕනෑ.

මේක ඉතාම විශාල පනත් කෙටුම්පතක්. පිටු විශාල ප්‍රමාණයක් තිබෙනවා. පිටු විධියට ගත්තොත්, හයසියයකට වඩා සංඛ්‍යාවක් තිබෙනවා. අපි හිතනවා, මේක සමස්තයක් විධියට හැම පැත්තක්ම කල්පනා කරලා ගෙනාපු පනත් කෙටුම්පතක් කියලා. විශේෂයෙන්ම හිතාමතාම - deliberately - ව්‍යාපාර කඩා වැටෙන්න ඉඩ දීලා යම්කිසි ආකාරයකින් ඒකෙන් ප්‍රතිපාදන ගන්න යම් කිසි පුද්ගලයෙක් හෝ යම් කිසි ආයතනයක් උත්සාහ කරනවා නම් ඒකටත් යම්කිසි තහනමක් තියාගෙන කටයුතු කරන්න ඕනෑ. හරි විධියට යම්කිසි ව්‍යාපාරයක් කරගෙන යන කොට external shock එකක්, එහෙම නැත්නම් අභ්‍යන්තරයෙන් සිදු වෙච්ච කරුණු කාරණා නිසා යම්කිසි ප්‍රශ්න, ගැටලු මතු වෙලා තිබෙනවා නම් ඒකට අවශ්‍ය ප්‍රතිපාදන මේකෙන් ලබා දීලා තිබෙනවා.

අපි රටක් විධියට දැවැන්ත ආර්ථික අපහසුතාවට මුහුණ දෙමින් ඉන්නේ. අපේ රටේ දැවැන්ත යුද්ධයක් තිබුණා. කොවිඩ් වසංගතයත් එක්ක ඇති වුණු ආර්ථික තත්ත්වයට අපි මුහුණ දුන්නා. ඒ වාගේම, අපේ රට තුළ තුළ සිදු වෙච්ච ආර්ථික බංකොලොත්භාවයට අපි මුහුණ දුන්නා. ඒ වාගේම මැද පෙරදිග රටවල සිදු වෙන නොසන්සුන් තත්ත්වයත් එක්ක නිර්මාණය වුණු ආර්ථික අර්බුදයටත් අපට දැන් මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අපි ඒ කුමන තත්ත්වයට මුහුණ දුන්නත් අපට කිසිසේත්ම අයිතියක් නැහැ, හරියාකාරයෙන් ව්‍යාපාරයක් කරගෙන යනකොට ඒ ව්‍යාපාරයට දඬුවම් දෙන්න.

උදාහරණයක් විධියට මේ කාරණය ගනිමු. අපි දන්නවා, මේ කාල වකවානුවල supply chains සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. සැපයුම් මාර්ගයට යම්කිසි හානියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ supply chain disruption එක නිසා, ඒ සැපයුම් මාර්ගයට යම්කිසි ආකාරයක හානියක් සිදු වෙච්ච නිසා ව්‍යාපාරයකට ඉදිරියට යන්න බැරි වුණා නම්, නිෂ්පාදනය හරියාකාරව කරන්න බැරි වුණා නම්, ඒ ව්‍යාපාරය බංකොලොත් වෙන එක වළක්වා, යම්කිසි ආකාරයකින් යළිත් එයාට අවස්ථාවක් දෙන්න ඕනෑ කියන එක තමයි මේකේ පරම අදහස විධියට අපට තිබෙන්නේ. ඒක ඉතාම වැදගත් දෙයක්.

මේකට ලෝකයේ බොහෝ උදාහරණ තිබෙනවා. විශේෂයෙන් ඇමෙරිකාවේ airlines කිහිපයක් ගැන මෙතැනදී සඳහන් කරන්න ඕනෑ. ඇමෙරිකාවේ Delta Airlines වෙන්න පුළුවන්, United Airlines වෙන්න පුළුවන්, ඒ වාගේම General Motors වෙන්න පුළුවන්, Marvel Entertainment වෙන්න පුළුවන්. අපි හැමෝම කැමැත්තෙන් නරඹන Marvel Entertainmentහි චිත්‍රපට රාශියක් තිබෙනවා. Marvel

Entertainment ගැන කථා කළොත්, 1990දී ඒ කියන සමාගම බංකොලොත්භාවයට පත් වෙනවා. ඒ බංකොලොත්භාවයට පත් වීමත් එක්ක ඒ රටේ තිබුණු නීති රීති තුළින් ඔවුන්ට යම්කිසි ආකාරයකින් ලබා දීපු ප්‍රතිපාදන එක්ක පුනරුදයක් විධියට ඒ ආයතනයට නැවත නැඟී සිටින්න අවස්ථාවක් ලැබෙනවා. දැන් Marvel Entertainment ආයතනය ඉතාම විශාල ආයතනයක් විධියට, ලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මොකක් හරි ගැටලුවක් නිසා, විශේෂයෙන් ඒ ආයතනය නොකරපු වැරැද්දක් නිසා යම්කිසි ආකාරයකින් ඒ ආයතනයට අපි දඬුවම් ලබා දෙනවාද, එහෙම නැත්නම් යළි අවස්ථාවක් දීලා අපි ඒ ආයතනයට යළි නැඟී සිටින්න අවස්ථාවක් දෙනවාද කියන එක තමයි මෙතැනදී ඉදිරිපත් කරන්න ඕනෑ වැදගත්ම කාරණාව.

ඒ වාගේම ලෝකයේ විවිධ රටවල් මේ හා සමාන නීති-රීති ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන්ම ඇමෙරිකාවේ බංකොලොත්භාවයට අදාළ Bankruptcy Code එකට අදාළ Chapter 11 කියන ප්‍රතිපාදනය ඉතාම වැදගත් ප්‍රතිපාදනයක් විධියට තිබෙනවා. ඉන්දියාවේ 2016 අවුරුද්දේ ඉදිරිපත් කරපු Insolvency and Bankruptcy Code කියන ඒ ප්‍රතිපාදන හරහා විවිධ ව්‍යාපාරවලට යළි නැඟී සිටින්න ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ සිදු වෙච්ච ආර්ථික අර්බුදය නිසා ඒ ව්‍යාපාර කඩා ගෙන වැටුණා නම්, යළි නැඟී සිටින්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. සිංගප්පූරුවේත් ඒ වාගේ ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. UKවලත් ඒ වාගේ ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඒ වාගේ, විවිධ රටවල් විවිධ ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිනි, ඇත්තටමම අපි බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. අපේ රටේ දැවැන්ත ආර්ථික ප්‍රතිසංස්කරණ සිදු වෙන, පසුගිය කාලයේ සිදු වෙච්ච දූෂණ, වංචා, නාස්තිය, අක්‍රමිකතා දේවල් වෙනස් කරමින් අපි රටක් විධියට එකතු වෙමින් සියලු ප්‍රජාව එකතු කරගෙන යන මේ මොහොතේ අපි හිතනවා, මේ පුනරුද ගමනට මේ වාගේ ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍යයි කියලා.

ඒ වාගේම, අපි යම් වාර්තා දිහා බැලුවාම පෙනෙනවා යම් යම් ප්‍රශ්න. අපේ රටේ තිබෙන එක ප්‍රශ්නයක් තමයි, Non-performing Loans කියන්නේ. බැංකුවලින් ණය අරගෙන තිබෙනවා. නමුත් ඒ ණය ගෙවනකොට යම් කිසි ගැටලුවක්, යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා. අපි non-performing loans කියන්නේ, ණය අරගෙන තිබුණු විවිධ පුද්ගලයන්ට ඒ ණය ගෙවන්න බැරි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙන එක. අපි ඒකේ ප්‍රතිශතය ගත්තොත්, පසුගිය කාල වකවානුව තුළ ඒ ප්‍රතිශතය ශීඝ්‍රයෙන් වැඩි වුණු තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේ රටේ ඒ වාගේ තත්ත්වයක් තිබියදී ණය ගෙවන්න බැරි වුණු ආයතනවල - non-performing loans තිබෙන ආයතනවල - තත්ත්වය හරියාකාරයෙන් සොයා බලමින්, ඒ ආයතන බංකොලොත් වන එක වළක්වන්න, ඒ ආයතන වෙන්දේසි කරන එක වළක්වන්න, ඒවායේ තිබෙන සම්පත් ටික නිවැරදි ආකාරයෙන් පාවිච්චි කරමින්, හරි තක්සේරුවක් කරමින්, යළි වතාවක් ඒ ආයතනවලට නැඟී සිටින්න අවස්ථාවක් ලබා දෙන්නට ඕනෑ. අපි දැක්කා, Easter Sunday attack එකෙන් පස්සේ ආයතන කිහිපයක් වැහුණු බව, කොවිඩ් වසංගතයෙන් පස්සේ ආයතන කිහිපයක් වැහුණා, යුද්ධය කාලයේත් ආයතන කිහිපයක් වැහුණා. ඒ වාගේම, පසුගිය කාලයේ සිද්ධ වුණු ආර්ථික අර්බුදය නිසා විශේෂයෙන්ම කුඩා ඇඟලුම් කර්මාන්තශාලා ඇතුළු මේ රටේ කුඩා කර්මාන්තශාලා විශාල සංඛ්‍යාවක් වහන්නට සිද්ධ වුණා. නමුත් අපි සතුටු වෙනවා, අපි බලයට පත් වුණාට පස්සේ එවැනි කිසි දෙයක් සිද්ධ වුණේ නැති එකට. අනාගතයේදීත් එවැනි දේවල් සිදු නොවෙන්න කටයුතු කරන්න අපට වගකීමක් තිබෙනවා. ඒ සඳහා ප්‍රගතිශීලී, ඉදිරිගාමී ප්‍රතිසංස්කරණ සඳහා වන මෙවැනි සංශෝධන මේ රටට ගෙන ආ යුතුයි. අපි දකිනවා, ඒකට අදාළව මෙම පනත් කෙටුම්පත ඉතාම වැදගත් කියලා. එම නිසා මම සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, මේකට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට තත්පර 30ක කාලයක් ලබා දෙන්නම්.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இங்கு பேசிய கௌரவ பிரதி அமைச்சர் அருண் ஹேமச்சந்திரா அவர்கள் பொய் ஒன்றைப் பகிரங்கமாகச் சொன்னார். நான் எனது உரையில், மலையக தமிழ் மக்கள்மீது நடத்தப்படுகின்ற தாக்குதல்கள் சம்பந்தமாகச் சொல்லிவிட்டு, அது தொடர்பில் Kahawatte Plantationsஇன் CEOஆன Binesh Pananwala அவர்களுடன் தொலைபேசியில் தொடர்புகொண்டு பேசியதாகவும், தாக்குதலைக் கண்டித்ததாகவும், இவ்வாறு செய்ய வேண்டாமெனச் சொன்னதாகவும் கூறினேனே தவிர, அரசாங்கத்தைச் சம்பந்தப்படுத்தவேயில்லை. அரசாங்கத்தின் அனுசரணையில் நடந்ததாகச் சொன்னதாகச் சொன்னார். தொப்பியைப் போட்டுக்கொள்கிறார். அரசாங்கத்தின் அனுசரணையில் நடந்தால் - அப்படிச் சொல்கிறார் என்றால் பரவாயில்லை! அரசாங்கத்திடம் சொல்லுங்கள், அவ்வாறு செய்ய வேண்டாம் என்று. நான் அவ்வாறு சொல்லவில்லை. அவர்தான் அவ்வாறு சொல்கிறார்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය කාරණය සම්බන්ධයෙන් විවාදයකට නොගිහින් ඉඳිමු, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
බොරු නේ කියන්නේ. මෙතුමා පිස්සු දේවල් කථා කරන්නේ. පිස්සු දේවල් කථා කරන්න එපා. අපි නිකම් කට තිබෙන පළියට කථා කරන මිනිස්සු නොවෙයි. මම CEOට කථා කරලා ඒක කරන්න එපා කිව්වා. මම ආණ්ඩුවට චෝදනා එල්ල කළේ නැහැ. හැබැයි, තොප්පිය හරි නම් දාගන්න ආණ්ඩුවට පුළුවන්. මෙතැනදී ආණ්ඩුව කථා කරලා කියන්න ඕනෑ, ඒක කරන්න එපා කියලා. මෙතැනට ඇවිල්ලා පිස්සු කථා කරන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.57]

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද සුවිශේෂී නව නීතියක් නිර්මාණය වන දවසක්. මම හිතනවා මේක වසර ගණනාවක් පැරණි, යල් පැනගිය වස්තුභංගත්ව නීතිය සම්පූර්ණ සංශෝධනයට ලක්වෙලා, නීතියක් බවට පරිවර්තනය කරන වෙලාවක් කියලා. මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා, මේ නීති සංශෝධනය වෙනුවෙන් මෑත ඉතිහාසයේදී හිටපු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමාට, ඒ වාගේම හිටපු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මැතිතුමාට. එතුමන්ලා මෑත කාලයේ මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය තුළ, අධිකරණ අමාත්‍යාංශය තුළ නීති සම්පාදන ක්‍රියාවලියේ නවමු වෙනසක් ඇති කරපු ඇමතිවරු. ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමාටත් ඒ ගෞරවය හිමි වෙන්න ඕනෑ, මේ වෙනසට මුල පිරීම පිළිබඳව.

අද ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "අපි ආපු නිසා තමයි මේක ගෙනාවේ" කියලා. නැහැ, මේ සම්බන්ධව 2023 ඉඳලා කටයුතු කරනවා. දැන් ඔබේ වත්මන් ආණ්ඩුව හරහා මේක නීතියක් බවට පත් වෙනවා. මේ සංශෝධන ක්‍රියාවලියට අවුරුදු තුන, හතරක් වෙනවා. ඔබතුමන්ලා credit එක දමාගත්තාට කමක් නැහැ. නමුත් මේ වෙනුවෙන් කැප වුණු පැරණි ඇමතිවරු ගැනත් සිහිපත් කරන එක වැදගත් කියලා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්වාධීන වස්තුභංගත්ව නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීම මෙම කෙටුම්පතේ ව්‍යුහය තුළ තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික බංකොලොත්භාවය කෙරෙහි නව ප්‍රවේශයක්, පරිපාලනය හරහා ආයතනික වශයෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ව්‍යාපාර සඳහා විශේෂ ක්‍රම ඇති කිරීම වාගේ කරුණු රාශියක් එක්ක නිර්මාණය වුණු නීතියක් මේ නීති සම්පාදන ක්‍රියාවලියේදී ඇති විය යුතුයි. එවැනි ක්‍රියාවලියක් ගැන තමයි අද අපි මේ පාර්ලිමේන්තුව තුළ විවාදයට ලක් කරන්නේ.

අධිකරණ ඇමතිතුමාගේ අවධානයට මා ලක් කරනවා, අපේ රටේ අපරාධ නීතිය තුළත් මෙවැනි සුවිශේෂී නීති රාශියක් නවමු විධියට සංශෝධනය විය යුතු තැනක තිබෙන බව. නමුත් එක් එක් රජයන් තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා වෙනුවෙන්, ආණ්ඩුව රැක ගැනීමේ අවශ්‍යතාව වෙනුවෙන් නව නීති සම්පාදනය කළත්, සම්පාදනය විය යුතු නීති රාශියක් සිවිල් නීතිය තුළත් අපරාධ නීතිය තුළත් තිබෙනවා. ඒවා සිදුකිරීමට අධිකරණ අමාත්‍යවරුන්ට නැත්නම් නීති සම්පාදකයන්ට අවශ්‍ය අවස්ථාව සලසා දීලා නැහැ කියන කාරණය මම මේ වෙලාවේ මතක් කරනවා. මට අද දිනයේ පොඩි වෙලාවක් ලැබී තිබෙන නිසා මම ඒ ගැන මීට වැඩිය කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ මිනිස්සු වත්මන් ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණු දේවල් තිබෙනවා. අපි මේ රටේ ඉතිහාසය පුරාම දැක්කා, අඩු වැඩි වශයෙන් හැම ආණ්ඩුවකම නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තිබුණු බව. ඒ වාගේම මේ රටේ රාජ්‍ය තන්ත්‍රය තුළ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යම් යම් ගැටලු සහගත තත්ත්ව තිබුණා, දේශපාලන මැදිහත්වීම් එක්ක.

මම එක කාරණාවක් කියන්නම්. මේ දිනවල අපට විශාල වශයෙන් එන මැසිවිල්ලක් තමයි, නැත්නම් රාජ්‍ය සේවයේ නිලධාරින්ගෙන් අපට එන ඉල්ලීමක් තමයි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා සිදුකරන රාජ්‍ය සේවයේ නියුතු නියමිත සුදුසුකම්ලත් රාජ්‍ය නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම පිළිබඳව. වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ බලය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට තිබෙනවා. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා සියලු අමාත්‍යාංශ සඳහා මේක ක්‍රියාත්මක වෙනවා.

අප්‍රේල් 6වැනිදා වෙනකොට සිදුකරන්න තිබුණු බොහෝ ස්ථානමාරු මේ වෙනකොට එක එක තැන්වල නතර වෙලා තිබෙනවා. මම එක උදාහරණයක් කියන්නම්. එම අදාළ ලිපිය මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

අනෙක් අමාත්‍යාංශවලට උපදෙස් දෙන, අනෙක් අමාත්‍යාංශවලට මේක ක්‍රියාත්මක කරන්න කියලා නිර්දේශ කරන, අවශ්‍ය නීතිය මොකක්ද කියලා අනෙක් අමාත්‍යාංශවලට ඉදිරිපත් කරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්, ආලෝක බණ්ඩාර මැතිතුමාගේ අවධානයට මම මේ කරුණ ලක් කරනවා. මම එතුමා සමඟ පෞද්ගලිකවත් මේ සිද්ධිය පිළිබඳව කථා කළා.

එම්. කොඩිප්පිලිආරච්චි, අතිරේක ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන; එච්.ජී.ටී. සුමුදු ප්‍රියදර්ශනී, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්; එන්. වසන්ත ආරියරත්න, අතිරේක ලේකම් (පාලන) යන නිලධාරින් මේ වනවිට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සේවය කරනවා. ස්ථාන මාරුවීම් පිළිබඳව එතුමන්ලාට ආපු නියෝගයක් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධව සේවකයන් විසින් අපට දැනුම් දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට ඉස්සරත් සමහර රාජ්‍ය සේවයේ නිලධාරින් ස්ථාන මාරු කරන්න ගියාම තමන්ගේ ප්‍රධානියාට ලිංගික අල්ලස් දෙන්න සිද්ධ වුණා. නැත්නම් වෙන වෙන ආකාරයට තමයි ඒක කරගන්න සිද්ධ වෙලා තිබුණේ. මේ නව රජයෙනුත් ඒක වෙනස් වෙලා නැහැ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයම මේ සම්බන්ධ නීති කඩනවා නම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට පුළුවන්ද කොන්දක් තියාගෙන අනෙක් අමාත්‍යාංශවලට කියන්න, මේක කරන්න කියලා. මම දැන් මේ ලැයිස්තුව බැලුවාම DMT එකේ නිලධාරිනියක් ඉන්නවා, එම්.කේ.එන්. ලක්ෂ්මි කියලා. එතුමිය නිදහස් කරලා මාසයක් වෙනවා. එතුමිය අදාළ තැන රැකියාව භාර ගන්නේ නැහැ. අලුතින් එතැනට එන කෙනා ඇවිල්ලා තිබෙනවා. මේ circle එක නැවතිලා තිබෙනවා. අර නිලධාරිනිය එතැන නිකම් ඉන්නවා. වැටුප් ගෙවන්නේ කවුද? මේක ක්‍රියාත්මක කරගන්න රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයාට, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාට කොන්දක් නැත්නම් මේ රටේ රාජ්‍ය සේවය තුළ,- මම දැක්කා, අද දාලා තිබෙනවා පොලිස් නිලධාරියෙක් තමන්ගේ uniforms ටික භාර දීලා පොලීසියෙන් ගෙදර යනවා. ඇයි?

මේ නිලධාරින්ට වෘත්තීය ගරුත්වයක් නැහැ. ඒ වෘත්තියට සාධාරණයක් නැහැ. අද නිකම් බල්ලෝ බළල්ලු ගාණට රජයේ සේවකයින් දාලා තිබෙන්නේ. ඒ නිසා බල නහර කපාගෙන

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

නොවෙයි වෙන ඒවාත් කපාගෙන මිනිස්සු මැරෙයි. මම කියන්නේ මැරුණා නම් - මැරුවාද, මැරුණාද කියන එක හෙට අනිද්දා වෙනකොට බලාගන්න පුළුවන් වෙයි. මේ ආකාරයට වසර 7, 8ක් වැඩ කරපු රාජ්‍ය සේවයේ සිටින රාජ්‍ය නිලධාරින්ගේ ඒ අයිතියට සාධාරණයක් ඉටු කරන්න රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයාට කොන්දක් නැත්නම්, අමාත්‍යාංශ ලේකම්වරයාට කොන්දක් නැත්නම්, මේ මිනිස්සු කාටද ගිහින් කියන්නේ? ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මේ නම් කියැවුණු සියලු නිලධාරින් අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට ගෙන්වන්න කියලා. මම ඒ වෙනුවෙන් මන්ත්‍රීවරයෙක් විධියට පෞද්ගලිකව ඉල්ලීමක් කරනවා. රටට වැරදි පූර්වාදර්ශයක් සපයන එක පසුගිය ආණ්ඩු වාගේම ජාතික ජන බලවේගය ආණ්ඩුවෙත් සිද්ධ වෙනවා. ඒක නවත්වන්න අවශ්‍ය කටයුතු කරන්න අපි සූදානම්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.04]

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින විවාදයට ගෙන තිබෙන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පතට අදාළව කරුණු දැක්වීමට ලැබීම ගැන මුලින්ම සතුටු වෙනවා. ඒ සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මුලින්ම අපේ ගරු අධිකරණ අමාත්‍යතුමා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන අවස්ථාවෙන් අනතුරුව විපක්ෂය මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ ස්ථාවරය දක්වන්න ඕනෑ. මුල් අවස්ථාවේදීම විපක්ෂය විසින් -විපක්ෂයේ ප්‍රධාන කථිකයෙකු ලෙස මෙම විවාදයට එකතු වෙච්ච මන්ත්‍රීවරයා විසින් - තත්පර කිහිපයක් මේ සම්බන්ධයෙන් වචන කිහිපයක් කිව්වා. නමුත්, විරෝධතාවක් ප්‍රකාශ වුණේ නැහැ. ඉන් අනතුරුව දිගින් දිගටම විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ අනෙකුත් මන්ත්‍රීවරුනුත් මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තමන්ගේ විරෝධතාවක් නැති බව ප්‍රකාශ කළා. ඒ අනුව මෙම පනත් කෙටුම්පත අපේ රටට අවශ්‍යව තිබෙන ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් බව පැහැදිලි වෙනවා, පිළිගැනීමක් සිද්ධ වෙනවා.

ඒ සම්බන්ධයෙන් කථා කිරීමට කලින් විපක්ෂ නායකතුමා කළ ප්‍රකාශයක් සම්බන්ධයෙනුත් පොඩි අදහසක් ඉදිරිපත් කරන්නට ඕනෑ කියලා මා හිතුවා. විපක්ෂ නායකතුමා කථා කරද්දී මට ඇහුණා, වචන කිහිපයක්. පැලවත්තකරණය සහ රාජ්‍ය නිලධාරින් සම්බන්ධයෙන් කෙරෙන මැදිහත් වීම් ගැන එතුමා සාකච්ඡා කළා. මා එතකොට කල්පනා කළා, මේ එම විපක්ෂ නායකතුමාම ද කියලා. ඒ මහත්මයාම ද කියලා බලන්න ඕනෑ නිසා මම පොඩ්ඩක් YouTube එකේ search කරලා බැලුවා, එහෙම කෙනෙක් සිටියාද කියලා.

YouTube එකේ තිබෙනවා හොඳ වීඩියෝ එකක්. එහි title එක තිබෙන්නේ, "Leaked video of Sajith Premadasa shows how Yahapalanaya addressing unemployment" යනුවෙන්. කොහොමද, ඒ කාලයේ job බෙදුවේ කියලා එහි තිබෙනවා. ඒ, සජිත් ප්‍රේමදාසම ද මේ ඉන්නේ කියලා මම අහනවා. දැන් AI තිබෙන නිසා පොඩි සැකයක් තිබෙනවා එතුමාම ද, වෙනත් කෙනෙක් ද කියලා. පෝලිමට එන්න කියලා, උස මැනලා, රැකියා බෙදපු ඒ මහත්මයාම ඇවිත් පැලවත්තකරණය ගැන හෝ රාජ්‍ය නිලධාරින්ට කෙරෙන මැදිහත් වීම් ගැන ඒ සිදු කළ කථා බහ හරිම පුදුමයි. ඉන් අනතුරුව එතුමා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක කරන්න ඕනෑ පැහැදිලි කිරීමක්, ඉල්ලීමක් පාර්ලිමේන්තුවේදී සිද්ධ කළා. නිවාසයක් අටවාගත් තැනැත්තෙකුගේ නිවාසය කඩා බිඳ දැමීමක් යන මාතෘකාව යටතේ පොඩි ඉල්ලීමක් සහ අභියාචනයක්, දුක්ගැනවිල්ලක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එතුමා ඔය කඩා බිඳ දැමුවාය කියන නිවස පිහිටි ප්‍රදේශයට අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට, නැත්නම් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ගිහින් වාඩිවෙලා ඔය කාරණය ඉදිරිපත් කළා නම් වඩා වටිනවා කියලා මා හිතනවා.

ඒ වාගේම නිවාස සම්බන්ධව ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. අපේ රටේ නිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් තවත් මන්ත්‍රීවරයෙක් කරුණු මතු කළා. නිවාස ඉදිකරන එක පෙනෙන්නේ නැහැ කියලා කිව්වා. සමහරවිට පෙනෙන්නේ නැති වෙන්න පුළුවන්. මේ වෙද්දී අප විසින් ඉදිකර තිබෙන නිවාස පාර අයිනේ පෙනෙන්න නැතිවෙන්න පුළුවන්. පාරේ නම් බෝඩ් නැහැ තමයි. එක කැල්ලක්, නමක්, ගමක් ඉස්සරහට දාලා, එහි කෙළවරට ගම කියලා දාලා, අලුතින් සමහර වචන දාලා හදපු ගම් නම් අපි හදලා නැහැ. කැලෑ එළි කරලා, අලි යන මංතීරු විනාශ කරලා, ඉඩම් අත්පත් කරගෙන, ඒ ඉඩම්වලට තිබෙන නීති කිසිවක් නොසලකා හරිමින් හදපු ගම්මාන නම් අපට නැහැ. ඒ වෙනුවට ගම්මාන ඇතුළේ සිටින ඉතාම දුප්පත්, නිවසක අත්‍යවශ්‍යතාවෙන් පෙළෙන පවුලක් තෝරාගෙන ගමක ගෙයක් හදලා දීලා ඇති. ගම්මාන හදනවා වෙනුවට, අපි ගම්වල ඕනෑ තරම් ගෙවල් හදලා දීලා තිබෙනවා. මේ අවුරුද්දේ ගෙවල් 50,000ක් හදන්න අපි කල්පනා කරනවා. ඔය කථා කරපු මැතිතුමා 2015-2019 කාලය තුළ නිවාස ඇමති විධියට සිටියදී ඒ කාලයේ ගෙවල් 64,000ක් හදන්න තීරණය කරලා තිබුණා. එයින් හදලා අවසන් කර තිබෙන්නේ ගෙවල් 15,000යි. ඒ ගෙවල් 15,000 තමයි ඔය පාරවල්වල යද්දී පෙනෙන්න තිබෙන්නේ. බෝඩ් ගහලා, නම් ගහලා, කැලෑ ඇතුළේ, සමහර විට අලි මංතීරුවල, නැත්නම් රජයේ ඉඩම්වල හදපු ගෙවල් තිබෙන්නේ. ඒ නිවාස 15,000ට අමතරව භාගෙට හදපු තවත් නිවාස 50,000ක පමණ ප්‍රමාණයක් තිබෙනවා. ඒවායේ විවිධ ප්‍රමාණයේ ප්‍රශ්න තිබෙනවා. සමහර ගෙවල්වල තෝරා ගැනීමේ ප්‍රශ්න තිබෙනවා. සමහර නිවාසවලට අදාළ ඉඩම්වල ප්‍රශ්න තිබෙනවා.

උදාහරණයක් විධියට ගත්තොත්, පෙර කාලයකදී හදපු ඉපලෝගම ප්‍රදේශයේ රණවිරු ගම්මානයක් තිබෙනවා. ඒ ගම්මානයේ නිවාස සම්බන්ධයෙන්, ඉඩම් සම්බන්ධයෙන් අවුරුදු 15ක්, 20ක් තිස්සේ අදටත් තවම ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්න තවමත් ඒ විධියටම ඉතිරි වෙලා තිබෙනවා. අද වෙනකොට මිනිස්සු ඒ ප්‍රශ්නත් එක්ක බැඳිලා ඉන්නවා. ඒ නිසා අපේ ආණ්ඩුවෙන් තීරණය කර තිබෙනවා, භාගෙට හදලා තිබෙන ප්‍රශ්න සහිත නිවාසවලට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා සොයා බලන්න අලුතින් කමිටුවක් පත් කරන්න. ඒවා විසඳන්නේ කොහොමද කියලා සොයා බැලීම සඳහා මේ වන විට කමිටු පත් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙම තමයි මේගොල්ලන් මේ වාගේ ප්‍රශ්න ඉතිරි කරලා ගිහින් තිබෙන්නේ.

ඒ වාගේම තමයි, ගම්මාන වාගේ ගොඩනඟපු ඇතැම් නිවාස සංකීර්ණවල තිබෙන සමහර නිවාසවල ජීවත් වෙන්නේ වවුල්ලු. මොකද, ඒ ගෙවල් හැදුවේ තමන්ගේ පාක්ෂිකයින්ට, නැත්නම් තමන්ගේ සංවිධායකයන්ට අවශ්‍ය වුණොත් පාවිච්චි කරන්නයි. නමුත්, පසුගිය කාලයේ අපි ගෙවල් හදලා තිබෙනවා. මේ අවුරුද්දේ අපි ගෙවල් 50,000කට වැඩි ප්‍රමාණයක් හදනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් වෙච්ච හානියත් සැලකිල්ලට අරගෙන,

[ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා]

ඒ විනාශයත් කල්පනා කරලා තමයි අපි ඒ නිවාස හදන්නේ. මේ අවුරුද්ද අවසන් වෙනකොට අපි හදලා අවසන් කරන ගෙවල් 50,000 තුළ හැම ගෙදරකම මනුස්සයෙක් ජීවත් වෙනවා; පවුලක් ජීවත් වෙනවා; දරුවෙක් ජීවත් වෙනවා. එහෙම තමයි අපි වැඩ කරලා තිබෙන්නේ. ඒ අතරේදී තමයි සමහර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී කියන්න ඕනෑ කාරණා කිසිදු පදනමක් නැතිව මෙම පාර්ලිමේන්තුවේ කියන්නේ. ඒවාට තමයි අපට උත්තර දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් වෙනකොට, ස්ථාවරය වෙන්න ඕනෑ එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මූලික සාකච්ඡාව සිද්ධ වෙන එකයි. එහෙම නැත්නම් මේ පනත් කෙටුම්පතටත් අමතරව එන්න ඕනෑ වෙනත් සංශෝධන තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් තමයි විපක්ෂය පැත්තෙන් පැහැදිලි කිරීම වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ගෙනාපු පනත් කෙටුම්පතේ මූලික වැරදි මොනවා හරි තිබෙනවා නම්, නීතියට පටහැණි යම් දෙයක් තිබෙනවා නම්, අත්තනෝමතිකභාවයක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන්න ඕනෑ.

අපි කාලාන්තරයක් තිස්සේ මේ පාර්ලිමේන්තුව තුළ නොයෙකුත් විවාද දකිනවා. නමුත්, එවැනි ආකාරයේ පැහැදිලි කිරීම් මේ විපක්ෂය පැත්තෙන් එන්නේ නැහැ. ඒ වෙනුවට ඒ සතිය, දෙක සමාජය යම් ප්‍රමාණයකට ව්‍යාකූල කරන්න පුළුවන්, නිශ්චිත නැති යම් අවිනිශ්චිත තත්ත්වයන් වැරදි විධියට අර්ථකථනය කරමින් ඉතාම හොඳින් ප්‍රයෝජනයට ගන්නවා, යම් ප්‍රමාණයකට ආණ්ඩුවට විරුද්ධව මතයක් ගොඩ නඟා ගන්න. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඒ සතිය දෙක ගියාට පස්සේ එම කාරණය, එම සාකච්ඡාව එතැනින් අවසන්.

දැන් ඇත්තටම විපක්ෂය බංකොලොත් වෙලා තිබෙන්නේ. ව්‍යාපාර බංකොලොත් වුණාට අමතරව මේ විපක්ෂයත් බංකොලොත් වෙලා තිබෙනවා. මාතෘකා විධියට හිඟ වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ මොහොතේ කුමන හෝ මාතෘකාවක් අරගෙන විපක්ෂය විසින් ආණ්ඩුවට මඩ ගහන්න පුළුවන් ද; එහෙම නැත්නම් සමාජය ඉදිරියේ ආණ්ඩුවට විරුද්ධව යම් මතයක් ගොඩ නඟන්න පුළුවන් ද කියලා කල්පනා කරමින් ඉන්නවා. නමුත්, ඇත්තටම වෙලා තිබෙන්නේ ඔය සතිය ඉවර වුණාට පස්සේ ඒ කථා කරපු මාතෘකාවත් ඉවර වෙන එකයි. හැබැයි, ඉතිරි වෙන සමහර කාරණා තිබෙනවා.

ඊයේත්, අද දිනයේත් රාජ්‍ය සේවකයකුගේ මරණයක් සම්බන්ධයෙන් ඉතාමත්ම බැරෑරුම් විධියට මේ සභාව ඇතුළේ සාකච්ඡා වුණා. ඒ හැම සාකච්ඡාවකම ආණ්ඩුවට ප්‍රබල ප්‍රහාරයක් එල්ල වේ යැයි හිතෙන යම් කොටසක් තිබෙනවා නම්, ඒවා සමහර මාධ්‍ය ආයතනවල යනවා. ඒ බොහෝ වීඩියෝ කොටස්, නැත්නම් බොහෝ ප්‍රකාශයන් ඒ අදාළ පාර්ශ්වයන් දකිනවා. ඒ මියගිය තැනැත්තාගේ ළඟම හිතවතුන් ඒ දේවල් දකිනවා. සහෝදර, සහෝදරියන් දකිනවා; දරුවන් දකිනවා. අපි ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන හැම වචනයක්ම ඔවුන්ගේ හදවතට දැනෙනවා. ඒ දේවල් ඔවුන්ට වේදනාවක් ගෙන දෙනවා. ඔවුන් පීඩාවකට පත් වෙනවා. ඒ සියල්ල මේ අය නොසලකා හරිමින්, ඉතාම සංවේදී කාරණා පවා නොසලකා හරිමින් මේ මොහොතේ මේ Debate එක දුවවා ගැනීම සඳහා, - දුවවන්න එපැ යි මේක - දුවවා ගැනීම සඳහා විපක්ෂයේ යම් participation එකක් තිබෙන්න ඕනෑ නිසා ඕනෑම අසංවේදී කථාවක් වුණත් මෙතැනට ගෙනැල්ලා දානවා.

දැන් මම මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නැවත හැරී බැලුවොත්, අපේ රටේ පසුගිය කාලයේ පැවති ආර්ථික අර්බුදයන් හේතුවෙන් සහ ඇතැම් වෙලාවට ආණ්ඩු විසින් ගන්නා ලද සමහර තීරණ හේතුවෙන්, කළමනාකරණයේ ප්‍රශ්න හේතුවෙන් විවිධාකාරයේ ආර්ථික පීඩාවන්ට පත්වෙලා සමාගම්, ආයතන, ව්‍යාපාර කඩා වැටිලා තිබෙනවා. පෞද්ගලික ව්‍යාපාරයක් කියලා කියන්නේ රටට සම්පතක්. අපි එන්න කලින් කිව්වා නේ, අපි බලයට ආවොත් පෞද්ගලික ව්‍යාපාරයක්වත් කර ගන්න ඉඩක් හම්බ වෙන්නේ නැතිවෙයි කියලා. එහෙම තමයි ජාතික ජන බලවේග ආණ්ඩුව සම්බන්ධයෙන් මේ අය ප්‍රකාශ කළේ. හැබැයි, බුන්වත්භාවය සම්බන්ධයෙන් තවමත් තිබෙන්නේ 1853දී ගෙනා පනතක්. මේ ආර්ථිකය ගොඩනඟනවාය කියපු, අපි ආවොත් ආර්ථිකය කඩා වැටෙයි, ව්‍යාපාරිකයින්ට අවස්ථාව අහිමි වෙයි කියපු විපක්ෂයට කියන්න තිබෙන්නේ, 1853 ඉඳලා බුන්වත්භාවය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන පනතත්, ඊට අමතරව 2007 අංක 07 දරන සමාගම් පනතත් ඇතුළුව පනත් කිහිපයක් සංශෝධනය වන බවයි. ඒ කියන්නේ, බුන්වත්භාවය සම්බන්ධයෙන් සහ බුන්වත්භාවයට පත් වුණාට පස්සේ පුනරුත්ථාපනය - rehabilitate - කරලා, එම ආයතනය නැවත නඟාසිටුවීම සම්බන්ධයෙන් අලුත් නීතියක් හැදෙනවා. ඒ අනුව යම් ආයතනයක්, යම් සමාගමක් කඩා වැටුණොත්, ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නොත්, එය ඇවර කරලා, ණය හිමියන්ගේ මුදල් ගෙවලා අවසන් කරනවා වෙනුවට, ඒ option එක අන්තිමට තියලා, ඊට කලින් options දෙකක් හදලා තිබෙනවා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න.

ඒ අනුව අවශ්‍ය නම් පුළුවන්, එම ආයතනයට මැදිහත්කරුවන් පත් කර ගන්න. ඒ වාගේම අධිකරණ ක්‍රියාවලිය ඔස්සේ ණය ප්‍රතිව්‍යුහගත කරලා, නැවතත් තම ව්‍යාපාර කටයුතු කරන්න පුළුවන්. අවශ්‍ය නම් ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් කරලා, අලුත් proposal එකක් හදලා ව්‍යාපාරය නැවත නඟාසිටුවා ගැනීම සඳහාත් අවස්ථාවක් හම්බ වනවා. පරිපාලනය සඳහාත්, ඒ වාගේම ප්‍රතිව්‍යුහගත කර ගැනීම සඳහාත් ආයතනයට හැකියාවක් තිබෙනවා, සමාගමට හැකියාවක් තිබෙනවා, අධිකරණ මාර්ගයෙන් අවස්ථාවක් අරගෙන අවශ්‍ය පරිපාලන නිලධාරීන් පත්කර ගන්න. ඒ වාගේම ඒ සඳහා මේ නීතිය හරහා, අධිකරණය හරහා ආරක්ෂාවක් ලැබෙනවා. ඉතාම හොඳ proposal එකක්, නැත්නම් නැවතත් ඒ ව්‍යාපාරය පවත්වාගෙන යෑමට හැකි විධියේ යෝජනාවලියක් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබුණොත්, ඔවුන්ට නැවත ව්‍යාපාර කටයුතු කරගෙන යන්න පුළුවන්. ඒ සඳහා ලෝකයේ ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. ඉන්දියාවේ තිබෙනවා, ඇමෙරිකාවේ තිබෙනවා, ඒ වාගේම සිංගප්පූරුව වාගේ රටවලත් ආර්ථිකයේ ඉතාම වැදගත් කොටසක් වන පෞද්ගලික ව්‍යාපාර, ඒ වාගේම සමාගම් පවත්වාගෙන යෑම සඳහා මේ වාගේ නීති හැදිලා තිබෙනවා.

ඒ නිසා අලුතෙන් ක්‍රියාත්මක වන මෙම නීතියත් එක්ක අපේ රටේ ව්‍යාපාරිකයින්ට තමන්ගේ ව්‍යාපාර සම්බන්ධයෙන් ඉතා හොඳ ආරක්ෂාවක් හම්බ වනවා. ඒ නිසා ඒ සඳහා සහයෝගය දක්වන්න කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වනවා. අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජීවන් තොණ්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.14]

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**

(மாண்புமிகு ஜீவன் தொண்டமான்)

(The Hon. Jeevan Thondaman)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, என்னுடைய உரையை ஆரம்பிப்பதற்கு முன்னர் சமீபத்தில் நடந்த தமிழ்நாட்டுத் தேர்தலைப் பற்றி குறிப்பிட

விரும்புகின்றேன். தமிழ்நாட்டின் முதல்வராகப் பதவியேற்க இருக்கின்ற தமிழக வெற்றிக் கழகத்தின் தலைவராகிய கௌரவ விஜய் அவர்களுக்கு எனது மனமார்ந்த வாழ்த்துக்களையும் பாராட்டுகளையும் இந்த இடத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

வழமையாகவே மக்கள் அரசியலையும் சினிமாவையும் வேறு வேறாகப் பார்த்ததில்லை. இவ்வளவு காலமும் அவரை ஒரு நடிகராகப் பார்த்த மக்கள் இன்றைக்கு அவரை ஒரு தலைவராகத் தேர்ந்தெடுத்து இருக்கிறார்கள். இரசிகர்கள் ஒரு மனிதனை உயர்த்தலாம். ஆனால், மக்களின் வாக்கு மட்டும்தான் அந்த உயர்வை ஒரு தலைமைத்துவமாக மாற்ற முடியும். அப்படி இருக்கும்பொழுது, இன்றைக்கு ஒரு வரலாறு எழுதப்பட்டிருக்கின்றது. இதிலே நான் ஒரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். அதாவது, அவரின் தேர்தல் பிரசாரத்தின்பொழுது இலங்கை சார்ந்த பல்வேறு விஷயங்களைப் பேசியிருந்தார். குறிப்பாக, கச்சதீவு சம்பந்தமாகக் குறப்பிட்டிருந்தார். நான் அமைச்சராக இருந்த காலப்பகுதியில் அதிக தடவை தமிழ்நாட்டுக்கு விஜயம் மேற்கொண்டிருந்தேன். அப்போது நான் ஒரு விடயத்தை அவதானிதேன். அது என்னவென்றால், முக்கியமான பிரச்சினை கச்சதீவு கிடையாது. அங்கு முகாமில் வாழும் எங்களுடய தமிழ் சொந்தங்கள் இருக்கிறார்கள். அவர்களுக்கும் பிரச்சினை இருக்கின்றது. அது மட்டுமல்லாமல், இன்றைக்கு இருக்கின்ற சூழலைப் பொறுத்தவரைக்கும் மீனவர் பிரச்சினை இன்னும் தொடர்ந்து கொண்டிருக்கின்றது. என்றாலும், தமிழ்நாட்டு அரசியலைப் பொறுத்தவரைக்கும் நாங்கள் ஒரு விழிப்புணர்வை கட்டாயம் ஏற்படுத்தியாக வேண்டும். மீனவர் பிரச்சினையைப் பொறுத்தவரைக்கும், அது தமிழர்களுக்கும் இராணுவத்திற்கும் இடையிலோ அல்லது தமிழர்களுக்கும் சிங்களவர்களுக்கும் இடையிலோ நடைபெறுகின்ற பிரச்சினை கிடையாது. அது தமிழ்நாட்டில் வாழுகின்ற தமிழர்களுக்கும் இலங்கையில் வாழுகின்ற தமிழ் மீனவர்களுக்குமிடையே இருக்கின்ற ஒரு முரண்பாடு. ஆனால், இதுவரைக்கும் அதற்கு ஒரு தீர்வு கண்டது கிடையாது. அவர் இலங்கைக்கு கட்டாயம் வருவார் என்று நாங்கள் எதிர்பார்க்கின்றோம். அதன்மூலமாக புதிய ஓர் உறவை ஆரம்பித்து, அவரின் புதிய ஆட்சியில் இதற்கான தீர்வுகளைப் பெற்றுக் கொள்ளலாம் என்று நான் நம்புகின்றேன்.

மலையக மக்களாகிய நாங்கள் இந்த நாட்டில் 200 வருஷமாக வாழ்கின்றோம். பல்வேறு பிரச்சினைகளுக்கு முகங்கொடுத்து இருக்கின்றோம். ஆனால், எங்களையும் இலங்கைத் தமிழர்களாகத்தான் நிறையப்பேர் பார்க்கின்றார்கள். அதில் தவறு கிடையாது. ஆனால், எங்களுக்கென்று தனிப்பட்ட ஓர் அடையாளம் இருக்கின்றது; தனிப்பட்ட ஒரு வரலாறு இருக்கின்றது. அப்படி இருக்கும்போது, மலையக மக்களுக்கான அங்கீகாரத்தையும் தமிழக அரசாங்கம் வழங்குமென்று நான் எதிர்பார்க்கின்றேன்.

இச்சந்தர்ப்பத்திலே சுவாரஸ்யமான ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். அதாவது, தமிழக தேர்தலின் பிற்பாடு இங்கு ஆளுங்கட்சியில் இருக்கின்ற பல்வேறு தரப்பினர்கள் சொன்னார்கள், இந்த வெற்றி கிட்டத்தட்ட அநுர குமார திஸாநாயக்கவின் ஆட்சி மாதிரி என்று. அதேபோன்று பல்வேறு pressureக்கு மத்தியில் தேர்தலுக்கு முகங்கொடுத்து பெண்கள், இளைஞர்களின் ஆதரவோடு புரட்சித்தனமாக ஆட்சியை அவர் பிடித்திருக்கிறார் என்று. நான் அதை ஏற்றுக் கொள்கின்றேன். மாற்றமொன்று வேண்டும் என்ற அந்த உணர்வுதான் - வெறிதான் - அங்கேயும் இருந்தது. ஆனால், ஒரேயொரு சின்ன வித்தியாசம்! கௌரவ விஜய் அவர்களைப் பொறுத்தவரைக்கும், அவர் நடித்து முடித்துவிட்டு அரசியலுக்கு வந்தார். இவர்களைப் பொறுத்தவரைக்கும், அரசியலுக்கு வந்து நடிக்க ஆரம்பித்து விட்டார்கள். அதுதான் ஒரேயொரு வித்தியாசம்!

முன்னாள் அமைச்சர் கௌரவ மனோ கணேசன் அவர்கள் உரையாற்றிக் கொண்டிருக்கும்போது, கௌரவ பிரதி அமைச்சர் அருண் ஹேமச்சந்திரா அவர்கள் ஒரு விஷயத்தைக் குறிப்பிட்டார். அதாவது, "உங்களுக்குப் பேசுவதற்கு எந்தவிதமான அருகதையும் இல்லை. நீங்கள் மக்களைத் தூண்டிவிடப் பார்க்கிறீர்கள்" என்று. நாங்கள் மக்களைத் தூண்டிவிடப் பார்க்கவில்லை. ஆனால், நான் அவரிடம் ஒரேயொரு விடயத்தைச் சொல்ல விரும்புகிறேன். கௌரவ மனோ கணேசன் அவர்கள் அமைச்சராக இருந்த காலத்திலும், மறைந்த தலைவரான முன்னாள் அமைச்சர் ஆறுமுகன் தொண்டமான் அவர்கள் இருந்த காலத்திலும் அவர்கள் செய்த பணியில் ஒரு சதவீதமாவது இந்த அரசாங்கம் செய்துவிட்டு வந்து தாராளமாகப் பேச முடியும். அதுவரைக்கும் பேசுவதற்கான அருகதை அவர்களுக்குத்தான் இல்லை. இன்றைக்கு யோசித்துப் பாருங்கள், இவர்கள் சம்பளப் பிரச்சினையைப் பற்றி சொல்கிறார்கள். சம்பள விடயம் தொடர்பில் தேர்தலுக்கு முன்பு இவர்களின் நடிப்பு வேறு! தேர்தலுக்குப் பிறகு நடக்கும் விடயம் வேறு! மாண்புமிகு ஜனாதிபதி அவர்கள்மீது மக்கள் வைத்திருக்கின்ற நம்பிக்கையை வைத்துத்தான் இன்று சில உறுப்பினர்கள் பிழைப்பு நடத்திக்கொண்டு இருக்கிறார்கள்; அது அவர்களுக்குப் புரிவதில்லை.

என்னுடைய கடமைகளை வெளிக்கொண்டு வரக்கூடிய ஒரு விடயம் பற்றி கூற வேண்டும். அதற்கு இந்திய வீட்டுத் திட்டத்தையே ஒரு சிறந்த உதாரணமாக எடுத்துக் கொள்ளுங்கள்! இந்தியத் துணை ஜனாதிபதி சீ.பி. ராதாகிருஷ்ணன் அவர்கள் இலங்கைக்கு வருகை தந்திருந்தபோது, நீங்கள் என்ன பண்ணியிருந்தீர்கள்? அவரை நேராக மலையகத்துக்குக் கூட்டிச் சென்று, லிடெஸ்டேல் தோட்ட வீட்டுத் திட்டத்தைக் காண்பித்தீர்கள். எனக்கு ஒரு கேள்வி இருக்கின்றது. நீங்கள் ஆட்சிக்கு வந்தபோது, "2025ஆம் ஆண்டில் 4,500 வீடுகள் கட்டுவோம்" என்று ஒரு பெரிய அறிவிப்பை வெளியிட்டீர்கள். அதற்குப் பின்னர் 2026ஆம் ஆண்டில் அதாவது, இந்தக் காலப்பகுதியில் 6,500 வீடுகள் கட்டப்படும் என்றும் அறிவித்தீர்கள். கடைசியில் இந்தியாவின் துணை ஜனாதிபதியை அழைத்துச் சென்ற இடம் எது? லிடெஸ்டேல் வீட்டுத்திட்டம். அது 2021இல் எங்களால் கட்டி முடிக்கப்பட்ட ஒரு வீட்டுத் திட்டம். அப்படியென்றால், இன்றைக்கு நீங்களே நிருபித்திருக்கிறீர்கள், நீங்கள் ஆட்சிக்கு வந்ததிலிருந்து மலையக மக்களுக்கு ஒரு வீட்டைக்கூட கட்டித் தரவில்லை என்று. இதுதான் யதார்த்தம்! அப்படி இருக்கும்போது, ஆளும் தரப்பினர் எங்களிடம் கேட்கிறார்கள், "அருகதை இருக்கிறதா?" என்று. நான் உங்களிடம் கேட்கிறேன், முதலில் உங்களுக்கு வெட்கம் இருக்கின்றதா? என்று. ஏனென்றால், ஒவ்வொரு விடயத்திலும் விமர்சித்து விமர்சித்தே நீங்கள் அரசியல் செய்கிறீர்களே தவிர உண்மையில் நீங்கள் செய்த வேலை என்ன?

அண்மையில் காவத்தைப் பிரதேசத்தின் நீலகாமம் தோட்டத்தில் ஒரு பிரச்சினை நடந்திருக்கின்றது. ஆனால், அந்தப் பிரச்சினையில் இளைஞர்கள்மீதும் தவறு இருக்கின்றது. ஒரு பிரச்சினை ஏற்பட்டால், அங்குள்ள அரசியல்வாதிகள் அனைவரும் அந்த இடத்துக்குச் சென்று பிரச்சினைக்கு முகங்கொடுக்க வேண்டும். அப்படித்தான் நாங்களும் செயற்பட்டோம்; அங்கு போய் பிரச்சினைக்கு

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

முகங்கொடுத்தோம். பீட்ரோ தோட்டப் பிரச்சினையின்போதும் தாய்மாரை அசிங்கப்படுத்தினார்கள்; நாங்கள் அங்கு போய் முகங்கொடுத்தோம். மாத்தளையில் அசிங்கப்படுத்தினார்கள்; அங்கும் போய் முகங்கொடுத்தோம். அதுவும் இதேபோன்ற ஒரு பிரச்சினைதான்! இன்று இரத்தினபுரி, காவத்தைப் பகுதியிலும் அதுதான் ஏற்பட்டது. அப்படியிருக்கும்போது, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் அநுராதபுரத்தில் சொன்ன விடயம், "மலையகத்தில் இருக்கின்ற அராஜக அரசியலுக்கு நான் முற்றுப்புள்ளி வைப்பேன்" என்பதாகும். ஆனால், மலையகத்தில் அவருடைய பிரதான வேட்பாளர் யார்? மஸ்கெலிய பகுதியைச் சேர்ந்த ஒரு கொடூரமான தோட்ட உரிமையாளர்! அதிலிருந்தே எங்களுக்குத் தெரிகிறது, ஜனாதிபதியாக இருக்கட்டும், அரசாங்கமாக இருக்கட்டும், மலையக மக்களுக்கு எவ்வளவு முக்கியத்துவம் கொடுக்கிறார்கள் என்பது. ஆனால், இந்த இடத்தில் நாங்கள் ஒரு விடயத்தை ஏற்றுக் கொள்கிறோம். எங்களைப் பொறுத்தவரையில், மலையக மக்கள் அதிக நம்பிக்கையுடன்தான் மாண்புமிகு ஜனாதிபதி அவர்களை ஆதரித்தார்கள். ஆனால், ஆளும் கட்சியில் இருக்கின்ற, மாண்புமிகு ஜனாதிபதி அவர்களின் பெயரைச் சொல்லி வாக்குச் சேகரித்த மலையக மக்களின் பிரதிநிதிகள் இன்றைக்கு மலையக மக்களுக்கு என்ன செய்திருக்கிறார்கள்? வெறும் அறிக்கைவிடுப்பதையும் கலந்துரையாடல் நடத்துவதையும் தவிர, வேறு எதையும் செய்யவில்லை. இதுதான் யதார்த்தம்!

இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒன்றரை வருடங்கள் கடந்திருக்கிறது. இன்னும் மூன்றரை வருடங்கள் இருக்கின்றது. அதுவும் போகட்டும்! ஆனால், மக்களிடம் நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புறேன். எங்களைப் பொறுத்தவரை, நாங்களும் மக்களுக்கு சேவை செய்ய வேண்டுமென்றுதான் நினைக்கிறோம். ஆரம்பத்தில் எங்களுடைய முழுமையான ஆதரவை மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்குக் கொடுத்தோம். வரவு செலவுத்திட்டத்திற்கு எதிர்த் தரப்பில் இருக்கின்ற தமிழ் முற்போக்குக் கூட்டணியாக இருக்கட்டும், இலங்கைத் தொழிலாளர் காங்கிரஸாக இருக்கட்டும், உங்களுக்கு ஆதரவாகவே வாக்களித்தோம். அப்படி நாங்கள் ஒவ்வொரு தடவையும் உங்களுக்கு உதவி செய்ய நினைக்கும்போது, மக்களுக்கு ஏதாவது ஒரு மாற்றம் வரும் என்ற நம்பிக்கையில் ஆதரவு வழங்கியிருந்தோம். அந்த நம்பிக்கையுடன் ஆதரவு வழங்கும்போது நீங்கள் என்ன செய்கிறீர்கள்? வேண்டுமென்றே நீங்கள் எங்களைச் சீண்டிக்கொண்டு இருக்கிறீர்கள். நான் இன்றைக்கு உங்களிடம் வெளிப்படையாகச் சொல்கிறேன். மலையக மக்கள் சம்பந்தமாக வெளியிடும் அறிக்கையையும் கலந்துரையாடலையும் ஒரு பக்கம் வையுங்கள்! அவர்களின் பிரச்சினை சம்பந்தமாக இந்தக் கேள்வியை இப்பாராளுமன்றில் நான் 10 தடவை கேட்டிருக்கிறேன். உங்களால் முடிந்தால், உங்களுக்குத் தைரியம் இருந்தால், யாராவது ஒருவர் இதற்கு பதில் சொல்லுங்கள்! அந்த மக்களுக்கு காணி உரிமை வழங்குவீர்களா, மாட்டீர்களா? வீட்டுத் திட்டத்தை அமுல்படுத்துவீர்களா, மாட்டீர்களா? தோட்டப்புறத்தில் வாழுகின்ற மக்களுக்கு பாதுகாப்பு வழங்குவீர்களா, இல்லையா?

நாங்கள் ஆட்சியில் இருக்கும்போது, அன்றைக்கு இருந்த IGP மூலமாக ஒரு விடயத்தைத் தெளிவாகக் கொண்டுவந்தோம். அதாவது, தோட்டப்புறங்களில் நடைபெறும் பிரச்சினைகளை போலிஸார் தலையிட்டு தீர்க்க வேண்டும் என்று. ஆனால், இன்றைக்கு சில தோட்டங்களுக்குள் பொலிஸாரே போய் அந்த மக்களை மிரட்டிக்கொண்டு இருக்கிறார்கள். நிலைமை இப்படி இருக்க, மக்களின் நியாயமான கோரிக்கைகளை நாங்கள் முன்வைக்கும்போது, நீங்கள் என்ன செய்கிறீர்கள்? "இது குடும்ப ஆட்சி, இவ்வளவு காலம் ஆட்சியில் இருந்துவிட்டார்கள்" என்று கூறுகின்றீர்கள். எங்கள்மீது ஊழல் குற்றச்சாட்டு இருந்தால், நடவடிக்கை எடுங்கள்! யார் வேண்டாம் என்று சொன்னது? ஆனால், உங்களால் எங்கள்மீது எப்படி விமர்சனம் வைக்க முடியும்? நாங்கள் இங்கு வந்து மக்களுக்காகக் கதைக்கும்போது இந்த இடத்தில் இருக்கும் அனைவரும் சிந்தித்தாக வேண்டும்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Give me one more minute, please.

இப்போதிருக்கின்ற சூழலில் ஒரு விடயத்தைக் கவனித்தாக வேண்டும். இந்த அரசாங்கத்தைப் பொறுத்தவரைக்கும் நீங்கள் மே தினத்தை நடத்தினீர்கள். அதிலும் நிறையப் பேர் நாங்கள் மே தினம் நடத்தவில்லை என்று கூறினீர்கள். நாங்கள் மே தினம் நடத்தாமல் இருந்தது இதுதான் முதற் தடவையல்ல. எங்களைப் பொறுத்தவரை எதை எப்போது செய்ய வேண்டும் என்று எமக்கு நன்றாகவே தெரியும். நான் ஒரேயொரு கோரிக்கையை முன்வைக்கிறேன். முடிந்தால் நான் கேட்ட கேள்விகளுக்குப் பதில் சொல்லுங்கள்! இல்லையென்றால், விமர்சிப்பதை நிற்பாட்டுங்கள்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.22]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මට මේ අවස්ථාව ලබා දීපු එක ගැන සතුටුයි. மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்கவகையின்மை (கூட்டிணைப்பு மற்றும் தனிப்பட்ட) சட்டமூலம் தொடர்பாக உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.

දැන් කථා කළ මන්ත්‍රීතුමෙක් කඳුළු හෙළමින් දෙමළ ජනතාව ගැනත්, දෙමළ ජනතාව ජීවත් වන ප්‍රදේශ ගැනත්, ඒ ජනතාවට මේක කළ යුතුයි, ඒක කළ යුතුයි කියාත් කිව්වා. ඇත්තටම එතුමා එහෙම කථා කිරීම ගැන අපට සතුටුයි. අවුරුදු 76ක් பூட்டன், தாத்தா, அப்பா කියන දේශපාලන මතය අනුව එක පවුලක් විධියට ඉඳිමින් වෙන කාටවත් - වත්තේ වැඩ කරන සාමාන්‍ය මනුස්සයෙකුට පවා - දේශපාලනයට එන්න බැරි වන විධියට අද වනතුරු බලය තියාගෙන හිටපු මේ කට්ටිය දෙමළ ජනතාව වෙනුවෙන් ලොකු සේවයක් කළා කියලා පුරසාරම් දොඩනවා.

මම කාරණයක් කියන්න කැමැතියි. මමත් ගම්පොල ප්‍රදේශයේ ජීවත් වෙන්නේ. මලෙයහම් ජනතාවත් ඒ ප්‍රදේශය තුළ තමයි ඉන්නේ. ඒ මලෙයහම් ජනතාව ජීවත් වන ප්‍රදේශයේ අවුරුදු 200කට කලින් හදපු පාර තමයි අද වනතුරු තිබෙන්නේ. මම ඒ ගැන වගකීමෙන් කියන්නේ. මනුෂ්‍යයින්ට සමහර පාරවල ට්‍රැක්ටර්වලින් තියා පයින්වත් යන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒක වෙනස් කරන්න.

අපේ ගරු ජනාධිපතිතුමාත් එක්ක ඊයේ තිබුණු සාකච්ඡාවේදී මම කිව්වා, වතු ජනතාව අවුරුදු 200ක් මේ තත්ත්වයේ ඉන්නවා, ඔවුන්ගේ ජීවනෝපාය අපි වෙනස් කරන්න ඕනෑ, ඔවුන් අපේම දෙමළ ජනතාව, අපේම සහෝදරයෝ, එම නිසා ඒ ජනතාවට උදවු කරන්න ඕනෑය කියලා. අපට තවත් අවුරුදු තුනහමාරක් තිබෙනවා. අපේ ආණ්ඩු කාලයෙන් අවුරුදු එකහමාරක් තමයි තවම ඉවර වෙලා තිබෙන්නේ. අවුරුදු 77ක් තුළ කරපු නැති දේවල් මේ අවුරුදු තුනහමාර තුළ ඒ ජනතාවට අපි ඉෂ්ට කරනවා කියලා පොරොන්දු වෙනවා. ඒ මන්ත්‍රීතුමා ඇහුවා, දෙමළ ජනතාවට ගෙවල් හදලා දෙනවාද, ඉඩම් අයිතිය දෙනවාද, තවත් දේවල් දෙනවාද කියලා. ඔව්, අපේ ගරු ජනාධිපතිතුමා අනිවාර්යයෙන් දෙමළ ජනතාවට ඒවා ලබා දෙනවා. අදාළ අමාත්‍යාංශයට දැන් ඒ සම්බන්ධයෙන් යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉදිරි කාලයේදී චක්‍රලේඛයක් එනවා. සිංහල ජනතාවට, මුස්ලිම් ජනතාවට ලැබෙන සියලු දේ ඒ චක්‍රලේඛය තුළින් දෙමළ ජනතාවටත් ඉදිරි කාලයේදී අපි ලබා දෙනවා. ඒ ගැන ඔබතුමන්ලා කනගාටු වෙන්න එපා. කොහොමත් තව අවුරුදු 15ක්, 20ක් විරුද්ධ පක්ෂයේ ඉඳලාම ඔබතුමන්ලාට යන්න පුළුවන්. ඒ දෙමළ ජනතාවගේ වැඩ ටික අපි ඉදිරියේදී කරලා දෙනවා.

අද හැම එක්කෙනාම කියනවා, ජෝසප් විජේගේ ජයග්‍රහණය ගැන. අපට ඒ ගැන සතුටුයි. අපි එතුමාට සුබ පතමු. ඒ වාගේම ජෝසප් විජේ කියන කෙනා නළුවෙක් වෙලා හිටියාය කිව්වා. දැන් අපි - මාලිමාවේ කට්ටිය - රඟපානවාය කියනවා. අපි රඟපාන්නේ නැහැ, ජනතාව වෙනුවෙන් වැඩ කරනවා කියලා මම කියන්න කැමැතියි.

තව කාරණයක් මම කියන්න ඕනෑ. පසුගිය සතියේ ගම්පොල ප්‍රදේශයේ වතු දෙමළ ජනතාවට ඉඩමක් ලබා දෙන්න මමත් ගියා. එතැන ඉන්නේ වතු தலைவர்கள் කියන කට්ටියක්. වතු தலைவர்கள் කියන්නේ කවුද කියලා ඔබතුමන්ලා දන්නවා. අනෙක් පක්ෂවල ඉන්න කට්ටිය ඇත්තටම අපට වැඩ කරන්න දෙන්නේ නැහැ.

මම දෙමළ භාෂාවෙනුත් වචන කීපයක් කථා කරනවා. හුඟක් දේවල් කථා කරන්න තිබෙනවා. ඒ වුණාට ඒවා ගැන කියන්න වෙලාව නැහැ.

இப்பொழுது முஸ்லிம்கள் மத்தியில், 'உழ்ஹிய்யா' கொடுப்பது சம்பந்தமான விடயம் முக்கிய பேசுபொருளாக உள்ளது. இது பற்றி YouTube, Facebookஇல் பதிவுகளை இட்டுக்கொண்டு இருக்கிறார்கள். முஸ்லிம்கள் ஒருபோதும் பயப்படத் தேவையில்லை. ஏனெனில், எங்களுடைய அரசாங்கம் இனவாத அரசாங்கம் அல்ல. 'போயா' தினத்தில் அல்லாமல், ஏனைய தினங்களில் 'உழ்ஹிய்யா' கொடுப்பதில் எந்தப் பிரச்சினையும் வராது. எங்களுடைய அரசாங்கம் இதற்கு எந்த இடையூறும் ஏற்படுத்தாது.

இன்னுமொரு முக்கியமான விடயத்தை நான் இங்கு சொல்ல வேண்டும். இன்றைக்கு நாங்கள் பல பிரதேசங்களில் பல்வேறு அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்கின்றோம். தமிழ்ப் பிரதேசங்களிலும் அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்கின்றோம். ஒரு காலை மட்டுமல்ல, இரண்டு கால்களையும் பிடித்து இழுத்துக்கொண்டு இருக்கிறார்கள். அவ்வாறு செய்யாமல் எங்களுடைய அரசாங்கத்துக்கு உங்களால் இயன்ற உதவிகளைச் செய்ய முடியுமாக இருந்தால், நிச்சயமாக நாங்கள் எதிர்வரும் காலங்களில் தோட்டப் பகுதிகளிலுள்ள அனைத்துப் பிரச்சினைகளையும் நிவர்த்தி செய்வதற்கு முயற்சி எடுப்போம்.

பத்து நாட்களுக்கு முன்னர் கம்பளை நகர சபைக்கு உட்பட்ட சில இடங்களில் Clean Sri Lanka வேலைத்திட்டத்தின் கீழான வேலைகளை நாங்கள் பார்வையிடும்பொழுது, கம்பளை - அபகமுவ வீதி, ஸ்கன்ஸா வீதியில் குப்பைகளைப் போட்டிருப்பதை அவதானிக்க முடிந்தது. இதனால் அங்குள்ள மக்களுக்கு அங்கு வாழ முடியாத நிலை ஏற்பட்டு இருக்கின்றது. கம்பளை நகர சபையானது, எங்களுடைய அதிகாரத்தின் கீழுள்ள நகர சபை அல்ல. மாறாக, සජබஇன் அதிகாரத்தின் கீழுள்ள நகர சபையாகும். எனவே, அங்குள்ள மக்களுடைய வாழ்க்கையில் எந்தப் பிரச்சினையும் ஏற்படாதவாறு, அங்குள்ள குப்பைகளை அள்ளுவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென உரிய நகராதிபதியைக் கேட்டுக்கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.28]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද වස්තුභංගත්වය, එහෙම නැත්නම් බුන්වත්භාවය පිළිබඳ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරද්දී මට මතක් වෙනවා, ශ්‍රී ලංකාවත් බුන්වත්භාවයට පත් වෙලා, වස්තුභංගත්වයට පත්වෙලා තමයි නැවතත් මේ තත්ත්වයට ආවේ කියන එක. වස්තුභංගත්වයට පත් වෙනකොට අපි සමගි ජන බලවේගය හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තීන්දුවක් ලබා ගත්තා, ඒ සම්බන්ධයෙන් වගකිව යුත්තන් කවුරුන්ද කියා හෙළිකර ගන්න. අපි ඒක කළා. සමගි ජන බලවේගය හැටියට අපි ඒ නීතිමය කාර්යයට උර දීලා ඒ වගකීම ඉෂ්ට කළා. ඒ, මේගොල්ලෝ තැන් තැන්වල රස්තියාදු ගහපු, අපේ විපක්ෂ නායකතුමාටත් පොල්ලෙන් ගහන්න එළවමින් හිටපු කාලය. නමුත් අපි අපේ වගකීම ඉෂ්ට කළා. අපේ යහළුවා මෙතැන නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නඩු තීන්දුවෙන් පැහැදිලිවම කියනවා, mismanagement of public funds ගැන. අපි අද මේ කථා කරන භාණ්ඩාගාරයේ ප්‍රශ්නය සම්බන්ධයෙනුත් අපට කියන්න තිබෙන්නේ mismanagement of public funds කියලා තමයි. ඒ වාගේම ඒ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවෙන් කියැවෙනවා, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව පවා උල්ලංඝනය කරනවා, නීතිය ඉදිරියේ සැමට සමාන රැකවරණයක් ලැබීම පවා උල්ලංඝනය කරනවා කියලා. අපට අද ඒවා නැවතත් මතක් වෙනවා, මේ public funds මෙච්චර mismanage කරද්දී. ඩොලර් ලක්ෂ 25ක් කියන්නේ,

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

රුපියල් කෝටි 80ක්, පොඩි ගණනක්ය කියලා මෙතැන සෑහෙන සද්දයක් දමනවා. හැබැයි, අපි දන්නවා SriLankan Airlines එකටත් රුපියල් බිලියන 20ක් විතර දාලා නාස්ති කර තිබෙන බව. ඒ නිසා ගණන, ප්‍රමාණය ගැන නොවෙයි, මට මේ නඩුව ගැන මතකයට ආවා, මේ බුන්වත්භාවය කියන එක දැක්කාම. රජයේ සේවකයින් විසින් සාපරාධී විශ්වාසය කඩ කිරීම කියන දණ්ඩ නීති සංග්‍රහයේ වගන්තිය පවා වෙනම මේ සමඟ කියවන්න අවශ්‍යයි. මොකද, මේ දේවලින් එළියට එනවා, mismanagement of public funds. ඒක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, දණ්ඩ නීති සංග්‍රහයත්, මේ රටේ අපරාධ නඩු විධාන සංග්‍රහය කියන සියලුම දේ උල්ලංඝනය කරනවා කියන එක විශේෂයෙන්ම කියන්න ඕනෑ. මොකද, මහ බැංකුවෙන් මේ transaction එක කරන account එක ගැන වෙනම අනතුරු ඇඟවීමක් පවා කර තිබියදී තමයි මේ හැසිරීම කර තිබෙන්නේ. ඒක අපි දැක්කේ මාධ්‍යවලින්. එහෙම නැතිව වෙන කොහෙන්වත් නොවෙයි. ඇවිල්ලා මගේ ඔළුව කන්න හදන්න එපා. අපි ඒක මාධ්‍යවලින් දැක්කා. මම වෘත්තීයභාවය තබාගෙන, COPF එකේ කියපු දේවල් හෙළිකරන්නේ නැහැ. හැබැයි, මම ඒක මාධ්‍යවලින් දැක්කා. ඒකත් මගේ ළඟ තිබෙනවා.

මේ රට භාර ගන්නකොට digitalization ගැන කියලා විශාල හා හුවක් නැඟුවා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ රටේ ව්‍යාපාරිකයින්, සාමාන්‍ය ජනතාව digitally ආර්ථික කටයුතුවලට සම්බන්ධ වීම ගැන විශාල සැක සංකා ඇති කර ගන්නා තත්ත්වයකට මේක පත් කරලා තිබෙනවා. ඒ නිසා digitalization කෙසේ වෙතත්, මේ රටේ ජනතාව සාමාන්‍යයෙන් බැංකුවකින් බැංකුවකට සල්ලි මාරු කරමින් හිටපු එකත් මේකෙන් නැති වෙනවා කියන එක මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේකේ තිබෙන ප්‍රධානතම කාරණය තමයි මේ ප්‍රශ්නය රටට, පාර්ලිමේන්තුවට දැන්වූයේ නැත්තේ ඇයි කියන එක. අපි මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කථා කළා. විවිධ අය විවිධ උත්තර දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සාමාන්‍යයෙන් පුහුල් හොරා අහුවෙන්නේ කරෙන්. හැබැයි, දැන් මේ හැසිරිච්ච විධියට පුහුල් හොරා කවුද කියන එක හැමදෙනාටම හෙළි වෙනවා. මම ඒ ගැන උදාහරණ වශයෙන් කියන්නම්. හර්ෂණ සූරියප්පෙරුම භාණ්ඩාගාර ලේකම්තුමා මුලින්ම කිව්වා, මේක හැකර් කෙනෙක් කරපු දෙයක් කියලා. හැබැයි, ඒක මුළු රටේම විහිළුවට ලක්වෙලා ඉවර වුණා. නැවතත් හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමාම කිව්වා, “Confidentiality was maintained deliberately to avoid obstructing investigations.” කියලා. එතුමා කිව්වා, හිතාමතාම - deliberately - මේක හෙළි කිරීම පැහැර හැරියා කියලා. ලෝකයට හොරෙන් අපරාධ හංගලා. සාමාන්‍යයෙන් අපරාධයක් හංගන්නේ නැහැ, විමර්ශන තමයි හංගන්නේ. විමර්ශනයේ තිබෙන දේවල් හැංගුවාට ප්‍රශ්නයක් නැහැ නේ. මේකෙදී අපරාධයක් හංගලා. හැබැයි එතුමා එහෙම කියනකොට අනිල් ජයන්ත මැතිතුමා මෙතැනට ඇවිල්ලා කියනවා, පාර්ලිමේන්තුව වහලා තිබුණු නිසා මේ ගැන හෙළි කළේ නැහැ කියලා. මොකක්ද ඒ කියන්නේ? හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා කියපු කථාව ගත්තොත්, එතුමා කියන්නේ අපරාධකාරයෝ පැනලා යයි කියලා හෙළි කළේ නැහැ කියායි. දහපාරක් සල්ලි ටික හොරකම් කරලා එකොළොස් වැනි පාර හොරකම් කරන්න යද්දි අතට අල්ලා ගන්න හිටියා වාගේ කථාවක් තමයි මේ කියන්නේ. මේක එහෙම හොරකමක් නොවෙයි නේ. මේක දහපාරක් transfer කරලා නේ.

ඒ වාගේම අනිල් ජයන්ත මහත්මයා තව කාරණයක් කියා තිබෙනවා. මම නම් වශයෙන් කියන්නේ, මට පෙන්වන්න දේවල් තිබෙන නිසා. එතුමා BBC එකට කියා තිබෙන කාරණය මේ විධියටයි සඳහන් වෙන්නේ: “Deputy finance minister Anil Jayantha Fernando said the extent of the cyber heist became clearer after the cyber criminals attempted to make another payment due to India, raising suspicions over altered bank account details.”

මේ මම නොවෙයි, BBC එකෙන් කියන්නේ. මේක සිද්ධ වුණේ ජනවාරිවල. එතකොට, ජනවාරි කථාවක් දැන් කියන්නේ නැහැ නේ. දැන් කියන්නේ මාර්තු කථාවක් නේ. අපි පිළිගන්නවා. අපි සාධාරණ වෙමුකෝ. ජනවාරි එක ඉන්දියාවේ නේ. ඕස්ට්‍රේලියාවේ එක මාර්තු 23 කියමුකෝ. ඊට පස්සේ අප්‍රේල් 7වැනි දා පාර්ලිමේන්තුව තිබුණා. මාර්තු 23වැනි දා ඉඳලා එතකොට අල කෑවාද ඒ ටිකේ? අප්‍රේල් මාසයේම පාර්ලිමේන්තුව වහලා තිබුණාය කියනවා. ඒ වුණාට පාර්ලිමේන්තුව තිබිච්ච වෙලාවේ මේක එළියට දැම්මේ නැහැ නේ. අප්‍රේල් 23වන දා නේ සියලුම දේවල් එළියට එන්න පටන් ගත්තේ.

ඒ වාගේම විපක්ෂ නායකතුමා ඇහුවාම, "අප්‍රේල් 7වන දා පාර්ලිමේන්තුව තිබුණා, එදා කිව්වේ නැත්තේ ඇයි?" කියලා, ඒ වෙලාවේම නැගිටලා කියනවා, "හරියට තොරතුරු තිබුණේ නැහැ, හොයා ගන්න..." කියලා. මොකක්ද මේ කියන්නේ? එකම කථාව තැන් තැන්වල වෙනත් වෙනත් විධියට කියනවා. හැබැයි මේකේ ලස්සනම පැහැදිලි කිරීම හැමදාම වාගේ කළේ අපේ ලක්මාලි හේමචන්ද්‍ර මැතිනිය. එතුමිය තමයි ලස්සනම පැහැදිලි කිරීම කළේ, හැමදාම වාගේ. එතුමිය කිව්වා, "මේක මොකටද පාර්ලිමේන්තුවට කියන්නේ? මේක මොකටද රටට කියන්නේ? එහෙම බැඳීමක් නැහැ" කියලා. ඊළඟට එතුමිය මහා භයානක ප්‍රකාශයකුත් කළා. "පාර්ලිමේන්තුවට තිබෙනවා තමයි මූල්‍ය බලය. හැබැයි මතක තියා ගන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වැනි ව්‍යවස්ථාව අනුව විධායක බලය තිබෙන්නේ ජනාධිපතිට" කියලා. ඉතින් මොකක්ද, අපි නැහැ කිව්වාද? කොහොමද, ඒ දෙක සමාන වෙන්නේ? විධායක තීරණයක්, එහෙම නැත්නම් ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා නම්, අපි මේක අහන්නේ නැහැ. හැබැයි මතක තියා ගන්න ඕනෑ කාරණය තමයි, ජනාධිපතිවරයාට සල්ලි වියදම් කරන්නේත් මෙතැනින් අනුමත කරලා කියන එක; ණය ගෙවන්න සල්ලි වියදම් කරන්නේත් මෙතැනින් අනුමත කරලා කියන එක.

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙසේ වෙතත් එතුමිය බැලුවේ නැහැ, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121(2). එහි සඳහන් වෙනවා, "මතු සඳහන් දේ පරීක්ෂා කරනු ලැබීම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය විය යුත්තේ ය." කියලා. ඒ යටතේ තිබෙනවා, "රාජ්‍ය ණය සහ ණය සේවා" යනුවෙන්. මෙහෙමත් තිබෙද්දී, මෙතැනට ඇවිල්ලා මොකක්ද මේ කියන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හුළඟේ පාවි පාවි ඉඳලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ස්ථාවර නියෝගය කියවා ගන්න බැරි එක ගැන මට තේරෙනවා. හැබැයි, මහන්සි වෙලා ඉගෙන ගෙන නීතිඥවරියක් වෙලා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවා ගන්න බැරි එක ගැන මට හිතා ගන්න බැහැ. ඒ සම්බන්ධයෙන් නීතිඥවරයෙක් විධියට මටත් පෞද්ගලිකව කනගාටුවක් සහ ලජ්ජාවක් තිබෙනවා කියන එක කියන්න ඕනෑ.

අධිකරණය ගැන මොනවාද දන්නේ? ජනාධිපතිවරයා එළිපිට කියනවා, "25වැනි දාට මේ නඩු තීන්දු එන්නට නියමිතයි, බලාගෙන ඉන්න කවුද ඇතුළට යන්නේ කියලා" යනුවෙන්. ජනාධිපතිතුමාට මම කියනවා, මේ රටේ ජනතාවගෙන් සමාව ගන්න කියලා. ඒ නැතත් කමක් නැහැ, මේ රටේ විනිශ්චයකාරතුමන්ලාගෙන්, නීතිඥවරුන්ගෙන් විශේෂයෙන් සමාව ඉල්ලන්න. මොකද, අධිකරණ පද්ධතියට කරපු ඒ මහා ගැරහීම වෙනුවෙන් එතුමා අනිවාර්යයෙන්ම සමාව ගන්න ඕනෑ ඉහළ සිට පහළ දක්වා සිටින විනිශ්චයකාරතුමන්ලාගෙන්.

ඊළඟට මේ සිදුවීම් සම්බන්ධයෙන් කථා කරද්දී අපි අහන්න කැමැතියි, ඒවා හෙළි කළේ නැත්තේ හොරු පැනලා දුවයි කියලා හිතලා නම්, එහෙම හිතලා හෙළි නොකරපු කොච්චර දේවල් තිබෙනවාද කියලා. මම නොවෙයි කියන්නේ, නලින්ද ජයතිස්ස ඇමතිතුමා කිව්වා, ඩොලර් ලක්ෂ 6ක් තැපැල් දෙපාර්තමේන්තුවෙනුත් දීලා වෙච්ච දෙයක් නැහැ කියලා. මේ විධියට විවිධ හේතු කියමින්, හංගා ගෙන ඉන්න තව මොන මොන අපරාධ තිබෙනවා ඇතිද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
තත්පර 30කින් මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි කියනවා ඒ දේවල් මෙතැන හෙළි කරන්න කියලා. ඇවිල්ලා හතර අතේ බොරු කියන්න එපා. එකක් හෙළි වුණාම බොරු දාහක් විතර කියනවා. මේ වාගේ හෙළි කරපු නැති දේවල් තව තිබෙනවා නම් රටට, පාර්ලිමේන්තුවට, ජනතාවට අද කියන්න. මොකද, ඒවා ඉදිරියේදී හෙළිවුණාට පසුව බොරු දාහකින් නතර කරන්න හම්බ වෙන්නේ නැහැ, බොරු දහදාහක් විතර කියන්න වෙනවා. මට කියන්න තිබෙන්නේ එච්චරයි. අවංක වෙන්න. වැරැද්දක් සිදුවුණා නම් කථා කරමු. අපි හැමදාම කියනවා වාගේ අවංක වෙලා පිළිගෙන ඒ වැරැද්ද හදාගන්න. එහෙම නැත්නම් ගල් අඟුරු හොරකම වාගේ මේකත් ඔබතුමන්ලා කරපු හොරකමක් බවට ඉදිරියේදී ඔප්පු වීමට නියමිතයි කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) THUSHARI JAYASINGHA took the Chair.*

[අ.භා. 2.37]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බේරා ගැනීම්, පුනරුත්ථාපනය සහ වස්තුභංගත්වයට අදාළ නීති සම්පාදනය කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව තමයි අද දවසේ අපි විවාද කරන්නේ; සාකච්ඡා කරන්නේ.

විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ප්‍රධානම හේතුවක් තිබෙනවා. රටක සංවර්ධන ක්‍රියාදාමයට දායක වන ප්‍රධාන ක්ෂේත්‍රයක් තමයි ආයෝජන. ඒක පෞද්ගලික ආයෝජනයක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් සමාගමක් විධියට, කණ්ඩායමක් විධියට, ආයතනයක් විධියට එන ආයෝජන වෙන්න පුළුවන්. ආයෝජන ක්‍රියාවලියට සම්බන්ධ වෙලා ව්‍යාපාර පවත්වා ගෙන යමින් රටේ ආර්ථිකයට දායක වන; නිෂ්පාදන, කර්මාන්ත ඇතුළු විවිධ දේවල් කරන ව්‍යාපාරික ප්‍රජාවගේ, ආයෝජකයන්ගේ ඒ ව්‍යාපාර රටේ පැන නඟින විවිධ අර්බුදකාරී අවස්ථාවලදී බංකොලොත්භාවයට පත්වන අවස්ථා තිබෙනවා. සමහර ව්‍යාපාර බංකොලොත්භාවයට පත් වුණාට පස්සේ ඒ ව්‍යාපාර නැවත ගොඩගන්න හෝ තිබිච්ච තත්ත්වයට පත් කරගන්න බැරි වීම නිසා අදාළ ව්‍යාපාරිකයන් බරපතළ විධියේ පීඩාවකට පත් වෙනවා. එවැනි තත්ත්වයකට පත් වුණාට පස්සේ අපේ රටේ පවතින වර්තමාන නීතිය අනුව කරන්න තිබෙන්නේ, ඒ ව්‍යාපාර ඇවර කිරීම; ඒවායේ තිබෙන සම්පත්, දේපළ ගණනය කර ඒ අදාළ පාර්ශ්වකරුවන්ට ගෙවමින් ව්‍යාපාරය වසා දැමීම හෝ වෙනත් කටයුත්තක් කිරීම. නමුත්, එහෙම කටයුත්තක් සිද්ධ වුණොත් ඒ ව්‍යාපාරිකයාට ව්‍යාපාරික ලෝකයේ තවදුරටත් පවතින්න බැරි, ඒ ආර්ථික කටයුත්ත තවදුරටත් ක්‍රියාත්මක කරන්න බැරි බරපතළ ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා ව්‍යාපාර ලෝකයට විතරක් නොවෙයි, රටේ ආර්ථිකයට ඔහුගේ දායකත්වය නැවත ලබා ගන්න බැරි තත්ත්වයකට පත් වෙනවා. ඒ නිසා මේ ගෙනෙන වත්මන් නීති රීති; සම්මත කරන්න යන පනත මඟින් ඒ තිබෙන බාධාව ඉවත් කර, වස්තුභංගත්වයට පත්වෙච්ච, තමන්ගේ ව්‍යාපාර බංකොලොත්භාවයට පත්වෙච්ච අයට නැවත වතාවක් අනාගතයේදී හෝ මේ රටේ ආර්ථිකයට දායක වෙන්න, තමන්ගේ ව්‍යාපාර, කර්මාන්ත කටයුතු පවත්වාගෙන යන්න අවස්ථාව හදලා දෙන්න අවශ්‍යයි. ඒ නිසා තමයි නැවත මේ පිළිබඳ සාකච්ඡාවක් පැන නඟින්නේ.

අපි දන්නවා, වස්තු භංගත්වය කියන්නේ මොකක්ද කියලා. ධනය හානියට පත්වීම, බංකොලොත්භාවයට පත්වීම, වත්කම්වලට වඩා වගකීම් ප්‍රමාණය, ණය ප්‍රමාණය වැඩි වීම කියන එක තමයි වස්තු භංගත්වයට පත්වීම කියලා අප විශ්වාස කරන්නේ. එහෙම නම්, ව්‍යාපාරයකට හෝ රජයකට තමන් ලබා ගෙන ඇති ණය සහ පොලිය නියමිත කාලයට ගෙවා ගැනීමට නොහැකි වීම, ව්‍යාපාරයක ණය හිමියන්ට ගෙවිය යුතු ණය ගෙවීමට නොහැකි වීම කියන එක ඕනෑම ආර්ථිකයක තීරණාත්මක ගැටලුවක්.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් මේ ගරු සභාවේ විපක්ෂයේ ඉදිරි පෙළේ ඉඳගෙන මහා ලොකුවට පාරම්බාමින් කථා කරන නායකයෝ ගොඩක් අය කියනවා නේ, මේ ආර්ථිකය ගැන; විවිධ දේවල් ගැන. ඒ දැවැන්ත කථා කියන අය අවුරුදු ගණනාවක් රට පාලනය කරලා අපට භාර දෙන කොට රට තිබුණේ ඔන්න ඔය කියන වස්තු භංගත්වයට පත් වෙච්ච තැනක. ශ්‍රී ලංකාව, 2022දී, වස්තු භංගත්වයට පත් වුණා කියලා නිල වශයෙන් ප්‍රකාශ කරපු රටක්. මේ රට මේ කියන වස්තු භංගත්වයට පත් කරන්න මැදිහත් වෙච්ච කට්ටිය තමයි විපක්ෂයේ ඉදිරිපස අසුන්වල වාඩි වෙලා අපට අද උපදෙස් දෙන්නේ. වස්තු භංගත්වයෙන් රට ගොඩ ගන්න කියලා අපට උපදෙස් දෙන්නේ එතුමන්ලා තමයි. ඒ අය හොරකම් කරලා, නාස්ති කරලා, කරන්න ඕනෑ නැති ජරා වැඩ ඔක්කෝම කරලා, විනාශ කරලා, බංකොලොත්භාවයට පත් කරලා වස්තු භංගත්වයට පත් වෙච්ච මේ රට ලස්සන රටක් විධියට දකින්න බලාපොරොත්තු වෙනවා, විපක්ෂය පැත්තේ පුටුවලට ගියාට පස්සේ. ඒක තමයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ කට්ටිය දැන් මෙතැන ගොඩක් දේවල් කථා කරනවා. ඒ කථා කරන හැම කෙනාගේම හදවත දන්නවා, 'අපි මේ රට මේ තත්ත්වයට පත් කරන්න දායක වෙච්ච අයයි' කියලා. එයට දායක වෙච්ච අය තමයි අද විපක්ෂයේ ඉදිරිපස පුටුවල ඉඳන් අපට උපදෙස් දෙන්නේ; කථා කරන්නේ. *[බාධා කිරීමක්]* නඩු දාපු ඒවා ගැන අපි දන්නවා. අපි ඒවා ගැන ඉදිරියේදී කථා කරමු. මේ තිබෙන තත්ත්වයට අදාළව ගත්තොත්, ආයතනයක්, ව්‍යාපාරයක් කඩාගෙන වැටුණාම මොකද වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි? අපි දන්නවා, සමහර ව්‍යාපාර, ආයතන කඩා වැටිලා වසා දැමුවාට පස්සේ ඒ ආයතනවල සේවය කරපු සේවකයන් අතිවිශාල ප්‍රමාණයකට තමන්ගේ රස්සාව අහිමි වෙලා එළියට වැටෙන බව. රස්සාව අහිමි වෙලා එළියට වැටුණු අයගේ පවුල් සංඛ්‍යාව ගත්තත් විශාල ප්‍රමාණයක් වනවා. වස්තු භංගත්වයට පත් වූ නිසා සේවකයන් 200, 300 සිටි ආයතන වසා දමන තත්ත්වයට පත් වුණා.

රටක් මෙසේ වස්තු භංගත්වයට පත් වෙන්න බලපාන සමාජ කාරණා ගොඩක් තිබෙනවා. අපි දන්නවා, 2019දී ඇති වුණු කොරෝනා වසංගතය ගැන. ඒ වෙලාවේ රටේ සමස්ත ආර්ථික ක්‍රියාවලිය ක්‍රියාත්මක වීම නැවතිලා රට එක තැන නතර වෙන තත්ත්වයකට පත් වුණා. අන්න ඒ වෙලාවේ අපි දැක්කා, රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ව්‍යාපාර හිමියන් විශාල ප්‍රමාණයක් තමන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යන්න බැරුව අසරණ වූ හැටි. එම කර්මාන්ත, ව්‍යාපාර මාස කිහිපයක් තුළදී කඩා වැටෙන තත්ත්වයකට පත් වුණා. ඒ තත්ත්වයට පත් වුණාට පසුව 2022දී ආර්ථික අර්බුදයක් ආවා. ඒක හදපු එකක්; නිර්මාණය කරපු එකක්. ඒක වංචා, දූෂණ, නාස්තිය ඇතුළේ රටක් විධියට අපි මුහුණ දීපු ප්‍රශ්නයක්. අන්න ඒ ප්‍රශ්නය වෙලාවේදීත් මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්, කර්මාන්තකරුවන්, ස්වයං රැකියා කරන හැම කෙනෙක්ම වාගේ තමන්ගේ ව්‍යාපාර බරපතළ විධියට කඩා වැටිලා වස්තු භංගත්වයට පත් වුණා. ඒ තත්ත්වයට පත් වෙච්ච හැම වෙලාවකම අපි දන්නවා, රටේ පැවතුණු නීතිය අනුව මොකක්ද වුණේ කියලා. අපේ රටේ පවතින නීති රීති අවුරුදු ගාණක් පරණයි. ඒ පරණ නීති අනුව කටයුතු කරලා බැංකුවකින් ණයක් අරගෙන ඒ ණය මුදලින් තමන්ගේ ව්‍යාපාරය පවත්වාගෙන ගිය ව්‍යාපාරිකයෝ හිටියා. ඒ ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන ණය ගෙවාගෙන ගිය ව්‍යාපාරිකයෝ හිටියා. හැබැයි, ඒ ණය ගෙවා ගෙන ගිය ව්‍යාපාරිකයන්ට තමන්ගේ ව්‍යාපාර කටයුතු බිඳ වැටුණාට පස්සේ බැංකු වාරිකය ගෙවා ගන්න බැරුව ණය ගෙවා දැමීම අත් හරිනවා. බැංකු වාරිකය ගෙවන්න බැරුව අත් හරින අවස්ථාවලදී අපේ තිබෙන නීතියට අනුව ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් එක්කෝ අධිකරණ ක්‍රියාමාර්ගයක් ගන්නවා; එහෙම නැත්නම් අධිකරණ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ඒ ආයතනය විසුරුවා හැරීම හෝ වසා දැමීම කරනවා. එහෙම නැත්නම් බැංකුවෙන් දීපු ණයට ඇපයක් විධියට තමන්ගේ ව්‍යාපාරය බැංකුවට අත් පත් කර ගැනීම සිද්ධ වෙනවා. තම ව්‍යාපාරය එහෙම බැංකුවට අත් පත් කර ගැනීම හරහා ඒ වත්කම සමස්තයක් හැටියට ඒ අදාළ ව්‍යාපාරිකයාට, නැත්නම් ඒ කර්මාන්තකරුවාට අහිමි වෙලා යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තම වත්කම් එහෙම අහිමි වෙලා ගියාට පස්සේ මොකද වෙන්නේ? ලංකාවේ බොහොම අමාරුවෙන්, බොහොම දුෂ්කරතා විඳිමින් කුඩා ආයෝජනයක් කරලා, පොඩි මුදලක් ආයෝජනය කරලා ව්‍යාපාරයක් ආරම්භ කරපු ව්‍යාපාරිකයකු කාලයක් තිස්සේ තමන්ගේ ව්‍යාපාරය පවත්වාගෙන යමින් ඉතා ඉහළට ගොඩනගා ගත්තු ඒ ව්‍යාපාරයේ සමස්ත දේපළ අහිමි වුණාට පස්සේ ඔහු හෝ ඇය මුහුණ දෙන තත්ත්වයක් තිබෙනවා. අන්න ඒ මත පදනම් වෙලා අලුත් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. පසුගිය දවස්වල ණය ගෙවා ගන්න බැරිව බංකොලොත්භාවයට පත් වෙච්ච අය සම්බන්ධයෙන් රජය ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන පරාටේ නීතිය සම්මත කරලා, ඒ නීතියට අනුව දේපළ පවරා ගැනීමේ ක්‍රියාවලියකට යන්න සූදානම් වෙලා තිබුණා. මෑත කාලයේදී ඒක නවත්වලා, ඒකට schedule එකක් හදලා දුන්නා. ඒ schedule එකට අනුව ණය ගෙවමින් යම් කළමනාකරණයක් කරගෙන, ආයතනය පවත්වා ගෙන යන්න අවස්ථාව හදා දීලා තිබෙනවා. හැබැයි, ඒක දිගටම කරන්න බැහැ. එහෙම නම් දැන් අලුත් වැඩ පිළිවෙළක් ඕනෑ. ඒ විධියේ අලුත් වැඩ පිළිවෙළක් තමයි, මේ පනතින් යෝජනා කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එහෙම නම් ඒ අලුත් වැඩ පිළිවෙළ මොකක්ද? බංකොලොත්භාවයට පත් වෙච්ච, එහෙම නැත්නම් වස්තු භංගත්වයට පත් වෙච්ච ඒ ව්‍යාපාර වසා දමලා ඒ ව්‍යාපාරිකයන් පීඩාවට පත් කරන්නේ නැතුව, ඒ ව්‍යාපාර බේරා ගන්නේ කොහොමද කියන එක ගැන සාකච්ඡාවක් කරන්න පුළුවන්. ඒ සාකච්ඡාව කිරීමේදී ඒ ව්‍යාපාරිකයාට අවස්ථාවක් හැදෙනවා, තම ව්‍යාපාරය ප්‍රතිනිර්මාණය කර ගැනීම, එහෙම නැත්නම් නැවත ගොඩනඟා ගැනීම සඳහා අනුගමනය කරන්න පුළුවන් වැඩ පිළිවෙළ මොකක්ද කියන එක ඒ සාකච්ඡාවේදී අවධානයට ගන්න.

මේ පනත් කෙටුම්පතෙහි කියා තිබෙනවා වස්තු භංගත්වයට පත් වුණාට පස්සේ දින 60ක් ඇතුළත කිසිම ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ කියලා; එතැනින් පසුව යම් සාකච්ඡාමය ක්‍රියාමාර්ගයක් තුළ තමයි කටයුතු කළ යුත්තේ කියලා. අපි මෙමඟින් බලාපොරොත්තු වෙනවා එක අතකින් රටේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න, ආයෝජකයන් රටට ගෙන්වා ගැනීමේදී විධිමත් විශ්වාසයක් හදන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටකට ආයෝජකයන් පැමිණෙන්න නම්, ඒ වාගේම රට අභ්‍යන්තරයේ ආයෝජකයන් තමන්ගේ යම් මුදලක්, එහෙම නැත්නම් තමා සතු වත්කමක් යොදවා ව්‍යාපාරයක් ආරම්භ කරන්න නම්, ඔවුන් තුළ විශ්වාසයක් ගොඩ නැඟෙන්න ඕනෑ ඒ රට තුළ තමන්ගේ ආයතනය, ව්‍යාපාරය, කර්මාන්තය පවත්වා ගෙන යන්න පුළුවන් මට්ටමේ රැකවරණයක් ඒ රටේ නීති රීතිවලින් ලැබෙනවා කියලා. අන්න ඒ නීති රීතිවලින් හැදිය යුතු විශ්වාසය හදන පනත් කෙටුම්පතක් පිළිබඳව තමයි අප අද සාකච්ඡා කරමින් සිටින්නේ. අපි විශ්වාස කරනවා, අපේ රටට ජාත්‍යන්තර මට්ටමේ ආයෝජකයන් එන්න ඉන්නවා නම්, ඒ ආයෝජන කැඳවා ගැනීම සඳහා යම් පෙළඹවීමක්, යම් උත්තේජනයක් මේ පනත් කෙටුම්පත සම්මත කිරීම හරහා, මේ නීති සම්මත කිරීම හරහා හදන්න පුළුවන් කියලා. ඒ වාගේම රට ඇතුළේ යම් යම් කර්මාන්ත, ව්‍යාපාර පවත්වා ගෙන යන අය ඉන්නවා නම් ඒ අයට විශ්වාසයක් හැදෙනවා, කොහොම හරි මගේ ව්‍යාපාරය මේ රට ඇතුළේ පවත්වා ගෙන ගිහිල්ලා, රටේ

ආර්ථිකයට දායක වෙන්න පුළුවන්කම මට තවදුරටත් තිබෙනවා කියලා. ඒ විශ්වාසය හැදෙන එක රටේ ආර්ථිකයට ලොකු පිටුවහලක් වෙනවා කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ විපක්ෂයේ ගොඩක් අය මේ පනත් කෙටුම්පත ගැන කථා කරනවා වෙනුවට ඊට එහා ගිහින් දැවැන්ත ගෝරනාඩුවක් කරනවා අපි දැක්කා. සමහර අය කියන දේවල්, කියන ක්‍රමය දිහා බැලුවාම අපට හිතා ගන්න බැහැ, පාර්ලිමේන්තුව ඇතුළේද මේවා කියන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදේ රැස්වීම පටන් ගත්තු වෙලාවේ ඉඳන්ම විපක්ෂයෙන් කරපු කථා අහගෙන ඉන්න කොට අපට පුදුම හිතෙනවා. මේ පාර්ලිමේන්තුව මොකටද හැදුවේ? අපේ මන්ත්‍රීවරුන් ජනතාවගේ නියෝජිතයන් හැටියට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ආණ්ඩුවක් හදලා මොකක්ද කරන්නේ? සමහර අයගේ කථා දිහා බැලුවාම අපට ඒවා ගැන හිතා ගන්නවත් බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එකක් නම් අපට තේරුම් ගන්න පුළුවන්. සමහර අය කියනවා "අපි තඩු දැම්මා, අපි මෙහෙම කළා, හරම කළා" කියලා. අපි දැන් මොකද කරන්නේ? අපි දැන් කරන්නේ, අපේ ආණ්ඩුව ඇතුළේ හෝ අපේ ආණ්ඩුවේ කාල සීමාවේදී කවුරුන් අතින් හෝ -දේශපාලන නියෝජිතයන්ගෙන් වෙන්න පුළුවන්, නිලධාරින්ගෙන් වෙන්න පුළුවන්- වරදක් වුණොත් ඒ වැරැද්ද මොකක්ද කියලා හොයන එකයි. එය අපේ වගකීමක්. එය හිතා මතා හෝ නොදැනුවත්කමින් හෝ කරන වැරැද්දක් වෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, උදේ ඉඳලා කියපු ඒ සිදු වීමට අදාළ කටයුතු ජනවාරි මාසයේ ඉඳලා සිද්ධ වුණා නම් ඒක එළියේ කිව්වේ නැත්තේ ඇයි, පාර්ලිමේන්තුවට කිව්වේ නැත්තේ ඇයි, අපට දැන ගන්න ඉඩ සැලැස්වූයේ නැත්තේ ඇයි කියලා අහන අයට මම එක දෙයක් කියන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවට පිටින් ඉඳගෙන කියන බොරු, හදන ප්‍රචාර, මාධ්‍ය තුළින් කියන දේවල් දැක්කාම, මේ වාගේ කාරණයක් ඇත්ත වශයෙන්ම එළියේ නොවෙයි කොහේවත් කියන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පාර්ලිමේන්තුව ඇතුළේ විතරක් නොවෙයි, එළියෙත් පට්ටපල් බොරු කියන, මහා දැවැන්ත අවලාද කරන තත්ත්වයක් තිබෙන්නේ. මේ අය මාධ්‍ය භාවිත කරලා කරන වැඩ දිහා බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය දවස්වල මේ විපක්ෂයේ මන්ත්‍රීවරු සමහර මාධ්‍යවලට කියපු කථා අහගෙන ඉන්නකොට අපට ලජ්ජා හිතුණා. ඒ වාගේ කථා කියන්න පුළුවන් තරමටම මේ අය පසුබැසලාද, එහෙම නැත්නම් සමාජය තුළ පිරිහිලාද කියලා අපට හිතෙන මට්ටමටම විපක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම පනත් කෙටුම්පත සම්මත වීම පිළිබඳව ඉතාම සතුටු වන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද්‍රානී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.50]

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත දෙවන වර කියවන මේ මොහොතේ ඒ ගැන වචන ස්වල්පයක් කථා කිරීමට මට අවස්ථාව ලැබීම සතුටට කාරණයක්. විශේෂයෙන්ම ඉතාම පැරණි ආඥා පනතක් වන (97 වන අධිකාරය වූ) වස්තුභංගත්ව ආඥා පනත ඉවත් කිරීම සඳහාත්, සමාගම් පනත, දේශීය ආදායම් පනත සහ සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහාත් මේ පනත් කෙටුම්පත අද දෙවන වර කියැවීමට ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පනත් කෙටුම්පත සම්මත වීම අපේ රටේ ඉන්න ජනතාවගේ ආර්ථික ගැටලු, ඒ වාගේම ආයතනවල තිබෙන ආර්ථික ගැටලු විසඳීමට උපකාර වෙනවා. විශේෂයෙන්ම යම් කිසි පුද්ගලයෙක් හෝ ආයතනයක් ලබා ගත් ණයක් නැවත ගෙවීමට අපහසු වුණු අවස්ථාවක නීතිමය සහන ලබා දීම මෙන්ම, ප්‍රතිසංවිධානය කිරීම සඳහා තමයි අද මේ පනත් කෙටුම්පත සම්මත කිරීමට ඉදිරිපත් කර තිබෙන්නේ. අපේ රටේ ගිය ආණ්ඩුවේ හිටපු ජනාධිපතිතුමන් විසින් තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ වැඩ කටයුතු ආරම්භ කළේ. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. ඒ වාගේම මේ ආණ්ඩුව ඒ වැඩ කටයුතු ඉදිරියට ගෙන යමින් අද දින මේ වැදගත් පනත් කෙටුම්පත දෙවන වර කියවීමට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳවත් මා සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ කලින් තිබුණු පරාටේ නීතිය වැඩියෙන්ම බලපෑවේ අපේ රටේ ඉන්න කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට. අපේ රටේ සිටින කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් තමයි අපේ රටේ ව්‍යාපාරවලින් සියයට 75ක්ම ආවරණය කරන්නේ. ඒ වාගේම අපේ රටේ රැකියා අවශ්‍යතාවෙන් සියයට 45ක්ම සපයන්නේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයතනවලින්. මේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයතන තමයි විශාල වශයෙන්ම පීඩනයකට ලක් වුණේ, පැවැති පරාටේ නීතිය නිසා. විශේෂයෙන්ම අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සම්මත වීම මේ ආයතනවලට, මේ ව්‍යාපාරවලට ලොකු රුකුලක් වෙනවා කියා තමයි මා විශ්වාස කරන්නේ.

අපි දන්නවා, 2022 වසරේ තිබුණු ආර්ථික අර්බුදය නිසා කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් සියයට 20ක් විතර වසා දැමීමට සිද්ධ වුණාණු බව. ඒ වාගේම අද පවතින තත්ත්වය ගත්තාම, විශේෂයෙන්ම විශාල බදු බර, ඒ වාගේම ඉන්ධන මිල ඉහළ යෑම, විදුලි බිල ඉහළ යෑම වැනි දේවල් නිසා කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ලොකු පීඩනයකට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ ආණ්ඩුව විසින් පසුගිය අය වැයෙන් එම ව්‍යාපාරවල වාර්ෂික ආදායම - annual turnover එක - රුපියල් මිලියන 60 සිට රුපියල් මිලියන 36 දක්වා අඩු කළා. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට තමයි මේක විශාල වශයෙන්ම බලපාන්නේ. මේ නිසා එම ව්‍යාපාර වසා දැමීමේ අවදානමකට ලක් වෙලා තිබෙනවා.

අද දින මේ පනත් කෙටුම්පත දෙවන වර කියැවීමට ඉදිරිපත් කිරීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. මෙම පනත් කෙටුම්පත ඉතා දීර්ඝ එකක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම හිතන විධියට පිටු 630ක් විතර තිබෙන පනත් කෙටුම්පතක්. මෙම පනත් කෙටුම්පත කොච්චර හොඳින් පිළියෙල කර තිබුණත් වැඩක් නැහැ, එය සම්මත වීමෙන් පසුව ඒක ක්‍රියාත්මක කිරීමේදී ගැටලු ඇති වෙනවා නම් හෝ මෙම පනත් කෙටුම්පත සම්මත වීම තුළ බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වෙනවා නම්. විශේෂයෙන්ම මේ පනත යටතේ වස්තුභංගත්ව නියාමන අධිකාරිය පිහිටුවනවා. මේ අධිකාරිය ප්‍රමාදයකින් තොරව පිහිටෙව්වොත් විතරයි, අපට මේ පනතේ අරමුණ ඉටු කරගන්න පුළුවන් වන්නේ. පසුගිය කාලයේ පාර්ලිමේන්තුවේ පනතක් සම්මත වුණා, අය වැය කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා. නමුත් අද වෙනතුරුත් එය ස්ථාපිත කර නැහැ.

[ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය]

ඒ වාගේම සුදු ක්‍රීඩා නියාමන අධිකාරිය අද වෙනතුරුත් පිහිටුවා නැහැ. ඒ වාගේම පසුගිය කාලයේ සම්මත කර ගනු ලැබුවා, කාන්තාවන් සවිබලගැන්වීමේ පනත. නමුත්, අද වනකල් කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම පිහිටුවා නැහැ. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම අක්‍රිය වෙලා තිබෙනවා. අපි කොපමණ පනත් හැදුවත් හරියාකාරව ඒක ක්‍රියාත්මක කිරීමට නොහැකි නම්, අපට ඒ පනතේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වනවා. ඒ සඳහා කඩිනම් පියවර ගැනීම අත්‍යවශ්‍ය වනවා වාගේම මේ අධිකාරියට අවශ්‍ය නිලධාරින් - විශේෂයෙන්ම අධ්‍යක්ෂ ජනරාල්තුමා, ඒ වාගේම අධිකාරියේ සාමාජිකයන් - තෝරා පත් කර ගැනීමේදී මම හිතනවා ඒ අයට නිසි පළපුරුද්ද තිබුණොත් හොඳයි කියලා. පැලවත්තෙන් මේ සාමාජිකයන් පත් කරන්නේ නැතිව, දේශපාලන හෙංචයියන් පත් කරන්නේ නැතිව, නිසියාකාරයට රාජ්‍ය නිලධාරින් පත් කළොත් හොඳයි කියලා තමයි මම මේ අවස්ථාවේ කියන්නේ.

මොකද, පසුගිය දිනවල අපි දැක්කා, අපේ රටේ අහිංසක ජනතාවගේ බදු මුදල්, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක බදු මුදල් වංචාවක් සිදු වුණා. ඒ පිළිබඳව සොයා බලනකොට අපි දැක්කා, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාට ඒ තනතුර දරන්න නිසි පළපුරුද්දක් තිබුණේ නැති බව. එතුමා මේ පාර්ලිමේන්තුවේ මාස 14ක් මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කරලා තමයි මහා භාණ්ඩාගාරයේ ලේකම් ධුරයට පත් කළේ. මම හිතන විධියට, ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි මේ තනතුරට දේශපාලන පත්වීමක් ලබා දුන්නේ. එම නිසා තමයි මම හිතන හැටියට ජනාධිපතිතුමා එතුමා මේ තනතුරෙන් ඉවත් කිරීමට කිසිම ක්‍රියාමාර්ගයක් ගන්නේ නැත්තේ. අපි දැක්කා, ගිය වසරේ රාජ්‍ය නිලධාරින් විශාල සංඛ්‍යාවක් එක රැයින් ඒ තනතුරුවලින් අයින් කළා, සිදු වුණු යම් යම් වැරදි නිසා.

ඒ වාගේම, භාණ්ඩාගාර ලේකම්තුමාගේ පුරවැසිභාවය පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව යම් කිසි කෙනෙකුගේ පුරවැසිභාවය පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම්, ඒ පුරවැසිභාවය පිළිබඳ කරුණු දැක්වීමේ වගකීම තිබෙන්නේ ඒ කෙනාට. අපේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීතුමියක් වන ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියගේ නඩුවේදී තමයි ඒ තීන්දුව දුන්නේ. නමුත්, අද වනකොට මේ රජය මෙතුමා සම්බන්ධයෙන් කිසිම පැහැදිලි කිරීමක් කරලා නැහැ. මේ ආකාරයට වැරදි නිලධාරින්, වැරදි තනතුරුවලට පත් කිරීම නිසා අපේ අහිංසක ජනතාවගේ බදු මුදල් එක රැයෙන් නැති වුණා කියලා තමයි අපට කියන්න වෙන්නේ. ඒ වාගේම, මෙවැනි වැරදි තේරීම් නිසා අපේ අහිංසක රාජ්‍ය නිලධාරින් ලොකු පීඩනයකට පත් වනවා.

අපි දැක්කා, පසුගිය දිනෙක මේ වංචාවට සම්බන්ධ වුණු රාජ්‍ය නිලධාරියාගේ ජීවිතය ඉතා අවාසනාවන්ත ලෙස නැති වුණු ආකාරය. සමහර වෙලාවට ඒ නැති වුණු සල්ලි නැවත මේ රටට ලැබෙන්නත් පුළුවන්, නොලැබෙන්නත් පුළුවන්. මම දැක්කා මෑයි දිනයේදී මේ පක්ෂයේ නායකයෙක් කියනවා, දින 7කින් - සතියකින් - මේ ප්‍රශ්නය විසඳනවා කියලා. අද වනකොට දින පහක් ගතවෙලා තිබෙනවා. නමුත්, තවමත් ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. මේ සල්ලි ලැබුණත්, නොලැබුණත් ඒ නැති වුණු ජීවිතය නැවත ලැබෙන්නේ නැහැ. අහිංසක දරුවන්ට පියෙක් නැති වුණා. භාර්යාවකට ස්වාමි පුරුෂයා නැති වුණා. ඉතින්, ඒ නැති වුණු ජීවිතය අපට නැවත ලබා ගන්න බැහැ. ඒ නිසා මම ඉතාම කාරුණිකව මේ රජයෙන් ඉල්ලා සිටින්නේ, මේ පත්වීම් කරනකොට නිසියාකාරව කරන්න කියලායි.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

[பி.ப. 2.59]

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இந்த உயரிய சபையிலே இலங்கையின் பொருளாதாரக் கட்டமைப்பில் ஒரு மைல் கல்லாக அமையவிருக்கும் இந்த மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்கவகையின்மை (கூட்டிணைப்பு மற்றும் தனிப்பட்ட) சட்டமூலம் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதில் பெருமையடைகின்றேன். அதற்கு முன்பதாக, அண்மையிலே இந்தியாவின் ஒரு மாநிலமாகிய தமிழ் நாட்டில் நடைபெற்ற சட்டமன்றத் தேர்தலிலே முதல்வராகத் தெரிவாகியிருக்கின்ற திரு. ஜோசப் விஜய் அவர்களுக்கு எனது சார்பிலும் எமது அரசாங்கத்தின் சார்பிலும் எமது மக்கள் சார்பிலும் வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்தியா எமது அயல் நாடாகவும் தமிழ் நாடு எமது அயல் மாநிலமாகவும் இருக்கின்ற நிலையில், அவை எங்களுடன் நல்ல உறவைப் பேணி, குறிப்பாக வடக்கு, கிழக்கு மற்றும் மலையக மக்களுக்குத் தகுந்த உதவிகளைத் தகுந்த நேரத்தில் செய்து வந்திருக்கின்றன. அந்தத் தமிழ் நாட்டு அரசாங்கத்தோடு எமது உறவை நாங்கள் பேணிப் பாதுகாத்து, தொடர்ந்தும் இந்த நல்லுறவைப் பலப்படுத்துவதன் மூலம், தொடர்ச்சியாக இருக்கின்ற சில பிரச்சினைகளை நாங்கள் பேசித் தீர்த்து, எமக்குச் சாதகமானதொரு நிலைமையை அந்த அரசாங்கத்துடன் பேணுவோம் என்று கூறிவைக்க விரும்புகின்றேன்.

இன்றைய தினம் இந்தச் சபையில் முன்மொழியப்பட்டு இருக்கின்ற சட்டமூலமானது, உண்மையிலேயே எமது அரசாங்கத்தின் முக்கியமான புரட்சிகரமானதொரு மைல் கல்லாகவே இருக்கின்றது. உங்கள் எல்லோருக்கும் தெரியும், நாங்கள் இந்த நாட்டைக் கையேற்கும்போது இந்த நாட்டின் பொருளாதார நிலைமை வங்குரோத்தடைந்த நிலைமையிலேயே இருந்தது என்பது. அந்த நிலைமையில் இருந்து நாட்டை முன்னேற்ற வேண்டிய தேவை எமது அரசாங்கத்துக்கு உள்ளது. அந்த வகையிலே, எமது நாட்டின் பொருளாதாரம் கடனை அடிப்படையாகக் கொண்டு இயங்கிய நிலையில், கடனைத் திருப்பிச் செலுத்த முடியாத சந்தர்ப்பங்களைக் கையாள்வதற்கு, சுமார் 170 ஆண்டுகள் பழமையான, 1853ஆம் ஆண்டின் சட்டத்தை இன்னமும் நாங்கள் பின்பற்றி வருவது வேதனையானது. எனவே, அதனை நவீன உலகின் மாற்றத்திற்கு ஏற்ப மாற்றி, ஒரு புதிய கட்டமைப்பையும் சட்டத்தையும் உருவாக்க நாங்கள் இன்று முன்வந்துள்ளோம். இந்த நாட்டின் முன்னேற்றத்துக்காகவே கொண்டுவரப்பட்டிருக்கின்ற இந்தச் சட்டமூலமானது பலராலும் வரவேற்கப்படுகின்றது. குறிப்பாக, எனக்கு முன் பேசிய எதிர்கட்சி உறுப்பினர்களும் இந்தச் சட்டமூலத்தை வரவேற்றுப் பேசியிருந்தார்கள். அதற்காக அவர்களுக்கு எனது நன்றியைக் கூறிக் கொள்கிறேன்.

இந்தச் சட்டத்தில் முக்கியத்துவமானதாகக் கருதப்படுவது, நிர்மூலமாதல் ஒழுங்குமுறை அதிகாரசபை - Insolvency Regulatory Authority என்பதாகும். இது வெறும் பெயரளவில் மட்டும் அமையாது, மக்கள் நேயமிக்க அதிகாரசபையாகவே அமையும் என்பதையும் நாங்கள் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றோம். இந்த நிதிச் சட்டம் மற்றும் இவ்வதிகாரசபை வணிகத் துறைகளில் ஆழமான அறிவுள்ள நிபுணர்களால் வழிநடத்தப்படவுள்ளது. அத்துடன், நிர்மூலமாக்கல் துறைசார் நிபுணர்களையும் இதில்

சேர்த்துக்கொண்டு, அவர்களின் கருத்துகளையும் பெற்றுக்கொண்டு இந்த அதிகாரசபையை மிகத் திறமையாகவும் மக்களுக்கு உதவி செய்கின்றதோர் அதிகாரசபையாகவும் மாற்றுவதற்கு இந்தச் சட்டமூலம் உதவும் என்பதில் சிறிதளவும் எங்களுக்கு ஐயம் இல்லை.

அடுத்ததாக, அழிப்பதற்குப் பதில் ஆற்றுப்படுத்தல். அதாவது, இதுவரை காலமும் பழைய சட்டங்கள் கடனாளிகளைத் தண்டிப்பதிலேயே குறிக்கோளாக இருந்தன. ஆனால், இந்தச் சட்டம் 'வாழவிடுதல்' என்ற கொள்கையைப் பின்பற்றுகின்றது. இந்தச் சட்டமூலத்தின் ஊடாக மறுசீரமைப்புக்கு முன்னுரிமை கொடுக்கப்படுகின்றது. ஒரு நிறுவனம் அல்லது தனிநபர் கடனைச் செலுத்தமுடியாத நிலையில், அவர்களைச் சிறைக்கு அனுப்புவதோ அல்லது நிறுவனத்தை மூடி, ஊழியர்களைப் பட்டினி போடுவதோ எமது நோக்கமல்ல. மாறாக, அவர்களுடைய கடன்களை மறுசீரமைத்து, தொழிலை மீட்பதற்கு வாய்ப்பளிப்படுகின்ற அரிய சந்தர்ப்பமாகவே இதனை நாங்கள் கருதுகின்றோம். இதன்மூலம் சிறிய மற்றும் நடுத்தர தொழில் முனைவோருக்கு மற்றும் 50 மில்லியனுக்கும் குறைவான கடன் நிலுவையைக் கொண்டுள்ள எமது நாட்டின் முதுகெலும்பாக விளங்கும் துறையினருக்கு நெகிழ்வான கடன் மறுசீரமைப்புத் திட்டங்கள் அறிமுகப்படுத்தப்பட்டுள்ளன. இதன்மூலம் பல நன்மைகள் கிடைக்கும். அதன்மூலம் இந்த வர்த்தகப் பெருமக்கள் இந்த நாட்டுக்குப் பாரிய சேவையை ஆற்றலாமென நான் நினைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எளிய மக்களுக்கான ஒரு கேடயமாகவும் இது விளங்கும். இந்தச் சட்டமூலம் வங்கிகளுக்காக மட்டும் உருவாக்கப்படவில்லை. இதனைச் சாதாரண மக்களுக்காக, அவர்களின் வாழ்வை முன்னேற்றுவதற்காக உருவாக்கப்படும் ஒரு சட்டமாகவே நாங்கள் கருத வேண்டியிருக்கின்றது. 20 இலட்சம் ரூபாய்க்கும் குறைவான கடனைக் கொண்டுள்ள எளிய மனிதர்களுக்கு அவர்களது தொழிலை முன்னெடுத்துச் செல்வதற்கு இது ஒரு வரப்பிரசாதமாகவே அமையும்.

ஒரு குடும்பத்தின் அடிப்படை வசிப்பிடம், அத்தியாவசிய வீட்டுப் பொருட்கள், ஒரு தொழிலாளிக்குத் தேவையான கருவிகள் மற்றும் அவரது முதுமைக்கால ஓய்வுப்பணம் என்பன பறிமுதல் செய்யப்படாதிருக்கும் வகையில் இந்தச் சட்டம் பாதுகாக்கும். அத்துடன், ஒரு கடனாளி நெருக்கடியில் இருக்கும்பொழுது, உடனடியாகச் சொத்துக்களைக் கையகப்படுத்த கடன் வழங்கியவர்களுக்கு 60 முதல் 360 நாட்கள் வரை தடை விதிக்கப்படும். இந்த அவகாசம் அவர் தன்னைத் தயார் செய்வதோடு, தனது தொழில்முயற்சியை மீண்டும் தொடங்குவதற்கும் மிகவும் உறுதுணையாக அமையும். எனவே, இப்படியான நல்ல திட்டங்களைக் கொண்ட இந்தச் சட்டமானது எமது அரசாங்கத்திற்கு முக்கிய ஒரு திருப்பமானதாகவே அமையும்.

அத்தோடு, நிறுவனங்களை மீட்டு எடுத்தல் என்பது, ஒரு நிறுவனம் நட்டமடையும்பொழுது அதனை உடனடியாகக் கலைக்காமல், நிர்வாகிகள்மூலம் அதனை மீண்டும் இலாபகரமான நிலைக்குக் கொண்டுவர இந்தச் சட்டம் வழிவகுக்கும் என்பதில் எமக்குச் சந்தேகமேயில்லை. இது ஆயிரக்கணக்கான ஊழியர்களின் வாழ்வாதாரத்தையும் பாதுகாக்கும். இச்சட்டத்தின்மூலம் திட்டமிட்ட மோசடிகளுக்கும் நாங்கள் ஒரு தடையை ஏற்படுத்தலாம். அதாவது, மனிதாபிமானமான அடிப்படையில் சலுகைகளை வழங்கும் அதேவேளையில், எமது நிதிச் சந்தையை ஏமாற்ற நினைப்பவர்களுக்கு எதிராக நாம் கடும்போக்கைக் கடைப்பிடிப்பதற்கும் இந்தச் சட்டங்கள் உதவும். சொத்துக்களை மறைப்பது அல்லது தவறான தகவல்களை வழங்குவது நிரூபிக்கப்பட்டால் பலத்த ஓர் அபராதமும் சிறைத்தண்டனையும் வழங்கப்படுமெனவும் இதிலே குறிப்பிடப்பட்டுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறிப்பிட்ட இந்தச் சட்டமானது பழைய துருப்பிடித்த சட்டங்களை நீக்கி, இலங்கையை முதலீட்டுக்கு உகந்த நாடாக மாற்றும். இது வெறும் சட்ட மாற்றம் மட்டுமல்ல. எமது நாட்டின் கடன் கலாசாரத்தில் ஒழுக்கத்தை ஏற்படுத்துவதுடன், பாதிக்கப்பட்டவர்களுக்கு நாம் வழங்கும் நிவாரணத்தின் ஒரு வரலாற்றுச் சாதனையாகும். இதேவேளை எமது பகுதியான வடக்கு மற்றும் கிழக்கு மாகாணத்தில் நிதி மற்றும் கைத்தொழில் நெருக்கடிகளுக்கும் தீர்வு காண இது பெரும் உதவியாக இருக்கும் என்றே நம்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 30 வருடகால யுத்தத்தில் ஏற்பட்ட ஆழமான பொருளாதார வடுக்களுடன் இன்னும் போராடிக்கொண்டிருக்கும் எமது வடக்கு கிழக்கு மாகாணத்தின் நிதி மற்றும் கைத்தொழில் துறையின் தற்போதைய இக்கட்டான நிலை குறித்து இந்த உயரிய சபையின் அவசர கவனத்தை நான் ஈர்க்க விரும்புகின்றேன். வடக்கு, கிழக்கு மாகாணம் தற்போது முறையான நிதி நிறுவனங்கள் மற்றும் ஒழுங்குபடுத்தப்படாத நுண்நிதி நிறுவனங்கள் ஆகிய இரண்டினாலும் ஓர் இரட்டை நெருக்கடியை எதிர்கொண்டிருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, யுத்தத்தால் சிதைவடைந்த வாழ்க்கையை மீண்டும் கட்டியெழுப்ப முயற்சிக்கும் எமது மக்கள், பல சந்தர்ப்பங்களில் சூறையாடும் கடன் நடைமுறைகளுக்கு இரையாகியுள்ளனர். நுண்நிதி நிறுவனங்கள், நூறு சதவீதத்துக்கும் அதிகமான வட்டி விகிதங்களை அறவிடுவதைக் காணக்கூடியதாக உள்ளது. இதன்மூலம் அனேகமாக பெண் தலைமைக் குடும்பத்திலுள்ள பெண்களே பாதிப்புக்குட்பட்டிருக்கின்றார்கள். இந்த நிறுவனங்களின் இவ்விதமான செயற்பாட்டினால் துரதிருஷ்டவசமாக அனேகமானோர் தற்கொலை செய்யுமளவுக்குக்கூட சென்றிருக்கின்றார்கள். இந்த நிதி நிறுவனங்களின் ஸ்திரத்தன்மை இன்மையால் வடக்கு, கிழக்கில் உள்ள பல வங்கி சாரா நிதி நிறுவனங்கள், பணப்புழக்க நெருக்கடிகளை எதிர்கொண்டுள்ளன. இதனால், ஓய்வூதியதாரர்கள் மற்றும் விவசாயிகளின் வாழ்நாள் சேமிப்பு முழுவதுமே ஆபத்தில் உள்ளது. எனவே, இது நாம் சிறந்ததொரு எதிர்கால சிந்தனையோடு செயற்பட வேண்டிய ஒரு விடயமாகும்.

யுத்தத்துக்கு முன்னர் வடக்கு மாகாணம் ஒரு செழிப்பான கைத்தொழில் மையமாக இருந்ததுடன், தேசிய உள்நாட்டு உற்பத்திக்குக் கணிசமான பங்களிப்பையும் வழங்கியிருந்தது உங்களுக்குத் தெரியும். யுத்தத்துக்கு முன்னராக எமது வட, கிழக்கு மாகாணங்களில் பல தொழிற்சாலைகள் இருந்தன. காங்கேசன்துறை சீமெந்துத் தொழிற்சாலை, பரந்தன் இரசாயனத் தொழிற்சாலை, ஆனையிறவு உப்பளத் தொழிற்சாலை, அச்சுவேலி கைத்தொழில் பேட்டை என்பனவற்றுடன் தனியார் துறையினரின் ஆடை உற்பத்தி மற்றும் கடலுணவு பதனிடல் உற்பத்தி நிறுவனங்கள் எனப் பல வர்த்தக நிறுவனங்கள் இருந்தன. ஆனால், இன்று அவை யாவும் அழிவு நிலைமைக்குச் சென்றமைக்கு முக்கிய காரணம்,

[ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා]

இவ்வாறான சட்டங்கள் இல்லாமையே ஆகும். இதனால் பல வியாபாரிகள் தங்களது தொழில்களைக் கைவிட்டு நடுவீதிக்கு வந்திருக்கின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
Hon. Presiding Member, please give me two more minutes.

நீண்டகால யுத்தத்தின் தாக்கத்தால் பாதிக்கப்பட்டவர்களைக் காப்பாற்றுவதற்கு இவ்வாறான சட்டங்கள் முக்கியமானவை. எமது நாட்டு இளைஞர்கள் நாட்டைவிட்டு வெளியேறாமல், இந்த நாட்டுக்கே தமது உழைப்பை வழங்குவதன்மூலம் அழகானதும் வளமானதுமான ஒரு நாட்டை இதன்மூலம் உருவாக்கக்கூடியதாக இருக்கும். எனவே, இந்தச் சட்டமூலத்தை எதிர்க்கட்சியில் இருப்பவர்கள் உட்பட அனைவருமே ஏற்றுக்கொண்டு இந்த நாட்டின் முன்னேற்றத்துக்கு உதவ வேண்டுமென்று கேட்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Ramanathan Archchuna. You have eight minutes.

[பி.ப. 3.10]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! “திரு. ஜோசப் விஜய் ஆகிய நான்” எனும் இந்த வசனத்தை நாளைக்குக் கேட்கும்போது எனக்கு மிகவும் சந்தோஷமாயிருக்கும் என்று நினைக்கிறேன்.

இன்று இலங்கையிலிருந்து ஒரு செய்தியைச் சொல்கிறேன். என்னுடைய சொந்த அண்ணன் மாதிரி பார்க்கக்கூடிய திரு. ஜோசப் விஜய் அவர்கள் வரலாறு காணாத ஒரு வெற்றியோடு நாளைய தினம் ஆட்சி பீடம் ஏறப் போகிறார். அமரர் எம்.ஜீ.ஆருக்கு அடுத்தபடியாக, அவருக்கு ஒருபடி மேலாக, நாளை தமிழ்நாட்டின் முதலமைச்சராக அண்ணன் விஜய் அவர்கள் பதவி ஏற்பதை என்னுடைய இரண்டு கண்களாலும் காண ஆசைப்படுகிறேன். குட்டிமணியும் தங்கத்துரையும் வெலிக்கடைச் சிறைச்சாலையில் கொல்லப்படுவதற்கு முன்னர், “உங்களுக்கு என்ன ஆசை” என்று கடைசி நிமிடங்களில் அவர்களிடம் கேட்டார்கள். அதற்கு, “நான் இறந்த பிறகு தமிழீழத்தை என்னுடைய கண்ணால் பார்க்க வேண்டும்” என்று குட்டிமணி சொன்னார். அதற்காக அவருடைய கண்களைக் குத்தி சிங்களக் காடையர்கள் வெலிக்கடைச் சிறைச்சாலையில் அவரைக் கொலை செய்தார்கள். அதேபோன்று, "உன்னுடைய கடைசி ஆசை என்ன" என்று இன்று என்னை எவனாவது கேட்டால், "திரு. ஜோசப் விஜய் ஆகிய நான்" என்பதை வாசிக்கின்றபோது அதை என்னுடைய இரண்டு கண்களாலும் பார்க்க வேண்டு என்று ஆசைப்படுகிறேன் என்று சொல்வேன்.

என்னுடைய ஒரு நிமிட உரையின்போது, 'எங்களுடைய நெடுந்தீவை முடிந்தால் தமிழ்நாட்டிற்குக் கொடுங்கள்' என்று நான் கூறிய அந்த ஒரு வசனத்திற்காக, ஒட்டுமொத்தத் தற்குறிகளும் நேற்று கத்தியதை நான் பார்த்தேன். கத்துங்கள்! இன்னும் எவ்வளவு வேண்டுமானாலும் கத்துங்கள்! அதைப்பற்றி நான் கவலைப்படப் போவதில்லை. அரசியலில் யார் வேண்டுமானாலும் கருத்துத் தெரிவிக்கலாம். இன்று தமிழக மக்கள் தாங்கள் உணர்வுள்ள தமிழர்கள் என்பதை நிரூபித்திருக்கிறார்கள். காலங்காலமாக ஊழல் செய்தவர்களை வீட்டிற்கு அனுப்ப வேண்டும் என்பதே அவர்களின் ஒரே நோக்கமாக இருந்தது. அது அ.தி.மு.க. ஆக இருக்கலாம், தி.மு.க. ஆக இருக்கலாம், 'திரள்நிதி' என்று சொல்லிக்கொண்டு எங்களுடைய புலம்பெயர் மக்களுடைய பணத்தில் தன்னுடைய பிள்ளையை அமெரிக்காவில் படிக்க வைத்த சீமான் என்கின்ற சாமானாக இருக்கலாம்! அவர்களுக்கு மக்கள் தகுந்த பாடம் படிப்பித்திருக்கிறார்கள். சிலர் கட்டுப் பணத்தைக்கூட இழந்திருக்கிறார்கள். இங்கு போலித் தமிழ்த் தேசியம் பேசும் சிறீதரனாக இருக்கட்டும், கஜேந்திரகுமாராக இருக்கட்டும், செல்வம் அடைக்கலநாதனாக இருக்கட்டும், இலங்கைத் தமிழரசுக் கட்சிக்காரர்களாக இருக்கட்டும், இவர்களுக்கு மிகத் தெளிவாக தமிழகத் தேர்தல் பாடம் ஒன்றைக் கற்பித்திருக்கின்றது.

எமது தேசியத் தலைவருடைய போராட்டத்தையும் அர்ப்பணிப்புகளையும் மாவீரர்களின் அர்ப்பணிப்புகளையும் எவனொருவன் தனது சுயலாப அரசியலுக்காகப் பயன்படுத்துகின்றானோ, அவன் மக்களால் நிச்சயம் தூக்கியெறியப்படுவான். போலித் தமிழ் தேசியம் பேசுபவர்களில் மணிவண்ணன் என்று ஒருவர் இருக்கிறார். டக்ளஸின் காலை நக்கிய மணிவண்ணன் அன்று நீதிமன்றத்தில் வாதாடுகிறார், இராமநாதன் அர்ச்சுனாவிடம் இருக்கும் துப்பாக்கியைப் பறிக்கச் சொல்லி. நான் இன்றைக்குச் சொல்கின்றேன், என்னுடைய இனமானது துப்பாக்கியால் தன்னைப் பாதுகாத்துக்கொண்ட இனம் என்று. அதனை மறப்பதற்கு நான் தயாராக இல்லை. சிங்கள மக்களுடன் ஒற்றுமையாக இருக்க வேண்டும் என்று இன்றுகூட நான் விரும்புகின்றேன்.

வடக்கு மாகாணத்தில் எத்தனையோ தீவுகள் இருக்கின்றன. அண்மையில் நான் நெடுந்தீவுக்குப் போனேன். அங்கு மாவட்ட வைத்தியசாலையாக இருந்த வைத்தியசாலையை, இப்போது இரண்டே இரண்டு வைத்தியர்கள் பணியாற்றுகின்ற வைத்தியசாலையாக இந்தச் சிங்கள இனவாத அரசு மாற்றியிருக்கிறது. உங்களால் நெடுந்தீவுக்கு ஒரு மாதத்தில் 4-5 நாட்களுக்கு மட்டும்தான் மின்சாரத்தை வழங்க முடியுமாக இருந்தால், கச்சத்தீவை மட்டுமல்ல, நெடுந்தீவு உட்பட கிழக்கு மாகாணத்தில் இருக்கின்ற மட்டக்களப்பையும் இந்தியாவுக்குத் தாரைவார்த்துக் கொடுங்கள்! ஏனென்றால், தனது சொந்த மக்களுக்கு கடல்வழிப் போக்குவரத்து வசதியை ஒழுங்காகச் செய்து கொடுக்க முடியாத அநுர குமார திஸாநாயக்க தலைமையிலான அரசாங்கத்தின்மீது எனக்கு நம்பிக்கையில்லை. ஓர் அம்மா அவசர நிலையில் குழந்தையைப் பிரசவிப்பதாக இருந்தால், அந்த வைத்தியசாலையில் ஒரு midwifeகூட இல்லை. Midwife இல்லாத, வைத்தியர்கள் தங்கியிருந்து பணியாற்ற முடியாத ஓர்

இடமாக இன்றைக்கு நெடுந்தீவு வைத்தியசாலையை மாற்றியிருக்கிறார்கள். இன்று நெடுந்தீவிலிருந்து, அனலைதீவிலிருந்து, புங்குடுதீவிலிருந்து மக்கள் கொஞ்சம் கொஞ்சமாக இடம்பெயர்கின்றார்கள். இவ்வாறான நிலைமை இருப்பதனால்தான் நான் மேற்கூறியவாறு சொன்னேன்.

எம்.ஜி.ஆர். முதல் தற்போது எங்களுடைய ஒரேயொரு நம்பிக்கையாக இருக்கின்ற விஜய் வரைக்கும் இலங்கைத் தமிழீழ மக்கள் நம்பியிருப்பது தமிழக மக்களைத்தான். எனவே, தமிழக மக்களிடம் ஓர் அன்பான வேண்டுகோளை விடுக்கின்றேன். தமிழ் கதைப்பதால்தான் என்னுடைய பரம்பரை இங்கே அழிக்கப்பட்டு இருக்கிறது. இந்தச் சிங்கள குகையில் தமிழ் கதைக்கின்ற ஒரு புலியாக நான் இருக்கிறேன். என்னுடைய இனம் சார்ந்த பிறக்காத குழந்தையை - வயிற்றிலிருக்கும்போதே - 'டயர்' போட்டு எரித்திருக்கிறார்கள். எங்களுக்கு இருக்கின்ற கடைசி நம்பிக்கை, தமிழக முதலமைச்சராக பதவியேற்க இருக்கின்ற விஜய்தான் என்பதைச் சொல்லிக் கொள்கின்றேன். நான் இந்த விடயத்தைத் தமிழில் கதைக்கின்றபோது இவர்கள் சொல்வார்கள், இந்த விடயத்தைச் சிங்களத்தில் கதைக்கலாமே என்று. நான் சிங்களத்தில் கதைக்கிறேன் கேளுங்கள்!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේක කියන්න ඕනෑ. මම එදා කිව්වා, අපේ Jaffnaත් ඉන්දියාවට දෙන්න කියලා. මම කථා කරන දෙමළ තේරෙන්නේ නැති නිසා සමහර මාධ්‍ය ඒක වෙනස් කරලා දාලා තිබෙනවා. මම පැහැදිලිවම කිව්වේ, කච්චතිව් නොවෙයි, අපේ ලංකාවත් දීලා ඉවර කරලා දාන්න කියලායි. සමහර ජෙප්පෝ ඇවිල්ලා මගෙන් අහනවා, "ඇයි ඩොක්ටර්, ඔයා අපේ රටට ආදරේ නැද්ද?" කියලා. මම අපේ රටට ආදරෙයි. හැබැයි, අනුර කුමාර දිසානායක ගිහිල්ලා ගිවිසුම් හතක් අත්සන් කරලා එනකොට ඒක තේරුණේ නැහැ. ඒවාට කිසි දෙයක් කිව්වේ නැහැ. හැබැයි, අපි කිව්වොත් තමයි ජෙප්පොන්ට ලෙඩක් හැදෙන්නේ. ඔයගොල්ලන් ගිවිසුම් හතක් අත්සන් කරලා මෝදිට දීලා නේ තිබෙන්නේ. මම කියන්නේ ඒකෙන් කැල්ලක් අරගෙන තමිල්නාඩුවලට දෙන්න කියලායි. එහෙම නැතුව මගේ රට මම විකුණන්නේ නැහැ. මතක තියාගන්න, අපි මේ රට ඕනෑය කියලා රණ්ඩු වෙච්ච මිනිස්සු. 1988-89 කාලයේදී වාගේ අපි තමන්ගේ මිනිස්සු මරලා දාලා නැහැ. අපි මේ රටට ආදරෙයි. මේක මගේ රට. ශ්‍රී ලංකාව කියන්නේ මගේ රට. හැබැයි, ඔයගොල්ලන් ගිවිසුම් හතක් අත්සන් කරලා ඉන්දියාවේ මෝදිට විකුණනවා කියන්නේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මෝදිට, අපි යන්නම් තමිල්නාඩුවට කියලායි මම කිව්වේ. කවදාවත් මේ රට විකුණන්න මට වුවමනාවක් නැහැ. එහෙම වුවමනාවක් තිබුණා නම්, අපි ඒ කාලයේම ඉන්දියාවට යනවා නේ. හැබැයි, මම එකක් කියන්නම්. කච්චතිව් යනකොට අපේ ජනාධිපතිතුමා ජැකට් එකක් මොකුත් දාන්නේ නැතුව ගියා. එතකොට ඔක්කෝම කිව්වා, ඔන්න ජනාධිපති කච්චතිව් එනවා කියලා. හැබැයි, අපි ගියා බෝට්ටුවලින්. රජයේ එක බෝට්ටුවක්වත් නැහැ, නාගදීපයට යන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි කිව්වේ පිළිම වන්දනාව ගෝත්‍රික වැඩක් කියලා. මතකයිද? පිළිම වන්දනාව ගෝත්‍රික වැඩක් කියලා කිව්වාට මිනිස්සුන්ට නාගදීපයට යන්න රජය එක බෝට්ටුවක්වත් දාලා නැහැ. මතක තියාගන්න. ඒ නිසා තමයි මම ඒ boat එකට නැග්ගේ. ඒ නිසා තමයි ඒ ජැකට් නැතුව හිටිය video එක leak වුණේ, මම මුහුද කිට්ටුව ඉපදිලා අවුරුදු 40ක් වෙනවා. මට පීනන්න පුළුවන්. හැබැයි, පොඩි දරුවෝ ඒ බෝට්ටුවල යනවා, අම්මලා යනවා, ජැකට් නැතුව. ඒ අයට මගේ ජැකට් එක ගලවලා දුන්නා, දාගන්න කියලා. බෝට්ටුව පෙරළුණොත් මට බේරෙන්න පුළුවන්. හැබැයි, ඒ අම්මලා, දරුවෝ බේරා ගන්නේ කවුද? මේ ජෙප්පෝ ටික ඇවිල්ලාද බේරා ගන්නේ?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියනවා, මට තුවක්කුවක් දීලා තිබෙනවා කියලා ආරක්ෂාවට. හැම මන්ත්‍රීලාටම- *[බාධා කිරීම්]* සුමන්තිරන්ට දීලා තිබෙනවා, MSD එකේ නිලධාරින් දෙන්නෙක්. හැබැයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන මට පොලිස් නිලධාරියෙකුගේ ආරක්ෂාවක්වත් නැහැ. හැබැයි අපේ පරම්පරාවට පුරුදුයි, ඔය තුවක්කුව. ඒක load කරලා, unload කරලා holster එකට දාන්න තේරෙන්නේ නැතුවද අවුරුදු 40ක කාලයක් තිස්සේ මම ඉන්නේ? මම අවුරුදු හයක් වෙනකොට gun එක dismantle කරනවා. මගේ තාත්තාගේ ඉණේ තිබුණේ gun එක. මගේ අයියාගේ ඉණේ තිබුණේ gun එක. මම gun එකත් එක්ක වාගේ තමයි ඉපදුණේ. ඒක නිසා මට ඒක load කරලා holster එකට දාන්න පුළුවන්. කවුරු හරි ගලක් ගැහුවොත් මම වෙඩි තියනවා කියන්න මට තත්පරයක්වත් යන්නේ නැහැ. හැබැයි මට තේරෙන්නේ නැහැ, මොන බම්බුවකටද ඒ gun එක දීලා තිබෙන්නේ කියලා. මට මාව ආරක්ෂා කර ගන්න පුළුවන්. හැබැයි, අනුර කුමාර දිසානායක ආණ්ඩුව ලජ්ජා වෙන්න ඕනෑ. එක ඇමති කෙනෙකුවත් ආරක්ෂාව නැතුව පාරේ යනවාද කියලා බලන්නකෝ. හැබැයි, අපට තුවක්කුවක් දීලා, අපට ගල් ගහන්න මිනිස්සුත් set කරලා. 2023ට කලින් හිටපු ඇමති ඩග්ලස් දේවානන්දාගේ කට්ටිය ඇවිල්ලා මට ගල් ගහන කොට මාව බේරාගන්න මම තුවක්කුව උස්සන්නේ නැතුව, ගල් වීසි කරන්නද? ඒක නිසා රජය පොඩ්ඩක් ඒ ගැන හිතලා බලන්න ඕනෑ. තමුන්ට ආරක්ෂාව ගන්නවා නම්, ඒ වාගේම විපක්ෂයේ වාඩිවන MPsලාටත් ආරක්ෂාව දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම අවසන් කරනවා.

හැබැයි, තමුන්නාන්සේලා එනකොට මොනවාද කිව්වේ? බස්වල, trainsවල යනවා කිව්වා නේ. අපි මාළු අල්ලන පරණ බෝට්ටුවල නාගදීපයට ගියා. තමුන්නාන්සේලා යන්නේ මොකකද? තමුන්නාන්සේලා Navy boat එකේ, Army boat එකේ යන්නේ. මම ඔයගොල්ලන්ට කියන්නේ, කරුණාකරලා විපක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමන්ලාට පුළුවන් නම් ආරක්ෂාව දෙන්න කියලා.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.19]

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නීතිය කියන්නේ නිරන්තරයෙන්ම යාවත්කාලීන වෙන්න ඕනෑ විෂය ක්ෂේත්‍රයක්. පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයක් වෙන්නේ මේ නීතිය යාවත්කාලීන කිරීම. එතකොට පවතින නීතිය සමාජයේ අවශ්‍යතාවන්ට නොගැළපෙනවා නම්, එහෙම නැත්නම් යල් පැන ගිය නීතියක් නම් එහෙම නැත්නම් සංශෝධනය වෙන්න ඕනෑ නීතියක් නම් ඒ නීතිය යාවත්කාලීන කරලා, සංශෝධනය කරලා, නව නීතියක් බවට පත් කිරීම පාර්ලිමේන්තුවේ වගකීමක් වෙනවා. අද දවසේ අපි ඉෂ්ට කරමින් සිටින්නේත් මෙන්න මේ කියපු ආකාරයට නීතිය යාවත්කාලීන කිරීමක්. විශේෂයෙන්ම බේරා ගැනීම්, පුනරුත්ථාපනය සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත තමයි අද දින පාර්ලිමේන්තුවේදී විවාදයට ගැනෙන්නේ.

මීට කලින් මේ සම්බන්ධව අදාළ වුණු නීති දෙකක් තිබුණා. එකක් තමයි, 1853 අංක 7 දරන වස්තු භංගත්ව ආඥා පනත. එය මීට අවුරුදු 170කට කලින් ඉදිරිපත් කළ පැරණි පනතක්. ඊළඟට, ආයතන සම්බන්ධයෙන් එහෙම නැත්නම් සමාගම් සම්බන්ධයෙන් අදාළ වුණේ 2007 අංක 07 දරන සමාගම් පනතයි. අවුරුදු 170ක් විතර පරණ පනතක් යාවත්කාලීන කර ගන්න එහෙම නැත්නම් වර්තමානයට ගැළපෙන විධියට සංශෝධනය කර ගන්න, වෙනස් කර ගන්න අද විපක්ෂයේ ඉන්න - එදා ආණ්ඩු පක්ෂයේ හිටපු - කට්ටියට බැරි වුණා. අදත් ඔවුන් පාර්ලිමේන්තුවේදී මේ පනත විවාදයට ගන්නා අවස්ථාවේදී කරපු කථාවලින් අපට තේරෙන්නේ, ඇත්තටම වස්තුභංගත්වය කියන කාරණය සම්බන්ධයෙන්වත් ඔවුන්ට අවබෝධයක් නැහැ කියන එකයි. බොහෝ දෙනෙක් මේ පනත විවාදයට ගන්නා අද දවසේ කථා බහ කළේ, මහ බැංකුවේ ඩොලර් මිලියන 2.5ක සිද්ධිය සම්බන්ධයෙනුයි. හැබැයි, වස්තුභංගත්වය කියන්නේ ඒක නොවෙයි. යම් රටක, යම් ආයතනයකට තමන්ගේ වත්කම් ඉක්මවපු වගකීම් තිබෙනවා නම් ඒකට තමයි වස්තුභංගත්වයට පත් වෙනවා කියන්නේ. මම කියපු මුල් පනත් කිහිපයෙන්ම ආවරණය වුණේ යම් කෙනෙක්, එහෙම නැත්නම් යම් සමාගමක් වස්තුභංගත්වයට පත් වුණාට පස්සේ ඒ සමාගමේ වත්කම් ඇවර කරලා, එහෙම නැත්නම් ණයන් බේරා වසා දැමීමක් කරලා, අදාළ කාර්යය අවසන් කරන එකයි.

හැබැයි, ඊට වඩා එහා ගිය සමාජ අවශ්‍යතාවක් පසුගිය කාලයේ මතු වෙමින් තිබුණා. ඒ අනුව ආර්ථික දුෂ්කරතාවකට පත්ව සිටින ශක්‍යතාවක් සහිත සමාගම් නැවත ගොඩනැඟීම නැත්නම් බේරා ගැනීමේ අවශ්‍යතාවක් සමාජය තුළින් මතු වෙලා තිබුණා. ඒ වාගේම ශක්‍යතා නොවන ව්‍යවසායයන් වසා දැමීම සඳහා නීති සංග්‍රහයක් පැනවීමේ අවශ්‍යතාවකුත් සමාජය තුළ ඉස්මතු වෙමින් තිබුණා. වස්තුභංගත්වය පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි කළ යුතුයි කියන අවශ්‍යතාවත් සමාජය තුළින් මතු වෙලා තිබුණා. ඇත්තටම වස්තුභංගත්වයට පත් වුණාට පස්සේ ඒ සමාගම වසා දමලා, එහෙම නැත්නම් ඇවර කරලා ආපසු නැඟී සිටින්න බැරි තත්ත්වයට පත් කරනවා වෙනුවට වස්තුභංගත්වයට පත් වෙන්න පුළුවන් ආයතන සහ පුද්ගලයන් පිළිබඳව පුරෝකථනය කරලා, ඔවුන් වස්තුභංගත්වයට පත් වීම වළක්වා ගැනීමේ අවශ්‍යතාවක් සමාජය තුළින් ඉස්මතු වෙලා තිබුණා.

ඒ වාගේම වස්තුභංගත්වය හේතුවෙන් ඇති වන අනවශ්‍ය පාඩු වළක්වා ගැනීමේ අවශ්‍යතාව, වස්තුභංගත්වයට අදාළ කටයුතු කරන වෘත්තිකයන් නියාමනය කිරීම, අධීක්ෂණය හා ඔවුන්ගේ විනය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීමේ අවශ්‍යතාවත් සමාජය තුළ ඉස්මතු වෙමින් තිබුණා. ඊට අමතරව, ණය හිමියන්ට කාර්යක්ෂමව තමන්ගේ ණය නැවත අය කර ගැනීම වැඩි කර ගැනීමේ අවශ්‍යතාවක් සමාජය තුළින් ඉස්මතු වෙලා තිබුණා. ඊළඟට, පීඩාකාරී ණය බරින් පෙළී සිටින අවංක ණයකරුවන්ට සහන සැලසීම සහ ණයකරුවන් නැවත ගොඩනැඟීම සඳහා අවකාශ සැලසීමේ අවශ්‍යතාවක් සමාජය තුළ ඉස්මතු වෙමින් තිබුණා. ඊට අමතරව, වස්තුභංගත්වය නිසා ඇති වන සමාජ පිරිවැය අඩු කිරීමේ අවශ්‍යතාවකුත් සමාජය තුළින් ඉස්මතු වී තිබුණා. විශේෂයෙන්ම ව්‍යවසායකත්වය දිරිගැන්වීමේ අවශ්‍යතාවක්; සමාගම් හෝ පුද්ගලයන් කඩා බිඳ දමනවා වෙනුවට නව ව්‍යවසායකයන් දිරිමත් කරන වස්තුභංගත්ව නීතියක් පැනවීමේ අවශ්‍යතාව පිළිබඳව සමාජය විසින් ඉල්ලීමක් සිදු කළා. ඒ අනුව තමයි අද දිනයේදී අප විවාදයට භාජන කරනු ලබන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්නේ.

මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ වැදගත්කම් කිහිපයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම මුලින් කිව්වා වාගේම ප්‍රධාන වශයෙන් ආයෝජකයන්ට ස්ථාවරත්වයක් ලබා දීම සහ ව්‍යාපාරය පුනරුත්ථාපනය කිරීම කෙරෙහි මෙම නව පනතෙන් ප්‍රතිපාදන සලස්වා තිබෙනවා. ඒ අනුව, යම් සමාගමක්, පුද්ගලයෙකු වස්තුභංගත්වයට පත් වුණාට පසුව ඔහුගේ ඒ ව්‍යාපාරය අවසන් කියන තීරණය වෙනුවට නැවතත් නැඟී සිටීමට, පුනරුත්ථාපනය වෙන්න අදාළ සමාගමට, පුද්ගලයාට අවස්ථාව ලබා දීමක් මෙම පනතෙන් සිදු කරන්න අපේක්ෂා කරනවා. ඊට අමතරව, තවමත් වාණිජ විභවයක් ඇති සමාගම් සඳහා ගලවා ගැනීමේ ක්‍රියා පටිපාටිය සහ එසේ නොවන සමාගම් සඳහා ඇවර කිරීමේ මාර්ග හඳුන්වා දීමත්, සරලවම කියනවා නම් ව්‍යාපාරයකට දෙවන අවස්ථාවක් ලබා දීමත් මේ පනතෙන් සිදු වෙනවා. ඊට අමතරව වස්තුභංගත්වයට පත් වීමට පෙර අදාළ පුද්ගලයන්ට හා සමාගම්වලට ඉතුරු වී ඇති දේපළ යොදාගෙන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවස්ථාව ලබා දීමත් මේ පනත මඟින් සිද්ධ වෙනවා. ඒ අනුව ප්‍රධාන වශයෙන් සමාගමක් වස්තුභංගත්වයට පත් වුණාට පස්සේ, පුද්ගලයෙක් වස්තුභංගත්වයට පත් වුණාට පස්සේ ඔහුගේ මුළු ව්‍යාපාරයම එතැනින් ඇවර කරනවා, නතර කරනවා වෙනුවට නැවත නැවතත් ගොඩනැඟෙන්න අවස්ථාව ලබා දීමක් මේ පනත හරහා සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම පරාටේ නීතිය යම් කාල සීමාවකට ක්‍රියාත්මක වීම නතර වීමක් සිදු කර ගන්න අදාළ ව්‍යාපාරයට හෝ සමාගමට හැකියාව ලැබෙනවා. විශේෂයෙන්ම බංකොලොත්භාවයට පත් ව්‍යාපාරයට පුනරුත්ථාපන ක්‍රමවේදයක් ඉදිරිපත් කළ වහාම මාස 2ක කාලයක් මේ කියන පරාටේ නීතිය ක්‍රියාත්මක වීම අත්හිටුවන්න හැකියාව ලැබෙනවා වාගේම ක්‍රියාත්මක වීම නතර කර ගන්නත් හැකියාව ලැබෙනවා. ඒ දවස් 60 ඉක්මවා ගියාට පසුව අදාළ දෙපාර්ශ්වයේ - ණයහිමියාගේ සහ ණයගැතියාගේ - එකඟතාව මත ඒ කාලය දීර්ඝ කර ගන්නත් හැකියාවක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවුරුදු 170 ගාණකට පස්සේ මේ පනත පාර්ලිමේන්තුවට ගෙන ඒම තුළින් අපේ රටේ ආයෝජනය කරන්න බලාපොරොත්තු වන ව්‍යවසායකයන්ට යම් ශක්තියක් ලැබෙනවා. මේ පනත හරහා ඔවුන්ට යම් ආකාරයකින් තමන්ගේ දුර්වලතාවක් නොවන අවස්ථාවක නැඟී සිටින්නට අවස්ථාවක් ලැබෙනවා. උදාහරණයක් විධියට "දිට්වා" සුළි කුණාටුව, සුනාමිය වාගේ ආපදා අවස්ථා ගත්තාම, සමහර වෙලාවට සමාගමක හෝ පුද්ගලයන්ගේ සියලු වත්කම් එක මොහොතින් නැති වෙලා යන්න පුළුවන්. එහෙම අවස්ථාවකදී

වුණත් කලින් තිබුණු නීතියට අනුව ඔවුන්ට අවස්ථාවක් ලැබුණේ නැහැ, පුනරුත්ථාපනය වෙන්න; නැවත නැඟී සිටින්න. හැබැයි, පනත සම්මත වීමත් එක්ක නැවතත් ව්‍යවසායකයන්ට අවස්ථාව ලැබෙනවා, විශ්වාසයකින් යුතුව තමන්ගේ ව්‍යවසායයන්, එහෙම නැත්නම් තමන්ගේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට.

ජාතික ජන බලවේගය විධියට අපට මේ රටේ මිනිස්සු බලය දීලා තිබෙන්නේ විධායකයේ කාර්යභාරය නිශ්චිතව ඉටු කරන්නයි. ඒ වාගේම ප්‍රධාන වශයෙන් ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය නිසි පරිදි ඉෂ්ට කරන්න තමයි මිනිස්සු අපට බලය ලබා දීලා තිබෙන්නේ. ඒ කාර්යභාරය තමයි අපි මේ වෙනකොට ඉෂ්ට කරමින් සිටින්නේ. අවුරුදු 76ක් පුරාවට රටේ අවශ්‍යතා අනුව නීතිය යාවත්කාලීන කරන්න එදා ආණ්ඩුවල හිටපු - අද විපක්ෂයේ ඉන්න - බොහෝදෙනෙකුට බැරි වෙලා තිබෙනවා. වර්තමානයේදීත් ඔවුන් ඉටු කරමින් ඉන්නේ විපක්ෂයේ කාර්යභාරයත් නොවෙයි. ඇත්තටම යම් කුඩා සිදුවීමක් අල්ලාගෙන ඒක දිගින් දිගටම ඇදගෙන යාමක් තමයි පාර්ලිමේන්තුව තුළත් අපට දකින්න ලැබෙන්නේ. ඒ නිසා තමයි අවුරුදු 170 ගාණකට පස්සේ යාවත්කාලීන කරන මේ නීතිය ගැන අඩුම තරමින් එක වචනයක් හෝ කථා කරන්න විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙකුට හැකියාවක් ලැබුණේ නැත්තේ. අඩුම තරමින් අවුරුදු 170 ගාණකට පස්සේ සිදු කරන මේ නීති ප්‍රතිසංස්කරණය අගයන්න ඔවුන්ගේ කට ඇරුණේ නැත්තේ මෙන්න මේ කාරණා නිසායි. කොහොම නමුත් අද සම්මත වන මේ පනතත් එක්ක අදට ගැළපෙන ආකාරයට වස්තුභංගත්වය සම්බන්ධයෙන් අදාළ නීතිය යාවත්කාලීන වෙනවා වාගේම මේක අපේ රටේ ආයෝජනය කරන, අපේ රටේ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යවසායකයන්ට ශක්තිය ලැබෙන පනතක් බවට පත් වන බවත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Naina Thambi Marrikkar Mohamed Thahir. You have seven minutes.

[අ.භා. 3.29]

**ගරු නෛනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින ඇත්තටම විවාද කරන්නේ වටිනා පනතක් පිළිබඳවයි. දීර්ඝ කාලයක ඉඳලා නීතිය හා සම්බන්ධව හිටපු අමාත්‍යවරු මේ පනත පාර්ලිමේන්තුවට ගෙනෙන්න උත්සාහ කළාට එය මේ සභාවට ඉදිරිපත් වුණේ නැහැ. විශේෂයෙන් ආර්ථිකමය වශයෙන් පීඩාවට පත් වුණු සුළු පරිමාණයෙන් කර්මාන්ත කරපු කට්ටියට අද සම්මත වන මේ පනත තුළින් සහනයක් ලැබෙනවා.

විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වෙන දේවල් වෙන්නේ නැහැ. උතුරු නැඟෙනහිර යුද්ධය කාලයේත් රටේ ආර්ථිකයට ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. විශේෂයෙන්ම කාලෙන් කාලෙට අපි හිතන දේවල් වෙන්නේ නැහැ. පාස්කු ප්‍රහාරයේදීත් ආර්ථිකයේ හැම අංශයක්ම ප්‍රශ්නවලට මුහුණ දුන්නා. ඒ වාගේම, මෑතකදී ඇති වුණු සුළි කුණාටුව නිසාත් ආර්ථික පැත්තෙන් ලොකු විනාශයක් වුණා, කර්මාන්තකරුවන් විශාල අපහසුතාවකට පත් වුණා.

ඒ වාගේම, අද බලන්න. අපි හිතපු දෙයක් නොවෙයි වුණේ. අද වන විට මැද පෙරදිග යුද්ධය නිසා අපිත් බැට කනවා. හැම අංශයකම රැකියා කරන අය ලොකු පීඩනයකට ලක් වෙනවා. ඇත්තටම යම් කෙනෙක් වාහනයක් ගත්තා නම් එහි ගෙවීම් පරක්කු වුණා නම් වාහනය උස්සාගෙන යනවා. මේ ගෙනෙන පනත තුළින් ඒකට යම්කිසි සහනයක් ලැබෙනවා. ඒ වාගේම, හැම බැංකුවලින්ම ණය අරන් තමයි යම් යම් වෙළෙඳාම් කටයුතු කරන්නේ. කුඩා කර්මාන්ත කරන කට්ටියටත් මේකෙන් යම් සහනයන් ලැබෙනවා. මේ පනත ඇත්තටම අත්‍යවශ්‍ය දෙයක්, කාලෝචිත දෙයක්. අපි එකඟ වෙනවා, මේ පනත සම්මත වෙන්න ඕනෑ කියන එකට.

විශේෂයෙන්ම ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමිය - අධ්‍යාපන ඇමතිතුමිය - කිව්වා, 6 ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2027 පටන් ගන්නවා කියලා. ඒකටත් අපි සහයෝගය දෙනවා කියමින් තව එක කරුණක් ඉදිරිපත් කරන්න ඕනෑ. ප්‍රාථමික අංශය - 1-5 ශ්‍රේණි - සඳහා අලුත් අධ්‍යාපන ක්‍රමය ආරම්භ කළා. දෙවැනි වාරයත් යනවා. නමුත් ප්‍රාථමික අංශයේ දැන් තිබෙන ප්‍රශ්නය තමයි, ඒකට අවශ්‍ය ගුරුවරු පුහුණු කරලා නැහැ. තාක්ෂණය පැත්තෙන් ගත්තොත්, smart board එකක් දෙනවා කිව්වා. ඒකත් නැහැ. දැන් දෙවැනි වාරයත් පටන් අරගෙන මාස 6කට කිට්ටු වෙන්න එනවා. මේ අධ්‍යාපනය අලුත් අධ්‍යාපන ක්‍රමයක්. රට පුරා ප්‍රාථමික අංශයේ පාසල්වලට අවශ්‍ය ගුරුවරු පුහුණු කරලාත් නැහැ, අවශ්‍ය තාක්ෂණික උපකරණ දීලාත් නැහැ. ඉතින් කොහොමද, ඒ දරුවාට ඒ target එකට යන්න පුළුවන් වෙන්නේ? අත්‍යවශ්‍ය දෙයක් නේ, මේක. මේක මාස 6කට කලින් පටන් ගෙන තිබෙන්නේ. ළමයි ලබන වසරේ දෙවැනි වසරටත් යනවා. ළමයි 1 වසරෙදි හරියාකාරයෙන් ඉගෙන ගත්තේ නැත්නම් මේකෙන් ඒ ළමයි කොච්චර අපහසුතාවකට පත් වෙයිද?

ඒ අතරතුර ඊයේ කියනවා, 2027දී 6 ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පටන් ගන්නවා කියලා. ඒක හොඳ දෙයක්. අපි ඒකට විරුද්ධ වෙන්නේ නැහැ. විපක්ෂයේ අය හැටියට අපි අලුත් අධ්‍යාපන ක්‍රමයක් අත්‍යවශ්‍යයි කියලා හැම දාම කියනවා. ඒක කරන්න ඉස්සෙල්ලා එහි අඩිතාලම හරියට දමන්න ඕනෑ. ගුරු සංගම්වලින් කියනවා, මේ ප්‍රශ්න විසඳිලා නැහැ කියලා. ගරු අධ්‍යාපන ඇමතිතුමිය ඒකට ඇහුම්කන් දීලා ඒ කටයුතු කරන්න ඕනෑ. අනික, 6 ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විපක්ෂය කොතැනදිවත් විරුද්ධ වුණේ නැහැ. ඒකෙදි වරද සිදු වුණේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. අධ්‍යාපන අමාත්‍යාංශය හරියාකාරයෙන් පෙළපොත් ටික හදලා මොඩියුලය සකස් කරලා දුන්නා නම් මේ ප්‍රශ්නය එච්චර ලොකුවට යන්නේ නැහැ. එතැනින් කරපු වැරැද්ද විපක්ෂයට පටවලා හරියන්නේ නැහැ. මෙය අත්‍යවශ්‍ය දෙයක්, රටට අවශ්‍ය දෙයක්. කවුරු දේශපාලනය කළත්, කවුරු ආණ්ඩු කළත් අධ්‍යාපනය අද නවීන තාක්ෂණයත් එක්ක යන්න ඕනෑ. අපි ඒක පිළිගන්නවා. නමුත් ඒකට අවශ්‍ය වටපිටාව හදන එක අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීමක්. ඒක ඉෂ්ට කරන්නේ නැතුව නිකම් නමට පටන් ගෙන මේක ක්‍රියාත්මක කරන එක සියලු දරුවන්ට කරන අසාධාරණයක් කියලා මම හිතනවා.

බලන්න, අද කොච්චර ගුරු හිඟයක් තිබෙනවාද කියලා. පළාත් 9ම අරගෙන බලන්න. පළාත් නවයේම ගුරුවරු 30,000ක, 40,000ක විතර ප්‍රමාණයේ හිඟයක් තිබෙනවා. එක් එක් විෂයන්වලට ගුරුවරු නැහැ. ඒ විෂයන්වලට ගුරුවරු දුන්නොත් තමයි ළමයින්ට හරි අධ්‍යාපනයක් ලැබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා අධ්‍යාපනය විෂය භාර ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් ඉල්ලා සිටිනවා.

ලාංකිකයන් හැටියට අපි සියලු ආගම්වලට ගරු කරනවා.

[ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා]

අපේ ආගමේ හැටියට අපිට නෝම්බි අවුරුද්දයි, හජ්ජි අවුරුද්දයි තමයි තිබෙන්නේ. මුස්ලිම් ජාතිකයන් හජ්ජි අවුරුද්ද සමරනවා නම් අනිවාර්යයෙන්ම "කුර්බාන්" දිය යුතුයි. ඒක මෙච්චර කාලයකට ප්‍රශ්නයක් තිබුණේ නැහැ. දැනුත් ආණ්ඩුවෙන් ප්‍රශ්නයක් නැහැ කියලා හිතනවා. නමුත් පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. "කුර්බාන්" දීමේදී පළාත් පාලන ආයතනවලින් - නගර සභා වෙන්න පුළුවන්, ප්‍රාදේශීය සභා වෙන්න පුළුවන් - තමයි අපි අවසර ගන්න ඕනෑ. ඒකට අවශ්‍ය ලිපි ලේඛන ගිහිල්ලා නැහැ. ඒ පළාත් පාලන ආයතන හරහා තමයි permission එක ගන්න තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා මේ ගැන. අපි කියනවා, 28, 29 අනිවාර්යයෙන්ම,- 30 වෙනි දා පෝය දිනය. වෙනත් ආගමක වුවත් අපි වෙසක් පොහොයටත් ගරු කරනවා. වෙසක් පොහොය කටයුතු අනිවාර්යයෙන්ම ඒ ආකාරයෙන්ම ඉෂ්ට වෙන්න ඕනෑ. ඒ අතරේ අපේ රටේ සිටින සියලු ජනතාවට සමඟියෙන් කටයුතු කරන්න අතිගරු ජනාධිපතිතුමාත්, ආණ්ඩුවත් මේකට සහයෝගය දෙන්න ඕනෑ කියලා ඉල්ලා සිටිනවා. ජාතීන් අතර යම් කිසි ප්‍රශ්නයක් මතු කරන්න කටයුතු කරන ආගම්වාදී, ජාතිවාදි අය ඉන්නවා. මේ ආණ්ඩුව ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා මේකෙදි හරියාකාරව කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න අවස්ථාව දුන්නාට ඔබතුමියට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

මීළඟට, ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**

(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)

(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

***විසින් ස්ථිර කරන ලදී.***

*ஆமோதித்தார்.*

*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***අනතුරුව ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) THUSHARI JAYASINGHA left the Chair and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 3.37]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නීතියේ අර්ථයෙන් ඉතාම හොඳ පනතක් මේ සභාවේ සම්මත කරලා ජාතික ජන බලවේගය ආණ්ඩුව සනිටුහන් කරන්නේ අපි දීපු ජන වරමේ පොරොන්දුව ඉෂ්ට කරන තීන්දුවක්. විශේෂයෙන් 1853 වස්තුභංගත්ව පනතේ ප්‍රතිපාදන ඉතාම පැරණියි. ඒ පැරණි පනතේ ප්‍රතිපාදන 2007 අංක 7 දරන සමාගම් පනතත් එක්ක ඒක රාශි කරලා ඊට පසුව ගෙනාපු 1884 අංක 24 දරන වස්තුභංගත්ව පනතත් සමාලෝචනය කරමින් කරන ලද සංශෝධනයක් තමයි අද දවසේ අපි සභාගත කර තිබෙන්නේ.

මෙන්න මේ තීන්දුවත් එක්ක විශේෂයෙන් ලංකාවේ නීතිය ඇතුළේ ආන්දෝලනය වන පරාටේ නීතිය පිළිබඳව සමාලෝචනයක් කරලා, ඒක නව නැම්මකට එළැඹෙන මොහොතක් එනවා. සම්පූර්ණයෙන්ම නොවෙයි, පරාටේ නීතිය පිළිබඳ කාරණය යම් පමණකට හොඳ තැනකට ගෙනෙන්න උත්සාහ කරනවා. පරාටේ නීතිය ඇතුළේ අඩුම තරමින් දින 60ක කාලයක් යෝජනා කරලා තිබෙනවා, මේ නීතිය යටතේ ඔවුන්ට අවශ්‍ය තීන්දු තීරණ ප්‍රමාණයක් ගැනීමට. බංකොලොත්භාවයට පත් වෙච්ච ව්‍යාපාරික මහතුන්ට, වස්තුභංගත්වයට පත් වෙච්ච ව්‍යාපාරික මහතුන්ට liquidation එකකට යටත්ව, දින 60ක කාල සීමාවක් තිබෙනවා නැවත ව්‍යාපාරය පණ ගැන්වීම වෙනුවෙන් කටයුතු කරන්න. ඉතින් ව්‍යාපාරික ප්‍රජාවේ අර්ථයෙන් ගත්තොත්, අද අපි මේ ඉෂ්ට කරමින් සිටින්නේ ඇත්තවශයෙන්ම ව්‍යාපාරිකයන්ගේ අභිලාෂයක්. පොදුවේ ගත්තාම ඒක ජනතා අභිලාෂයක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වස්තුභංගත්වය පිළිබඳව කථා කරනකොට අපට මතක් වෙන්නේ ඉතිහාසයේ අපේ මහා භාණ්ඩාගාරය වස්තුභංගත්ව වුණේ කොහොමද කියන එකයි. ඔබතුමන්ලාට මතකයි, අපේ ආණ්ඩුව බලයට පත් වෙන්න ප්‍රථමයෙන් මහා භාණ්ඩාගාරය ලෙසම; මහ බැංකුව ලෙසම ලෝකයට ප්‍රකාශයට පත් කරලා තිබුණා අපි වස්තුභංගත්වයි කියලා. එවැනි තත්ත්වයක් තුළ තමයි අපි රට ක්‍රම ක්‍රමයෙන් ඉදිරියට ගෙන යන්නේ. දෙවැනි අය වැය විවාදය වෙනකොට මහා භාණ්ඩාගාරයේ රුපියල්, ඩොලර් සංචිත ප්‍රමාණයන් සම්පූර්ණ කර ගනිමින් ආපු වටපිටාවක් ඇතුළේ අද අපි ජනතා අභිලාෂයක් ඉෂ්ට කරනවා මේ පරාටේ නීතිය ව්‍යාපාරික ප්‍රජාවේ අවශ්‍යතාවට බල ගන්වන්නේ කොහොමද කියලා. මෙහෙම වටපිටාවක් ඇතුළේ අපි ඉතාම හොඳ අණ පනතක් ගෙනෙන වෙලාවක අද මේ සභා ගර්භය ඇතුළේ මොනවාද කථා වෙන්නේ?

අපි හොඳ දෙයක් පෙන්වන කොට, ඒ හොඳ දේ වෙනුවට වෙන පැත්තකින් ආණ්ඩු පක්ෂයට ඇඟිල්ල දිගු කරන්න විපක්ෂය සූදානම් වෙලා ඉන්නවා. අද උදේ විපක්ෂයේ අය කරපු කථා

ඇතුළේ මොනවාද කියා තිබෙන්නේ? මේ වෙද්දී ජාතික ජන බලවේගය ආණ්ඩුව අධිකරණයට අත පොවමින්, අධිකරණයට යම් බලපෑමක් එල්ල කරමින් සිටිනවා කියලා ඔවුන්ගේ කථා ඇතුළේ අර්ථ දක්වන්න උත්සාහ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව තරම් මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ඇති කරපු ආණ්ඩුවක් ඉතිහාසයේ තිබුණේ නැහැ. ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි අපි මේ වාගේ ආණ්ඩුවක් දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජන වරමක් අරගෙන තිබෙනවා. ඒ ජන වරම ඇතුළේ අපි පොරොන්දුවක් දුන්නා, ආයතන ස්වාධීන කරනවා, ආයතන ස්වාධීන කිරීම ඇතුළේ රටේ ප්‍රධාන කුලුනු තුන ස්වාධීන කරනවා කියලා. ඒකෙන් එකක් තමයි අධිකරණය කියන්නේ. අධිකරණය නමැති ආයතනයට අපි පූර්ණ ස්වාධීනත්වය දීලා තිබෙනවා. කොහොමද, එහෙම දෙන්නේ? විශේෂයෙන් නීතියට සම්බන්ධ ආයතන වන නීතිපති දෙපාර්තමේන්තුවේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ, ඒ වාගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු සමස්ත පොලිසියේ ස්වාධීනත්වය අප ඇති කරලා තිබෙන්නේ ස්වාධීන ආයතනයක වටපිටාවක් තුළයි. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි අද අධිකරණයේ ස්වාධීනත්වය කියන කාරණාවට අප අවතීර්ණ වෙලා ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපට වක්‍රෝක්තියෙන් වෙන වෙන දේවල් කියන්න අවශ්‍ය නැහැ. ඕනෑ නම්, අධිකරණයට බලපෑම් කරපු ඉතිහාසය පිළිබඳ උදාහරණ අපි කියන්නම්. නෙවිල් සමරකෝන් අග්‍ර විනිශ්චයකාරතුමාගේ නිවස ඉස්සරහට ගිහිල්ලා ගල් ගහපු කට්ටිය ගැන අපි දන්නවා. දැන් ඉන්නේ ඒගොල්ලන්ගේ පසු පරම්පරාව. ඒ පසු පරම්පරාවේ අය දැන් විපක්ෂය පැත්තේ වාඩි වෙලා ඉන්නවා. එහෙම නේද? එක්සත් ජාතික පක්ෂයේ මහත්වරු එදා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගල් ගහපු ඉතිහාසයක් තිබෙනවා. නෙවිල් සමරකෝන් අග්‍ර විනිශ්චයකාරතුමාගේ නිවස ඉස්සරහට ගිහිල්ලා ගල් ගැහුවා. ඒ වාගේම, තමන්ට අවශ්‍ය තීන්දුව දුන්නේ නැති නිසා ශිරානි බණ්ඩාරනායක මහත්මිය අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් පන්නා දැමීමට අදාළ ඉතිහාසය අපි දන්නවා. එතුමිය කෙළින්ම පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, අදාළ අණ පනත්වලටත් විරුද්ධ නඩු අහලා, සෙලාන් බැංකුවේ සභාපතිවරයෙකු ගෙනැල්ලා අග්‍ර විනිශ්චයකාර පුටුවේ තැබුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්න එවැනි සිදුවීම් ගැන තමයි ඉතිහාසයේ කියැවෙන්නේ.

ඒ විතරක් නොවෙයි, අද අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යටත්ව තමයි විනිශ්චයකාරවරුන් පත් කරන්නේ. හැබැයි, ඔබතුමාත් දන්නා ඉතිහාසය තුළ දහඅටවන සහ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ඇතුළේ මොනවාද යෝජනා කරලා තිබෙන්නේ? තනිකර ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි අදාළ විනිශ්චයකාරවරයන් පත් කිරීමක් ගැනයි ඒවායේ කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ අපි පළාත් පාලන මැතිවරණ පිළිබඳ නඩුව අභියෝගයට ලක් කළා. ඊට පස්සේ, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැන් සිටින අග්‍ර විනිශ්චයකාරතුමාගේ මූලිකත්වයෙන් යුත් කමිටුවකින් අතුරු තීන්දුවක් දුන්නා මැතිවරණ තියන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ තියන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් යෝජනා කරන කොට මේ සභාවේ හිටපු පසුපෙළ මන්ත්‍රීවරයෙකු වුණු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහත්මයා කමිටුවකට යෝජනා කරනවා, එහෙම තීන්දුවක් දුන්නේ ඇයි කියලා කරුණු විමසීම සඳහා ඒ තීන්දුව දුන්නු විනිශ්චයකාරවරුන් තුන්දෙනා පාර්ලිමේන්තුවට ගෙන්වන්න කියලා. අන්න, ඉතිහාසය. තමුන්නාන්සේලාට කරුණු දැන ගන්න ඕනෑ නම්, ඉතිහාසය පරිශීලනය කරන්න. අන්න එහෙම තමයි අධිකරණයට අත පෙවීම් කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි ස්වාධීන අධිකරණයක් නිර්මාණය කරලා තිබෙන්නේ. එය කළේ, ජාතික ජන බලවේගය ආණ්ඩුවක් යටතේයි. අන්න ඒක තමයි ඇත්ත කථාව. ඉතිහාසය පිරික්සන කොට පෙනෙනවා, අධිකරණයට බලපෑම් කළේ කොහොමද කියලා.

ඒ විතරක් නොවෙයි, දැන් කට්ටියක් panic වෙලා, කලබල වෙලා ඉන්නවා. මොකද, ආයතන ස්වාධීන වෙලා ඒවායේ ක්‍රියාවලිය ඉදිරියට යනකොට, ඒ වාගේම අධිකරණ ස්වාධීන වෙලා ඒවායේ ක්‍රියාවලිය ඉදිරියට යනකොට, ඇතුළේ කට්ටියක් කෑ ගහලා කියනවා, "දැන් මාර ප්‍රශ්නයක් වේගෙන එන්නේ, මේක ප්‍රජාතන්ත්‍රවාදයට ගැටලුවක්" කියලා; "Democracy is in danger" කියලා තමයි කියන්නේ. ප්‍රජාතන්ත්‍රවාදයේ ගැටලුවක් නිසා වහාම එකතු වෙන්නලු.

මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකේ තේරුම? අපි ජන වරමක් අරගෙන තිබෙනවා, හොරු අල්ලනවා කියලා. අපි ජන වරමක් අරගෙන තිබෙනවා, අපරාධකරුවන්ට දඬුවම් කරනවා කියලා. ඒ කියන්නේ, හොරු අල්ලන්න, අපරාධකරුවන්ට දඬුවම් කරන්න අපි ජන වරමක් අරගෙන තිබෙනවා. එහෙම නම්, ඉතිහාසය ඇතුළේ කියැවෙන්නේ මහජන දේපළ මංකොල්ල කෑමට, මහජන දේපළ අයථා පරිහරණයට අදාළ කාරණාවයි. රටේ දේපළ තමන්ගේ බූදලයක් බවට පත් කර ගත්තු ඉතිහාසයක් තමයි තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි අයට නීතිය ක්‍රියාත්මක කරන එක අධිකරණයේ ස්වාධීනත්වයට ප්‍රශ්නයක්ද? නැහැ. ජනතාව අපේක්ෂා කරන්නේ ඒක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අපරාධයක් කරලා තිබෙනවා නම්, ඒ අපරාධකරුවන්ට අදාළ නඩුව තිබෙන්නේ කවදාද, ඔවුන්ට මොන වාගේ තීන්දුවක් එයිද කියන එක දැනගන්න රටේ ජනාධිපතිට නොවෙයි, පුරවැසියන් කාටත් අයිතියක් තිබෙනවා. ඒවා රටේ ජනතාව දැනගන්න ඕනෑ.

මේ රටේ මිනිස්සු දන්නවා, නාමල් රාජපක්ෂට එරෙහිව නඩු ගණනාවක් තිබෙනවා කියලා; ක්‍රිෂ් නඩුව 29වන දා එනවා කියලා. කෙහෙලිය රඹුක්වැල්ල හොර බෙහෙත් ගෙන්වා මිලියන 97ක් වංචා කිරීමට අදාළ නඩුවක් අප්‍රේල් 27 එනවා කියලා මිනිස්සු දන්නවා. ඊයේ පායලි චම්පික රණවකගේ නඩුව තිබෙනවා කියලා මිනිස්සු දැනගෙන හිටියා. ඔය විපක්ෂය පැත්තේ ඉන්න චාමර සම්පත් මහත්මයාගේ, ඌව පළාත් සභාවේ චෙක්පත් වංචාවට අදාළ නඩුව අප්‍රේල් 30 එනවා. ඒක රටේ ජනතාව දැනගන්න ඕනෑ. එහෙම දැනගත්තාම මොකක්ද තිබෙන ප්‍රශ්නය? සරණ ගුණවර්ධන අල්ලස් ගත්තු නඩුව අප්‍රේල් 30 එනවා. ශෂීන්ද්‍ර රාජපක්ෂගේ නඩුව ජූලි 10 එනවා. සජින් ද වාස් ගුණවර්ධනගේ අල්ලස් නඩුව අප්‍රේල් 22 එනවා. මේවා ගැන දැනගන්නා එක වරදක්ද? ඒක අධිකරණයේ ස්වාධීනත්වයට ප්‍රශ්නයක්ද? නැහැ. ජනතාව ඒක දැනගන්න ඕනෑ. රටේ ජනාධිපතිවරයා නොවෙයි, රටේ සාමාන්‍ය ජනයා මේවා දැනගන්න ඕනෑ. යෝෂිත රාජපක්ෂගේ ඩේසි ආච්චිගේ අයථා වත්කම් නඩුව ජුනි 10 එනවා. ඒක දැනගන්න ඕනෑ. ලක්ෂ්මන් යාපා අබේවර්ධනගේ නඩුව මැයි 12 එනවා. ඒක දැනගන්න ඕනෑ. මර්වින් සිල්වාගේ නඩුව මැයි 25 එනවා. ඒක දැනගන්න ඕනෑ. රවි කරුණානායකගේ නඩු දෙකක් එනවා, මැයි 13 සහ මැයි 15. පියංකර ජයරත්නගේ නඩුව මැයි 07 එනවා. තවත් ඒවා රාශියක් තිබෙනවා. ජනාධිපතිවරයා කිව්වේ එළඹෙන මාස හයක, හතක කාලය ඇතුළේ අපරාධ චෝදනාවලට ලක් වුවන්ට අදාළ විමර්ශන ක්‍රියාවලියක් අධිකරණයේ සිදු වෙනවා කියලායි. ඒක අධිකරණයට කරන බලපෑමක් නොවෙයි. ඒක මහජනයාගේ අභිලාෂය වෙනුවෙන් කරපු දෙයක්. ඒක නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය කවුරු panic වුණත්, කවුරු

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

කලබලයට පත් වුණත් ජන වරමේ අභිලාෂය ඉෂ්ට කරන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව පසුබට වෙන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේ තමුන්නාන්සේලාට මතක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.49]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, කාලය ලබා දීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා මේ රජයට ජනතාව බලය ලබා දීලා තිබෙන්නේ රට අවුරුදු හතරක හෝ පහක කාලයක් පාලනය කිරීමට සහ මේ රට කළමනාකරණය කිරීමට බව. මේ රටේ සංචිත ගොඩ නැඟෙන්නේ, රාජ්‍ය ආදායම ගොඩ නැඟෙන්නේ මේ රටේ බදු ගෙවන ජනතාවගේ බදු මුදල්වලින්. මේ රටේ බදු ගෙවන ජනතාව ඒ බදු මුදල් ලබා දෙන්නේ කොහොමද? තමන්ගේ දහඩිය මහන්සියෙන් උපයන මුදල්වලින්. විශේෂයෙන් තමන්ගේ දරුවාට දෙන්න මිල දී ගන්නා කිරිපිටි පැකට් එකට ගහන බදු, එහෙමත් නැත්නම් තමන්ගේ අම්මාට, තාත්තාට, සහෝදර සහෝදරියන්ට අරගෙන දෙන ඖෂධවලට ගහන බදු, ඒ වාගේම ප්‍රවාහන පහසුකම්වලට ගෙවන බදු ඇතුළුව ඍජු හා වක්‍ර බදුවලින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම තමයි මේ රටේ සංචිත සහ රාජ්‍ය ආදායම වැඩි වෙන්නේ. හැබැයි, අද මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මේ ආණ්ඩුවේ තිබෙන අකාර්යක්ෂමතාව නිසා, දුර්වලතාව නිසා, නොහැකියාව නිසා අපේ රටේ සංචිතත්, රාජ්‍ය ආදායමත් අඩු වෙමින් යනවා. එහෙම නැත්නම්, මේ රටේ මූල්‍ය පාලනය කර ගන්න බැරිව මේ ආණ්ඩුව අද රට කබලෙන් ළිපට ඇද දමලා තිබෙන තත්ත්වයකට පත් කර තිබෙනවා.

ඒකට හොඳම උදාහරණය තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්තු මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා ඉතාම කෙටි කාලයක් තුළ අපේ රටේ සංචිතවලින් සියයට 3.7ක් අඩුවෙලා තිබීම. ඒ විතරක් නොවෙයි. අපේ රටේ ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 2.3කින් අවප්‍රමාණ වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දිගින් දිගටම මේ වාගේ සිද්ධි අනාවරණ වෙනවා අපි දැක්කා. මේ රජය පිළිගත්තා RDA එකේ contractorsලාට රුපියල් මිලියන 280ක් දෙවතාවක් ගෙවලා තිබෙනවා කියලා. මතක තියාගන්න, මේවා මේ රටේ බදු ගෙවන අහිංසක ජනතාවගේ මුදල් බව. ඒ වාගේම, US Postal Service එකට ගෙවපු ඩොලර් ලක්ෂ 6ක මුදලට වෙච්ච දෙයක් නැහැ. එතකොට ඒක නැවත වතාවක් ගෙවන්න සිදු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම රටක් හැටියට අපි කනගාටු වෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මොකක්ද ඒ කාරණය? පෝලන්තය European Union එකට පැමිණිල්ලක් - complaint එකක් - ඉදිරිපත් කරනවා පැහැදිලිවම e-passport tender එකේ ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝනය කරලා මේ ආණ්ඩුව කටයුතු කරපු ආකාරය පිළිබඳව. අද ලෝකයේ අනෙකුත් රජයන් අපේ රටට විරුද්ධව පැමිණිලි කරනවා. මේ කාරණය මතක තබාගන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම European Union එකේ වැදගත්කම අපි කල්පනා කර බලන්න ඕනෑ. ඔවුන් අපට GSP plus ලබා දීලා තිබෙනවා. ඒ තුළින් මේ රටේ නිෂ්පාදන ආර්ථිකය රඳා පවතිනවා, අපනයන ආර්ථිකය රඳා පවතිනවා, මේ රටට ඩොලර් ඉපැයෙනවා, තරුණ ප්‍රජාවට රැකී රක්ෂා ලැබිලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබියදී මේ දූෂිත, අක්‍රමික සහ අකාර්යක්ෂම, පළපුරුද්දක් නැති ආණ්ඩුවේ ක්‍රියාකලාපය නිසා අද ලෝකයේ රටවල් අපේ රටට විරුද්ධව ජාත්‍යන්තරයට පැමිණිලි කරන තත්ත්වයට පත්ව තිබෙනවා. ඒක අපි ඉතිහාසයේ දැක්කේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව අද අපේ රට කොයි තරම් හැල්ලුවට පත් කර තිබෙනවාද?

ඒ වාගේම රුපියල් බිලියන 80ක fertilizer scam එක, එහෙම නැත්නම් පොහොර වංචාව අද සමාජගත වෙලා තිබෙනවා. ඒකෙන් මොකක්ද වෙලා තිබෙන්නේ? කසක්ස්තානය හරහා ඩොලර් 220කට හෝ 230කට ලබාගන්න පුළුවන් පොහොර - යූරියා - මෙට්‍රික් ටොන් එකක් ඕමාන් රාජ්‍යයෙන් මේ අය ලබාගන්න හදන්නේ ඩොලර් 700කට හෝ ඩොලර් 800කට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිවම වංචාවක්. ඒ පොහොර මේ රටට ගෙනැල්ලා ගොඩබාන්න ඩොලර් 290යි යන්නේ. එහෙම තිබෙන පොහොර ටික - යූරියා ටික - මේ අය ගෙන්වන්න හදන්නේ ඩොලර් 700ක්, ඩොලර් 800ක් වාගේ දැවැන්ත මුදලකට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතැන පැහැදිලි වංචාවක් තිබෙනවා. මේ රටේ ඉන්න ගොවියාට ලාබෙට පොහොර ලබා දෙනවා වෙනුවට ගසා කාලා, මුදල් යටි මඩි ගසා ගැනීමේ ක්‍රියාවලියක් තමයි මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරමින් යන්නේ.

අනික් පැත්තෙන්, ගල් අඟුරු වංචාවෙන් මේ රටට වෙච්ච හානිය රුපියල් බිලියන 100කට ආසන්න ප්‍රමාණයක් වෙලා තිබෙනවා. ඒ වාගේම, ඉතිහාසයේ පළමුවැනි වතාවට ඩොලර් 280කට තෙල් බැරලයක් මිලදී ගන්නා ලෝකයේ එකම රට බවට අද මේ රට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, NDB බැංකුවේ රුපියල් බිලියන 13කට ආසන්න ප්‍රමාණයක් - තැන්පතුකරුවන්ගේ මුදල් ද, එහෙම නැත්නම් බැංකුවේ වෙනත් මුදල් ද කියන එක අනාවරණ කරගන්නේ නැතිව - හොරකම් කරලා තිබෙනවා. ඒ මුදල්වලට වෙච්ච දෙයක් නැහැ. ඒ, මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ සල්ලි. NDB එකේ හොරකම් කරපු සල්ලි මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ සල්ලි. එහෙම තිබෙනකොට මේ ආණ්ඩුව නිශ්ශබ්දව කටයුතු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි තත්ත්වයක් තිබියදී තමයි තවත් ඩොලර් මිලියන 2.5ක වංචාවක් මහා භාණ්ඩාගාරයේ සිදු වන්නේ. එහෙම තිබෙනකොට හර්ෂණ සූරියප්පෙරුම මහත්මයා ආරක්ෂා කරන්න ආණ්ඩුව කටයුතු කරනවා. අපට ප්‍රශ්නයක් නැහැ. එතුමා ආරක්ෂා කරන්න. ඔයගොල්ලන් දූෂිත නිලධාරීන්, දූෂිත දේශපාලනඥයන් ආරක්ෂා කරන්න. ඔයගොල්ලන්ට දැන් ඡන්ද දායකයාට වෙච්ච පොරොන්දුව අමතක වෙලා තිබෙනවා.

සත්‍ය ගවේෂකයෝ සංවිධානයේ නිර්මාතෘ ප්‍රේමනාත් සී. දොලවත්ත මහත්මයා විසින් ගරු කථානායකතුමාට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සිදුවීම පිළිබඳව FBI පරීක්ෂණයකුත්, ඒ වාගේම ඒ මරණයට පත් වෙච්ච නිලධාරියාගේ මරණය පිළිබඳව ජාත්‍යන්තර අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් සිදු කරන්න කියපු ඉල්ලීමත් සහිත එම ලිපිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී. ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.56]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இடம்பெறுகின்ற மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்கவகையின்மை (கூட்டிணைப்பு மற்றும் தனிப்பட்ட) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துகளைக் குறிப்பிடலாமென நினைக்கின்றேன்.

மீட்பு மற்றும் புனரமைப்புடன் தொடர்புபட்ட வங்கிகள்கூட இன்று காணப்படுகின்றன. வடக்கு, கிழக்கில் வங்கிகள் செறிவாகக் காணப்படுகின்றன. அவை மக்களிட மிருந்து வைப்புகளைப் பெற்றுக்கொள்வதை நாங்கள் காணக் கூடியதாக இருக்கின்றது. உற்பத்தியில் பங்கெடுக்கக்கூடிய விதத்தில் கடன்கள் அல்லது முதலீடுகளை அந்த வைப்புகள்மூலம் வழங்க வேண்டுமென மக்கள் எதிர்பார்த்து நிற்கின்றார்கள். வைப்புகள் அதிகரிக்கப்படுகின்ற அதே வேளை, அந்த வைப்புகள் அந்தந்த மாகாணங்களில் அல்லது அந்தந்தப் பிரதேசங்களில் எந்தளவுக்கு உற்பத்தியைப் பெருக்குவதற்குப் பயன்படுத்தப்படுகின்றன என்பது பற்றி நாங்கள் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம். நான் இந்த இடத்தில் ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். வடக்கு, கிழக்குப் பிரதேசங்களில் வைப்புச் செய்யப்படுகின்ற நிதியானது, அந்தப் பிரதேசங்களுக்கு எந்தளவுக்கு அபிவிருத்தியைப் பெற்றுக்கொடுத்து இருக்கின்றது? என்ற கேள்வி எழுகின்றது. மக்களால் வங்கிகளில் வைப்புச் செய்யப்படுகின்ற நிதியானது, சில வேளைகளில் பிற மாகாணங்களுக்குக் கொண்டுசெல்லப்பட்டு, மூலதனமாகப் பயன்படுத்தக்கூடிய விதத்தில் கடன்களும் அதன்மூலம் கொடுக்கப்படுகின்றன.

நான் இன்னுமொரு விடயத்தையும் சொல்லியாக வேண்டும். முன்னாள் மத்திய வங்கியின் ஆளுநர் குறிப்பிட்ட விடயம் என்னவென்றால், மக்களின் வாழ்வாதாரத்தை உயர்த்தக்கூடிய விதத்திலும், உற்பத்தியைப் பெருக்கக்கூடிய விதத்திலும், அந்தந்தப் பிரதேசத்தில் அபிவிருத்தியை ஏற்படுத்தக்கூடிய விதத்திலும் வங்கி வைப்புகள் பயன்படுத்தப் பட வேண்டும் என்பதுதான். யுத்தத்தால் பாதிக்கப்பட்டு இருக்கின்ற வடக்கு, கிழக்குப் பகுதிகளில் உற்பத்தியைப் பெருக்கக்கூடிய விதத்தில் வைப்பகங்கள் அல்லது வங்கிகள் செயற்படுகின்றனவா? என்ற கேள்வி எழுகின்றது. நான் இந்த இடத்தில் இன்னுமொரு விடயத்தைச் சொல்ல விரும்பு கின்றேன். அதாவது, வங்கிகள் கடனைக் கொடுத்துவிட்டு, அதனை அறவிடுவதற்கு மக்கள்மீது செலுத்துகின்ற இறுக்கமான போக்குகளை நீக்கி, மக்களுக்குக் கடன்களைக் கொடுத்து உற்பத்தியைப் பெருக்கக்கூடிய விதத்தில் செயற்படக்கூடிய தன்மையை ஏற்படுத்த வேண்டும்.

ஏனெனில், மீட்பு, புனரமைப்பு என்பது நிதியோடு சம்பந்தப்பட்ட விடயமாகக் காணப்படுகின்றது. அந்த விடயத்தை மிகவும் துல்லியமாகவும் சீராகவும் பயன்படுத்தும் பொழுது, உற்பத்தித்துறையை அபிவிருத்தி செய்யக் கூடியதொரு வாய்ப்புக் காணப்படுகின்றது. வைப்புச் செய்தவர்கள் இடம்பெயர்ந்தால் அல்லது காணாமல்போனால் அல்லது சிலவேளைகளில் அவர்கள் இறந்துபோனால், அவர்களால் வைப்புச் செய்யப்பட்ட அந்த நிதி அவர்களுக்கு அல்லது அவர்களது குடும்பத்தவர்களுக்கு எந்தளவுக்கு உதவப் போகின்றது என்ற விடயத்தையும் பார்க்க வேண்டும். வைப்புச் செய்யப்பட்ட நிதி இடம்பெயர்ந்தவர்களுக்கு அல்லது காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு அல்லது இறந்து போனவர் களின் உறவுகளுக்கு ஒப்படைக்கப்படக்கூடிய விதத்தில் கையாளப்படுகின்றனவா? என்பது பற்றியும் சிந்திக்க வேண்டிய தேவை எழுந்துள்ளது.

அதேவேளை, நுண்கடன் நிதி நிறுவனங்கள் - microcredit - கூடுதலான வட்டிகளை மக்கள்மீது திணிக்கின்றன. குறிப்பாகச் சொல்லப்போனால், 10 சதவீதத்தில் இருந்து 100 சதவீதம் வரை அந்த வட்டி வீதங்கள் காணப்படுகின்றன. இந்த நுண்கடன் நிறுவனங்களைக் கையாளுகின்ற அல்லது கண்காணிக்கின்ற அல்லது அவற்றை வழிப்படுத்துகின்ற திறன் எந்தளவுக்கு மத்திய வங்கியிடம் காணப்படுகின்றது என்பதைப் பற்றியும் பார்க்க வேண்டும். மக்கள் பல்வேறுபட்ட பொருளாதாரப் பிரச்சினைகளில் தடுமாறுகின்றபொழுது, அவர்களுக்குக் கடன் கொடுப்பதாக முன்வந்து வீடு தேடி வருகின்றபொழுது அந்தக் கடன்களைப் பெறுவதில் அவர்கள் ஆர்வம் காட்டுகின்றார்கள். ஆனால், கூடுதலான வட்டியோடு அவை அறவிடப்படுகின்ற வேளையில், அவற்றைச் செலுத்த முடியாமல் தற்கொலை செய்கின்ற நிகழ்வுகள் வடக்கு, கிழக்குப் பிரதேசங்களில் மட்டுமல்ல, ஏனைய பிரதேசங்களிலும் காணப்படுவதை அவதானிக்கக் கூடியதாக இருக்கின்றது.

இன்னுமொரு விடயத்தையும் சொல்ல வேண்டும். The Finance Company என்று சொல்லப்படுகின்ற ஒரு நிறுவனம் காணப்பட்டது. மத்திய வங்கியின் அனுசரனையோடு இயங்கிய அந்த The Finance Companyஐப் பொறுத்தமட்டில், அதில் பலர் நம்பிக்கையோடு தங்களுடைய வைப்புக்களைச் செய்திருந்தார்கள். வைப்புக்கள் செய்யப்பட்ட பின்னர், திடீரென்று அந்த நிறுவனம் மூடப்பட்டது அல்லது அதன் செயற்பாடு நிறுத்தப்பட்டு இருக்கின்றது. இதன் காரணமாக அங்கே வைப்புச் செய்தவர்கள் ஏமாற்றப்பட்டு இருக்கின் றார்கள். அவர்களது பெருமளவு நிதி கொடுக்கப்படாமலே அச்செயற்பாடு நடந்திருக்கின்றது.

எனவே, மீட்பு மற்றும் புனரமைப்பு விடயங்களைச் செய்கின்றபொழுது நிதி முக்கியமான மூலமாகக் காணப்படுகின்றது. இவ்வாறு அதிகளவில் நிதியைக் கொண்டிருக்கின்ற நிறுவனங்கள் மூடப்பட்டதனால், அங்கு நிதியை வைப்புச் செய்தவர்கள் மிகவும் திக்குமுக்காடிக் கொண்டு இருக்கின்றார்கள். அவர்கள் அந்தப் பணத்தைப் பெற முடியாமல் திண்டாடுகின்றார்கள். எனவே, இந்த விடயத்தில் அரசு கவனம் செலுத்தி, The Finance Companyஇல் நிதியை முதலீடு அல்லது வைப்புச் செய்தவர்கள் உரிய நிவாரணத்தைப் பெற்றுக்கொள்வதற்கு ஆவன செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அண்மையில் தமிழகத்தில் நடைபெற்ற மாநில தேர்தலில் திரு. விஜய் அவர்கள் ஒப்பீட்டு ரீதியில் அதிகளவான ஆசனங்களைப் பெற்று முதலமைச்சராக வரக்கூடிய நிலையில் காணப்படுகின்றார். அவருக்கு எங்கள் வாழ்த்துகளைத் இந்த இடத்தில் தெரிவித்துக் கொள்கின்றோம். "ஈழத்தமிழர்கள் தொப்புள்கொடி உறவுகள்" என்பதாக அவர் கூறியிருக் கின்றார். அந்த வகையில், எமது மக்களின் பல்வேறுபட்ட

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

பிரச்சினைகளிலும் அவருடைய பங்களிப்பு இருக்க வேண்டும். எங்களுக்கு அவர் மூலமாகப் பல பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டியிருக்கின்றது.

இன்றையதினம், மீட்பு, புனர்வாழ்வு மற்றும் கடனிறுக்க வகையின்மை சட்டமூல விவாதத்தில் வடக்கு, கிழக்கு மக்கள் எதிர்நோக்குகின்ற நிதி சார்ந்த பிரச்சினைகளைக் கையாளக்கூடிய விதத்தில் அரசு செயற்படுவதற் கேற்றவாறு சட்டத் திருத்தங்களை மேற்கொள்ள வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ විවාද කරන්නේ පවරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත පිළිබඳවයි. මෙය ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. විශාල තොරතුරු ප්‍රමාණයක් මෙහි තිබෙනවා. මේ සාකච්ඡා කරන කාරණාවලට ප්‍රවේශ වෙන්නට කලින්, කාරණා කිහිපයක් පිළිබඳව කියන්න මට විනාඩියක්, දෙකක් ගන්න සිද්ධ වෙනවා. ඇත්තටම තොරතුරු රහිතව වාගේම වැරදි තොරතුරු සහිතව තමයි මේ අය කථා කරන්නේ. මහා භාණ්ඩාගාරයෙන් ණය ගෙවීමකදී වෙනත් පාර්ශ්වයකට ඩොලර් බිලියන 2.5ක් යෑම සම්බන්ධයෙන් හදන වැරදි ප්‍රවෘත්ති පිළිබඳව ගොඩක් කරුණු කාරණා ඊයේ විවාදයේදී ඉදිරිපත් කළා. විශේෂයෙන්ම විපක්ෂයෙන් මුලින්ම මතු කරපු කාරණාව තමයි, මේ පිළිබඳව වාර්තා කළේ නැහැ, කිව්වේ නැහැ කියන එක. අපි පැහැදිලිව කියා සිටියා, මේක දැනගත් පසු ඒ අදාළ අංශ සමඟ පරීක්ෂණ කරලා අවශ්‍ය කටයුතු සිදු කළ බව. තොරතුරු සහිතව මේ පිළිබඳව කථා කළ යුතු බව කිව්වත්, ඔවුන් නිරන්තරයෙන් අසත්‍ය කරුණු කිය කියා හිටියා. පළමුවෙන්ම කිව්වා, "නිලධාරින් ස්ථාන මාරු කළා, නිලධාරින්ගෙන් පළිගන්නවා, ලොකු අය හංගනවා, හොරකම් කළා, ඒ මුදල් වෙන වෙන අයගේ ගිණුම්වලට ගිහිල්ලා තිබෙනවා" කියලා. ඒ ආකාරයට වැරදි තොරතුරු ගණනාවක් කිව්වා.

මේ සිද්ධිය වුණාට පස්සේ අවාසනාවන්ත විධියට ඒ නිලධාරි මහත්මයෙක් තමන්ගේ ජීවිතය නැති කර ගත්තා. ඊට පස්සේ ඔවුන්ගේ ප්‍රවෘත්තිය බවට පත් වුණේ මොකක්ද? ඊට පස්සේ ඔවුන් කියා සිටියා, ඒ නිලධාරි මහත්මයා තමයි මේ පැමිණිල්ල කරලා තිබෙන්නේ කියලා. අපි පුන පුනා කිව්වා, ඔහු නොවෙයි ඒ පැමිණිල්ල කරලා තිබෙන්නේ කියලා. ඔවුන් එතැනින් පෙන්වන්න උත්සාහ කරනවා, මේ සම්බන්ධයෙන් පැමිණිල්ල කළේ ඒ නිලධාරියා, ඒ නිසා ඔහුව ඝාතනයට ලක් වුණා ද කියලා සැකයක් තිබෙනවා කියලා. අපි මේ සම්බන්ධයෙන් සමාජයට ඉතා පැහැදිලිව තොරතුරු කියා තිබියදීත් අනවශ්‍ය බියක්, සැක සංකාවක් මතු කරන්න හදනවා. අපි මේ සම්බන්ධයෙන් ඉතා වගකීමෙන් කරුණු කියා තිබෙනවා. ඒ මියගිය නිලධාරියා නොවෙයි මේ පැමිණිල්ල කළේ. එහෙම නම් මේ පැමිණිල්ල කළේ කවුද කියලා ඔවුන් ඉදිරිපත් කරන්න ඕනෑ. ඊට පස්සේ කියා සිටියා, එම මියගිය නිලධාරියාගේ බිරිඳ මරණ පරීක්ෂණයක් ඉල්ලුවා කියලා. එවැනි වැරදි තොරතුරුත් මේ අය ඉදිරිපත් කළා.

ඒ වාගේම අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඊයේ නොමඟ යවන විධියට සමහර කාරණා කිව්වා. ඊයේ එතුමාගේ පක්ෂයේ නායකයා වන ගරු විපක්ෂ නායකතුමා අසන ලද ප්‍රශ්නයකට මම පිළිතුරු ලබා දුන්නා. එතුමා ප්‍රශ්නයකින් ඇහුවා, ඩොලර් මිලියන 2.5ක් ගෙවලා තිබෙන්නේ කවදා ද කියලා දින වකවානු සහිතව කියන්න කියලා. එතකොට මම ඒ සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කළා. එතැනදී මම පැහැදිලි කර පෙන්වා දුන්නා, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5 හැදිලා තිබෙන්නේ මෙන්න මේ මේ විධියට කියලා. ඒක ඇතුළේ කුඩා ප්‍රමාණයේ ගෙවීම් කළ ඒවාත් තිබෙනවා. ලොකු ප්‍රමාණයේ ගෙවීම් කළ ඒවාත් තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5 කියන්නේ ඒ සියල්ලෙහි එකතුව. ඒ වාගේ වැදගත් මන්ත්‍රීවරයෙකුත් මගේ නම කියලා කියනවා, "මෙන්න ඊයේ මේ ඇමතිවරයා තවත් ඩොලර් නවලක්ෂ අනූහත්දහස් ගණනක් ගෙවපු බව ප්‍රකාශ කළා" කියලා. එතකොට මිනිසුන්ට ප්‍රශ්නයක් මතු වෙනවා, "ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් ගෙවලා තිබෙනවා, තවත් ඩොලර් නවලක්ෂ අනූහත්දහස් ගණනක් ගෙවපු බව ඊයේ අමාත්‍යවරයා කිව්වා" කියලා. ඒ කොටස විතරක් cut කරලා ප්‍රචාරය කරනවා. මේක ඔවුන් නොදැනුවත්ව කරන දෙයක් නොවෙයි, හිතා මතාම කරන වැරැද්දක් ද කියන සැකය අපට තිබෙනවා. මොකද, ඒ ඩොලර් නවලක්ෂ අනූහත්දහස් ගණන කියන්නේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ට ඇතුළත්ව තිබ්බ වවුචර් ප්‍රමාණය; වවුචර් 10ක ප්‍රමාණය. මේ කරුණුවලින් පෙනෙන දේ තමයි, එවැනි ඉතාම නරක පන්නයේ ප්‍රචාරයක් විපක්ෂය විසින් ගෙන යනවා කියන එක.

ඊයේ ෆේස්බුක් හරහා ප්‍රචාරය වූ දේවල්වල අපි නොකරපු ප්‍රකාශත් තිබුණා. ඒ වාගේම, මගේ ඡායාරූපයකුත් දාලා ෆේස්බුක් එකේ පෝස්ටුවක් යනවා, අපි මේ ඉදිරිපත් කරපු කරුණු පෙළ ගැහිලා තිබුණේ කොහොමද කියලා. මේ ගනුදෙනුව සිද්ධ වුණේ කොහොමද, ඒ නිලධාරින් කටයුතු කළේ කොහොමද, මේ පිළිබඳව පරීක්ෂණ යනවා කියලා එහි තිබෙනවා. එතකොට පෝස්ටුව හදනවා නියෝජ්‍ය මුදල් ඇමතිවරයා කිව්වා කියලා මේ ගනුදෙනුවට, මුදල් වංචාවට සම්බන්ධ වෙලා තිබෙන්නේ අදාළ සැක සහිත පුද්ගලයා කියලා. මේ විධියට, අර මරණයට පත් වෙච්ච පුද්ගලයාව ඇදලා ඉතාම නරක දෙයක් කරනවා. ඒක නොකළ යුතුයි කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ඇත්තටම මේ සම්බන්ධයෙන් විපක්ෂයට සැබෑ වුවමනාවක් තිබෙනවා නම්, ඔවුන් කරන්න ඕනෑ මොකක්ද? මෙතැන ප්‍රශ්නයක් වුණා, ප්‍රශ්නයක් වෙලා තිබෙනවා කියලා අපි කවුරුත් පිළිගන්න ඕනෑ. මුදල් හරහා ණය ගෙවීම් තුන්වැනි පාර්ශ්වයකට ගිහිල්ලා තිබෙනවා. ඒක තමයි කාරණය. ඒක තමයි හොයමින් ඉන්නේ. එම නිසා, මේක ගැන සොයා ගන්න නම්, දන්නේ නැති තොරතුරු සමාජගත කරලා විකෘතියක් හදනවා වෙනුවට ඒ තොරතුරු අදාළ පරීක්ෂණ අංශවලට ලබා දෙන්න ඔබටත් වගකීමක් තිබෙනවා. අද ලබා ගත් තොරතුරුවලට අමතරව හෙට අනිද්දා වන විට තව අතිරේක තොරතුරු හෙළිදරව් වෙන්න ඉඩ තිබෙනවා. ඒ පරීක්ෂණ අංශ අදාළ පරීක්ෂණ සිද්ධ කරගෙන යනවා. එම නිසා ඔබේ වගකීම විය යුතු වන්නේ පරීක්ෂණවලට සහාය දීම මිසක්, වෙනත් කාරණයක් නොවෙයි. එහෙම නැතිව, එක අවස්ථාවකට එක බොරුවක් බැගින් ඉදිරිපත් කරමින් මේවා දිගටම ඇදගෙන එන්න එපා.

පසුගිය දවස්වල කන්ටේනර් සම්බන්ධව ප්‍රශ්නයක් මතු කළා. ඒ පිළිබඳව අපි සත්‍ය තොරතුරු ඉදිරිපත් කරලා සමාජගත කළාට පස්සේ දැන් ඒ ගැන සාකච්ඡා කරන්නේ නැහැ. ගල් අඟුරු ප්‍රශ්නය

ගත්තත් එහෙමයි. මේ විධියට එක අවස්ථාවකට එක බොරුවක් බැගින් ඉදිරිපත් කිරීමේ න්‍යාය අයින් කර ගත යුතු වනවා.

දැන් මම අද දවසේ මාතෘකාවට එන්නම්. අද අපි කථා කරන පනතේ ප්‍රධාන පදනම වන්නේ, ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැළී ඉන්න තනි පුද්ගලයන්, ව්‍යාපාර, ඒ කියන්නේ corporates, සාමූහිකව ව්‍යාපාර කරන අය, සමාගම් ඒ ව්‍යාපාර කටයුතු කරගෙන යනකොට විශේෂයෙන්ම බුන්වත්භාවය එක්ක ගනුදෙනු කිරීමේදී මුහුණ දෙන ප්‍රශ්නවලදී ඒ පුද්ගලයන්ගේ හෝ ව්‍යාපාරවල ආර්ථිකය සවිමත් කරන්න මේ පනත උදව් වෙන්නේ කොහොමද කියන එකයි. අපි කවුරුත් දන්නවා, ව්‍යාපාර කටයුතු කරගෙන යනකොට ණය ගන්න සිද්ධ වන බව. ඒ වාගේම සමහරුන් ඉතිරි කර ගත් ධනය සහිතව ව්‍යාපාර කටයුතු කරනවා. එලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යනකොට විවිධ හේතු නිසා එම ව්‍යාපාර බිඳ වැටෙන්න පුළුවන්. එහිදී මුදල් ප්‍රවාහයේ ගැටලු ඇති වෙන්න පුළුවන්, අලාභ ඇති වෙන්න පුළුවන්. සමහර වෙලාවට ඊට හේතු වන්නේ ඔවුන්ගේ අභ්‍යන්තර කාරණා වෙන්නත් පුළුවන්. ඒ ව්‍යාපාරවලත් වැරදි, වංචා සිදු වෙන්නත් පුළුවන්. ඒ වාගේම සමහර වෙලාවලදී ඔවුන්ට පාලනය කර ගන්න බැරි බාහිර සාධකත් ඊට හේතු වෙන්න පුළුවන්.

මේ මොහොත වන විට අපි කවුරුත් දන්නවා, ලෝක පරිමාණයෙන් ඇති වෙච්ච යුද්ධයකදී ලෝකයේ හැම රටකටම තෙල් මිල ඉහළ යෑමේ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙන බව. ඒ විධියේ විවිධ කාරණා මත ව්‍යාපාරයක් කරන සාමූහික ආයතනයකට හෝ තනි පුද්ගලයෙකුට තමන්ගේ - තමන් සතුව තිබෙන - සමස්ත වත්කම් ප්‍රමාණයට වඩා වැඩි වගකීම් ප්‍රමාණයක් ලැබෙනවා නම්, එතැනදි ප්‍රශ්නයක් පැන නඟිනවා.

උදාහරණයක් විධියට ගත්තොත්, ඔහු සතුව තිබෙන සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් 100යි, නැත්නම් රුපියල් මිලියන 100යි, නැත්නම් රුපියල් කෝටි 100යි, හැබැයි ඔහුට ඊට වඩා වැඩි ප්‍රමාණයක් ගෙවන්න සිදුවීම දැක්විය හැකියි. එහෙම නම් ඔහු සතුව තිබෙන සියලු වත්කම් පාවිච්චි කළත්, ඔහුට ඒ වත්කම්වලින් වගකීම් පියවන්න පුළුවන්ද කියන ප්‍රශ්නය ඇති වනවා. එවැනි තත්ත්වයක් සමාජයේ දිගින් දිගටම පැවතීම ගැටලු සහිත නිසා තමයි අපි මෙවැනි පනතක් ගෙනාවේ.

අපේ දැනට පවත්නා නීති රීතිවලදී, පුද්ගලයින් සම්බන්ධයෙන් තිබෙන බුන්වත් නීතිය යටතේදීත් ඔවුන්ට අවස්ථාවක් දීලා තිබෙනවා, නීතිමය රැකවරණයක් දීලා තිබෙනවා, තමන්ගේ වත්කම්වලට වඩා වගකීම් ප්‍රමාණය වැඩි නම් එය ප්‍රකාශයට පත් කරන්න. ඒ කියන්නේ, බුන්වත් වීම නිසා මට මේ මුදල ගෙවා ගන්න බැහැ කියන එක දැනුම්ද දීම. ඊට කලින් ඔවුන්ට සරණ වන්න කිසිදු පියවරක් තිබුණේ නැහැ. ඒ අනුව තමයි පුද්ගලයන් සම්බන්ධයෙන් කටයුතු කළේ. කෙනෙකු හෝ ව්‍යාපාරයක් බුන්වත් තත්ත්වයට පත් වුණාට පස්සේ ඒ බුන්වත්භාවය එක්ක හිර වෙලා කටයුතු කිරීම සඳහා තමයි මේ නීති රීති ටික තිබෙන්නේ. නමුත් අපි අද ඉදිරිපත් කරන පනතේදී ප්‍රධාන වශයෙන්ම සිද්ධ කරන්නේ මෙයයි. එවැනි තත්ත්වයකදී, බුන්වත්භාවයට යන්න කලින් ඔවුන් ව්‍යාපාර කටයුතු කරද්දි, ආර්ථික කටයුතු කරද්දි තමන්ට මේ වගකීම් පියවා ගන්න බැරි වෙයි, මූල්‍ය අර්බුදයක් පැන නඟියි කියලා යම් අවස්ථාවකදී යම් සංඥාවක් දැනුනොත්, ඒවාට ගන්නා පියවර සහ ඒ මැදිහත්වීම කරන්නේ කොහොමද කියන එක තමයි මේ පනතේ පදනම බවට පත් වී තිබෙන්නේ.

අපි ආණ්ඩුව ලබා ගන්නකොට රටත් බුන්වත් කරලා තිබුණා. රටත් ඉදිරියට යන්නේ නැතුව ආර්ථික වශයෙන් හිර කරලා, පටි තද කර ගන්න කියලා, ආනයන සීමා දමා තමයි යම් සංචිත ප්‍රමාණයක් රැක ගත්තේ. ඒ කියන්නේ පඩි නඩි වැඩි කිරීම් කිසිවක් කළේ නැහැ. ඒ කියන්නේ බුන්වත්භාවයක රටක් හිර කරලා හිටපු කණ්ඩායම, ඒවාට අඩු වැඩි වශයෙන් සම්බන්ධ වෙච්ච කණ්ඩායම තමයි බොහෝදුරට මේ චෝදනා ඉදිරිපත් කරන්නේ. අපට පුළුවන්කම ලැබුණා, බුන්වත්ව තිබුණු රටේ, හිර කරලා තිබුණු රටේ, ආර්ථික වශයෙන් ගැට ගහලා තිබුණු රටේ, බැඳලා තිබුණු රටේ ආර්ථිකය ප්‍රසාරණය කරමින් ඉදිරියට අරගෙන යන්න. එහෙම නම් සමස්තයක් වශයෙන් රටක් විධියට ගත්තත්, මේ බුන්වත්භාවයෙන් මිදීමේ පාර තිබෙන්නේ, ආර්ථික ක්‍රියාවලියට ඔවුන්ව සම්බන්ධ කර ගන්නකොටයි; රටක් විධියට ඊට සම්බන්ධ වෙමින් ඉදිරියට යනකොටයි. එතකොට මේ මොහොතේදීත්, මේ තිබෙන ලෝක තත්ත්වයේදීත්, ලංකාවේ පවතින තත්ත්වයේදීත් අපි කිසිදු ආකාරයක කිසිදු සීමා කිරීමකින් තොරව ආර්ථිකය ඒ ගලාගෙන යන ක්‍රියාවලිය ඇතුළේම ගමන් කරවමින් තමයි මේ ප්‍රශ්නවලට උත්තර හොයමින් තිබෙන්නේ. ඒ නිසා අද ඉදිරිපත් කරන මේ පනතත් ඒ හා සමානව වැදගත් වනවා. ව්‍යාපාරිකයාව, තනි පුද්ගලයාව බුන්වත් වෙන්න ඉඩ හැරලා බුන්වත්භාවයට ගියාට පස්සේ මොකක්ද උත්තරය කියලා හොයනවා වෙනුවට ඔවුන්ට නැවත ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ වෙන්න, ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ වෙන්න අවශ්‍ය පරිසරය, නීතිමය පරිසරය නිර්මාණය කරමින් වැඩ කටයුතු කිරීම නිසා අපි ගමන් ගන්නා අපේ ආර්ථික දර්ශනයට මෙය සමපාත වෙනවා.

ඒ අනුව මම කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්නම්, මෙම පනතේ ප්‍රධානම අවශ්‍යතාව බවට පත් වන්නේ මොකක්ද කියන එක ගැන. තිබුණු පනත්වලින්, ඒ පැරණි නීතිරීතිවලින් වර්තමානයේ තිබෙන අර මම කලින් කියපු කරුණු කාරණාවලට උත්තර හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා දැන් අපට ඒවාට උත්තර හොයන්න වෙනවා. ඒ වාගේම පුද්ගලයන් සම්බන්ධයෙන් තිබුණේ වෙනම නීතියක්, සමාගම් සම්බන්ධයෙන් තිබුණු සමාගම් පනතේ උත්තරය තිබුණේ, සමාගම් ඈවර කිරීම - liquidation. ඒ වෙනුවට දැන් අපි සමාගම් සහ පුද්ගලයන් කියන කොටස් දෙකම එකට ගෙනැල්ලා මේ පනත යටතේ සාකච්ඡා කරනවා. බුන්වත්භාවය විතරක් නොවෙයි, ඔවුන්ව බේරා ගැනීම, පුනරුත්ථාපනය කිරීම සහ බුන්වත්භාවයට අදාළ කටයුතුත් මේ අනුව කරනවා.

ඒ වාගේම අද අපි ලෝකයත් එක්ක ගනුදෙනු කරනවා. එහිදී විදේශීය ආයෝජන අපට ලැබෙනවා. අපි ඒ ආයෝජකයින්ගේ විශ්වාසය දිනාගන්න ඕනෑ. බුන්වත්භාවය පිළිබඳව ලෝකයේ ගොඩක් දියුණු නීති රීති පැන නැඟිලා තිබෙනවා; විශේෂයෙන්ම එංගලන්තයේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ. මේ පනත් කෙටුම්පත් සාදනකොට ඒ නීති රීති පරිශීලනය කරලා ජාත්‍යන්තර මට්ටමේ තිබෙන භාවිතයන්, නීති රීතිත් මේකට ඇතුළත් කරලා තිබෙනවා. එම නිසා ඒ පදනම ඉතාම ශක්තිමත් පදනමක්.

ඒ අනුව මේ පනතේ ප්‍රධාන අරමුණු ගණනාවක් තිබෙනවා. මම කලින් කිව්වා වාගේ, යම් හෙයකින් පියවරෙන් පියවර බුන්වත්භාවයට එනකොට ඉතා වැදගත් වන දෙයක් තමයි, වත්කම්වලට වඩා වගකීම් වැඩි නම් ප්‍රශ්නයක් ඇති වීම. හැබැයි, අතීතයේ තිබුණු බුන්වත් නීතිය අනුව ඒ වත්කම් ටික උපලබ්ධි කරන්න ගියාම බොහෝදුරට ඒ වින්දිත පාර්ශ්වයට, ඒ කියන්නේ ණයගැතියාට තමන්ගේ වත්කම් ටික නියම මිලට විකුණා ගන්න බැරි වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි සාමාන්‍යයෙන් කළමනාකරණයේදී එයට කියනවා, bankruptcy cost කියලා. බුන්වත් කියලා ප්‍රකාශ වෙච්ච ගමන්, බුන්වත් කියන ලේබලය ඇලවුණු ගමන් ඔහු සතුව තිබෙන දේපළක්, වත්කමක් වෙළෙඳ පොළේ තිබෙන මිලට විකුණා ගන්න බැරි වෙනවා. කවුරුත්

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

දන්නවා, මේ පුද්ගලයා ප්‍රශ්නයක ඉන්නේ, අර්බුදයක ඉන්නේ කියලා. එම නිසා කුණුකොල්ලෙට ඒ දේපළ විකුණන්න සිදු වෙනවා. ඔබතුමන්ලා දකින්න ඇති, පෞද්ගලික අංශයේ සමහර ව්‍යාපාරවලට මේක ගොඩක් තදින් බලපා තිබෙන බව. ඒක තමයි ඇත්ත. Bankruptcy cost එකක් එතැන තිබෙනවා. මේ පනතින් අපි මොකක්ද කරන්නේ? මේ පනතේදී අපි ප්‍රතිසාධන සම්පාදනය කරලා තිබෙනවා. ඔවුන්ගේ වත්කම් සැබෑ වෙළෙඳ පොළ වටිනාකමට උපලබ්ධි කර ගැනීමේ යන්ත්‍රණය මේ තුළ අපි සාකච්ඡා කර තිබෙනවා. ඒක ඉතාම වැදගත් එකක්.

ඒ වාගේම මේ පනතේ ප්‍රධාන අරමුණ වන්නේ, බුන්වත් වීමේදී උත්තර හොයන එක නොවෙයි, බුන්වත් වෙන්න කලින් ඔහුව නැවත නඟාසිටුවන්නේ කොහොමද කියන කාරණයයි. ඒ වාගේම එයට උත්තරය හොයනකොට බුන්වත් වීම සම්බන්ධයෙන් ණය ගැනීම ගැනත් බලන්න වනවා. එතකොට ණය දුන් පාර්ශ්වයන් ද තිබෙනවා. අනෙකුත් ව්‍යාපාර කටයුතු කරන පාර්ශ්වයන් ද තිබෙනවා. එවැනි ගැටලුවක් ආවාම ඒ ණය හිමියායි, ණයකරුවායි දෙන්නා අතර ගනුදෙනු කරලා ඔබ කැමැති විධියට මේක බේරා ගනිල්ලා කියන කාරණය වෙනුවට නීති රීති, අණ පනත් හදලා සාමූහික මැදිහත්වීමක් මේ තුළ කරනවා. ඒ සඳහා තමයි මේ අධිකාරිය පිහිටුවන්නේ. ඒ අධිකාරියේ වගකීම බවට පත් වන්නේ ඒ කාරණයයි. ඒ සාමූහික මැදිහත් වීමෙන් සියලු තොරතුරු සාකච්ඡා කරලා, කල්පනා කරලා කියනවා, මේ ව්‍යාපාරය ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියලා. ඒක ඉතාම වැදගත් අරමුණක්.

ඒ වාගේම යම් හෙයකින් බුන්වත්භාවයට පත් වුණොත් - මෙහිදී අපි බුන්වත් කියන්නේ බංකොලොත් කියන එකයි - එතකොට ඔහුට ආර්ථිකයේ, සමාජයේ තැනක් හිමි වන්නේ නැහැ. නමුත්, බුන්වත්භාවයේදී ඔහු වත්කම් අදාළ පරිදි විකුණා ණය බේරුවාට පස්සේ ඔහුට නව ජීවයක්, අලුතෙන් ව්‍යාපාර කටයුතු කරන්න නව හැකියාවන් ලබා ගන්න අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීම තමයි මේ පනත තුළින් කරන්නේ.

මෙහි ප්‍රධානම කොටස තිබෙන්නේ, ආයතනික රාමුව තුළයි. මේ ආයතනික රාමුවේ නියාමන අධිකාරිය පිහිටුවනවා. මේ නියාමන අධිකාරියේදී central regulatorට තමයි මේ බලඅධිකාරිය ලැබෙන්නේ, ඒ වගකීම පියවීම සඳහා වත්කම් කළමනාකරණය කිරීමට. ඒ වාගේම ඒ කටයුතුවලදී - වත්කම් උපලබ්ධි කර ගැනීමේදී - වෘත්තිකයන්ටත් මැදිහත් වන්න සිදු වනවා, වත්කම් අගය කිරීම පිළිබඳව, විකිණීම පිළිබඳව, හිලව් කිරීම පිළිබඳව. එම නිසා වෘත්තිකයන්ට බලපත්‍ර ලබා දීමේ කාර්යය, ඒ වාගේම මේ ක්‍රියාවලිය පිළිබඳව මාර්ගෝපදේශ ලබා දීමේ කාර්යය සහ අධීක්ෂණය කිරීමේ කාර්යය මේ නියාමන අධිකාරියට පැවරෙනවා. ඒ වාගේම අපට නිල ග්‍රාහකයෙක් - receiver කෙනෙක් - පත් කිරීමේ පුළුවන්කමත් මේ තුළින් ලැබෙනවා. ඒ කියන්නේ, වත්කම් එක ස්ථානයකට ගෙනැල්ලා, ඒ වත්කම් අධීක්ෂණය කරලා, ඒ වත්කම් අනවශ්‍ය විධියට, වංචනික විධියට වෙන වෙන පාර්ශ්වවලට මාරු කරන්න බැරි වන ආකාරයට මේ ග්‍රාහකයා සතු වීම. එම නිසා වෘත්තිකයන් බිහි වීමත් මේ අනුව සිද්ධ වනවා.

ඒ වාගේම වැදගත් වන ඊළඟ කාරණය තමයි, මේ පනත ඇතුළේ structured system එකක් තිබීම. අපි කවුරුත් දන්නවා, ඒ නීති රීති ඇතුළේ පරාටේ නීතිය ගැනත් සාකච්ඡා කළ බව. මෙතැනදී ණයගැතියාට ඔහුගේ ණය එකවරම ගෙවා ගන්න බැරි වූ පමණින්ම ණය හිමියාට අවසර දෙන්නේ නැහැ, ඒ දේපළ අත්පත් කර ගැනීමට. ඔහුට තාවකාලික ණය ආරක්ෂණයක් ලබා දෙනවා. ඒ කියන්නේ, තමන්ගේ වත්කම් අනෙක් පාර්ශ්වයෙන් එකවර ඉවත් කර ගැනීමේ හැකියාව නැති කරනවා. ඒ වාගේම මේ ක්‍රියාවලිය ඇතුළේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියටත් ඔවුන්ට උදව් උපකාර කරනවා.

ඒ වාගේම තමයි බහු ස්තර පරිපාලන ක්‍රමවේදය. පළමුවෙන්ම බලන්නේ මේ ව්‍යාපාරය නැවත නඟාසිටුවීමට ඔහුට ඒ මුදල් ප්‍රවාහ ටික ලබා ගන්න පුළුවන් වන්නේ කොහොමද කියන කාරණයයි. ඒ සඳහා උපදෙස් ලබා දීම ගත්තොත්, ඇත්තටම වැදගත් වන්නේ මෙයයි. අපි කවුරුත් දන්නවා, පසුගිය වකවානුවේදී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත බිඳ වැටෙනකොට මේ මේ කටයුතු කරන්න කියලා තිබෙන නීති රීති රාමුව ඇතුළේ මහ බැංකුව පවා උපදෙස් ලබා දුන් බව. හැබැයි, කිසිවෙක් උපදෙස් ලබා දෙන්නේ නැහැ, මේ ව්‍යාපාර නැවත ගොඩ අරගෙන ඉස්සරහට අරගෙන යන්නේ කොහොමද කියන එක සම්බන්ධව. මේ තුළින් අපට යම් අවස්ථාවක් නිර්මාණය වනවා, ව්‍යාපාරය බුන්වත් වෙලා කෙළවර කරනවා වෙනුවට, ඒ ව්‍යාපාරය නැවත නඟාසිටුවීමට අවශ්‍ය මුදල් ප්‍රවාහය අත්පත් කර ගැනීමට. ඒ මුදල් ප්‍රවාහය මෙන්න මේ විධියට තමයි අපි ගෙවන්නේ, එම නිසා ණය සැලසුම් නැවත සකස් කරන්න - reschedule කරන්න, restructure කරන්න - ඒවා නියාමනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ මහ පෙන්වීම ඒ අතර තිබෙනවා. ඒ අර්ථයෙන් ගත්තොත්, ව්‍යාපාරිකයින්ගේ විශ්වාසයත් මෙහිදී ගොඩනැඟෙනවා. අපි කථා කරන ව්‍යාපාර කටයුතු පහසු කිරීම - ease of doing business - වේගයෙන් ඉහළට ගෙන යන්න පුළුවන් ආකාරයට ආයෝජකයින්ගේ විශ්වාසයත් මේ අනුව ගොඩනැඟෙනවා කියන කාරණය මා මෙහිදී සඳහන් කරන්නට ඕනෑ.

බුන්වත්භාවයේදී තිබෙන තව ක්ෂේත්‍රයක් තමයි, willful defaultersලා. අපි කිව්වා වාගේ, ඇත්තටම ආර්ථිකමය වශයෙන්, රැකියාව වශයෙන් ව්‍යාපාර කරන කණ්ඩායම්වලට අපි උදව් කරන ගමන්ම, පවතින නීති රීති රාමුව උපයෝගී කරගෙන සැබෑ ලෙසම වංචනිකව යම් අකටයුත්තක් කරනවා නම් මේ අනුව ඒ සඳහාත් අපි යම් වැළැක්වීමක් සිද්ධ කරනවා. මෙතැනින් ප්‍රධාන වශයෙන් මතු වන්නේ මෙයයි. ලෝකයේ තිබෙන පර්යේෂණවලින් හොයාගෙන තිබෙනවා, ease of doing business වැඩි කිරීම හරහා, ඒ දර්ශකයේ ඉහළට එනකොට සෘජු විදේශ ආයෝජනත් සාමාන්‍යයෙන් සියයට 10ත්, සියයට 20ත් අතර ප්‍රමාණයකින් ඉහළ යන්න පුළුවන් කියලා. දැනටමත් අපි අපේ ආයෝජන මණ්ඩලය - BoI, Board of Investment of Sri Lanka - හරහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා, ලංකාවට ආයෝජන කැඳවාගෙන එන්නේ කොහොමද කියන එක සම්බන්ධව. ඒ සඳහා අවශ්‍ය පසුබිම තමයි මේ තුළිනුත් නිර්මාණය වෙලා තිබෙන්නේ. අපි කියන්න යන්නේ නැහැ, මේ කාල පරිච්ඡේදයේදී විශාල ප්‍රමාණයේ විදේශීය ආයෝජන ආවා කියලා.

නමුත්, මේ පනත මඟිනුත් අපට සෘජු විදේශ ආයෝජන වැඩි ප්‍රමාණයක් ලංකාවට ගෙන්වා ගැනීමට උදවු ලැබෙනවා. ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. ඒ වාගේම ආයෝජන කලාප ලංකාව පුරා දැන් ව්‍යාප්ත කරමින් තිබෙනවා. ඒ සඳහා ගන්නා වූ අනෙකුත් ක්‍රියාමාර්ග තුළ ලංකාව මේ වෙනකොට අත්පත් කරගත් ආර්ථික ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහිල්ලා වඩාත් හොඳ වෙළෙඳ හා ආයෝජන පරිසරයක් නිර්මාණය කරමින් විදේශීය ආයෝජන වැඩි කිරීම හරහා අපට තිරසාර ආර්ථික සංවර්ධනයක් කරා වේගයෙන් ඉදිරියට යන්න අවශ්‍ය පසුබිම නිර්මාණය කර ගැනීමට මේ පනත උපයෝගී වෙනවා කියන කාරණයත් සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.19]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක, ලංකාවේ වැඩ කරන අයට, වැඩ ලබා දෙන ව්‍යාපාරවලට ඉතාම හිතකර පරිසරයක් ගෙන දීම උදෙසා නිර්මාණය වන පනතක්. අද ඉතාම වැදගත් දවසක්. මොකද, අද මේ පනත වෙනුවෙන් අදහස් දක්වන්න මටත් අවස්ථාව ලැබිලා තිබෙනවා.

විශේෂයෙන්ම ලංකාවේ වැඩියෙන් අවධානයට ලක් නොවන ව්‍යාපාරිකයින් රැක ගැනීම උදෙසා වසර ගණනාවක් තිස්සේ සැලසුම් කරලා ගෙනාපු මේ පනත පසුගිය ආණ්ඩුව කාලයේ නිර්මාණය වුණු පනතක් බව මට අද දැනගන්න ලැබුණා. මේ පනත සෑදීම සඳහා චානක ද සිල්වා මහතා ඇතුළු කණ්ඩායමක් දායක වෙලා තිබෙනවා. එතුමාට මම ස්තුතිවන්ත වෙනවා, ලංකාව වෙනුවෙන් මෙවැනි විශාල වැඩක් කිරීමට දායකත්වය සැපයීම සම්බන්ධව. මින් ඉදිරියට ආණ්ඩුව පැත්තෙන් අදහස් දක්වන අයගෙන් මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඔබේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මේ වෙනකොට වසර එකහමාරක විතර කාල සීමාවක් ගත වෙලා තිබෙනවා. නමුත්, සම්පූර්ණ කර තිබුණු පනත පාර්ලිමේන්තුවට ගෙනෙන්න මෙච්චර ප්‍රමාද වුණේ ඇයි? ඒ පනත ගෙනෙන්න ප්‍රමාද වීම හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් විශාල ප්‍රමාණයකගේ වත්කම් බැංකුවලට සින්න වුණා; ඔවුන් විශාල කරදරවලට ලක් වුණා. ඔබතුමන්ලා අවුරුදු එකහමාරක් මේක දිහා බලාගෙන හිටියේ ඇයි කියලා මුලින්ම මම අහන්න අවශ්‍යයි. ඔබතුමන්ලා ඒ කාල සීමාව තුළ මේ පනතට මොනවා හරි සංශෝධන ගෙනාවා නම්, ඒ සංශෝධන මොනවාද කියන එක පිළිබඳවත් ඊළඟට අදහස් දක්වන අයට පොඩි පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්. ඒ වාගේම ලංකාවේ තිබෙන්නේ කිසියම් ව්‍යාපාරයක් කරන්න ගිහිල්ලා, ඒ ව්‍යාපාරය හිර වුණොත් තමන්ගේ වත්කම් ටික බැංකුවට සින්න වන නීති. බැංකු කිසිම අවස්ථාවක සූදානම් නැහැ, ඒ අවදානමින් කොටසක්වත් භාර ගන්න. හැබැයි, ආණ්ඩුවට ලංකාවේ රාජ්‍ය බැංකු වැඩිම ලාභයක් ඉපයුවා කියලා වර්ණනා කරන්න පුළුවන්. එහෙම වර්ණනා කරන අතරතුර අමතක නොකළ යුතු දෙයක් තමයි ව්‍යාපාර කරන්න, වැඩ කරන්න උත්සාහ කරපු මිනිස්සුන්ගේ වත්කම් ඒකරාශි කරගෙන, වත්කම් සින්න කරගෙන ඒවා අලෙවි කරමින් ව්‍යාපාරිකයින් ඔවුන්ගේ ව්‍යාපාරවලින් ඉවත් කරන වැඩ පිළිවෙළක් බැංකු හරහා ක්‍රියාත්මක වෙනවාය කියන එක. ඒ නිසා මේ පනත් ගෙන ඒමට අමතරව ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නත් ආණ්ඩුව පැත්තෙන් නිසි අවසරය ලබා දෙන්න කියාත් මම ඉල්ලනවා.

ඊළඟ කාරණය මේකයි. ව්‍යාපාරිකයෙක් තමන්ගේ ව්‍යාපාරය අත්හැරලා රැකියාවකට යෑම හරහා විශාල පිරිසකට රැකියා අහිමි වෙනවා. පසුගිය සතියේදී මට හමු වුණා, කුලී රථ රියැදුරෙක්. ඔහු කලින් garment factory එකක් කරලා තිබෙනවා. හැබැයි, අවාසනාවට පසුගිය කාලයේ ඇති වුණු ආර්ථික අර්බුද නිසා ඔහු 20දෙනෙකු විතර වැඩ කරපු කර්මාන්තශාලාව අත්හැරලා මේ වනවිට රියැදුරෙක් ලෙස රැකියාව කරනවා. ඔහු ඒකෙන් රුපියල් 6,000ක්, 7,000ක් දවසකට හොයා ගන්නවා. නමුත්, ඔහු යටතේ වැඩ කරපු 20දෙනෙකුගේ, 30දෙනෙකුගේ රැකියා ටික අහිමි වෙලා තිබෙනවා. මේ වාගේ ප්‍රශ්න බේරා ගන්න තිබුණා, මේ පනත කලින් ගෙනාවා නම්. ඒ නිසා මේ පනත ගෙනෙන්න ප්‍රමාද වුණේ ඇයි කියන එකට ආණ්ඩුව පැත්තෙන් උත්තරයක් ලබා දීම අවශ්‍යයි.

ඒ වාගේම පසුගිය ආණ්ඩුවට සහ එවකට හිටපු ජනාධිපතිවරයාට මම ස්තුතිවන්ත වෙනවා, වසර 150ක් විතර පැරණි නීතියක් මේ විධියට වෙනස් කිරීම සඳහා අවධානය යොමු කිරීම පිළිබඳව.

අද උදේ අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා එක්ක කථා කරපු වෙලාවේ දී මට දැනගන්න ලැබුණා, කමිටු අවස්ථාවේදී සංශෝධනයක් ඉදිරිපත් කරන්න කියා එතුමා කිව්වා කියලා. බැංකු එක්ක සාකච්ඡා කිරීමට තිබෙන දින 60 ප්‍රමාණවත් නැහැ, ඒක දින 180 දක්වා වැඩි කරන්න කියන සංශෝධනය කිරීම මම හිතනවා, ප්‍රායෝගිකයි කියලා. ඒකට හේතුවක් තිබෙනවා. බිඳ වැටුණු ව්‍යාපාරයක් යළි ගොඩ නඟන්න ඒ ව්‍යාපාරිකයා උත්සාහ කරන අවස්ථාවේදී බැංකුවත් එක්ක කරනු ලබන සාකච්ඡාවලටත් තමන්ගේ කාලය වෙන් වෙනකොට ඔහුට මේ කුඩා කාල සීමාව ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. මොකද, ඒක ඔහු කලින් ලබපු අත්දැකීමක් නොවන නිසා. ඒ නිසා ආණ්ඩුව පැත්තෙන් දින 60 කාල සීමාව දින 180 දක්වා වැඩි කරනවා නම් ඒක ව්‍යාපාරිකයින්ට පහසුවක්. උසාවි ගිහිල්ලා වට කිහිපයකින් කර ගන්නවාට වඩා එකවරම ඒ දෙය කරගන්න පුළුවන් නම් හොඳයි.

ව්‍යාපාර සම්බන්ධයෙන් ගත්තාම, මම මේ කාරණයත් කියන්න කැමතියි. ඊයේත් සාකච්ඡාවට ගත්තා, Colombo Port City Economuic Commission Act එක යටතේ නියමයන්. Colombo Port City එක කියන්නේ, ලංකාව ඇතුළට ආයෝජකයන් එන්නේ නැත්නම් ලංකාවේ පිටතින් නිර්මාණය වෙච්ච ඒ ව්‍යාපෘතිය කරා හෝ ආයෝජකයන් කැඳවා ගැනීම සඳහා ලංකාවට ලැබී තිබෙන මහඟු සම්පතක්. ඒ මහඟු සම්පත ප්‍රයෝජනයට ගන්නා අතරතුර පසුගිය කාලයේදී අපට දකින්න ලැබුණා, හොර ව්‍යාපාර register කරලා, ඒ හරහා business visa ගහලා, විශේෂයෙන්ම චීන ජාතිකයන් විශාල ප්‍රමාණයක් ලංකාවේ විවිධ වූ අකටයුතුකම් - සයිබර් අවකාශයේ අපරාධ - සිදු කරමින් ඉන්න බව. මේක නරක තත්ත්වයක්. ලංකාව ඇතුළට ඇවිල්ලා ව්‍යාජ කොම්පැනි හදලා, ඒවා ඇතුළට business visa හරහා මිනිස්සු ගෙනැල්ලා මේ සයිබර් අපරාධකරුවන් ලංකාවේ ඉඳගෙන මේ කලාපයට ඇති කරන තර්ජනය බරපතළ අර්බුදයක්. ඒ නිසා කලාපය තුළ සයිබර් අපරාධ ආරක්ෂිත උද්‍යානයක් බවට ලංකාව පත් වෙමින් පවතිනවා. ඩිජිටල් අමාත්‍යවරයා කියන්නේ, මේ රටේ ජනාධිපතිවරයා. ඩිජිටල් නියෝජ්‍ය ඇමති කියලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ලංකාව ඇතුළේ මේ වාගේ දේවල් වෙන දිහා බලාගෙන සිටියදී අපට සැකයක් තිබෙනවා, මේ වැඩවලට අමාත්‍යාංශය පැත්තෙනුත් සහයෝගයක් ලැබෙනවාද කියලා. ව්‍යාපාර ලියාපදිංචි කරලා ඒවායෙන් කොයි තරම් බදු මුදල් ලැබුණාද කියන එක පිළිබඳව පසු විපරමක් සිදු කරනවා නම් මේ සයිබර් අපරාධකරුවන්ට ලංකාව ඇතුළේ මේ විධියට කටයුතු කරන්න ලැබෙන්නේ නැහැ.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

දැන් මේ සතිය පුරාවට අහන්න ලැබෙන්නේ මුදල් හුවමාරු වීම පිළිබඳ ප්‍රශ්නය; සැක කටයුතු ගිණුමකට අපේ රටෙන් මුදල් හුවමාරු කරද්දී ඇති වෙච්ච අර්බුදය. ඒකටත් මේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වග කියන්න ඕනෑ. ලංකාව වාගේ රටක මේ වාගේ මුදල් හුවමාරුවේදී බරපතළ අතපසුවීම් සිදු වෙනවා නම් ඒක ලංකාව ඇතුළට ආයෝජකයන් පැමිණීමට හිතකර තත්ත්වයක් වෙන්නේ නැහැ. රජය ඇතුළේ මේ වාගේ අර්බුද නිර්මාණය වෙද්දී ආයෝජකයන් ලංකාවට මුදල් ගෙනැල්ලා ආයෝජන කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ නිසා මේ හරහා රාජ්‍ය නිලධාරින් මුහුණ පාන අර්බුද පිළිබඳව ආණ්ඩුව මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ. රාජ්‍ය නිලධාරිනුත් මතක තබා ගත යුතුයි, දැන් පවතින තත්ත්වය මත යම්කිසි අර්බුදයක් ආපු වෙලාවට ආණ්ඩුව රාජ්‍ය නිලධාරින් බිල්ලට දීලා නිදහස් වන තත්ත්වයක් පෙන්නුම් කරන නිසා තමන්ගේ ආරක්ෂාව තමන්ටම සලසා ගන්නට සිදු වෙනවාය කියන එක.

ඊළඟ ප්‍රශ්නය තමයි, ව්‍යාපාර පරිසරය යහපත් කරන්න ඕනෑ කියලා කියන ආණ්ඩුව නීති අණපනත් ගෙනෙන අතරතුර ලංකාව ඇතුළේ තිබෙන ව්‍යාපාරවලට ඇති කරන කරදර සහ බාධා. මම මේ සතියේ මීගමුවේ වැල්ලට ගියා කරවල ටිකක් ගන්න. ඒ මිනිස්සු කරවල විකුණන එක පැත්තකින් තියලා ආණ්ඩුවෙන් තිබෙන බාධා ටික ගැන අපට කිව්වා. නගර සභාවයි, ඒ ප්‍රදේශවල ඉන්න මන්ත්‍රීවරුයි කරවල වේළන ස්ථානය වෙන වැඩවලට ගන්න; සෙනඟ 1,500ක් විතර රාජකාරි කරන ඒ භූමිය වෙන කාර්යයන්වලට ගන්න වාගේම ඒගොල්ලන් එතැනින් අයින් කරන්න පිඹුරුපත් සකසනවා කියලා ඒ මිනිස්සුන්ට තිබෙන ප්‍රශ්න ටිකක් අපිත් එක්ක කිව්වා. ඒ නිසා ව්‍යාපාර අලුතින් ගොඩනඟන්න, පහසුකම් සලසන්න ඕනෑ කියලා උදේ හවා කයිවාරු ගහන ආණ්ඩුවට අපි කියනවා, පාඩුවේ ව්‍යාපාර ටික කරගෙන යන මිනිස්සුන්ට ඔවුන්ගේ ව්‍යාපාර ටික පහසුවෙන් කරගෙන යන්න ඉඩ දෙන්න කියලා. ඔවුන්ට සුදුසු ස්ථාන වෙන් කරලා, ඒවා හදලා, ඔවුන්ගේ ස්ථාන ඉවත් කිරීම කරන්න පුළුවන්. එහෙම නැතුව මෙවැනි අත්තනෝමතික ක්‍රියා කලාපයන් සිදු කරන්න එපා කියලා අපි ඉල්ලනවා.

ඒ වාගේම ඒ ව්‍යාපාරිකයන්ගේ පැත්තෙන් ලැබුණු තවත් පණිවුඩයක් තිබුණා. ඒ පණිවුඩය තමයි, ආණ්ඩුවේ ඇමතිවරු, ඊට අමතරව ප්‍රාදේශීය සභා සභාපතිවරු වෙසක් කලාප නිර්මාණය කරලා ව්‍යාපාරිකයන්ගෙන් මුදල් ඉල්ලනවාය කියන එක. වෙසක් උත්සව කාලයේදී තමන්ගේ කැමැත්තෙන් දන්සලක්, උත්සවයක් පවත්වන එක වෙනයි. හැබැයි, රාජ්‍ය බලය භාවිත කරලා ඒ රාජ්‍ය බලයට තිබෙන යටහත් පහත්කම මුදල් එකතු කර ගැනීම සඳහා යොදා ගන්නවා නම් ඒක හොඳ දෙයක් නොවෙයි.

විශේෂයෙන්ම Airport එකේ සිටින හයර් යන රියැදුරන් කියනවා, අදාළ මුදල ගෙව්වේ නැත්නම් තමන්ගේ හයර් එක ලබා ගන්න බැරිකමක් තිබෙනවාය කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
තව සුළු මොහොතකින් මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මම ආණ්ඩුවෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා, ව්‍යාපාර අමාරුවෙන් ගොඩනඟා ගෙන යන මොහොතක අත්තනෝමතික ක්‍රියා කලාප මඟින් ඒ ව්‍යාපාරිකයන් තවත් අපහසුතාවට පත් කරන්න එපා කියලා. ඒකට හේතුව මෙකයි. ව්‍යාපාරවලට ඉඩ දෙන්න පනත් ගෙනාවාට තමන්ගේ මිනිස්සු ගිහිල්ලා ඒ ව්‍යාපාරිකයන්ට කරදර කරනවා නම් ඒ ව්‍යාපාරිකයන් අධෛර්යවත් වෙනවා නේ. ඒ පිළිබඳවත් ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියමින් අදහස් දැක්වීම මම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.28]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පාර්ලිමේන්තුවේ විශේෂයෙන්ම මේ රටේ ආර්ථිකයට බලපාන, මේ රටේ ආර්ථිකය නඟා සිටුවන්න අවශ්‍ය කරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්නා මේ අවස්ථාවේ මම කැමැතියි, වැදගත් කරුණු කිහිපයක් මතු කරන්න.

වස්තුභංගත්වය කියන්නේ මොකක්ද කියන කාරණය ගත්තොත්, එය සරලව බංකොලොත් බව. මේක පුද්ගලයෙකුට වෙන්න පුළුවන්. තමන්ගේ වත්කම්වලට වඩා බැරකම්, ණය වැඩි වීම තමයි මේ. මේක ආයතනයකට වෙන්න පුළුවන්. ඒ වාගේම මේක රාජ්‍යයකට වෙන්නත් පුළුවන්. හරියටම ලංකා රාජ්‍යයට 2022දී කළා වාගේ. ඔය විපක්ෂයේ ඉන්න "President of pressure" - "තෙරපි තෙරපි ජනාධිපතිලාට" - 2022දී වුණේ ඒක. ඒගොල්ලෝ එකතු වෙලා රට මංකොල්ල කාලා මේ රට බංකොලොත් කරලා දැම්මා. මේ රටේ ණය ගෙවන්න, පොලිය ගෙවා ගන්න බැරි තැනට මේ රට පත් කළා. ඒ වාගේ මේ රටේ ව්‍යාපාර ක්ෂේත්‍රයේත් වෙන්න පුළුවන්කමක් තිබෙනවා. පුද්ගලයන්ට වෙන්න පුළුවන්කමක් තිබෙනවා.

2026 වසරේ අපි දැන් මේ ගෙනෙන පනත් කෙටුම්පත - Bill එක - මොකක්ද? 1853දී තමයි අපේ රටේ මේ සම්බන්ධයෙන් මූලික පනත එන්නේ; ආඥා පනත. 1853 අංක 7 දරන වස්තුභංගත්ව ආඥා පනත. ඇත්තටම මේක යටත්විජිත, එහෙම නැත්නම් colonial පනතක්. 1833දී කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ එනකොට, ලංකාවේ capitalism හැදීගෙන එනකොට, නැඟීගෙන එනකොට අවශ්‍ය වුණු ව්‍යාපාර පසුබිම සකස් කරන්න තමයි මේක හැදුවේ. ඒ අනුව එදා තත්ත්වයන්ට ගැළපෙන නීතියක් තමයි මේකේ තිබුණේ. ඒ නිසා මේ රටේ ලොකු සංවාදයක්, රට ඇතුළේ ධනේෂ්වර ආර්ථිකය, capitalism වර්ධනය අත්පත් කර ගනිද්දී, ඒක ගෝලීය ආර්ථිකයක් දක්වා ඉස්සරහට එද්දී, ඇවිල්ලා වර්ධනයන් අත්පත් කර ගනිමින් ඉස්සරහට එද්දී, අලුත් නීති තත්ත්වයන් ඕනෑ වුණාට, ඒ සම්බන්ධයෙන් සාකච්ඡාව තිබුණා වුණාට ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ අනුව අපට ගැටලුවක් තිබුණා; ගරු අමාත්‍යතුමාත් මතු කළා වාගේ, Ease of Doing Business Index එකේ අපට තිබෙන්නේ පහළ තැනක් කියන එක සම්බන්ධව. ඉහළ තැනකට එන්න, ඒ කියන්නේ ව්‍යාපාර කිරීමේ පහසුව හදාගෙන ඉහළට

යන්න අපට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා ජාත්‍යන්තර තත්ත්වයන්ට ගැළපෙන විධියට මේ නීති ප්‍රතිසංස්කරණ අපට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ අනුව තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුත්ත කාලයක් තිස්සේ මේ රටේ විද්වතුන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, මේ පාර්ලිමේන්තුව, කමිටු ඇතුළේ දීර්ඝ සාකච්ඡා, සංවාද කරලා, ජාත්‍යන්තර අත්දැකීම් අරගෙන, එකතු කරගෙන මේ RTI Act එක මෙතැනට එන්නේ. ඉතින් එයට දායක වෙච්ච විශාල පිරිසක් ඉන්නවා, මේ රටේ ප්‍රගමණය වෙනුවෙන්.

මේ පැරණි පනතේ නැති නමුත් අලුත් පනතේ වැඩි අවධානයක් යොමු කරපු ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධව කථා කරන්න මම කැමැතියි. දැන් වහන එක වහලා වේගයෙන් ඉවර කරන එකත් වැඩක්, බංකොලොත් වුණාට පස්සේ. ඒක වේගවත් කරනවා වාගේම බංකොලොත් වෙච්ච ව්‍යාපාර නැවත ගොඩනැඟීමේ ශක්‍යතාවක් තවදුරටත් තිබෙනවා නම්, එවැනි ව්‍යාපාර සඳහා ගොඩනැගෙන්න අවශ්‍ය කරන සහාය දෙන්න අවශ්‍ය නීති සම්පාදනය කරන එක තමයි මේ නීති පද්ධතිය ඇතුළේ මූලික පදනම වෙන්නේ. එතකොට international best practices මේ වෙනුවෙන් තිබෙනවා, ලෝකයේ. ඒ international best practices මේකට ගේන්න මේ අලුත් නීති පද්ධතිය සමත් වෙලා තිබෙනවා. ඒකට තමයි වස්තුභංගත්ව නියාමන අධිකාරිය පිහිටුවලා ඒ අවශ්‍ය කටයුතු ඉටු කරන්න මේ යෝජනා කරලා තියෙන්නේ.

"බංකොලොත් බව" කිව්වාම කාට වුණත් තේරෙන්නේ, ඉවරයි; ඔක්කෝම ඉවරයි; දැන් ආයේ ගොඩ යැමක් නැහැ; නැවත මේකේ උඩට එන්න බැහැ කියලායි. එහෙම නේ, මේ රට ගැනත් කිව්වේ. නමුත් අපේ ආණ්ඩුව ඇවිල්ලා, ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා විධියට වගකීම අරගෙන මේ රට ගොඩදාලා තිබෙන්නේ. ඒ වාගේම තමයි පුද්ගලික අංශයෙත් කාට හරි තමන් බංකොලොත් වුණොත්, පුද්ගලිකව බංකොලොත් වුණොත් තමන්ගේ ව්‍යාපාරය නැවත ගොඩනගා ගැනීමේ ඒ බලාපොරොත්තුව ඉස්සෙල්ලා තිබුණේ නැහැ.

ඒ බලාපොරොත්තුව, ඒකට අවශ්‍ය කරන පසුබිම, නෛතික සහයෝගය තිබුණේ නැහැ. අන්න ඒක හදන එක තමයි, මේ පනතේ පදනම බවට පත් වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් දේ තමයි, මේ MSMEsවලට, එහෙම නැත්නම් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දක්වා තිබෙන සහයෝගය. ඒක ශක්තිමත් කරන්න අවශ්‍යයි. ඒකට හේතුව, 2024 දත්ත අනුව ගත්තාම, මේ MSMEs මිලියන 1.1ක් පමණ ලංකාව ඇතුළේ ක්‍රියාත්මකයි. රටේ ආර්ථිකයට, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 52කට ආසන්න ප්‍රමාණයක් මේ ක්ෂේත්‍රයෙන් තමයි දායකත්වය දෙන්නේ. රටේ ජාතික රැකියා නිෂ්පාදනයට සියයට 45ක් විතර දායකත්වය දෙන්නේ මේ ක්ෂේත්‍රයෙන්. එතකොට මේ ක්ෂේත්‍රයට ප්‍රාග්ධනය සපයා ගැනීමේ ගැටලුවක් තිබෙනවා වාගේම, මේ ක්ෂේත්‍රය ඇතුළේ ණය ලබා ගත්තාම, ඒ ණය ගෙවා ගැනීම සම්බන්ධයෙන් ගැටලුවක්, ඒ වාගේම cash flow එකේ ගැටලුවක් ආදී වශයෙන් විශාල ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න ඕනෑ ක්ෂේත්‍රයක්. මෙතැන තමයි වැඩි ප්‍රමාණයක් ව්‍යාපාර බිඳවැටීමේ අවදානම තිබෙන තැන. ඒ නිසා මේ පනත තුළින් ඒ කාරණා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ අනුව ගත්තාම, මේ ක්ෂේත්‍රයේ පැවැත්ම හා පුනරුත්ථාපනය මේ නීතිය මඟින් තහවුරු කරලා තිබෙනවා. පරාටේ නීතිය පැත්තෙන් ගත්තාම, පරාටේ නීතිය එකවර ක්‍රියාත්මක කරනවා වෙනුවට යම් ආකාරයක සාකච්ඡාවකට පස්සේ ව්‍යාපාරයට ගොඩ එන්න අවස්ථාවක් දීලා කටයුතු කරන්න මේ පනතින් ඉඩ කඩ හදලා තිබෙනවා. ඒ අනුව අපි ආර්ථිකමය වශයෙන්, ව්‍යාපාර කිරීමේ පහසුව පැත්තෙන් ඉතා ඉහළ තැනකට රට ඔසවා තබන්න, මේ පනතින් නීතිය ක්‍රියාත්මක කෙරෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි, ශ්‍රී ලංකා මහ බැංකුවේ, Annual Economic Review - 2025 නැමැති වාර්තාවේ 32වන පිටුවෙන් කොටසක් උපුටා දක්වන්න. I quote:

> "A broad-based expansion in credit across key sectors of the economy was observed in 2025, reflecting the ongoing recovery in economic activity."

අපේ රටේ කෘෂි කර්මාන්ත අංශයේ ණය ලබා ගැනීම් රුපියල් බිලියන 163.3ක්, ඒක සියයට 9ක්. කර්මාන්ත අංශයේ ණය ලබා ගැනීම් රුපියල් බිලියන 583.4ක්, ඒක සියයට 37.8ක්. Services අංශයේ රුපියල් බිලියන 849.6ක්, ඒක සියයට 31.2ක්. Personal loans පැත්තෙන් ගත්තොත් බිලියන 406.3ක්, ඒක සියයට 22ක්. මෙසේ 2025දී ආර්ථිකයේ ණය ලබා ගැනීම පුළුල් වෙලා තිබෙනවා. ණය ලබා ගැනීම පුළුල් වෙන්නේ, රටේ ආර්ථිකය ශක්තිමත් කියලා මේ රටේ ජනතාව මත, ව්‍යාපාර මත විශ්වාසයක් හදන්න ආණ්ඩුවට පුළුවන්කම ලැබුණාමයි. අන්න ඒ විශ්වාසය නිසා තමයි, ආර්ථිකය පුළුල් කරන්න, තමන්ගේ ව්‍යාපාර පුළුල් කර ගැනීමේ හැකියාව සොයා බලා ජනතාව ණය ලබා ගන්නේ. අන්න ඒ වාගේ අවස්ථාවකදී මෙවැනි නීතියක් ඉතාම වැදගත් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි පුළුල් කර ගැනීමේ අවශ්‍යතාව තිබෙන ව්‍යාපාරවලට ශක්තියක් වෙන්න, බිඳ වැටෙනවා වාගේ නම් එහෙම නොවී තිබෙන ලෙස ශක්තිමත් කර ගන්න, ශක්තිමත්ව ඒකට මුහුණ දෙන්න මේක ඉතා වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රජයක් විධියට, ආණ්ඩුවක් විධියට මේ ගන්නා ක්‍රියාමාර්ග තුළ, අපේ රටේ ආර්ථිකය යළි බිඳ වට්ටන්න බැරි ආර්ථිකයක් බවට, resilience එකක් තිබෙන ආර්ථිකයක් බවට, ශක්තිමත්ව නැඟී සිටින්න පුළුවන් ආර්ථිකයක් බවට පත් කරන්න අවශ්‍ය කරන කටයුත්ත තමයි මේ කරමින් ඉන්නේ. හැබැයි, මේ මොනවත් තේරෙන්නේ නැහැ, තෙරපි තෙරපි ජනාධිපති 1.0ටයි, තෙරපි තෙරපි ජනාධිපති 2.0ටයි. ඒගොල්ලෝ ඇවිල්ලා මෙතැන බොරු කිය කියා, පව කිය කියා, ජනතාව රවටමින්, ජනතාව රවටනවාට අමතරව ජනතාව කුමන්ත්‍රණකාරී ලෙස නොමඟ යවන්න උත්සාහ කරමින් ඉන්නවා. විශේෂයෙන්ම සභාවේ මහත්වරුන්ට නම් මේක කොහොමටත් අදාළ නැහැ. ඒගොල්ලන් කරන්නේ, එනවා, බොරුවක් විදිනවා, පවයක් ගහනවා, ඩිජිටල් නියෝජ්‍ය ඇමතිට මඩක් ගහනවා, මඩක් ගහලා ආපහු පස්සේ "සොරි" කියනවා වාගේ දේවල් කරලා මෙතැන ටීවී එකේ මුහුණ දමා ගන්න වැඩක් හදා ගන්න එක. ඒ නිසා මේ කිසිවක් ඒගොල්ලන්ට වැඩක් නැහැ. ඒගොල්ලන්ට ඕනෑ ඊළඟට බලය ගන්න, මොකක් හරි කුමන්ත්‍රණයක් කරලා ආණ්ඩුව පෙරළන්න කටයුතු කරන්නයි. ඉතින් අපිට කියන්න තිබෙන්නේ, මහත්වරුනි, සොරි, ඒක නම් කරන්න ලැබෙන්නේ නැහැ. මේ පනත ටිකක් ලොකු පනතක්. පිටු බොහෝ ගණනක් තිබෙන, විශේෂයෙන්ම බංකොලොත් විපක්ෂයට ඉතාම හොඳ පනතක්, මේක. බංකොලොත් විපක්ෂය එකතු වෙලා මේ පනත කියවලා, ඊළඟ වාරයේදීවත් බංකොලොත් විපක්ෂය පුනරුත්ථාපනය වෙන හැටි ඉගෙන ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 4.39]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිටු 550කට වැඩි, විශාල පනත් කෙටුම්පතක් විවාදයට බඳුන් කර තිබෙන මේ අවස්ථාවේ, ඒකෙන් පරිබාහිරව වචන ස්වල්පයක් කථා කිරීමට මම මුලින්ම බලාපොරොත්තු වෙනවා.

අපේ ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරද්දී, මෑතකදී ආන්දෝලනයට තුඩු දුන්, ජනාධිපතිතුමාගේ කථනයක් පිළිබඳව කෙරෙන විපක්ෂයේ විවේචන තම මාතෘකාව කරගෙන ආණ්ඩු පක්ෂයේ නිදහසට කරුණු කිහිපයක් කියන්න උත්සාහ කළා. ඒ, විශේෂයෙන්ම අධිකරණයට බලපෑම් කිරීමේ උත්සාහයක් පිළිබඳවයි. ඇත්ත වශයෙන්ම මේ සභාවේ ඉන්න නීතිඥවරුන් හැටියට එතුමාත්, අපත් දන්නා කාරණයක් තමයි මේ රටේ ස්වාධීන වෘත්තීය ආයතනයක් වන ශ්‍රී ලංකා නීතිඥ සංගමය මේ පිළිබඳව තමන්ගේ විරෝධය දැනට ප්‍රකාශ කර තිබෙනවා කියන එක. මෙතැනදී ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් නොකරපු කාරණාවක් ද තිබෙනවා. නඩු දින පිළිබඳව කල් තියා රටේ හැම දෙනාම දැන ගන්නවා, අහවල් දේශපාලනඥයාට විරුද්ධව නඩු දිනයක් තිබෙන බව අප කියන එකේ වැරැද්දක් නැහැ කියලා එතුමා කිව්වාට, එතැන ගැටලුවට හේතු වුණු කාරණය තමයි, ජනාධිපතිතුමාගේ කථාවේදී "අත්පුඩි ගහන්න ලැහැස්ති වෙන්න" කියලා ගැලරිය පිනවීම සඳහා කියපු කථාව. එතැනින් ඉඟියක් කෙරෙනවා කියන කාරණය මත තමයි නීතිඥ සංගමය පවා ඒකට විරෝධතාව පෑවේ. මා ඒ බව විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. ඒ ගැනත් කියමින්, තවත් කාරණාවක් පිළිබඳව මා ද්‍රවිඩ භාෂාවෙන් කෙටියෙන් අදහස් දක්වනවා.

இன்று நாங்கள் இந்தச் சபையில் முக்கியமானதொரு சட்டமூலம் தொடர்பில் விவாதித்துக்கொண்டு இருக்கின்ற இந்தத் தருணத்தில், தமிழ் நாட்டில் நடந்து முடிந்திருக்கின்ற தேர்தல் சம்பந்தமாக இங்கு பலரும் கதைத்தார்கள். குறிப்பாக, தமிழ் நாட்டில் நாளை அல்லது நாளை மறுநாள் முதலமைச்சராக சத்தியப்பிரமாணம் செய்ய இருக்கின்ற பிரபல சினிமா நட்சத்திரமாக எங்களுக்கு எல்லாம் அறிமுகமான ஜோசப் விஜய் அவர்கள் எந்தத் தயக்கமும் இல்லாமல் தன்னை ஒரு கிறிஸ்தவராகவே அடையாளப்படுத்தினார். இதுவரை காலமும் அவர் ரசிகர்கள் மத்தியில் 'தளபதி விஜய்' என்று அழைக்கப்பட்டு வந்த நிலையில், தன்னுடைய பெயரை வேண்டுமென்றே 'ஜோசப் விஜய்' என்று சொன்னதன்மூலம் தான் சார்ந்திருக்கின்ற சமயத்தை தயங்காமல் அடையாளப்படுத்தி, இன்று முழுத் தமிழகத்திலும் அதிகூடிய ஆசனங்களை வென்ற கட்சியின் தலைவராக விளங்குகின்றார். வெறும் இரண்டரை வருடங்களுக்குள் மிகப் பெரிய இமாலயச் சாதனையைப் புரிந்திருக்கின்ற தளபதி விஜய் அவர்களுக்கு எனது கட்சி சார்பில் வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

தமிழ் பேசுகின்ற மக்கள் மத்தியில் சமயம் சார்ந்த பாரம்பரியம் இருக்கக் கூடாது, மொழி அடிப்படையில் ஒரே மொழியைப் பேசுகின்ற இனமாக நாங்கள் எங்களை மிகப் பெருமையோடு அடையாளப்படுத்திக்கொள்ள வேண்டுமென்ற உணர்வைத் தூண்டுகின்ற கருத்து தமிழ் பேசும் மக்கள் மத்தியில் வலுப்பெற்றது திராவிட இயக்கங்களின் வளர்ச்சியின் மூலம்தான் என்பதை நான் இங்கு சுட்டிக்காட்ட வேண்டும். எல்லாவற்றையும் முந்திக்கொண்டு இலங்கையில்தான் 'தந்தை செல்வா' எனப்படுகின்ற தனிப்பெரும் ஆளுமையை கிறிஸ்தவராக இருக்கிறார் என்பதற்காக ஒதுக்கிவிடாமல், அவரைத் தங்களுடைய தானைத் தளபதியாக வரித்துக்கொண்டதன்மூலம் ஈழத்து மக்கள்தான் முதலிலே எந்த மத அடையாளத்துக்கும் அடிமைப்படாமல், தங்களுடைய மொழி அடையாளத்தை முன்னிறுத்தி, ஒரு தேசிய அடையாளத்துக்கு வழிகோலினார்கள் என்பது இங்கு பெருமையோடு நாங்கள் சொல்லுகின்ற விஷயமாகும்.

எங்களுடைய சிநேகக் கட்சிகள் சிலவற்றின் உறுப்பினர்கள் தமிழக சட்டமன்றத் தேர்தலில் வெற்றிபெற்று இருக்கிறார்கள். அவர்களுக்கும் என்னுடைய வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, இந்திய யூனியன் முஸ்லிம் லீக் அபார வெற்றியடைந்து இருக்கின்றது. கேரள மாநிலத்தில் 22 உறுப்பினர்களை அக்கட்சி வென்றெடுத்திருக்கிறது. அண்மையில் இந்திய யூனியன் முஸ்லிம் லீக்கின் தலைவரான பேராசிரியர் காதர் மொஹிதீன் அவர்கள், 'தகைசால் தமிழர்' விருதை முன்னாள் முதலமைச்சர் ஸ்டாலின் அவர்களிடமிருந்து பெற்றார். நாங்களும் அவருக்கு இங்கு பெரியதொரு வரவேற்பு நிகழ்ச்சியொன்றைச் செய்திருந்தோம். அக்கட்சியின் தேசிய ஆலோசனைக் குழுவின் தலைவராக இருக்கின்ற கேரளாவைச் சேர்ந்த சாதிக் அலி தங்கள் அவர்களுக்கும் எங்களது வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றோம். மிக விரைவில் 5 அமைச்சரவை ஆசனங்களை இக்கட்சி பெற இருக்கிறது. துணை முதலமைச்சர் பதவியைப் பெறவிருக்கின்ற அக்கட்சியின் தேசியப் பொருளாளரும் முன்னாள் மாநில உறுப்பினருமான குஞ்சாலிக்குட்டி அவர்களுக்கும் என்னுடைய வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

தமிழ்நாடு சட்டப் பேரவைத் தேர்தலில் போட்டியிட்ட இரண்டு தொகுதிகளிலும் இந்தியன் யூனியன் முஸ்லிம் லீக் உறுப்பினர்கள் வெற்றிபெற்று இருக்கிறார்கள். குறிப்பாக, நான் தமிழ்நாட்டுக்குப் போகும்போது என்னோடு தொடர்ந்து பயணிக்கின்ற என்னுடைய நண்பரும் பாபநாசம் தொகுதியின் புதிய உறுப்பினருமான ஆடுதுறை ஏ.எம். சாஜஹான் அவர்களுக்கும், வாணியம்பாடி தொகுதி உறுப்பினர் எஸ்.எஸ்.பி. ஸையித் பாரூக் அவர்களுக்கும், மனிதநேய மக்கள் கட்சியின் தலைவரும் நாகப்பட்டினம் தொகுதியை வென்றவருமான பேராசிரியர் ஜவாஹிருல்லா அவர்களுக்கும், சிதம்பரம் தொகுதியில் வெற்றிபெற்று இருக்கின்ற தமிமுன் அன்சாரி அவர்களுக்கும், திராவிட முன்னேற்றக் கழகம் சார்பில் பாளையங்கோட்டையில் வெற்றிபெற்று இருக்கின்ற அப்துல் வஹாப் அவர்களுக்கும், முதலமைச்சராகப்

பதவியேற்க இருக்கின்ற விஜய் அவர்களுடைய தமிழக வெற்றிக் கழகத்தின் சார்பில் அறந்தாங்கி தொகுதியில் வெற்றிபெற்று இருக்கின்ற முஹம்மது பர்வேஷ் அவர்களுக்கும், ராணிப்பேட்டைத் தொகுதியை வென்றிருக்கின்ற சகோதரி தாஹிரா அவர்களுக்கும், காங்கிரஸ் கட்சியின் சார்பில் மயிலாடுதுறை தொகுதியில் வென்றிருக்கின்ற முஹம்மது யூனூஸ் அவர்களுக்கும் என்னுடைய வாழ்த்துகளை இந்தச் சபையில் தெரிவித்துக் கொள்கின்றேன். இந்த அபார வெற்றியை அடைவதற்கு முன்பு, இது சம்பந்தமாக ஆரூடம் கூறிய பலரும் இந்த விசிலடிச்சான் குஞ்சுகள் என்ன விசித்திரத்தைச் செய்யப் போகிறார்கள் என்று அலட்சியமாகப் பேசியபோதும், அவர்கள் எல்லோரையும் அதிர்ச்சியடையக்கூடிய வகையில் பாரிய வெற்றியை ஈட்டியிருக்கின்ற தமிழக புதிய முதலமைச்சருக்கு மீண்டும் ஒரு முறை வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஜோசப் விஜய் அவர்கள் கச்சத்தீவைப் பற்றி பேசியிருந்தார். "இரண்டு இறைமையுள்ள நாடுகளுக்கு இடையில் முடிவு செய்யப்பட்டு இருக்கின்ற விவகாரத்தை நாங்கள் மாற்றியமைப்போம்" என்று சூளுரைத்திருந்தார். அந்த வகையில், சாத்தியமில்லாத, யதார்த்தமில்லாத சில விஷயங்களை உணர்ச்சிகரமாகப் பேசுவதன்மூலம் மாத்திரம் அரசியல் செய்வதை விடுத்து, இலங்கைக்கும் இந்தியாவுக்கும் இடையில் குறிப்பாக, தமிழ் நாட்டுக்கும் தமிழ் பேசுகின்ற தமிழர்களும் முஸ்லிம்களும் வாழுகின்ற வடக்குக்கும் இடையில் பாலம் அமைப்பதில் கூடிய கவனத்தைச் செலுத்த வேண்டுமெனவும் அதற்கு மத்திய அரசை வலியுறுத்த வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையில் பாலம் அமைக்க வேண்டும் என்பதை புரட்சிக் கவிஞன் பாரதி, “சிந்து நதியின் மிசை நிலவினிலே சேர நன்னாட்டிளம் பெண்களுடனே ......" என்று ஆரம்பமாகும் பாடலில்,

"சிங்களத் தீவினுக்கோர் பாலம் அமைப்போம்;

சேதுவை மேடுறுத்தி வீதி சமைப்போம்........."

என்று கூறுகிறார்.

நான் இங்கு முன்னாள் முதலமைச்சர் ஸ்டாலின் அவர்கள் பற்றியும் சொல்லியாக வேண்டும். இந்த நாட்டில் இருக்கின்ற தமிழ் பேசும் மக்களுடைய மாத்திரமல்ல, உலகளாவிய தமிழ் பேசும் மக்களுடைய தாயகமாகத் தமிழகத்தைக் கருதி, விசேடமாக எங்களை கௌரவப்படுத்துவதற்காக அவர், "அயலகத் தமிழர் தினம்" என்றொரு தினத்தைப் பிரகடனப்படுத்தி, அதைக் கொண்டாடி வந்தார். இவ்வாறான நல்ல விஷயங்களைச் செய்த அவர், தன்னுடைய கொள்கை சார்ந்து, தான் கடைப்பிடித்த கொள்கைகளின் ஊடாக 'திராவிட மாடல் ஆட்சி' என்றதொன்றை உருவாக்கி, மத சார்பற்ற மற்றும் மதச் சார்பான சக்திகளுக்கு சிம்ம சொப்பனமாகத் தமிழகத்தை மாற்றியமைத்தார். அந்தப் பெருமை அவருக்குரியது. அவர் தன்னுடைய ஆட்சிக் காலத்தில், நாங்கள் எல்லோரும் எதிர்பார்த்த மாதிரி, முழு இந்தியாவிலும் ஆகக் கூடுதலான வெளிநாட்டு முதலீடுகளைக் கொண்டுவருகின்ற ஒரு மாநிலமாக தமிழகத்தை மாற்றியமைத்து, அங்கு பொருளாதார விருத்தியை ஏற்படுத்திக் காட்டினார். அதற்காக நாங்கள் அவரை வாழ்த்த வேண்டும்.

புதிதாக ஆட்சியைப் பிடித்திருக்கின்ற முதலமைச்சர், ஸ்டாலின் போன்ற அனுபவம்மிக்க அரசியல்வாதிகளின் ஆலோசனைகளைப் பெற்று செயற்பட வேண்டும். அதாவது, முன்னைய ஆட்சியாளர்கள் தொடர்பில் விமர்சனங்கள் எப்படி இருந்தபோதிலும், அவர்களுடைய சாதனைகளைத் தொடர்ந்தும் முன்னெடுத்துச் செல்ல வேண்டும்; அதற்காக உழைக்க வேண்டும். மேலும், மதவாத சக்திகள் தமிழகத்தில் புகுந்துவிடுவதற்கு இடங்கொடுக்காமல் அவர் செயற்பட வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன்.

அவருடைய சாதனைகளில் ஒன்றுதான், குறைந்த சாதி மக்களுக்கு நிறைய இடங்களைப் பெற்றுக்கொடுத்து, அவர்களை வெற்றிபெறச் செய்திருப்பது. சாதியக் கொடுமையிலிருந்து விடுபடுவதற்காக திராவிட இயக்கங்கள் முன்னெடுத்த போராட்டத்தின் அடுத்த கட்டமாக இவரும் தன்னை அடையாளப்படுத்தி இருக்கிறார்; தேர்தலில் வென்றுகாட்டி இருக்கிறார். அதைத் தொடர்ந்தும் செயற்படுத்துவதில் அவர் வெற்றிபெற வேண்டுமென நாங்கள் பிரார்த்திக்கின்றோம்.

தமிழக சட்டமன்றத் தேர்தலில் தன்னுடைய தோல்வியைப் பெருந்தன்மையோடு ஒப்புக்கொண்டு, தோல்வி ஒவ்வொன்றும் அடுத்தகட்ட வெற்றிக்கு அடித்தளம் என்ற அடிப்படையில் செயற்படுகின்ற முன்னாள் முதலமைச்சர் ஸ்டாலின் அவர்களுக்கு என்னுடைய வாழ்த்துகளைத் தெரிவித்து, இன்றைய தினம் விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டு இருக்கின்ற சட்டமூலம் குறித்து ஒருசில வார்த்தைகள் பேச விழைகின்றேன்.

Hon. Presiding Member, I would like to deal with this particular piece of legislation - Rescue, Rehabilitation and Insolvency (Corporate and Personal) Bill - that we are discussing today, which has been brought in to amend and consolidate the laws relating to rescue, rehabilitation and insolvency of individuals and companies. This Bill repeals the Insolvency Ordinance, which was enacted way back in the 19th Century, during the colonial period, and also amends the Companies Act, No. 07 of 2007, the Inland Revenue Act, No. 24 of 2017 and the Mediation Boards Act, No. 72 of 1988 and so on and so forth.

In this regard, I would like to point out a very salient point raised by Mr. Thilan Wijesinghe, who is an investment expert in the country. He came before the Committee on Public Finance and pointed out that it is important for us to study the Indian Insolvency and Bankruptcy Code enacted in 2016. It has succeeded in reducing non-performing loans on Indian balance sheets from 9 per cent to 2 per cent or less; it was because of the implementation of the Indian Insolvency and Bankruptcy Code and particularly due to time-bound exercises. Particularly, this Act only provides for an initial period of two months for any company or participant in distress to be rehabilitated. But, the Indian Insolvency and Bankruptcy Code provides for an initial period of 180 days - almost six months - and also enables a time-bound exercise with a maximum of 360 days. When you begin to rehabilitate a company with many assets, from the start itself, it is important for the investors to be convinced as you are converting it from a debtor-controlled process to a creditor-controlled process, which becomes an issue when you facilitate a programme to help the distressed companies to find relief.

In that regard, I would like to comment on one issue. That is, after cyclone "Ditwah", this Government’s colossal failure in trying to assist the aggrieved parties, those who have lost their properties. For instance, I come from the Central Province.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Presiding Member, I saw that the Bank Supervision Department of the Central Banks has said that only about Rs. 2,000 million had been disbursed by the banks in the Kandy District, whereas Rs. 4,000 million in Badulla District and Rs. 3,000 million in Nuwara Eliya District had been disbursed. But, in the most affected district, the Kandy District, only Rs. 2,000 million had been disbursed. That is because of the reluctance and the risk-averse attitude of the banks and that has to be addressed. I have been looking forward - *[Interruption.]*- Not only that. - *[Interruption.]* I know. Now, let me finish because I have limited time.

Now, what has happened? The Government said that a maximum of Rs. 5 million would be given to properties destroyed. Now, you all are telling them, "Okay, you take, once and for all, a payment of Rs. 500,000 and settle it." That is how it is happening. Nothing has happened so far. So, this issue has to be addressed. A lot of money had been allocated by Parliament; we passed almost Rs. 750 billion! What happened to the money? Also, Rs. 8,000 billion had been collected by donations, none of which has, so far, been properly distributed among the aggrieved people. So, that is an issue that has to be addressed very fast, Mr. Presiding Member.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[4.56 p.m.]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you, Mr. Presiding Member, for giving me the opportunity to speak on this Bill.

While stating that the introduction of this Rescue, Rehabilitation and Insolvency (Corporate and Personal) Bill is timely, I must also tell you that it something that has been brought into existence through commissioning by Mr. Chanaka de Silva, President's Counsel, in June, 2023.

Sir, it needs many corrections.

I spoke to the Hon. Minister of Justice and National Integration today and he said that owing to the time factor, they would like to see this legislated and that amendments could be brought in later. But, I thought I would contribute in that regard during the little time available to me to make it more meaningful.

When it comes to insolvency, it is different from bankruptcy. There are laws for liquidation, but there is not any mechanism to resuscitate a business that is under-capitalized or not solvent enough with a good business proposition. There is personal insolvency and corporate insolvency. In 1888, amendments had been made to the Insolvency Ordinance, No. 07 of 1853, and the Companies Act, No. 17 of 1982 and No. 07 of 2007 had further incorporations relating to liquidation. But, no one had introduced a system to assist businesses like they do under Chapter 11 of the Bankruptcy Code of the USA or under the restructuring process in India, which permit a good company that is not sufficiently capitalized and faces bankruptcy to be pulled out of that situation through an insolvency process.

While appreciating the legislation of this Act, the rectifications that need to be done to it are as follows. My feeling is that the 60-day time frame has got to be looked at since it is hardly sufficient because the decision-making process in Sri Lanka is not as competent as it should be. So, my view is that we should look at a 180-day period because it would be routed through the courts with a windup officer being appointed. So, my feeling is that we should introduce a realistic 180-day window at the initial stage.

Then, we would also have to look at prioritization of small and medium enterprises - SMEs. Small and medium enterprises, I would say, are the most important aspect of our GDP. Almost 60 to 65 per cent of the companies in our country are small and medium enterprises, and they are the ones which are severely affected by this. Therefore, there should be a process for prioritization of SMEs, and that process should go on.

I see the Hon. Minister of Justice and National Integration walking in and I only want to reiterate the matters I referred to earlier. The process would be a court process. So, I would say that specific district courts need to be established for this particular purpose like the commercial courts that had been established to fast-track the process.

Now, let us take the negative aspects pointed out by those who came before the Committee on Public Finance. One thing that had been pointed out is that this system should operate islandwide.

We would not be able to establish courts islandwide at once, but if you, at least, start from a particular place, then with the success rate of it, others could be established in the rest of the country as well.

It goes unsaid that the temporary suspension of the *parate* law is important. I say that the *parate* law is something which has to be addressed separately. The *parate* law relates to the insolvency aspect of it and I will deal with it after I finish speaking about the Rescue, Rehabilitation and Insolvency (Corporate and Personal) Bill that we hope to pass.

Then, when we look at cross-border insolvency, it necessitates that we look at the foreign exchange aspect of it. The Foreign Exchange Department of the Central Bank will have to look at the impact of internationalizing local debt. If you have a company that runs aground and they syndicate it - you might have many of those companies amalgamated - and take it overseas, making the insolvency cross-border, then you would have foreign domination. When foreign domination comes in, there would be dollar perspective to be looked at. Then, we will have to consider the country’s risk aspect in that. Also, the Central Bank's accepting dollar loans for rupee loans would be a matter that we would have to consider further.

On that score, we have got to look at many aspects. Most importantly, when you give a receivership to a particular person and the creditors place their hopes on that particular receiver, you have got to look at the prioritization process because if the prioritization process leads to a situation where the Government's priority list comes from public finance and Government taxes coming in first, it would have a negative impact on the entire process. That is why you have got to look at it from a business revival perspective, considering the employees and the company. Then, the success of it would help you to carry the company through to the next level.

Then, you look at taxation. That has been dealt with in the Insolvency Act rather than being looked at from the taxation laws' point of view. That was mentioned by Mr. Suresh Perera of KPMG, who is preeminent in that area, pointing out that there is a necessity to incorporate it in tax amendments. So, I guess it has got to be looked at from that perspective because, otherwise, the Inland Revenue Department might say, “Sorry, it does not affect us”. So, on that basis, this Act, by the time it comes into effect, would lose its value.

The next matter is the fear of the banks owing to the *parate* law. Not only that, owing to the fact that the NDB is now going through some financial crisis, you might have a situation where even a bank would seek redress through this law. So, we must look at it from a practical aspect and how to improve from a business sense. Insolvency happens due to bad policies, bad business decisions or high interest rates such the increase on 12th April, 2022 to 70 per cent while companies are not prepared to accept external and internal shocks.. So, on that score, we have got to help the small and medium enterprises and the big businesses which have a good business propositions but not a sufficient capital component.

Then, when a company goes into liquidation, what basically goes into the bank’s receivership? This *parate* law is something that everybody is talking of today. I am sure the Hon. Deputy Minister of Finance and Planning (Dr.) Anil Jayantha must be lampooned today because a lot of requests are coming in with regard to *parate*.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Just give me a minute, Sir.

The *parate* law came in during the period 1989-1990 when companies had been held hostage by outside forces due to civil aberration that took place. But, Sri Lanka is the only country in the region where the *parate* law is implemented, under which preferential treatment has been given to the banks. Today, they are using it to the detriment of the business sector. So, please ensure that the *parate* law is looked at, at least, futuristically. We must bring in amendments to the *parate* law because the small and medium enterprises are disproportionately affected by it and that has not helped the business sector.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව සුළු වෙලාවක් දෙන්න. මේ කාරණය කියලා අවසන් කරන්නම්.

If you look at the aspect of businesses up to 1990, it was working very ambitiously, aggressively and positively. But with the *parate* law coming in, there was a halo around the banks, an impregnable area, with the banks thinking that they could do anything, even predatory activity. Some banks looked at the cash flows of companies which were weak, went into those areas and tried to buy those companies over owing to the illiquidity. So, considering the time factor, I would request, please relook at the *parate* law, ensure that priority is given to the SMEs and look at business propositions.

Also, look at the amendments proposed to make the Rescue, Rehabilitation and Insolvency (Corporate and Personal) Act more consistent and practical in its implementation.

Thank you, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. UPUL KITHSIRI left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES took the Chair.*

[අ.භා. 5.06]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ සාකච්ඡාවට ගන්නා විශේෂ වැදගත්කමක් තිබෙන මේ පනත් කෙටුම්පත පිළිබඳව විවාදය අවසාන වන අවස්ථාවේ අදහස් දක්වන්නට ලැබීම පිළිබඳව මම සතුටු වනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරද්දී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේ ගැන කථා කළේ, ටිකක් පරක්කු වෙලා අපි මේක ගෙනෙනවා වාගෙයි. මම ඒ ගැනත් කියන්න ඕනෑ. අපේ ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු එකහමාරක වාගේ කාලයක් වනවා. ඒ අවුරුදු එකහමාරට අණපනත්, නීති කොපමණ ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තුවේ සම්මත කළාද කියන කාරණය පිළිබඳවත් මම මතක් කර දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත් කෙටුම්පත පිළිබඳව තමයි අද අපි සාකච්ඡා කරන්නේ. මේ පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්නේ ඇයි කියන කාරණය පිළිබඳව අපි කවුරුත් දන්නවා. මොකද, අපේ රටේ මේක ප්‍රශ්නයක් හැටියට තිබෙනවා. රවී කරුණානායක මන්ත්‍රීතුමාත් මේ ගැන දන්නවා. ව්‍යාපාර බංකොලොත් වනකොට, එහෙම නැත්නම් ව්‍යාපාර අඩපණ වනකොට, විවිධ හේතු නිසා ඒවා දුර්වල වනකොට, කොවිඩ් වාගේ තත්ත්වයක් නිසා ව්‍යාපාර පවත්වාගෙන යන්න බැරි වුණාම, ලෝක ආර්ථික අර්බුදය හමුවේ සියයට 29, 30, 32, 33ට පොලී අනුපාතය ඉහළ ගියාම, ගත්ත ණය අවුරුදු දෙක තුනෙන් double, triple වෙනකොට ඒ අයට ව්‍යාපාර කරගෙන යන්න බැරි වුණා. ඒ ව්‍යාපාර කරගෙන යන්න බැරි වුණාට පස්සේ ණය ආපසු ගෙවන්න moratoriums දුන්නා. Moratoriums දුන්නත් ඒවා ගොඩ දමන්න බැරි වුණා. ඒ බැරි වුණාට පස්සේ සමහර ව්‍යාපාර එහෙමපිටින්ම අඩපණ වුණා.

මම මීට පෙර අවස්ථාවකත් මේ කාරණය ගැන ගරු සභාවේ අවධානය යොමු කළා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ විතරක්, විවිධ ප්‍රමාණවලින්, විවිධ මට්ටම්වලින් සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ හෝටල් 800කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මේ හෝටල්වලින් සියයට 90ක්ම ණය අරගෙන තිබෙනවා. පසුගිය වසර කිහිපය තුළ මේ හෝටල්වලින් සියයට 75කට වැඩි ප්‍රමාණයක් බැංකුවලට සින්න වුණා; බැංකු විසින් පවරාගෙන තිබෙනවා. දැන් හෝටලයත් නැහැ, එතැන ව්‍යාපාරයකුත් නැහැ. එතැන ගොඩනැගිල්ලක් තිබෙනවා. සමහර ඒවායේ ජනෙල්, දොරවල් ගලවාගෙන ගිහින් තිබෙනවා. සමහර ඒවායේ උළුවහු, ජනෙල් නැහැ, A/C නැහැ. හැබැයි, ඒක බැංකුවේ වත්කමක්. "බැංකුව සතු දේපළකි" කියලා ඉස්සරහ බෝඩ් එකක් ගහලා තිබෙනවා. හැබැයි, අවසානයේ විවිධාකාර සොර සතුරු පහරකෑම්වලට ලක් වීම නිසා ව්‍යාපාරයත් නැති වෙලා, බැංකුවටත් දේපළ නැති වෙලා තිබෙනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ ප්‍රශ්නය හඳුනා ගත්තා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්, විශේෂයෙන් අපේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ අය රැකවරණ නැතිව, පහසුකම් නැතිව තමයි ව්‍යාපාර කටයුතු කරගෙන ගියේ. ඒ නිසා තමයි අපි ආණ්ඩුවක් හැටියට කල්පනා කරලා ණය පහසුකම් විතරක් නොවෙයි, විවිධාකාර වූ සහන පැකේජ ලබා දෙමින්, මේ භූමියේ ස්ථාපිත කරපු ව්‍යාපාරයක් මැකිලා යන්න දෙන්නේ නැතිව - අහෝසි වෙන්න දෙන්නේ නැතිව - ඒ ව්‍යාපාරය නැවත ගොඩ නඟාගන්න පුළුවන් ක්‍රමවේදයකට - joint venture එකකට - යන්න පුළුවන්ද, එහෙම නැත්නම්, තවත් හවුල්කරුවෙකු සම්බන්ධ කර ගන්න පුළුවන්ද කියලා බලලා අපි මේ කාරණය කරළියට අරගෙන ආවේ. මොකද, මේකේ පැති දෙකක් තිබෙනවා. ඒ තමයි පුද්ගලයන් සහ ව්‍යාපාර. එහෙම නැත්නම් ආයතන. වස්තුභංගත්ව නියාමන අධිකාරියක් පිහිටුවීමට අපි මේ පනත් කෙටුම්පත යටතේ යෝජනා කරනවා. වස්තුභංගත්ව නියාමන අධිකාරියක් අපි හදන්නේම මේ නිසායි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. බංකොලොත්භාවයට පත් වන ආයතනවලට හෝ පුද්ගලයන්ට පුළුවන්කම තිබෙනවා, ඒ ගැන ඒ අදාළ ආයතනය දැනුවත් කරන්න.

සමහර ව්‍යාපාර තිබෙනවා, අවුරුදු 60, 70ක් පරණයි. තමන්ගේ දෙමව්පියන්ගෙන් ලැබුණු ව්‍යාපාර තමයි සමහර දරුවෝ පවත්වාගෙන යන්නේ. පසුගිය ආර්ථික අර්බුදය හමුවේ ඒ අයට සමහර ප්‍රශ්න විසඳා ගන්න බැරි වුණා. ඒ නිසා එම ව්‍යාපාර අඩපණ වුණා; බංකොලොත් වුණා; ණය ගෙවා ගන්න බැරි වුණා; ඒ අය ජීවත් වුණු ගෙයත් බැංකුවට සින්න වුණා. ඒ නිසා ඒ අයට නැවත එම ව්‍යාපාර පටන්ගන්න යනකොට විශාල ප්‍රශ්න ප්‍රමාණයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකද, CRIB එකේ නම තිබෙන නිසා ණයක් ගන්න බැහැ. අඩුම ගණනේ බයිසිකලයක් ගන්නවත් ණයක් ගන්න බැහැ, CRIB එකේ නම තිබෙන නිසා. ලීසිං එකක් දමන්න බැහැ, CRIB එකේ නම තිබෙන නිසා. ඒ නිසා මේ තත්ත්වය තේරුම් අරගෙන මේකට උත්තරයක් හොයන්න තමයි අපි ආණ්ඩුවක් හැටියට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

ලෝකයේ රටවල් 190කින් 180ක්ම බංකොලොත්භාවය සම්බන්ධයෙන් වන නීති ශක්තිමත්ව ක්‍රියාත්මක කරනවා. එම රටවල් අතර ලංකාවත් තිබෙනවා. මොකද, අපේ 2007 අංක 7 දරන සමාගම් පනතේ මේ සම්බන්ධව provision එකක් තිබෙනවා. එම පනත යටතේ, බංකොලොත්භාවය ආවරණය කිරීම සඳහා වන වගන්ති තිබුණත්, මෙම පනත් කෙටුම්පත එම වගන්තිවලින් එහා ගිහින් තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ නීතිය තුළ සම්මත කර තිබෙන පරාටේ වාගේ නීතියකින් සිද්ධ වන ක්‍රියාවලිය හරහා බොහෝ ව්‍යාපාර අපේ භූමියට, එහෙම නැත්නම් අපේ රටේ ආර්ථිකයට අහිමි වන නිසා ඒවා ගැන නැවත සලකා බලමින් ඒවා නැවත ක්‍රියාත්මක කරන්න අවස්ථාව හදන එක තමයි අපේ මේ කටයුත්ත තුළ තිබෙන්නේ.

බංකොලොත්භාවය සම්බන්ධයෙන් ගත්තාම, පුද්ගලයෙකුගේ වුණත්, ආයතනයක වුණත් - ඒ දෙකේම - ණයගැතියාගේ වගකීම් ප්‍රමාණය, ආයතනයේ වගකීම් ප්‍රමාණය කොච්චරද කියා අපි මේ තුළ බලනවා. ඒ වාගේම ඒ කෙනා එය හරියටම හෙළිදරව් කර තිබිය යුතුයි. මොකද, හෝටලයක් හදන්න කියා ණය අරගෙන ආපහු කැසිනෝ ගහලා, එහෙම නැත්නම් බාර්වලට ගිහිල්ලා හරියන්නේ නැහැ නේ. ඒ නිසා අපි ඒ ගැනත් දැනගන්න ඕනෑ. එම පුද්ගලයා මුදල් යෙදවූ ව්‍යාපාරය ආර්ථික අර්බුදය ඇතුළත තමයි දුෂ්කරතාවට පත් වුණේ කියන කාරණයත් අපි හරියට හෙළිදරව් කර ගන්න ඕනෑ. ඒ වාගේම ගත් ණය සහ ගෙවපු ණය පිළිබඳ සියලු කාරණා හෙළිදරව් කළාට පසුව ඒවාත් එක්ක සලකා බලා තමයි වස්තුභංගත්ව නියාමන අධිකාරිය මේ කටයුත්තට මැදිහත් වන්නේ, එම ව්‍යාපාරය යථාවත් කරමින් පවත්වා ගෙන යන්න අවශ්‍ය කරන ඉඩ හදා ගැනීම සඳහා.

මේ කටයුත්ත ගැන අපි කියනකොට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කියනවා, බැංකුවේ වෙච්ච සිද්ධි, මුදල් ගනුදෙනු, මුදල් හුවමාරු නිසා ආයෝජකයින්ට අවිශ්වාසය ඇති වනවා කියලා. නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එන්නත් කලින් ආයෝජකයින්ට විශ්වාසය හදනවා, තමන් ආයෝජනය කළාට පස්සේ කිසියම්ම හෝ තත්ත්වයක් මත

තමන්ගේ ආයෝජනය අවදානමට ලක් වෙලා නම්, දුෂ්කරතාවකට මුහුණ දීලා නම්, බංකොලොත්භාවයට පත් වෙලා නම්, අත් හරින්න සිද්ධ වනවා නම් ගිහිල්ලා ඒ ගැන කියන්න පුළුවන් අධිකාරියක් තිබෙනවා කියලා. "මම මෙච්චර ප්‍රාග්ධනයක් යොදවා ආයෝජනයක් කරලා මේ ව්‍යාපාරය හැදුවා, සේවකයින්ට රැකියා දුන්නා, මෙහෙම මෙහෙම දේවල් ටිකක් කළා, නමුත් දැන් මේක බංකොලොත් වෙලා නිකම් වැහිලා යනවාට වඩා හොඳයි, මේක අරගෙන යන්න පුළුවන් විධියක් කියන්න" කියලා එන්න කලින්ම ආයෝජකයාට පණිවුඩයක් දෙනවා, විශ්වාසයක් හදනවා, රටේ නීතිය ඇතුළේ ඔහුට දෙවෙනි අවස්ථාවක් තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ ව්‍යාපාරිකයින්ට තිබෙන්නේ එක අවස්ථාවයි. දේපළ ඇපයට තියලා තමන්ට පුළුවන් උපරිම ණය ප්‍රමාණය අරගෙන ඉවර වෙලා ඒ ඇපය සින්න වුණාට පස්සේ ඔහුගේ chapter එක close වෙනවා, පළමුවෙනි අවස්ථාවෙන්ම ඔහු ඉවර වෙනවා. මේ තිබෙන්නේ දෙවන අවස්ථාව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දෙවන අවස්ථාව එනකොට ඔහුට අවස්ථාවක් එනවා, වස්තුභංගත්ව නියාමන අධිකාරියට වාර්තා කරලා තවත් අවස්ථාවක් ගන්න, තවත් හවුල්කරුවෙක් එක්ක තමන්ගේ ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න පුළුවන් නම් ඒ දේ කරන්න. තමන් මහන්සි වෙලා හදා ගත්ත ව්‍යාපාරය එතැනින් එහාට තමන්ට ගෙන යන්න බැරි නිසා මේ තුළින් අඩුම ගාණේ ඒක ඉදිරියට කරගෙන යා හැකි විධියට ඉඩක් හදා ගන්න පුළුවන් වනවා.

මේ විපක්ෂය බොරු බිල්ලෝ මවනවා. ඒක විපක්ෂයේ සාමාන්‍ය ක්‍රියාවලිය තමයි. හැබැයි, මෙවැනි කටයුත්තකදීවත් අඩුම තරමින් විපක්ෂයට අපේ අරමුණ පෙනෙන්න ඕනෑ, දැනෙන්න ඕනෑ. අපි මේ සකස් කරන්නේ පෙර සූදානමක්. ආයෝජකයා ලංකාවට එනකොටම ඔහුට විශ්වාසයක් හදනවා, ඔහුට දෙවෙනි අවස්ථාවකුත් මේක ඇතුළේ තිබෙනවා කියලා. මේ පනත තුළින් ඒ සඳහා නීති සංශෝධනය කරලා තිබෙනවා, ඒ සඳහා අලුත් නීති හැදෙනවා. ඒ හදන නීති ඇතුළේ තමයි අපි අද මේ කටයුත්ත කරමින් සිටින්නේ. එහෙම නැත්නම් දැන් තිබෙන නීතිය යටතේ මොකක්ද වෙන්නේ? ඇප මත තිබෙන දේපළ සියල්ල බැංකු ඇතුළු මූල්‍ය ආයතනවලට සින්න වනවා. සමහරවිට ඉන්න හිටින්න තැනුත් නැති වනවා. කවුරු හරි ගෙයක් දුන්නොත් ඒකේ ඉන්න පුළුවන්කම තිබේවි, එහෙම නැත්නම් ඒකත් නැති වෙයි. ඒ තත්ත්වය කළමනාකරණය කරලා ආයෝජකයින්ට, ව්‍යාපාරිකයින්ට, අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ සිටින සියලුදෙනාට විශ්වාසය හදන නීතියක් හැටියට තමයි අපි මේ නීතිය ස්ථාපිත කරමින් සිටින්නේ.

මම අහගෙන හිටියා, දැන් ටිකකට කලින් අපේ රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කියනවා, "ආණ්ඩුව 'දිට්වා'වලදීත් හරියට කර ගත්තේ නැහැ, ඇන ගත්තා" කියලා. එතුමා සභාවෙන් ගිහිල්ලා තිබෙන නිසා මේක නොකියා ඉන්නද කියලා මම මේ බැලුවේ, නමුත් කියන්න ඕනෑ. මොකද, බොරු කියලා ගියාට පස්සේ ඒ බොරුව ස්ථාපිත වෙන්න පුළුවන් නේ. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා නම් සභාවේ ඉන්නවා. රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කිව්වා, අපට හම්බ වුණේ රුපියල් ලක්ෂ 5යි කියලා. මට හිතෙන විධියට ඒ කිව්වේ රවුෆ් හකීම් මන්ත්‍රීතුමා ගැනද දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුවේ අවදානමකට ලක් වෙලා, සම්පූර්ණයෙන් ගේ කඩාගෙන ගියාට පස්සේ රුපියල් ලක්ෂ 50ක මුදලක් දීලා, ගරු අනුර දිසානායක ජනාධිපති සහෝදරයා ලංකාවේ පළමුවෙන්ම මුල්ගල තියපු ගෙය මාස 3යි දවස් 9ක් ඇතුළත හදලා මේ සිංහල-හින්දු අලුත් අවුරුද්දේදී ඒ ගෙදර අලුත් අවුරුදු චාරිත්‍ර පැවැත්වුවා කියන එක අපි විපක්ෂයට මතක් කර දෙන්න ඕනෑ. මොකද, බොරු කියන එකේ සීමාවක් තිබෙන්න ඕනෑ නේ. අපි කිව්වා, සම්පූර්ණයෙන් ගේ කැඩුණොත් රුපියල් ලක්ෂ 50ක් දෙනවා, ඉඩමක් නැත්නම් ඉඩම ගන්න තව රුපියල් ලක්ෂ 50ක් දෙනවා, නිවසක් අර්ධ හානියට පත් වෙලා නම් ඒ අර්ධ හානියේ ස්වභාවය අනුව රුපියල් ලක්ෂ 5ක් දක්වා වන්දි හම්බ වෙනවා කියලා. ඊට කලින්, බඩු ටික ගන්නත් රුපියල් 50,000ක් දුන්නා, ගේ සුද්ද කර ගන්න තව රුපියල් 25,000ක් දුන්නා. පාර අයිනේ පොඩි hut එකක් හදාගෙන එළවලු ටිකක්, පලතුරු ටිකක් විකුණාගෙන හිටපු කෙනාගේ hut එක ගැලවිලා ගිහිල්ලා නම් ඔහුටත් රුපියල් 25,000ක් දුන්නා. ව්‍යාපාරයකට වතුර ටිකක් ගියා නම්, ව්‍යාපාරයේ බඩුවලට හානියක් වුණා නම් ඔවුන්ටත් රුපියල් ලක්ෂ 2ක් දුන්නා. කුකුළු ගොවිපොළවල, එළු ගොවිපොළවල, හරක් ගොවිපොළවල, ඌරු ගොවිපොළවල මිය ගිය සතුන් ප්‍රමාණය අනුව රුපියල් මිලියනය දක්වා අපි වන්දි දුන්නා. ධීවරයින්ගේ බෝට්ටුවලටත් අපි වන්දි දුන්නා. ගොවීන්ගේ වගා හානිවලටත් වන්දි දුන්නා. මේ සියලුදෙනාට අපි වන්දි දුන්නා. දැන් රවුෆ් හකීම් මන්ත්‍රීතුමා මේ සභාවේ කියනවා, හම්බ වුණේ රුපියල් ලක්ෂ 5යි කියලා. හම්බ වුණේ රුපියල් ලක්ෂ 5යි නම්, ඒ කොහේද කියලා කිව්වා නම් ඒක බේරලා දෙන්න තිබුණා. සමහර විට මේක එතුමාගේ ප්‍රශ්නයක්ද දන්නේ නැහැ.

"දිට්වා" සුළි කුණාටුව නිසා පීඩාවට පත් වෙච්ච ජනතාවට, අවතැන් වුණු ජනතාවට අවශ්‍ය පහසුකම් මේ වනකොට අපි ලබා දී තිබෙනවා, විශේෂ තාක්ෂණික ප්‍රශ්න මොකුත් නැත්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, තාක්ෂණික ප්‍රශ්න කියන්නේ, සමහර තැන්වලට ගංවතුර ගිහිල්ලා ගේ damage වෙලා තිබුණත්, පළමුවෙනි වටයේ බලන්න යනකොට බිත්ති පෙරළිලා තිබුණේ නැහැ. නමුත් සති තුන හතරක් යනකොට බිත්ති පෙරළිලා, ඒවා හානියට පත් වෙලා, ඒ ගෙදර ඉන්න බැරි තත්ත්වයකට පත්ව තිබෙනවා. නමුත් පළමුවැනි වතාවේ වාර්තා කරන්න යනකොට එහෙම තත්ත්වයක් එතැන තිබුණේ නැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ අපේ සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා ඇතුළු අපි හැමෝම එකතු වෙලා මේ කටයුත්ත කළේ කොහොමද? දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් මැදිහත් වෙලා කමිටුවක් දාලා මේ ප්‍රශ්නයට මුහුණ දීලා විසඳුම් නැති අය සම්බන්ධයෙන් අපි ගිහිල්ලා ස්ථානීය පරීක්ෂණ පවා කළා. ඒ අනුව, ආධාර ඉල්ලපු අයගෙන් සියයට 98කට වැඩි ප්‍රමාණයකට මේ වනකොට සියලු දීමනා දීලා ඉවරයි. විපක්ෂය තමන්ට හම්බ වෙන හැම අවස්ථාවකදීම බොරු කියනවා.

"දිට්වා" සුළි කුණාටුවත් එක්ක අපේ රටේ ජනතාවට ලබා දීපු සහන මුදල පොඩි මුදලක් නොවෙයි. 2025 අවුරුද්දේ රුපියල් බිලියන 270ක් - රුපියල් කෝටි 27,000ක් - දුන්නා. ඒ වාගේම මේ 2026 අවුරුද්දේ රුපියල් බිලියන 500ක් -රුපියල් කෝටි 50,000ක්- ඒ වෙනුවෙන් අපි වෙන් කර තිබෙනවා. ඒ, පාරවල් හදන්න, වැව් අමුණු ටික හදන්න, ඇළ වේලි ටික හදන්න, වන්දි දීම වැනි දේවල්වලට. ඒ අනුව රජයක් හැටියට ජනතාව බලාගන්න ඕනෑ කොතැනකදී ද, ඒ සියලු තැන්වලදී අඩුවක් නොකර මේ රටේ සියලු ජනතාව ජාති භේද, කුල භේද, ආගම් භේද නැතුව අපි බලාගත්තා කියන කාරණයත් මේ වෙලාවේ විපක්ෂයට මතක් කරනවා.

මේ පනත යටතේ ව්‍යාපාරික ප්‍රජාව පිළිබඳව කථා කරනකොට ව්‍යාපාරිකයින්ට අවශ්‍ය පහසුකම් නැහැ කියලා විපක්ෂය කිව්වා. අපි මේ කිව්වේ එක පැත්තක්. ආයෝජකයා එනකොටම අපි ආයෝජකයාට විශ්වාසය හදනවා, දෙවැනි අවස්ථාවක් තිබෙනවා කියලා.

ඊළඟ කාරණය මෙයයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි රජයක් හැටියට 2026 අවුරුද්දේ විතරක් විවිධ ව්‍යාපෘති සහ විවිධ ණය පහසුකම් යටතේ සුළු හා මධ්‍ය

[ගරු වසන්ත සමරසිංහ මහතා ]

පරිමාණ කර්මාන්තකරුවන්ට රුපියල් මිලියන 50 දක්වා ණය ලබා ගැනීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා තිබෙනවා. සියයට 4, 5, 6, 7 පොලියට බැංකුවලින් රුපියල් මිලියන 97,000ක් ලබා දෙන්න අදාළ ව්‍යාපෘති සැලසුම් මේ වනකොට සකස් කර තිබෙනවා. අන්න දැන් පුළුවන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා, තමන්ගේ ව්‍යාපෘතිය පිළිබඳ කාරණය කියලා, ව්‍යාපාරය පිළිබඳ කාරණය කියලා, එය අලුත් ව්‍යාපාරයක්ද, නැත්නම් තිබෙන ව්‍යාපාරයක් දියුණු කරන එකක්ද කියලා එම ණය ලබාගන්න. මේගොල්ලන් ව්‍යාපාරික ප්‍රජාව බය කරමින් යනවා, ප්‍රශ්න තිබෙනවා කියලා. මාළු ගන්න, කරවල ගන්න මීගමුවේ ගියාම ඒ අය ප්‍රශ්න කියනවාලු. ඔව්, ප්‍රශ්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මොකද, අපේ රටේ මේගොල්ලන් හදලා තිබුණේ ප්‍රශ්නම තමයි. අපි මුල ඉඳන් ඒ ප්‍රශ්න තමයි මේ විසඳමින් යන්නේ. අවුරුදු එකහමාරක් ඇතුළත අපි විසඳුවේ පොඩි ප්‍රශ්න නොවෙයි නේ.

රටේ මිනිස්සු බලාගන්නේ නැතුව තමන්ව බලාගන්න හදලා තිබ්ච්ච පනත් නම් කීයක් අපි සංශෝධනය කළාද? එහෙම පනත් කීයක් නම් ගෙනැල්ලා තිබුණාද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අවුරුදු 5ක් පාර්ලිමේන්තුවට ආවාම විශ්‍රාම වැටුප හදාගත්තා. හැබැයි, අපි ඒක අහෝසි කළා. ජනාධිපතිවරුන්ගේ ගෙවල්, ජනාධිපතිවරුන් නඩත්තු කරන්න ගෙනාපු පනත් අපි අහෝසි කළා. ජනාධිපතිවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතුත් අපි අහෝසි කළා. ඒ විතරක් නොවෙයි. පොදු දේපළ අවභාවිත කරලා වත්කම් රැස් කරගෙන ඉන්න, හංගාගෙන ඉන්න අයව හෙළිදරව් කරන පනත් පවා අපි ගෙනැල්ලා තිබෙනවා. එම නිසා දැන් තමන් ඒ වත්කම් රැස් කරගත් හැටි කියන්න ඕනෑ. ඒ පනත් එකින් එක එකින් එක මේ අවුරුදු එකහමාර ඇතුළත අපි ගෙනාවා. ඒ වාගේම පනතක් තමයි, මේ බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත. මේ පනත ගෙනාවේම නැවත වතාවක් සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ ඉන්න අයට පරාටේ නීතිය හරහා සිද්ධ වන බලපෑමත් යම් ප්‍රමාණයකට අඩු කරලා පරාටේ නීතිය හරහා දේපළ බැංකුවලට සින්න වෙලා මේ ව්‍යාපාර මැකී ගිහිල්ලා, අභිමි වෙලා යන එක වෙනුවට නව අවස්ථා හදන්න පුළුවන් පනතක් ලෙසයි. මේ ක්‍රියාවලිය ඇතුළේම අපි තවත් නීති ගේනවා.

රවී කරුණානායක මන්ත්‍රීතුමා යෝජනාවක් කළා, මේ ක්‍රියාවලිය සඳහා මාස දෙකක් මදි කියලා. ඔව්, එතුමාගේ යෝජනාව අනුව මාස දෙක මදි වුණොත් අපි ඉස්සරහට ඒ ගැන බලමු. මොකද, මොකුත්ම නැති වෙලාවක අපි මාස දෙකකුත් දීලා, අධිකාරියකුත් හදලා තිබෙනවා. මේ ක්‍රියාවලිය එකවර අධිකාරියට එන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ ගැන දෙගොල්ලන් කථා බහ කරලා තමයි අධිකාරියට යන්නේ. අධිකාරියට ගිහිල්ලා කියනවා, මට partner කෙනෙක් ඉන්නවා, මාස දෙකක් කල් දෙන්න, අපි දෙගොල්ලෝ එකඟ වෙලා මේක ඉස්සරහට අරන් යන්නම්, එහෙම නැත්නම් මට joint venture එකකට යන්න අවස්ථාව තිබෙනවා, අපි එහෙම කරගෙන යන්නම් කියලා. එහෙම බැරි නම්, මාස දෙකක කාලය ප්‍රමාණවත් නැහැයි කියලා හිතෙනවා නම්, එතකොට අපි ඒ පිළිබඳව බලමු. පළමුව නීතිය ක්‍රියාත්මක කරමු, නීතිය භාවිතාවේ යොදවමු. කල් මදි නම්, ඒකටත් තව සංශෝධනයක් ඉස්සරහට ගේන්න පුළුවන්. මොකද, නීති කියන ඒවා ගලේ කොටලා වාගේ වෙනස් කරන්න බැරි නැහැ නේ. ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවට ඕනෑ නීතියක් සංශෝධනය කරන්න පුළුවන්. ඒ නිසා රටට අවශ්‍ය කරන නීතිය තමයි අපි ඉස්සෙල්ලාම අරන් එන්න කථා කරමින් තිබෙන්නේ.

මේ වනකොට රටේ ව්‍යාපාරික ප්‍රජාවට වාගේම ගොවි ජනතාවට පවා ණය ලබා ගැනීම නිසා තමන් කරමින් සිටින ව්‍යාපාර අහිමි වනවා, පුද්ගලයින්ට ගෙවල් දොරවල් අහිමි වනවා. මෙන්න මේ සියලුදෙනාට බලාපොරොත්තුවක් තබා ගත හැකි පනත් කෙටුම්පතක් තමයි, අපි අද සම්මත කරන්නේ. ඒකෙන් බේරා ගැනීම සහ පුනරුත්ථාපනය කියන දෙකම සිද්ධ වනවා. මොකද, මේ පනතට අනුව අහෝසි වෙන්නේත් නැහැ; නැති වෙන්නේත් නැහැ. ඒ වෙනුවට බේරා ගැනීම එනවා. ඒ වාගේම මේ අනුව නැවත ප්‍රතිෂ්ඨාපනය කරලා ව්‍යාපාරයක් ලෙස ඉදිරියට යන්න පුළුවන් අවස්ථාව අපි හදනවා; හදලා ඉස්සරහට යනවා.

ඒ වාගේම තව නීති ගෙනෙනවා; රටේ ජනතාවගේ කටයුතුවලට පහසු වන තව නීති සංශෝධන ඉදිරියේදී ගෙන එනවා. ඒ නීති සංශෝධන තුළිනුත් අපි උත්සාහ කරනවා, රටේ ජනතාවට පහසු ජීවිතයක්, ලස්සන ජීවිතයක් හිමි කර දෙන්න. පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගොඩනැඟීම වෙනුවෙන් තමයි මේ අයුරින් අපි නීති සංශෝධනය කරමින් රට ඉස්සරහට අරගෙන එන්නේ. අපි මේ පනත් සංශෝධන හරහා සිදු කරමින් තිබෙන්නේ පැවතුණු ක්‍රමය තුළ තිබෙන දුර්වලතා අතික්‍රමණය කරලා, ව්‍යාපාරිකයන්ට වාගේම මේ රටේ පුරවැසියන්ට තමන් ජීවත් වන වටපිටාව තුළ විශ්වාසයෙන් යුතුව ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් හදන්න අවශ්‍ය කරන නීති සංශෝධන කිරීමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. අපි මේ වනකොටත් අධිකාරිය හදලා තිබෙන්නේ. දැනුත් හිටපු ගමන් ඔබතුමියලාගෙත් mobile phone එකටත් පණිවුඩ එනවා ඇති, ඇප නැතිව loan එකක් දෙනවාය කියලා. අපේ රටේ online හරහා ණය දෙන මහා පරිමාණයේ ජාවාරම් සිදු වනවා. සමහර බැංකු ගිණුම්වලට දවසකට රුපියල් කෝටි දෙක තුන වැටෙනවා. සමහර විට ඒ අය බැංකු ගිණුම් පටන් ගත්ත දා ඉඳලා මුදල් වැටෙනවා. එම නිසා බැංකුවලටත් එම කටයුත්ත දැන් වගකීමක් ලෙස ඇවිල්ලා තිබෙනවා. මූල්‍ය බුද්ධි අංශය පිහිටුවා තිබෙනවා. ඒ හරහා මේවා check කරන්න පුළුවන්, එක account එකකට සල්ලි වැටෙනවාද කියලා බලන්න. විශේෂයෙන් සාමාන්‍ය දුප්පත් ජනතාවට, බැංකුවලට ගිහිල්ලා ණයක් ගන්න බැරි ජනතාවට හදිසි අවශ්‍යතා සඳහා ණයක් දෙනවාය කියලා පෙන්වලා මේ වාගේ online ක්‍රම හරහා සිදු කරන මාෆියා හා ජාවාරම් නවත්වන්නත් අවශ්‍ය කරන අධිකාරිය හදන්න අපි කටයුතු කරලා තිබෙනවා. අපි ඉදිරියේදී ඉතුරු කාර්යයනුත් කරලා මිනිසුන්ට විශ්වාසයෙන් සහ වඩා සුව පහසුව ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් හදනවා. බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත ගෙන එන්නේම අපේ රටේ ව්‍යාපාරිකයන්ට, ආයෝජකයන්ට අලුත් බලාපොරොත්තුවක් හදමින් රට තුළ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැළෙන්න පුළුවන් වටපිටාවක් ස්ථාපිත කරන්නයි කියන කාරණය ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

අද දින වැඩකටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු හර්ෂණ නානායක්කාර මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Harshana Nanayakkara.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee. -*
*[THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES in the Chair.]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පනත් කෙටුම්පතට විරුද්ධත්වය ප්‍රකාශ කරලා නැහැ. එම නිසා එකඟ නොවන වගන්ති මොනවාද කියලා අහලා එකවර අනුමත කරන්න පුළුවන් නේද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Thank you, Hon. Member, for proposing that, if that could be done. I do not know whether we could do it, according to the Standing Orders.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ලේකම් මණ්ඩලය පවසන්නේ එහෙම අනුමත කරන්න බැහැ, වගන්තියෙන් වගන්තියට කියවිය යුතුයි කියන එකයි.

***1 සිට 480 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 480ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 480 ordered to stand part of the Bill.*

***පළමුවන උපලේඛනයේ සිට දසවන උපලේඛනය දක්වා උපලේඛන පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*முதலாம் அட்டவணையிலிருந்து பத்தாம் அட்டவணை வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*First Schedule to the Tenth Schedule ordered to stand part of the Bill.*

***පූර්විකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*முன்னுரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Preamble ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*சட்டமாகு வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Enacting Clause ordered to stand part of the Bill.*

***නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*தலைப்பு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Title ordered to stand part of the Bill.*

***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Bill reported without Amendment.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වගන්ති 480ක් එක වචනයක්වත් වරද්දන්නේ නැතුව මැරතන් එකක් වාගේ හරියටම ඉදිරිපත් කිරීම පිළිබඳව ඔබතුමියගේ සේවය අගය කරනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.53ට, 2026 මැයි 07වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.53க்கு, பாராளுமன்றம் 2026 மே 07, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.53 p.m. until 9.30 a.m. on Thursday, 07th May, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.